
## කොවිඩ් ව්‍යාප්තිය




# දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | දිනමින




විශේෂ අවුරුදු අතිරේකය අද පත්‍රය සමඟ

ශ්‍රී බුඩ වර්ෂ 2564ක් වූ බක් පුර දියවක ලත් කුජ දින | කාණ්ඩය 112 | පත්‍රය 101 | පිටු 20 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 අප්‍රේල් 13 අඟහරුවාදා

## NGOවලට තහනම් 2ක්

# පිටරටවල් සමඟ ගිවිසුම් තහනම්

# පිටරටවලින් මුදල් ගැනීම තහනම්

හක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

රාජ්‍ය නොවන සංවිධානවලට විදෙස් රටවල් සමඟ ගිවිසුම්වලට එළඹීම සහ විදෙස් රටවලින් අරමුදල් ලබා ගැනීම රජය විසින් සම්පූර්ණයෙන්ම තහනම් කර තිබේ.

රට තුළ ආගමික මූලධර්මවාදී කටයුතු සහ බෙදුම්වාදී ක්‍රියා පවත්වා ගෙන යෑම සඳහා නොයෙක් රාජ්‍ය නොවන සංවිධාන මඟින් මුදල් ලබා ගෙන ඇති බව අනාවරණය වීමත් සමඟ රජය මෙම තීරණය ගෙන ඇත. පාස්කු ප්‍රහාරයට පෙර කටාර්, කුවේට්, සවුදි අරාබිය යන රටවල ආගමික සංවිධාන විසින් රුපියල් කෝටි ගණනින් මුදල් මෙම අන්තවාදීන්ට පිරිනමා ඇති බව ද හෙළි වී තිබේ.

පිට 08

# සතොස සැපයුම්කරුවන්ට කෝටි 830ක ණයයි

ධනුෂ්ක ගොඩකුඹුර

පසුගිය ආණ්ඩුව සමයේ ලැබූ අලාභය හේතුවෙන් ලංකා සතොස සමාගම සැපයුම්කරුවන්ට ගෙවීමට ඇති මුදල් ප්‍රමාණය මේ වසරේ පෙබරවාරි මස 25 වැනි දින වන විට රුපියල් කෝටි 830 දක්වා ඉහළ ගොස් තිබේ.

පිට 08

## රථවාහන අනතුරු වළක්වන්න පූර්ණ බලැති ආයතනයක්

පිට 8

## බස්නාහිර විශේෂ මෙහෙයුමකින් සැකකරුවෝ 925ක් අත්අඩංගුවට

සුභාෂිණී සේනානායක සහ රක්ෂණ ශ්‍රියන්ත

විවිධ වැරදි සම්බන්ධයෙන් සැකකරුවන් 925 දෙනකු බස්නාහිර පළාතේ සිදු කළ විශේෂ මෙහෙයුමකදී අත්අඩංගුවට ගෙන තිබේ.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අතුරින් අපරාධ සම්බන්ධයෙන් සැකකරුවන් 40 දෙනකු, වරෙන්තුකරුවන් 306 දෙනකු, දූෂණ වැරදි සම්බන්ධයෙන් සැකකරුවන් 518 දෙනකු අත්අඩංගුවට ගෙන ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය සඳහන් කළේය.

පිට 08

## පොල්තෙල්-වියළි මිරිස් තත්ත්ව සහතිකය ලැබෙන තෙක් මුදාහැරීම අත්හිටුවයි

රේගු අධ්‍යක්ෂ ජනරාල්

සුභාෂිණී සේනානායක

ඇෆ්ලටොක්සීන් නමැති පිළිකාකාරකය බහුලව අඩංගු බවට පිළිගැනෙන පොල්තෙල් සහ වියළි මිරිස් තත්ත්ව සහතිකය ලැබෙන තෙක් ආනයනික සමාගම්වලට මුදාහැරීම අත්හිටුවූ බව රේගු අධ්‍යක්ෂ ජනරාල් විශ්‍රාමික මේජර් ජනරාල් විජිත රවිප්‍රිය මහතා ඊයේ (12) පැවසීය.

පිට 08

## පාසල් සිසුන්ට නිල ඇඳුම් දෙන්න රු. කෝටි 330ක්

හක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

2022 වර්ෂය සඳහා පාසල් සිසුන්ට නිල ඇඳුම් පිරිනැමීමට රුපියල් කෝටි 330ක මුදලක් මහා භාණ්ඩාගාරය මඟින් වෙන් කර ඇත.

කාන්තා හා ළමා සංවර්ධන පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය වෙත මෙම මුදල් ඉදිරියේදී පිරිනැමීමට මහා භාණ්ඩාගාරය කටයුතු කර තිබේ.

පිට 08

## ඇෆ්ලටොක්සීන් අඩංගු තෙල් තොගයක් ආපසු යවයි

පිට 8




කැවුම් කිරිබත් කොකිස් අතිරස සුවඳ දස අත රැඳෙන්නේ
නැවුම් සිතිවිලි උදා වන බව කොවුල් ගීයෙනි ගැයෙන්නේ
පැතුම් මල් වැසි සිනා සඳකැන් සමඟ මුසු වී ගලන්නේ
උතුම් අරමුණු ගෙනෙන කිරිබත එක ම නැකතිනි ඉදෙන්නේ

බතින් බුලතින් සාර වීමෙන් දැයේ සැම කුසගිනි නිවේවා
අතින් අත ගෙන සමගි දාමෙන් රටේ දියුණුට පෙළ ගැසේවා
දොරින් දොර තිබු රෝග දුක් ගිනි දුරු ව සැමට ම සුව ලැබේවා
රනින් ලියැවෙන යුගය මේකයි මේ බිමේ රන් මල් පිපේවා

*අමර පී. වීරසිංහ*

## කෝටි 100ක අයිස් සපුගස්කන්දේදී අත්අඩංගුවට

සුභාෂිණී සේනානායක රක්ෂණ ශ්‍රියන්ත සහ හක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

සපුගස්කන්ද රක්ගහවත්ත ප්‍රදේශයේදී රුපියල් කෝටි 100ක් පමණ වටිනා අයිස් මත්ද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 100ක් සමඟ සැකකරුවන් පස්දෙනෙක් පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය විසින් ඊයේ (12) අත්අඩංගුවට ගෙන තිබේ.

පිට 08

## චීන සංවර්ධන බැංකුව සමඟ ඩො. මි. 500ක ණය ගිවිසුමකට අත්සන්

පිට 8

## අලුත් අවුරුදු නිවාඩුව හේතුවෙන් හෙට සහ අනිද්දා දිනමිණ පළ නොවේ

## අවුරුදු ප්‍රීතිය භුක්ති විඳින්න මෙවර අවස්ථාව ලැබුණා

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ



පසුගිය වසරේ අවුරුදු උදාව සමයේ රටේ පැවැති අයහපත් සෞඛ්‍ය පසුබිම ඊට බාධා කළ ද, පුරාණ චාරිත්‍ර වාරිත්‍රවලට මුල්තැන දෙමින් සෞඛ්‍ය උපදෙස්වලට ද අනුගතව අලුත් අවුරුදු ප්‍රීතිය භුක්ති විඳීමට පසුබිම මේ වසරේ අප සියලු දෙනා එක්ව සකසා ගෙන තිබෙන බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අලුත් අවුරුද්ද වෙනුවෙන් සුබ පැතුම් එක් කරමින් කියා සිටී.

පිට 08

## සියලු දෙනාගේ අනාගතය සෞභාග්‍යවත් කිරීමේ වෑයමක රජය නිරතව සිටිනවා

අගමැති



ජනතාව මත පැටවෙන පීඩා ආණ්ඩුව මත තබා ගනිමින්, රජය සියලු ජනතාවගේ අනාගතය සෞභාග්‍යවත් කිරීමේ වෑයමක නිරතව සිටින බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා අලුත් අවුරුද්ද වෙනුවෙන් පණිවිඩයක් නිකුත් කරමින් පවසයි.

පිට 08

## සංස්කෘතිකමය උත්සව ලෝකයට ආශීර්වාදයක්



විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස

සොබාදහම සමඟවන ජීවිතයේ වටිනාකම ඉස්මතු කරන අලුත් අවුරුද්ද වැනි සංස්කෘතිකමය උත්සව අවශ්‍යයෙන්ම සමාජයටත් ලෝකයටත් ආශීර්වාදයක් බව විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා අලුත් අවුරුදු පණිවිඩයක් නිකුත් කරමින් කියා සිටී. එම අලුත් අවුරුදු පණිවිඩයේ මෙසේද සඳහන්වේ: චිරාත් කාලයක් මුළුල්ලේ පැවතගෙන එන සංස්කෘතිකමය හරය විදහා දක්වන මුදුන්මල්කඩක් ලෙස අලුත් අවුරුද්ද හඳුන්වා දිය හැකිය.

පිට 08




පිට 8

## උම්බලකඩ ව්‍යාපාරයට මුවා වී හෙරොයින් ජාවාරම් කළ කෝටිපතියා සහ ගෝලයා දැලේ

පිට 8

## පුනරුත්ථාපන කාර්යාංශයක් පිහිටුවීමට රජය සැරසෙයි

## 'දිනමිණ' පුවත පල දරයි:

# ලංගම විශ්‍රාමිකයන්ට ජය හිමි වෙයි කාටත් මුදල් ගෙවීම ස්ථිරයි

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සමාගමක් බවට පත් කිරීමේදී ඒ ඒ ඩිපෝවල වත්කම් හා සේවා කාලය ගණනය කර සේවකයන්ට රු.10 බැගින් වූ කොටස් නිකුත් කරන ලදී.

එහෙත් එම කොටස් සහතිකවලට අදාළ මුදල් සේවකයන් විශ්‍රාම යැමේදී ගෙවිය යුතු වුවත් එසේ සිදු නොවිණි.

මේ කොටස් මුදල් ලබාගැනීමට අප ලංගම විශ්‍රාමිකයන්ගේ සුභසාධන සංගමය කලක සිටම උත්සාහ දැරූ අතර වාර ගණනාවකදීම අදාළ මැති ඇමැතිවරුන්, ජනාධිපති ලේකම් හා අගමැති ලේකම්ද හමු වී සාකච්ඡා කළෙමු.

කෙසේ වෙතත් පසුගිය රජයන් කීපයක් යටතේම ලබාගැනීමට නොහැකි වූ මේ මුදල් 2021 අයවැය යටතේම ගෙවීමට සූදානම් බව ප්‍රවාහන රාජ්‍ය ඇමැති දිලුම් අමුණුගම මහතා හා ලංගම ප්‍රධාන ගණකාධිකාරිගෙන්ද දැන ගතිමු.

තවද මේ මුදල් ඉතා කඩිනමින් ගෙවන බව දන්වා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් පී.ඒ.එස්. අතුල කුමාර මහතාගේ අංක PED/S/SLTS/1/6(1) හා 2021.03.24 දින දරන ලිපිය මගින්ද අප සංගමය වෙත දැනුම් දී ඇත.

අප සංගමය විසින් දීර්ඝ කාලයක සිට දැරූ උත්සාහය පල ගැන්වී ඇති මේ අවස්ථාවේ මේ සම්බන්ධයෙන් මුල් කාලයේ සිටම අප වෙත සහාය දැක්වූ මැති ඇමැතිවරුන් සියලු නිලධාරීන්, ලංගම ඇතුළු සියලු ආයතන වෙත අපගේ කෘතඥතාව පළ කර සිටිමු.

**මහනුවර ලංගම විශ්‍රාමිකයන්ගේ සුභසාධක සංගමය**


වෙළඳ අමාත්‍යාංශය

# සතොස සහන

| | | |
|---|---|---|
| රතු කැකුළු සහල් | 1kg | 89/- |
| සුදු කැකුළු සහල් | 1kg | 93/- |
| නාඩු සහල් | 1kg | 96/- |
| සුදු සීනි | 1kg | 99/- |
| දුඹුරු සීනි | 1kg | 115/- |
| රතු පරිප්පු | 1kg | 165/- |
| ලොකු ළූණු ( පකිස්ථාන් ) | 1kg | 70/- |
| ලොකු ළූණු ( ඉන්දියන් ) | 1kg | 95/- |
| හාල්මැස්සන් ( තායි ) | 500g | 288/- |
| ගම්මිරිස් | 100 g | 160/- |

සතොස

ජාතියේ මිල තීරක


# අඩු ආදායම්ලාභීන්ට 5,000 දීමනාව පිරිනැමීම ඇරඹේ



සමෘද්ධිලාභීන් සහ අඩු ආදායම්ලාභීන් ඇතුළු තෝරා ගත් පිරිසකට රුපියල් 5000 අවුරුදු දීමනාවක් පිරිනැමීම රජය පසුගියදා තීරණය කළේය. ඒ අනුව දිවයිනේ විවිධ ප්‍රදේශවල ඊයේ (12) එම දීමනාව ගෙවීමේ කටයුතු ආරම්භ කර තිබු අයුරුයි මේ.

**ඡායාරූප-සුදත් මලවීර, අයි.එම්. වී.සී. ගුණසේකර (ඇල්පිටිය සමූහ), ආරියරත්න ගනේගොඩ (මැද කොළඹ සමූහ) අමිල ප්‍රභාත් වනසිංහ**















# ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට පරිසර හිතකාමී රථගාල කාගිල්ස් වෙතින්

සමාජ වගකීමක් සහිත ආයතනයක් ලෙසින් කාගිල්ස් සැමවිටම ශ්‍රී ලාංකීය ජනතාවට සේවය සැලසීම සහ මිහිතලය අනාගත පරපුර උදෙසා රැකගැනීම වෙනුවෙන් කැපවී සිටී. දිවයිනේ ප්‍රමුඛතම නවෝත්පාදන විසඳුම් සපයන්නකු වන AGC Innovative පෞද්ගලික සමාගම හා එක්ව "Paving with Plastic" යන සංකල්පය සහ ව්‍යාපෘතිය එළිදක්වනු ලැබුවේ ශ්‍රී ලංකාවේ ප්ලාස්ටික් අපද්‍රව්‍ය ගැටලුවට පරිසර හිතකාමී සහ වඩා ඵලදායී විසඳුමක් ලබාදෙන අදහසිනි.

ප්ලාස්ටික්වලින් අප ලබා ගන්නා ප්‍රයෝජන අතිමහත්ය. එසේම අපගේ එදිනෙදා ජීවිතයේදී එය මුළුමනින්ම ප්‍රතික්ෂේප කළ නොහැකි අමුද්‍රව්‍යයක් බවට පත්ව ඇත්තේ අඩු මිල, නිෂ්පාදනයේ පහසුව, කල්පැවැත්ම සහ භාවිතයට පහසුව වැනි කරුණු නිසාය. කෙසේ වෙතත් පාවිච්චියෙන් පසු ඉවත දැමූ පසු ප්ලාස්ටික් දීර්ඝ කාලයක් නොදිරා පවතී.

එහි ප්‍රතිඵලයක් ලෙස ප්ලාස්ටික් නිසා සිදුවන පරිසර දූෂණය ගෝලීය අර්බුදයක් වී ඇත. ශ්‍රී ලංකාව තුළ දිනපතා එකතුවන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 7000 න් 6% ක්ම ප්ලාස්ටික් සහ පොලිතීන් අපද්‍රව්‍ය වේ. ඒ අනුව විධිමත් අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියකින් තොර ප්‍රතිචක්‍රීය කළ නොහැකි ප්ලාස්ටික් විශාල ප්‍රමාණයක් ගොඩ කළ බිම්වල දමා තිබේ. මෙම බිම්වල ඇති ඉඩකඩ මේ වනවිට සීමිත වෙමින් පවතින අතර, රටේ පාරිසරික සහ සමාජ ගැටලු රාශියක් මේ නිසා ඇති වෙමින් පවතී.

මෙම ප්ලාස්ටික් අපද්‍රව්‍ය ගැටලුව විසඳීමේ පුරෝගාමී පියවරක් ලෙස, කාගිල්ස් ආයතනය AGC Innovative සමග එක්ව, නවීකරණය කරන ලද ප්ලාස්ටික් ඇස්ෆල්ට් තාර භාවිතයෙන් කාගිල්ස් ෆුඩ්සිටි රථගාල සකස් කිරීමේ සුවිශේෂී වැදගත් තීරණය ගනු ලැබීය. PMAC හරිත තාක්ෂණය උපයෝගී කර ගනිමින් ප්ලාස්ටික් අපද්‍රව්‍ය භාවිත




කර පොලිමර් මට්ටමින් සාම්ප්‍රදායික තාර තාක්ෂණිකව වැඩිදියුණු කර භාවිත කිරීම තිරසාර විසඳුමකි. සාම්ප්‍රදායික බ්ලැක්ටොප් ඇස්ෆල්ට් තාර කොන්ක්‍රීට් හා සසඳන විට PMAC භාවිත කර සාදන මාර්ග ශක්තිමත් භාවයෙන් සහ කල්පැවැත්ම අතින් ඉහළ බව ක්ෂේත්‍ර සහ රසායනික පර්යේෂණවලින් හෙළි වී තිබේ. අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ සිට PMAC සැකසීම දක්වා වන මෙම ක්‍රියාවලිය තාක්ෂණික ජයග්‍රහණයක් මෙන්ම ප්ලාස්ටික් නිසා සිදුවන ශ්‍රී ලංකාවේ පාරිසරික දූෂණයටද ඉතා යහපත් සහ සාධනීය විසඳුමකි.

මෙම රථවාහන අංගනය පවතින්නේ වල්ගම කාගිල්ස් ෆුඩ්සිටි ශාඛාවේය. අප්‍රේල් 1 වනදා සිදු කළ අවසන් PMAC ඇතුරුම සමග "Paving with Plastic" සංකල්පයේ පළමු ව්‍යාපෘතිය ලෙසින් ඉවත දැමූ ප්ලාස්ටික් බෑග් 200,000 ක් පමණ භාවිතා කොට මෙය ඉදිකරන ලදී. ඒ අනුව මෙම කාගිල්ස් ෆුඩ්සිටි රථගාල නුදුරු අනාගතයේදී නිල වශයෙන් විවෘත කරනු ඇත.

# "හයිලන්ඩ්" සන්නාම ප්‍රවර්ධකයින් පත් කිරීම



ඩබ්ලිව්. ඩබ්ලිව්. නිමේෂා එල්. කුමාරි ශිෂ්‍යාව 2019 වසරේ දී තුර්කියේ පැවති රටවල් 137ක් නියෝජනය කරන ලද යොවුන් ලෝක ශූරතා තායි බොක්සිං තරගාවලියේ දී (මුයිතායි බොක්සිං) රන් පදක්කම ලබාගෙන ඇති අතර, 2018, 2019 සහ 2020 වසරවල දී පැවති ජාතික තායි බොක්සිං තරගාවලීන්වල දී රන් පදක්කම් ලබා ගත් දක්ෂ ක්‍රීඩිකාවකි.

මිල්කෝ ආයතනයේ සභාපති ලසන්ත වික්‍රමසිංහ මහතාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක වන "කැකුළු විකසිත කරමු" දේශයේ දිරිය දරුවන් ඇගයීමේ වැඩසටහන යටතේ ශ්‍රී ලංකාව නියෝජනය කරමින් යොවුන් ලෝක ශූරතා මුයිතායි බොක්සිං තරගාවලීන්හි දී ශ්‍රී ලංකාවට විශිෂ්ට ජයග්‍රහණ අත්කර දුන් හඟුරන්කෙත පල්ලේබෝවල ද්විතීක විද්‍යාලයේ ඉගෙනුම ලබන කසුන් කේ. ගුණවර්ධන ශිෂ්‍යයා සහ ඩබ්ලිව්.ඩබ්ලිව්. නිමේෂා එල්. කුමාරි ශිෂ්‍යාව වෙනුවෙන් උපහාර පිදීමේ හා ඔවුන්ගේ ඉදිරි ක්‍රීඩා කටයුතු වෙනුවෙන් වසරක කාලයක් සඳහා ශිෂ්‍යත්වාධාර පිරිනැමීමේ උත්සවයක් 2021 අප්‍රේල් මස 02 වන දින කොළඹ පදනම් ආයතනයේදී පැවැත්වූ අතර, එහිදී මෙම සිසුන් දෙදෙනා "හයිලන්ඩ්" සන්නාම ප්‍රවර්ධකයින් ලෙස පත් කිරීම ද සිදු විය.

කසුන් කේ. ගුණවර්ධන ශිෂ්‍යයා, 2018 වසරේදී තායිලන්තයේදී පැවති රටවල් 87ක් නියෝජනය කරන ලද යොවුන් ලෝක ශූරතා තායි බොක්සිං තරගාවලියේ දී කිලෝග්‍රෑම් 36-38 බර පන්තිය අංශයෙන් (මුයිතායි බොක්සිං) රිදී පදක්කමත්, එම වසරේදීම ජාතික තායි බොක්සිං තරගාවලියේ රන් පදක්කමත් හිමිකර ගැනීමෙන් දස්කම් දක්වා ඇත.

දේශීය කිරි ගොවියාගෙන් එකතු කර ගන්නා නැවුම් කිරිවලින් පමණක් නිෂ්පාදිත කිරි නිෂ්පාදන වෙළඳපොළට ඉදිරිපත් කර බහුජාතික සමාගම් හා කරට කර සටන් කරමින් දේශීය වෙළඳපොළ ජයගත් මිල්කෝ සමාගම බොහෝ දුෂ්කරතා හා බාධක මධ්‍යයේ ජාත්‍යන්තරය ජයගන්නා මෙවන් දිරිය දරුවන් දිරිමත් කිරීමට ඉදිරිපත් වීම පැසසුම් කටයුතු කාර්යයකි.

දේශීය කිරි ගොවියාගේ ආර්ථිකය නගාසිටුවීමත්, දේශීය ජනතාව වෙත නැවුම් සහ සෞඛ්‍ය සම්පන්න කිරි නිෂ්පාදන ලබා දීමත් මුඛ්‍ය පරමාර්ථය කර ගත් මිල්කෝ සමාගම, දේශීය කිරි ගොවියාගේ සුබසාධනය සඳහා ද අතිමහත් කර්තව්‍යයක් සිදු කරයි. කිරි ගොවි සමාජ ආරක්ෂණ අරමුදල හා කිරිගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය දැනට මෙම ආයතනය මගින් කිරි ගොවීන් වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන සුබසාධන කටයුතු අතරින් ප්‍රධාන තැනක් ගනී.

බන්දුල ඇමැතිගේ දාහේ බඩු මල්ලේ
නොසොයා අඩුපාඩු පිළිගෙන සැනසිල්ලේ
කොස් කොළ මාල නොදමා ඔහුගේ බෙල්ලේ
ආසිරි පතමු! මේ අවුරුදු මංගල්ලේ

කොරෝනාවලින් බැටකන ලොවක ඉඳ
හැකි ලෙස දෙන සහන ගෙන කම්කටොලු මැද
සමඟිව සියලු දෙන අවුරුදු සුවය විඳ
තුන් සිංහලය සැරදේවා! පතමු අද

රටේමුල්ලේ මුදන්නායක

අවුරුදු සමරන්න හිතා හිතු හැටියට රිස්සේ
පොර කනවා දුටිමි සෙනඟ රෙදි කඩවල් අස්සේ
නොපෙනෙන වයිරස් හතුරා නෑ තව පසුබැස්සේ
මතු නොවුණොත් මදැයි පොකුරු අවුරුද්දෙන් පස්සේ



# සවස් කාලයේ ගිගුරුම් සහිතව වැසි ඉදිරි දිනවලත්

**උපාලි කරුණාරත්න**

ඉදිරි දිනවලදී දිවයිනේ බොහෝ ප්‍රදේශවලට සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේ වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවීමේ වැඩි හැකියාවක් පවතින බව කාර්ය නියුතු කාලගුණ විද්‍යාඥ කසුන් පැස්කුවල් මහතා පැවසීය.

මේ වැසිත් සමග ඇති විය හැකි අකුණු මගින් සිදු වන අනතුරුවලින් ආරක්ෂා වීමට පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාර්ය නියුතු කාලගුණ විද්‍යාඥවරයා ඉල්ලා සිටී.




# යාපනය රෝහල් පාරේ ලැගුම් හලක නීති විරෝධි මත්පැන් ස්කාගාරයක්

**රක්ෂණ ශ්‍රියන්ත**

යාපනය රෝහල් පාරේ ලැගුම් හලක නීති විරෝධි ලෙස පවත්වාගෙන ගිය මත්පැන් ස්කාගාරයක් වටලා නීති විරෝධී මත්පැන් ලීටර් 5000කට අධික ප්‍රමාණයක් සමග සැකකරුවෙකු පෙරේදා (11) යාපනය කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකය මගින් අත්අඩංගුවට ගෙන තිබේ.

මේ ස්කාගාරයේ නිෂ්පාදනය කරන නීති විරෝධි මත්පැන් බෝතල්වලට පුරවා රජයේ අනුමත අරක්කු ලෙස අඟවමින් ව්‍යාජ ලේබල් සහ මූඩි යොදා වෙළෙඳ පොළට කලක් තිස්සේ නිකුත් කර ඇති බවට පොලිස් පරීක්ෂණවලදී අනාවරණය වී තිබේ.

මේ ස්ථානයේ තිබී මිලි ලීටර් 750 මත්පැන් බෝතල් 42ක්, මිලි ලීටර් 180 මත්පැන් බෝතල් 262ක්, නීති විරෝධි මත්පැන් ලීටර් 3000ක්, ව්‍යාජ ලේබල් තොගයක් සහ පෙරීමේ උපකරණ පොලිස් භාරයට ගෙන තිබේ. අත්අඩංගුවට ගත් සැකකරු 48 හැවිරිදි මල්ලාකම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

සිද්ධිය සම්බන්ධයෙන් යාපනය කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකය වැඩිදුර විමර්ශන සිදුකරයි.

# අවුරුදු නිවාඩුවෙන් පසු වැඩට එන්න 15 දා සිට අමතර බස් 3,000ක්

## ප්‍රවාහන රාජ්‍ය ඇමැති

**අසේල කුරුළුවංශ**

අලුත් අවුරුදු නිවාඩුවට නිවෙස්වලට පැමිණ යළි සේවා ආයතනවලට යන ජනතාවට කිසිදු බාධාවකින් තොරව ගමන් ගැනීම සඳහා 15 දා සිට අමතර බස් රථ 3000ක් ධාවනයේ යොදවන බව ප්‍රවාහන රාජ්‍ය අමාත්‍ය දිලුම් අමුණුගම මහතා පවසයි.

නගරයේ සිට අලුත් අවුරුද්ද වෙනුවෙන් ගමට ගිය ජනතාවට අපහසුවකින් තොරව ගමන් ගැනීමට විධිමත් හා සැලසුම් සහගත බස් සේවාවක් සැලසු ආකාරයෙන්ම ගමේ සිට නගරයට එන ජනතාවට වෙනුවෙන්ද එම සේවය ඒ ආකාරයෙන්ම සලසා බවද ඒ මහතා කීය.

මහනුවර දුම්රිය ස්ථානයේ නිරීක්ෂණ චාරිකාවට එක් වෙමින් ඇමැතිවරයා මේ බව ප්‍රකාශ කළේය.

සාමාන්‍යයෙන් අවුරුදු සමයේදී ලංගම බස් 500ක් හා පෞද්ගලික බස් 500ක් අමතරව ධාවනයේ යෙදවූවත් මෙවර බස් රථ 3000ක් ධාවනයේ යෙදවූ බවත් සෞඛ්‍ය නිර්දේශ අනුව ජනතාවට අපහසුවකින් තොරව ගමන් කිරීමට මේ තීරණය ගත් බවත් හෙතෙම කීය.




# සිලි සිලි බෑග් සහ ලන්ච් ෂීට් භාවිතය අවම කිරීමට දැඩි නීති ගේන්න සිදුවේවි

## පරිසර ඇමැති අනතුරු අඟවයි

**බුද්ධිකා ඉමුලාන**

මෙරට ජනතාව බහුලව භාවිතා කරන ලන්ච් ෂීට් (LUNCH SHEET) සහ ෂොපින් බෑග්(සිලි සිලි බෑග්) සම්බන්ධව දැඩි නීති ගෙන ඒමට පරිසර ඇමැති මහින්ද අමරවීර මහතාගේ අවධානය යොමු වී ඇත.

අපේ රටේ සුපිරි වෙළෙඳසල් ජාලයෙන් පමණක් ෂොපින් බෑග් (සිලි සිලි බෑග් )බිලියනයක් ( කෝටි 100ක්) වාර්ෂිකව බෙදා හරින බවත් වසරකට සිලි සිලි බෑග් කෝටි 100ක් යනු සුළුපටු ප්‍රමාණයක් නොවන නිසා මෙයින් පරිසරයට සිදු වන හානි අවම කිරීමට කිසියම් පියවරක් ගැනීමට සිදු වන බවත් ඇමැතිවරයා පවසයි.

ඒ අනුව දැනට සුපිරි වෙළෙඳසල්වලින් සහ කඩ සාප්පුවලින් ජනතාවට භාණ්ඩ දමා නොමිලේම ලබා දෙන සිලි කවර සඳහා රුපියලක් හෝ යම් මුදලක් අය කර ගැනීමටත් තම අමාත්‍යාංශයේ අවධානය යොමු වී තිබෙන බවද ඇමැතිවරයා කියයි. මේ පිළිබඳ අවසන් තීරණයකට එළඹී නැති බව පවසන ඇමැතිවරයා පෙන්වා දෙන්නේ එසේ යම් මුදලක් මේ බෑග් සඳහා අය කරන්නේ නම් ඒ මුදල පරිසර සංරක්ෂණ අරමුදලකට බැර කිරීමට සුපිරි වෙළෙඳසල් ජාලයේ ඉහළ කළමනාකාරිත්වයන් සමඟ තමන් කළ සාකච්ඡාවකදී එකඟතාව පළ කළ බවයි.

පසුගිය දිනෙක අපේ රටේ සුපිරි වෙළෙඳසල් ජාලයේ ඉහළ කළමනාකාරිත්වය සමඟද මේ සාකච්ඡාවක් කළා. ඒ අය මේ සිලි බෑග් සඳහා අඩු තරමින් එක් බෑගයකට රුපියලක්වත් අය කරන්න ඉඩ දෙන්න කියන ඉල්ලීම කළා . දැන් මේ බෑග් දෙන්නේ නොමිලේ. ඒ නිසා එක් පාරිභෝගිකයෙක් වරකට බෑග් හතක් අටක්වත් භාවිතා කරනවා. එම බෑග් සඳහා අය කරන මුදල පරිසර සංරක්ෂණ අරමුදලකට ලබා දෙන්නත් ඒ අය එකඟතාව පළ කළා. නමුත් මේ සම්බන්ධව අපි අවසන් තීරණයක් අරගෙන නැහැ. ඒ වුණත් ඉක්මනින්ම තීරණයකට එන්න අවශයයි.

දැවැන්ත පරිසර හානියක් මෙමගින් සිදුවෙනවා.ඒ වගේම තමයි ලන්ච් සීට්. ලෝකයේ ලන්ච්ෂීට් භාවිතා කරන එකම රට ශ්‍රී ලංකාවයි. දිනකට ලන්ච් ෂීට් මිලියන 10ක් අපේ රටේ භාවිතා වෙනවා. ඒ නිසා ඉදිරි කාලයේ මේ සිලි සිලි බෑග් හා ලන්ච් ෂීට් භාවිතය අවම කිරීමට දැඩි නීති රීති ගෙන එන්න සිදුවේවි. අපේ රටේ ජනතාව තවමත් පරිසර හානිය සම්බන්ධව නිසි ලෙස දැනුම්වත් වී නැතැයිද ඇමැතිවරයා කීය.

# අලුත් අවුරුද්දට රැඳවුවන් බැලීමට එන අමුත්තන් ගණන සීමා කෙරේ

**බුද්ධිකා ඉමුලාන**

අලුත් අවුරුද්දට රැඳවුවන් බැලීමට පැමිණෙන අමුත්තන් ගණන සීමා කිරීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුව තීරණය කර තිබේ.

බන්ධනාගාර කොමසාරිස් (පාලන හා පුනරුත්ථාපන) බන්ධනාගාර මාධ්‍ය ප්‍රකාශක චන්දන ඒකනායක මහතා පැවැසුවේ මෙයට පෙර අවුරුදු අවස්ථාවන්දී පවුලේ සාමාජිකයන් කීපදෙනකුට රැඳවූවකු හමුවීමට අවස්ථාව උදා වුවද කොවිඩ් වසංගත තත්ත්ව මර්දන කටයුතු හමුවේ, මෙවර අමුත්තන් දෙදෙනකුට පමණක් රැඳවූවකු හමු වීමට අවස්ථාව හිමිවන බවයි.

එයද සිරකරුවකුට මාසයකට වරක් අමුත්තන් දෙදෙනකු හමු වීමට හිමි වන අවස්ථාව අනුව ලබා දෙන්නක් බවද ඒ අනුව අද -හෙට (13 - 14) බන්ධනාගාර රැඳවූවන්ට තම ඥාතින් හමුවීමට හැකි බවද ඒකනායක මහතා පවසයි

දැඩි සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් බන්ධනාගාර නිතීරිතීවලට අනුකූලව එම ඥාතීන්ට සිරකරුවන් හා සැකකරුවන් බැලීමට අවස්ථාව සලසා දුන්නද නිවෙසින් රැගෙන එනු ලබන කිසිදු ආහාරයක් ඔවුන්ට දීමට අවස්ථාව නොලැබෙන බව ද ඒකනායක මහතා කියයි.






Maliban

රස උතුරන මැලිබන් සමඟ මේ අලුත් අවුරුද්ද රසවත්ව සමරමු.

යහගුණයෙන් තව තවත් ඉදිරියට...

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2021 අප්‍රේල් 13 අඟහරුවාදා

# සැමට සුබ නව වසරක්!

සෑම ජීවිතයකටම නැවුම් බලාපොරොත්තු, අලුත් සැලැසුම් හා විවිධ ප්‍රාර්ථනා තිබේ. පොදු අර්ථයකින් ගත් කල ඒවා අනාගතය ලෙස හැඳින්විය හැකිය. අදට වඩා හොඳ හෙටක් ගැන බොහෝ දෙනා කතා කරති. එහෙත් හොඳ හෙටක් ඉබේ පහළ වන්නේ නැත. සාර්ථක අනාගතයක් ආකස්මිකව ලැබෙන්නේ නැත. කැපවීම, වැඩ කිරීම පමණක් නොව හෙට දවස උදෙසා සිහින දැකීම ද අවශ්‍ය බව දැන් පිළිගනු ලැබේ. ධනාත්මක චින්තනයට අනුව ගත හොත් අනාගතය පිළිබඳ සිහින දැකීම ජයග්‍රහණයට ලැබෙන උත්තේජනයකි. ලොව දිනූ මිනිසුන් දෙස ආපසු හැරී බලන විට පෙනී යන්නේ ජයග්‍රහණ පිළිබඳ සිහින සිය-දහස් වාරයක් ඔවුන් දැක ඇති බවය. සැකයකින් තොරව අනාගතය පිළිබඳ සිහින දැකීමේ අයිතිය හා අවකාශය ඔබට තිබේ.

හෙට පූර්ව භාග 2.33ට අලුත් අවුරුද්ද උදා වේ. අලුත් අවුරුදු උදාව යන්න තවත් දවසකට සීමා කිරීම වැරැද්දකි. එය ජීවිතයේ සන්ධිස්ථානයක් ලෙසද, කේන්ද්‍රීය අවස්ථාවක් ලෙස ද ගැනීම ඉතා නිවැරැදිය. බැලූ බැල්මට නම්; අලුත් අවුරුද්ද යනු සංස්කෘතික උළෙලකි. එහෙත් එහි යටිපෙළ ඊට වඩා ගැඹුරුය. අලුත් අවුරුද්ද ජීවිතයේ හැරවුම් ලක්ෂයකට ආරාධනා කරයි. මෙහි එන චාරිත්‍ර හා වාරිත්‍ර මඟින් බරසාර අවස්ථා හතරක් අපට ලබා දෙයි. එක; සමාජානුයෝජනය, දෙක; පවුලේ සමගිය, තුන; කාර්යක්ෂමතාව, හතර අනාගතය සැලැසුම් කිරීම යනුවෙන් එය විවරණය කළ හැකිය. මේවා නැති තැන සාර්ථක ජීවිතයක් නැත. පොහොසත් සමාජයක් නැත. දියුණු ජාතියක් නැත. සංවර්ධිත රටක් නැත.

සමාජානුයෝජනය යනු කුමක්ද? සමාජය සමඟ හොඳින් ගනුදෙනු කිරීම එහි සරල අර්ථයයි. සාමූහිකව ගැටලුවලට මුහුණදීම යන්න ද සමාජානුයෝජනය යන්නෙන් අදහස් කෙරේ. අධ්‍යාපනයෙහි එක් අර්ථයක් ලෙස ද එය පවතී. අලුත් අවුරුද්ද යනු සමාජානුයෝජනයට ලැබෙන අවස්ථාවකි. ගෙදරකින්-ගෙදරකට, පවුලකින් - පවුලකට, ගමකින්-ගමකට යන ලෙසින් අලුත් අවුරුද්දේ කටයුතු විස්තාරණය වී ඇත. ක්‍රීඩාව, විනෝදය හා ආහාර බෙදීම ඔස්සේ එය තහවුරු වෙයි. අලුත් අවුරුද්දේදී තරහකාරයාට පවා බුලත් දී එකඟතා ඇති කර ගත යුතුය. මිනිසාට හුදෙකලාව ජීවත්විය නොහැකිය යන අගනා පාඩම අවුරුද්ද අපට උගන්වයි. එය රටක් හා ජාතියක් ගොඩනැඟීමේ පදනම ද වෙයි.

පවුලේ සමගිය හා සුරක්ෂිතතාව පෞද්ගලික කාරණයක් ලෙස කෙනකු දකින්නට පුළුවන. එහෙත් එය වැරැදිය. පවුල හෙවත් කුටුම්භය යනු රටක කුඩා ඒකකය වෙයි. රටක් යනු පවුල් සමූහයකි. පවුලක ඒකාග්‍රතාව බිඳී යෑම ජාතියක ඉදිරි ගමනට බලපායි. මේ වන විට රට තුළ ඇති පවුල් ආරවුල් ප්‍රමාණය ඉහළය. ශ්‍රී ලංකාව තුළ දික්කසාද සංඛ්‍යාව දිනෙන්-දින ඉහළ යන බවට වාර්තා පළ වී ඇත. දියුණු රටවල කුටුම්භ ආරවුල් වැළැක්වීම සඳහා විවිධ ආයතන ක්‍රියාත්මක වෙයි. ශ්‍රී ලංකාව තුළ ද දැන් ඒවා දැකගත හැකිය. රටක සංවර්ධනය සඳහා කුඩාම ස්ථානයෙන් වැඩසටහන් ආරම්භ කිරීම සුදුසු බව ආර්ථික විශේෂඥයන් පවා සඳහන් කර ඇත. අලුත් අවුරුද්දට අදාළ බොහෝ චාරිත්‍ර පවතින්නේ පවුලේ ඒකාග්‍රතාව හා සමගිය තහවුරු කිරීමටය.

කාර්යක්ෂමතාව දියුණුවට අදාළ තවත් වැදගත් කාරණයකි. දියුණු රටවල මිනිසුන්ගේ කාර්යක්ෂමතාව වැඩිය. සාඵල්‍යතාව වැඩිය. චීනය, දකුණු කොරියාව, ජපානය වැනි රටවල් දෙස බලන විට මේ තත්ත්වය හොඳින් වටහා ගත හැකිය. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් එල්ල වන ප්‍රධාන චෝදනාවක් වන්නේ කාර්යක්ෂමතාව හීනය යන්නය. මේ නිසා ඉලක්ක සපුරා ගත නොහැකිව ආයතන පාඩු ලබයි. නැතහොත් වසා දමයි. ශ්‍රී ලංකාවට පෞද්ගලිකරණය හඳුන්වා දෙන අවස්ථාවේ ඉදිරිපත් වූ ප්‍රධාන තර්කයක් වූයේ රාජ්‍ය අංශයට ලාභ ලැබිය නොහැකි බවය. මෙය ඇත්ත කතාවක් නොවේ. මැලේසියාව ඊට හොඳම නිදසුන වෙයි. දූෂණයෙන් හා අකාර්යක්ෂමතාවෙන් පිරී ගිය මැලේසියානු රාජ්‍ය සේවය මහතිර් මොහොමඩ් මහතා වෙනස් කළේය. අලුත් අවුරුද්ද සමාජයේ කාර්යක්ෂමතාව අවදි කරයි.

අලුත් අවුරුද්දේ බොහෝ කටයුතු සිදුවන්නේ නැකැතකට හෙවත් සුබ වෙලාවකට අනුවය. එහි යටි අර්ථය වන්නේ නිශ්චිත වේලාවක විශ්වාසයෙන් යුතුව වැඩක් ආරම්භ කිරීම සාර්ථකත්වයට හේතුවක් වන බවය. අනාගතය හොඳින් සැලැසුම් කිරීම එහි ඉලක්කයයි. අතීත ශ්‍රී ලාංකිකයා අලසව මුළුගැන් වී නැත. දේශීය වාපි කර්මාන්තය, වාරි කර්මාන්තය, ඉදිකිරීම් තාක්ෂණය පමණක් නොව අපේ පැරණි කලා ශිල්ප වුව ඊට සාක්ෂි ලෙස පවතී. අපේ පැරණි නැටුම් ශිල්පියා හිමිදිරි උදෑසන අවදි වී ආගමික චාරිත්‍ර ඉටු කොට දුෂ්කර පුහුණුවීම්වල නිරත විය. ඒ සඳහා ඔහුට මිලක් ලැබුණේ නැත. එහෙත් එය රාජකාරියකි. ශිල්පියා රාජකාරියට කැප වී සිටියේය.

සල්ලි ඇතොත් හැමදාම අවුරුදු යැයි ජනවහරේ එන කියමනක් තිබේ. එහෙත් එය සියයට-සියයක්ම නිවැරැදි නැත. සියල්ලම මුදලින් තක්සේරු කිරීමට යෑම නිසා අපට බොහෝ දේවල් මඟහැරී ඇත. ජාතියක් ඉදිරියට යන්නේ සාමූහික ප්‍රයත්නයක් මතය. එම ප්‍රයත්නයේදී එකිනෙක සමාජ කණ්ඩායම් වෙත පමණක් නොව; තනි පුද්ගලයකු වෙත ද පැවරෙන වගකීම් හා යුතුකම් කොටසක් තිබේ. එය ඉටු කළ යුතුය. එවිට එහි ප්‍රතිලාභය පුද්ගලයා වෙත ගලා එනු ඇත. අලුත් අවුරුද්ද පුද්ගලයා සතු වගකීම් හා යුතුකම් දෙස ආපසු හැරී බලන්නට උගන්වයි. එය සමාජ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් සේ හැඳින්විය හැකිය. අලුත් අවුරුද්දේ සියලු කාර්යයන් යොමු වී ඇත්තේ පුද්ගලයාගේ හා සමාජයේ සංවර්ධනය උදෙසාය. එය මහ ඉහළින් සැමරිය යුත්තේ ද ඒ නිසාය.

කොවිඩ් වසංගතය නිසා සමාජ-ආර්ථික කටයුතු බරපතළ පසුබෑමකට ලක් වී ඇති බව පිළිගත හැකි කාරණයකි. එය මුළු මහත් ලෝකයටම පොදු තත්ත්වයකි. ඒ අනුව වසංගතයට මුහුණ දෙමින් ජන ජීවිතය පවත්වා ගැනීමට අපට සිදුවී ඇත. ඉන්දියාව, බ්‍රසීලය, අමෙරිකාව වැනි රටවල් කොවිඩ් වසංගතයෙන් බරපතළ පීඩාවකට ලක් වී ඇත. ශ්‍රී ලංකාව කොවිඩ් මර්දනය අතින් සාර්ථක ප්‍රතිඵල ලබා ඇත. මෙවර අලුත් අවුරුද්ද යම් ඉස්පාසුවකින් යුතුව සැමරීමේ අවස්ථාව උදා වී තිබේ. කොවිඩ් මර්දනයට සහයෝගය ලබාදෙමින් අවුරුදු ප්‍රීතිය භුක්ති විඳීම ඉතා වැදගත්ය. සියලු ශ්‍රී ලාංකිකයන්ට සුබ නව වසරක් ප්‍රාර්ථනා කරමු.

**දිල්රුගෙ සීවිද**

| | |
|---|---|
| වසක් විසක් නැති අහරින් මුළුතැන්ගෙය සරු | වේවා |
| දොසක් බසක් අසන යමක් කිසිවකුගෙන් නොම | වේවා |
| අගක් හිගක් නැති දිවියක් කොයි කාටත් හිමි | වේවා |
| අදත් හෙටත් පමණක් නොව අවුරුද්දම සරු | වේවා |

# වායුගෝලයට ඔක්සිජන් එන්නේ ගස්වලින් පමණක් ද?



ආචාර්ය සුරතිස්ස දිසානායක
පරිසර විද්‍යා හා සත්ත්ව විද්‍යා අධ්‍යයන අංශය
කොළඹ විශ්වවිද්‍යාලය



මිනිසා ඇතුළු සත්ත්ව ප්‍රජාවට ජීවත්වීම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන්නේ ඔක්සිජන් වායුවය. වායුගෝලයට ඔක්සිජන් වායුව එකතු වනුයේ ශාක, ඇල්ගී හා ශාක ප්ලවාංග මඟිනි. එනම්, පෘථිවිය මත පිහිටා ඇති ශාක වැස්ම මෙන්ම සාගර පරිසර පද්ධතිවල ඇති ඇල්ගී හා ශාක ප්ලවාංග මේ සඳහා විශාල ලෙස උපකාරි වේ. මේ වන විට මානවයාගේ විවිධාකාර ක්‍රියාකාරකම් මඟින් පෘථිවි පෘෂ්ඨයේ මෙන්ම ජලජ පරිසරවල ප්‍රභාසංස්ලේෂක ජීවීන් ශීඝ්‍රයෙන් අඩු වෙමින් පවතී.

පෘථිවියේ සම්භවය ඇති වන්නේ අදින් වසර මිලියන 4600කට පමණ පෙරය. සූර්යග්‍රහ මණ්ඩලයේ විසල් පිපිරීමකින් කැඩුණු කැබැල්ලකින් කැඩී විත් පෘථිවිය ඇති වන්නට ඇතැයි තවමත් පිළිගැනේ. එම කාල වකවානු ගණනය කිරීම කරනු ලබන්නේ පොසිල ගත වී ඇති පාෂාණ කැබලි ආධාරයෙනි. මුල් අවධියේදී පෘථිවිය අධික උෂ්ණත්වයක් සහ නිර්ඔක්සිහාරක එකක් විය. නිර්ඔක්සිහාරක යනු ඔක්සිජන් රහිත වායුගෝලයකි. මෙහි නිදහස් ඔක්සිජන් දක්නට ලැබුණේ නැත. ඔක්සිජන් පරමාණු වෙනත් සංයෝග සමග සම්බන්ධ වී එනම් සල්ෆර් ඩයොක්සයිඩ්, කාබන් ඩයොක්සයිඩ්, ජල වාෂ්ප, නයිට්‍රජන් ඩයොක්සයිඩ් වායු ගෝලය තුළ දක්නට ලැබිණි. වායුගෝලයේ තිබුණු අධික උෂ්ණත්වය හේතුවෙන් කිසිම ජීවියකුට ජීවත්වීමේ හැකියාව ඒ වන විට නොතිබිණි.

එහෙත් ජල වාෂ්ප ඝනීභවනය වී වර්ෂාව ඇති වුව ද වර්ෂාව පෘථිවියට ළඟා වීමට පෙර පෘථිවියේ අධික උෂ්ණත්වය හේතුවෙන් වාෂ්පවීම සිදු විණි. මේ ආකාරයට පෘථිවි වායු ගෝලයේ තිබූ ජල වාෂ්ප ක්‍රමයෙන් ඝනීභවනය වී වසර මිලියනයක් පමණ ගත වූ පසු පෘථිවියට වර්ෂා ජලය වැටෙන්නට පටන් ගෙන තිබේ. පෘථිවිය මත සාගර නිර්මාණය වන්නේ ඉන් පසුවය. ප්‍රථම ජීවය ඇතිවන්නේ සාගර නිර්මාණය වීමෙනි. මෙම ජීවය නිර්වායු විෂම පෝෂී ජීවයක් වේ. බැක්ටීරියාවන්ට සමාන සෛල දර්ශකයක් මෙහි අන්තර්ගතය. ඔක්සිජන් නොමැති හෙයින් ස්වායු ශ්වසනය සිදු කළ නොහැකිය. මෙම ජීවය ඇති වී වසර බිලියනයක් පමණ ගත වූ පසු පෘථිවිය මත ඇති සාගරවල ස්වායු තත්ත්වයට ළඟා විය හැකි ජීවීන් ගන්නට පටන් ගෙන තිබේ. මෙම ජීවීන් ප්‍රභාස්වයංපෝෂීන් ලෙස හඳුන්වනු ලැබීය. එනම් තමන්ට අවැසි ආහාර තමන් විසින්ම නිපදවා ගනු ලබන ඒක සෛලික ජීවීන්ය.

## යකඩ ඔක්සයිඩ

මෙම ජීවීහු ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය මඟින් මුල් වරට වායුගෝලයට ඔක්සිජන් නිදහස් කළහ. එහෙත් මෙම ඔක්සිජන් වායුගෝලයට පැමිණීමට පෙර මුලින්ම පෘථිවි තලයේ ඇති විවිධ පරමාණු, විශේෂයෙන් යකඩ සමග ප්‍රතික්‍රියා කොට යකඩ ඔක්සයිඩ බවට පත් වී තිබේ.

පෘථිවි කබොල්ල තුළ ඇති ඔක්සිජන් වායු ගෝලයට එකතු වන්නේ පෘථිවි තලයේ ඇති සියලුම මූලද්‍රව්‍යයන් ඔක්සිජන් සමග සංතෘප්ත වූ පසුවය. මෙම ඔක්සිජන් අද තිබෙන ප්‍රමාණයට වායු ගෝලය තුළ දක්නට ලැබෙනුයේ අදින් වසර මිලියන සියයකට පමණ පෙර සිටය. ඉන්පසු පෘථිවි කබොල්ල මත ගොඩබිම් පරිසර පද්ධති නිර්මාණය වී ශාක සහ සත්ත්ව ව්‍යාප්තිය ඉතා යහපත් අන්දමින් පැවතෙන්නට විය. උරගයන් සහ ඩයිනෝසරයන් විශාල වශයෙන් පෘථිවිය මත ව්‍යාප්ත වන්නට විය. මෙම ජීවීන් ස්වායු ජීවීන් වේ. මිනිසාගේ සම්භවය ඇරැඹෙනුයේ පෘථිවිය මත අනෙක් සතුන්ගේ සම්භවය ඇරැඹී දිගු කාලයකට පසුවය. වසර මිලියන 25කට ප්‍රථම වානර සම්භවය ඇති වී ක්‍රම ක්‍රමයෙන් දෙපාවත් බව දැක්වූ මානවයන්ගේ මුල්ම පුරුක් අදින් වසර මිලියන පහකට පමණ පෙර සම්භවය විය. එම මානව මුල් පුරුක් මඟින් නූතන මානවයාගේ සම්භවය අදින් වසර 50,000කට ප්‍රථම ඇති විය. එතැන් සිට ක්‍රම ක්‍රමයෙන් මානවයන්ගේ පෘථිවියේ සම්පත් භාවිත කිරීම ඇරැඹි බව පොසිල දත්ත මඟින් සනාථ වේ. ඔවුන් තුළ පැවති ස්වභාව ධර්මය පිළිබඳ දැනුම හේතුවෙන් පෘථිවිය මත ජීවත්වන සතා සීපාවා ඇතුළු සියලු දෑ සමබරව භාවිත කිරීමට පටන් ගෙන තිබේ.

පෘථිවි වායුගෝලයේ ප්‍රධාන වායුන් වර්ග හතරක් පවතින අතර බහුලවම පවතින වායුව නයිට්‍රජන් වේ. එය 78.09%කි. ඔක්සිජන් 20.95%කි. කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණය වන්නේ .04%කි. ආගන් වායුව .93%කි. පෘථිවි කබල ගත් විට එහි වැඩි ප්‍රමාණයක් ඇත්තේ ඔක්සිජන් පරමාණුය. එය 46.6%කි. මිනිස් දේහයේ බර අනුව ප්‍රතිශතය ගත් විට ද ඔක්සිජන් පරමාණු 65%ක් පවතී. මේ ආකාරයෙන් සලකා බැලූ විට පෘථිවි කබොල්ලට, මිනිස් දේහයට සහ සතුන්ට අත්‍යවශ්‍යම ද්‍රව්‍යයක් වන්නේ ඔක්සිජන්ය. ඔක්සිජන් නොමැතිව මිනිස් සහ සත්ත්ව ජීවිත ඉදිරියට ගෙන යා නොහැකි බව මින් ප්‍රත්‍යක්ෂ වේ. පෘථිවි වායුගෝලය තුළ ඔක්සිජන් පවතින අවම සීමාව වන්නේ මතු පිට සිට කිලෝමීටර් 3.8ක පමණ වපසරියකි.

පෘථිවි කබොල තුළ වැඩි ප්‍රමාණයක් පවතිනුයේ ජල ගෝලයයි. එය 75% ක පමණ ප්‍රමාණයකි. එමෙන්ම පෘථිවි වායුගෝලය තුළ ඇති උෂ්ණත්වය ගත් විට උෂ්ණත්වයේ ප්‍රධාන ප්‍රභවය වන්නේ සූර්යයාය. මෙම උෂ්ණත්වය ජීවී සෛලයක් තුළ විශාල ලෙස පහළ මට්ටමකට ගිය හොත් එම සෛලය භෞතික ලෙස හානියට පත් වන අතරම සෛලය තුළ අයිස් පතුරු ඇති වීමෙන් සෛලය විනාශවීම පවා සිදු විය හැකිය. උෂ්ණත්වය අධික ලෙස ඉහළ ගිය හොත් ජීවීන්ගේ සෛල තුළ ඇති ප්‍රෝටීන් විනාශ වීම සිදු වේ. මෙම උෂ්ණත්ව වෙනස්වීම දරා ගැනීම සඳහා ශාක සහ සත්ත්ව දෙකොට්ඨාසයම අනුවර්තනය වී සිටී. උදාහරණයක් ලෙස ඇතැම් ක්ෂීරපායී සතුන් දේහ උෂ්ණත්වය අඩු වූ විට තාප පරිවාරකයක් ලෙස ශරීරයේ රෝම කෙළින් කොට ගෙන තාපය දේහයෙන් පිට නොවන සේ තබා ගනී.

## හරිතාගාර වායුන්

උෂ්ණත්වය අඩු වැඩි වීම ප්‍රධාන වශයෙන් පෘථිවි කබොල මත සිදු වනුයේ හරිතාගාර වායුන් වර්ග හේතුවෙනි. හරිතාගාර වායුන් ලෙස බහුල වශයෙන් දක්නට ලැබෙනුයේ කාබන් ඩයොක්සයිඩ් වායුවය. මීට අමතරව මීතේන්, ක්ලෝරෝෆ්ලූරෝ කාබන්, නයිට්‍රස් ඔක්සයිඩ් වැනි වායුන් දක්නට ලැබේ. පෘථිවි උෂ්ණත්වයේ මධ්‍යන්‍යය සෙල්සියස් අංශක 15ක පමණ ප්‍රමාණයක පවතී. වායු ගෝලයට නිදහස් වන හරිතාගාර වායුන් ප්‍රමාණය වැඩි වන විට මෙම වායුන් මඟින් සූර්ය කිරණ අල්ලා ගැනීම සිදු වේ. මෙම සිදුවීම තුළ පෘථිවි උෂ්ණත්වය ඉහළ නඟී. මේ නිසා ඇති වන අනිසි ප්‍රතිඵල බොහෝය. ඉන් ප්‍රධාන වන්නේ ගෝලීය උණුසුමය.

පෘථිවියේ උෂ්ණත්වය සඳහා ඉතා වැදගත් සාධකයක් වන්නේ ඔක්සිජන්වල ද්‍රාව්‍යතාවයය. අඩු පරිසර උෂ්ණත්වයකදී ඔක්සිජන්වල ද්‍රාව්‍යතාවය ඉතා වැඩිය. උදාහරණයක් ලෙස උෂ්ණත්වය සෙල්සියස් අංශක 0දී ඔක්සිජන්වල ද්‍රාව්‍යතාවය ඝන ඩෙසි මීටරයට මිලි ග්‍රෑම් 124ක් වේ. සෙල්සියස් අංශක 10දී එය 11.3කි. 20දී 9.2ක් වන අතර 30දී 7.6ක් සහ සෙල්සියස් අංශක 40දී එය 6.6ක් වේ. පරිසර උෂ්ණත්වය වැඩි වීම නොහොත් ගෝලීය උණුසුම වැඩි වීමේ ප්‍රතිඵලයක් ලෙස වායු ගෝලයේ ඔක්සිජන් සාන්ද්‍රණය අඩු වීම ද නිරායාසයෙන්ම සිදු වේ. වායුගෝලයට ඔක්සිජන් ලබා දෙන එකම ක්‍රමවේදය ප්‍රභාසංස්ලේෂණය පමණි. ශාක වැස්ම, ඇල්ගී හා ශාක ප්ලවාංග මඟින් එය සිදු කරනු ලබයි. වැඩිම ඔක්සිජන් ප්‍රමාණයක් වායුගෝලයට නිදහස් කරන්නේ ඇල්ගී සහ ශාක ප්ලවාංග මඟිනි. ක්ලෝරෝෆ්ලූරෝ කාබන් (CFC) වැනි වායු වර්ග වායුගෝලයට නිදහස් වීමෙන් අහිතකර UV කිරණ සූර්යයාගේ සිට සාගරවලට පතිත වී එම ශාක ප්ලවාංග විනාශ වීමෙන් වායුගෝලයට නිදහස් වන ඔක්සිජන් ප්‍රමාණය අඩු වේ.

## ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය

එහෙත් උෂ්ණත්වය වෙනස්වීම මත ඔක්සිජන්වල වෙනස්වීම ද සිදු වේ. පෘථිවිය මත ශාක මඟින් සිදු කෙරෙන ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය වායුගෝලයේ පවතින ඔක්සිජන් සාන්ද්‍රණය සහ කාබන් ඩයොක්සයිඩ් සාන්ද්‍රණය සමතුලිතව තබා ගැනීමට ඉවහල් වන ප්‍රධානම ක්‍රියාවලිය වේ. එය සෘජුව හෝ වක්‍රීය ලෙස සත්ත්වයන්ට ශක්තිය සැපයීමට ද දායක වේ. එමෙන්ම මෙම ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය මඟින් පොසිල ඉන්ධන ඇති කරවීමේ ක්‍රියාවලියට ද දායක වේ. මේ අනුව සලකා බැලූ විට පැහැදිලි වනුයේ ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය යම් හෙයකින් ඇනහිටිය හොත් එනම් පෘථිවිය මත ඇති වන වැස්ම ඉවත් වුවහොත් වායු ගෝලයේ පවතින ඔක්සිජන් ප්‍රමාණය ජීවීන්ට ප්‍රමාණවත් නොවන බවය. ඊට හේතුව වන්නේ වායු ගෝලයේ පවතින ඔක්සිජන්වලින් 80%ක් පමණ ප්‍රමාණයක් විවිධ වායු ඔක්සයිඩ තැනීමට භාවිත වීමය.

මැද පෙරදිග රටවල ශාක වැස්ම ඇත්තේ සීමාසහිත ප්‍රමාණයකිනි. එහෙත් අදින් වසර 10,000කට පමණ පෙර ගත් විට තුර්කිය, ජෝර්දානය, ඉරාකය, ඉරානය, ලෙබනනය, ඊශ්‍රායලය, සයිප්‍රස්, කුවේට්, සෞදි අරාබිය, කටාර්, බහරේන්, ඕමාන් වැනි රටවල් ඉතා සශ්‍රීක ලෙස පැවති රටවල් වේ. එම නිසා සාරවත් අඩකවය ලෙස ද එම රටවල් හැඳින්විණි. එම රටවල් ගහ කොළ, සතා සීපාවා අධික ලෙස පැවති රටවල් වේ. වර්තමානය වන විට එම රටවල් ඉතා උෂ්ණාධික රටවල් බවට පත් වී තිබේ. මානවයාගේ සම්භවයත් සමගම පෘථිවිය මත මානවයාගේ විවිධ ක්‍රියාකාරකම් හේතුවෙන් මේ ආකාරයට කාලගුණික සහ දේශගුණික වෙනස්කම්වලට භාජනය වී තිබීම ඊට හේතු සාධක ලෙස පෙන්වා දිය හැකිය. නමුත් අරාබියේ මෙන්ම අනෙකුත් මැද පෙරදිග රටවල ද වායුගෝලයේ ඇති ඔක්සිජන් මිනිසා ඇතුළු සතුන් සහ ශාකවල ශ්වසනයට භාවිත කරයි. මැද පෙරදිග රටවල ශාක සංයුතිය අඩු වුව ද වායුගෝලයට ඔක්සිජන් එකතු වන්නේ සාගරවල සිදු වන ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය මඟිනි.

පෘථිවි වායුගෝලයේ පවතින ඔක්සිජන් ප්‍රමාණය පෘථිවියේ ජීවත් වන සෑම ජීවියකුටම අත්‍යවශ්‍යය. එම ඔක්සිජන් ප්‍රමාණය පමණක් ගහ කොළ, සතා සීපාවා නොමැතිව වායුගෝලයේ රඳා පවත්වා ගැනීම උගහටය. වර්තමාන මානවයා විසින් කළ යුතු ප්‍රධානම ක්‍රියාවලිය වන්නේ වායුගෝලයේ පවතින ඔක්සිජන්, කාබන් ඩයොක්සයිඩ් සාන්ද්‍රණය නියතව තබා ගැනීමත්, ගෝලීය උණුසුම අඩු කර ගැනීමත්ය. මේ නිසා ඉදිරියට අනාගතය යහපත් වන්නටත්, නැතහොත් සාර්ථක ලෙස ජීවීන් අනාගතයේදී පෘථිවි තලය මත ස්ථාපිත වන්නටත් හැකියාව ලැබෙනු ඇත. මේ සඳහා ගහ කොළ ඉතා හොඳින් ආරක්ෂා කර ගැනීම අත්‍යවශ්‍ය වේ. පෘථිවිය මත ඇති වන වැස්ම ආරක්ෂා කරන අතරම වන වැස්ම නැවත වගා කොට පෘථිවි තලයේ වන වැස්මේ ප්‍රතිශතය වැඩි කර ගත යුතු වේ. එසේ කළ හොත් වායුගෝලය තුළ ඔක්සිජන් පවතින අතර මිනිසාට ද ජීවත් විය හැකිය. මිනිසා ජීවත් වේ නම් රට සංවර්ධනය වේ. රට සංවර්ධනය වේ නම් ලෝකය තුළ ශ්‍රී ලංකාවට හිමි නිසි තැන ළඟා කර ගැනිමට හැකියාව ලැබෙනු ඇත.





චතුමී පිටිපන

මෑත කාලයේ මෙරට පාරිභෝගික ජනතාව අතර වැඩි කතාබහට ලක් වූ විසකාරක පොල් තෙල් ගැටලුවට මෙතෙක් නිශ්චිත විසඳුමක් නැත. ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ ඇෆ්ලටොක්සින් විසකාරකය අඩංගු පොල් තෙල් විශාල ප්‍රමාණයක් ප්‍රතිඅපනයනය කිරීමේ පසුබිමකදී පාරිභෝගිකයෝ දේශීය පොල් තෙල් කරා යොමු වෙමින් සිටිති. ඇෆ්ලටොක්සින් විසකාරකය පිළිබඳ සමාජයේ විවිධ මතිමතාන්තර පළ වූවත් සැබැවින්ම මේ විසකාරකය සම්බන්ධව පැහැදිලි අවබෝධයක් මෙරට සාමාන්‍ය ජනතාව අතර නැත. ඇෆ්ලටොක්සින් විසකාරකය ඇත්තේ පොල් තෙල්වල පමණක් නොවන බව පැහැදිලි කරමින් 'ඇෆ්ලටොක්සින් තිත්ත ඇත්ත' නමින් ආචාර්ය ප්‍රසන්න ජේ.පී.ගුණවර්ධන මහතා විසින් 'සන්ඩේ ඔබ්සර්වර් පුවත්පතට ලියූ ලිපියක් ඇසුරින් මේ ලිපිය සකස් වන්නේ මෙරට පාරිභෝගික ජනතාවට ඒ පිළිබඳ අවබෝධයක් දීමේ අරමුණ ඇතිවය.



# විස පොල් තෙල්වල ඇත්ත නැත්ත

ඇෆ්ලටොක්සින් යනු 'මයිකෝටොක්සින්' විශේෂයකි. එය ඇස්පර්ගිලස් (Aspergillus) නමැති දිලීර වර්ගයකින් (මූලික වශයෙන් ඇස්පර්ගිලස් ෆ්ලේවර්ස්, ඇස්පර්ගිලස් පැරසිටිකස් සහ ඇස්පර්ගිලස් නොමියස්) නිපදවෙන විශේෂිත ද්විතීයික පරිවෘත්තීය (secondary metabolites) ක්‍රියාවලිය හඳුන්වනු ලබන පොදු නාමයකි. මෙවැනි වර්ගයේ ඇෆ්ලටොක්සින්ජනක මඟින් $AFB_1$, $AFB_2$, $AFG_1$ and $AFG_2$ වැනි විවිධ ඇෆ්ලටොක්සින් දිලීර වර්ග නිපදවනු ලැබේ.

ලොව පුරා විවිධ ස්වභාවික දිලීර දක්නට ලැබෙන අතර, තෙතමනය සහ උණුසුම් දේශගුණයක් සහිත පළාත්වල ආහාර සැපයුම් ක්‍රියාවලියේදී බහුලව දක්නට ඇතැයි සැලකේ. වැඩි උෂ්ණත්වයක් සහ වැඩි තෙතමනයක් සහිත නිවර්තන හා උපනිවර්තන කලාපවල එය වැඩි වශයෙන් දැකිය හැකි අතර, සාමාන්‍යයෙන් නරක් වූ සහ දිරාපත් වූ ගස්වැල් තුළින් ද සොයා ගත හැකිය. මේ දිලීර විශේෂයට ආහාර භෝග ආක්‍රමණය කිරීමේ හැකියාව ඇත. භෝග දැඩි නියඟයට හසුවීම සහ කෘමින්ගෙන් හානියට පත් වීම ද මේ දිලීර වර්ධනය ඉහළ යැමට ඉවහල් වේ.

## ඇෆ්ලටොක්සින් අනතුරුදායක ද?

මේ ඇෆ්ලටොනික් විශේෂය පළමුව සොයාගනු ලැබුවේ 1960 වසරේ එංගලන්තයේදී හඳුනාගත නොහැකි හේතුකාරයක් තුළින් කළුකුම් සඳහා බලපෑ රෝගයක් ව්‍යාප්ත වීමත් සමඟය. එතැන් සිට මේ විසකාරකය මනුෂ්‍ය වර්ගයාට බලපෑවේ කෙසේද යන්න පිළිබඳ නිවැරැදිව අවබෝධ කර ගැනීමට පරීක්ෂණ පැවැත් වූ විද්‍යාඥයන්ගේ සහ පර්යේෂකයන්ගේ ප්‍රමාණය අති විශාලය. ඇෆ්ලටොක්සින් සැලකිය යුතු සෞඛ්‍ය අවදානමක් පෙන්නුම් කිරීම පමණක් නොව දැඩි ආර්ථික ගැටලුවක් ද නිර්මාණය කිරීමක් ද වන්නේ ඇෆ්ලටොනික් විසකාරකය හේතුවෙන් ලෝක ආහාර භෝග අතරින් අවම තරමින් 25%ක ප්‍රමාණයක් වාර්ෂිකව විනාශයට පත්වන බැවිනි.

## ශ්‍රී ලංකාව තුළ ශීඝ්‍ර ව්‍යාප්තිය

ආනයනය කරනු ලැබූ පොල් තෙල් තොගවල ඇෆ්ලටොක්සින් විසකාරකය බහුලව අඩංගු බවට පුවත්පත් වාර්තා පලවීම ශ්‍රී ලාංකික ජනසමාජය ව්‍යාකූලත්වයට පත් කළ සිදුවීමක් විය.

අවාසනාවකට මෙන් මාධ්‍ය තුළින් ඉදිරිපත් වූයේ හුදෙක් පවතින තත්ත්වයේ විකෘති වූ මතයකි. මන්ද ඇෆ්ලටොක්සින් පිළිබඳ තර්ක ඉදිරිපත් කරන්නන් සහ ඊට එරෙහිව හඬ නගන්නන් විද්‍යාවෙන් බැහැර වූ, මූලික ජීව විද්‍යාත්මක සංකල්ප පිළිබඳ අවබෝධයක් නැති පුද්ගලයන් වූ බැවිනි.

ඇෆ්ලටොක්සින් පිළිබඳ මිථ්‍යාවන් සහ අර්ධ සත්‍යයන් ප්‍රචාරය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් එම තත්ත්වය ඇති වූ අතර, ඇෆ්ලටොක්සින් මිනිස් සිරුරට ඇතුළු වන්නේ විෂ සහිත පොල් තෙල්වලින් පමණක් බව බහුතරයකගේ විශ්වාසය වී ඇත. කෙසේ වෙතත් මෙය හුදෙක් සත්‍යය නොවන අතර, ඇෆ්ලටොක්සින් අපගේ සිරුරට ඇතුළු විය හැකි තවත් මාර්ග ගණනාවක් තිබේ.

සැබැව නම් සාමාන්‍ය ශ්‍රී ලාංකික ජනතාව දිනපතා භාවිතයට ගන්නා ආහාර වර්ග ගණනාවකම ඇෆ්ලටොක්සින් විසකාරකය අඩංගු වන බවය.

විශාලතම තර්ජනය පොල් තෙල් ද?

පොල් තෙල් යනු ශ්‍රී ලංකාවේ වඩාත් බහුලව භාවිත කෙරෙන එළවළු තෙල් වර්ගය වේ. මෙරට වෙළෙඳ පොළේ ආහාරයට ගන්නා එළවළු තෙල්වල ඇෆ්ලටොක්සින් අඩංගු වීමේ සිදුවීම සම්බන්ධව පසුගිය දශකය පුරා පර්යේෂණ සිදු කළ විද්‍යාඥයන් අතලොස්සක් සිටිති. ඔවුන් සොයා ගත් කරුණු පිළිබඳ අන්තර්ජාලයෙන් දැන ගත හැකිය.

බොහෝ පර්යේෂකයන් සොයා ගෙන ඇත්තේ ආසන්න වශයෙන් පොල්තෙල් සාම්පලවල (ආනයනය කරන ලද සහ මෙරට නිෂ්පාදිත) ඇෆ්ලටොක්සින් විසකාරකය සියයට 20-30ක අතර ප්‍රතිශතයක් පවතින බවය.

පොල්තෙල්වල අඩංගු සමස්ත ඇෆ්ලටොක්සින් ප්‍රමාණය කිලෝග්‍රෑම් 2.25 සිට 72.70ක මට්ටමක පවතින අතර, ඇෆ්ලටොක්සින් B1විසකාරකය කිලෝග්‍රෑම් 1.76 සිට 60.92ක මට්ටමක පවතී. මෙය අනතුරුදායක තත්ත්වයකි. මන්ද ඇෆ්ලටොක්සින් අඩංගු අනෙකුත් කෘෂිකාර්මික පාරිභෝගික ආහාර මෙන් නොව දිනපතා පොල්තෙල් පරිභෝජනය කිරීමෙන් පාරිභෝගිකයන් අඛණ්ඩව සෞඛ්‍ය අවදානමකට නිරාවරණය වන බැවිනි.

පොල්තෙල්වල ඇෆ්ලටොක්සින් ඉහළ අගයක් පෙන්නුම් කිරීම කොප්පරාවල ටොක්සිජනක දිලීර වර්ධනය වීමට ඉඩ සැලසෙන අවිධිමත් කෘෂිකාර්මික ක්‍රියාවලියක ප්‍රතිඵලයක් විය හැකිය. මේ ගැටලුවට ඇති එකම විසඳුම වන්නේ මේ කර්මාන්තයට නිවැරැදි නිෂ්පාදන ක්‍රමවේද හඳුන්වා දෙන අතරතුර වෙළෙඳපොළේ ඇති පොල් තෙල්වල ඇෆ්ලටොක්සින් අඩංගු වේදැයි (බලයලත් රසායනාගාරවල පමණක්) පරීක්ෂා කිරීමය.

## සහල්වල තත්ත්වය

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාරය සහල් වන අතර, එය වැඩි වශයෙන් තැම්බූ සහල් ලෙස සැකසේ. ධාන්‍ය වර්ග අතරින් කෘෂිකාර්මික ක්‍රමවේදයේ විපර්යාස හේතුවෙන් ස්වාභාවික තත්ත්වයන් තුළ ඇෆ්ලටොක්සින් බහුලව අඩංගු වන්නේ සහල් සහ ඉරිඟුවලය.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් සහල් නිෂ්පාදන කෙරෙන ප්‍රදේශවලින් සහ සහල් පරිභෝජනය කරන නගරබද පළාත්වලින් ලබා ගත් අඹරන ලද අමු සහල් සහ තම්බා ගත් සහල් සාම්පල ආශ්‍රිතව ඇෆ්ලටොක්සින් B1, සහ ඇෆ්ලටොක්සින් G1 මට්ටම විශ්ලේෂණය කිරීම සඳහා ඉතා ඵලදායි අධ්‍යයනයක් සිදු කර ඇති අතර, පරීක්ෂා කරන ලද තම්බා ගත් සහල් සාම්පලවල ඇෆ්ලටොක්සින් B1, සහ G1 ප්‍රමාණය අඹරා ගත් අමු සහල් සාම්පලවල අඩංගු ප්‍රමාණයට වඩා සැලකිය යුතු අන්දමින් ඉහළ අගයක් පෙන්නුම් කර ඇත.

## පැහැදිලිව පෙනෙන සතුරා

කෙසේ වෙතත් ඇෆ්ලටොක්සින් බලපෑම ඇත්තේ සහල්වලට සහ පොල්තෙල්වලට පමණක් නොවේ. නිෂ්පාදනය, සකස් කිරීම, ප්‍රවාහනය සහ ගබඩා කිරීම ආදි ආහාර සැපයුම් ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවකදී ආක්‍රමණය කිරීමට ඇෆ්ලටොක්සින් විසකාරකයට හැකියාව ඇත.

අඩු තත්ත්වයන් යටතේ අවිධිමත් ලෙස ආහාර ගබඩා කිරීම (උණුසුම් හෝ තෙතමනය සහිත පරිසරයක ගබඩා කිරීම) දිලීර වර්ධනයට ඉවහල් වේ. එවැනි පසුබිමකදී එළිමහන් පරිසරයකට වඩා ඉහළ අගයකින් ආහාර විනාශ කිරීමට ඇෆ්ලටොක්සින් විසකාරකයට හැකියාව තිබේ.

සහල්, බඩ ඉරිඟු, මඤ්ඤොක්කා, ගම් මිරිස්, මෙනේරි, රටකජු, තල ඇට, මුං ඇට, සූරියකාන්ත බීජ, තිරිඟු, කොප්පරා, විවිධ කුළුබඩු (සාදික්කා වැනි) වැනි භෝග වර්ග පවා අවිධිමත් ලෙස ගබඩා කිරීමේදී ඇෆ්ලටොක්සින් නිපදවන දිලීර ඇති බව සොයා ගත හැකිය.

ප්‍රධාන වශයෙන් බඩ ඉරිඟු, කපු බීජ, රට කජු ආදිය අස්වනු නෙලීමට පෙර ඇෆ්ලටොක්සින් විසකාරකයේ ආක්‍රමණයට හසුවන අතර, කෝපි, සහල් සහ කුළුබඩු වැනි වෙනත් භෝග අස්වනු නෙලීමෙන් පසු එහි ආක්‍රමණයට ගොදුරු වීමේ ඉඩකඩ පවතී. ඇෆ්ලටොක්සින් විසකාරකය ඇති ආහාරවලින් එය ඉවත් කිරීමට ආහාර සකස් කිරීමේ ශිල්පී ක්‍රම ප්‍රමාණවත් නොවේ.

එම විසකාරක ආහාර සකස් කිරීමේදී ඇෆ්ලටොක්සින් සාමාන්‍ය ආහාර සැපයුම් ක්‍රියාවලියට එක්වන අතර, එය සුරතල් සතුන්ගේ ආහාර සහ මිනිස් ආහාර දෙවර්ගයටම ඇතුළු වේ. එමෙන්ම කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිත කරන වෙනත් සතුන්ගේ ආහාරවලට ද එක් වෙයි.

කිරි සහ කිරි ආශ්‍රිත නිෂ්පාදනවල තවත් විසකාරක විශේෂයක් වන ඇෆ්ලටොක්සින් M1 අඩංගු විය හැකිය. එය සිදු වන්නේ කිරි ගවයන්ට ඇෆ්ලටොක්සින් B1 අඩංගු ආහාර ලබා දීම හේතුවෙනි.

සත්ත්වයන්ට විසකාරක ආහාර දීමෙන් ඇෆ්ලටොක්සින් බිත්තර, කිරි නිෂ්පාදන සහ මස් වැනි නිෂ්පාදනවලට පැතිරීමට ද ඉඩ තිබේ. අනතුරුව කිරි සහ කිරි නිෂ්පාදන, ආහාරයට ගැනීමෙන් මිනිසුන් ද ඇෆ්ලටොක්සින් විසකාරකයට නිරාවරණය වේ. ඒ අනුව මව් කිරි හරහා ළදරුවන් මත් ගතියක් ඇතිවීමේ අවදානමට ගොදුරු වීමට පුළුවන.

## සෞඛ්‍ය අවදානම

ආහාර ගැනීම මඟින් ඇෆ්ලටොක්සින් විසකාරකයට නිරාවරණය වීමෙන් බරපතළ සෞඛ්‍ය සංකූලතා හා ප්‍රතිවිපාක ඇති විය හැකිය. මෙහි බලපෑම උග්‍ර වශයෙන් සහ දිගු කාලීන වශයෙන් සිදු විය හැකිය. එහි බලපෑම අනුව මිනිස් සිරුරේ විවිධ විපර්යාසයන් සිදු වේ.

එමඟින් දරුවන්ගේ උපත් දෝෂ (teratogenic) සිදු විය හැකි අතර, විකෘතිතා (mutagenic) (ඩීඑන්ඒ විකෘතියක් හෝ වෙනසක්), පිළිකාකාරක වර්ධනය (carcinogenic), ප්‍රතිශක්තිකරණයට (immunotoxic) බලපෑම් එල්ල විය හැකිය. එමෙන්ම අක්මාවේ (hepatotoxic) සෛලවලට ද හානි සිදුවිය හැකිය. ඇෆ්ලටොක්සින් ප්‍රබල වශයෙන් අක්මාවට සහ වකුගඩුවලට බලපෑම් එල්ල කරන අතර, ප්‍රජනක ඉන්ද්‍රියන්වලට ද සුළු වශයෙන් බලපානු ඇත.

## ඇෆ්ලටොක්සින් සීමා කිරීම

ඇෆ්ලටොක්සින් අඩු තත්ත්වයක් යටතේ පවා මිනිසුන්ට සහ කෘෂිකාර්මික සතුන්ට අනතුරුදායක ය. ආහාර නිෂ්පාදනයේ දී ඇෆ්ලටොක්සින් හඳුනා ගැනීම සහ එම ප්‍රමාණය ගණනය කිරීම වර්තමානයේ ආහාර සුරක්ෂිතභාවය සහතික කිරීමට විශාල අභියෝගයක් වී තිබේ. බොහෝ ගොවීන්ට ඇෆ්ලටොක්සින් තත්ත්වය පිළිබඳ දැනුමක් නැත. ඔවුන්ගේ පරිභෝජන ක්‍රියාවලිය සම්බන්ධ බරපතළ අවදානම කෙසේ වුවත් ඒවා අවම කිරීමට සැළකිල්ලක් නොදක්වති.

දේශීය වශයෙන් පරිභෝජනය කරන ආහාරවල ඇෆ්ලටොක්සින් සම්බන්ධව ප්‍රමාණාත්මක විශ්ලේෂණයක් අත්‍යවශ්‍ය වේ. එහෙත් අපනයනය කරනු ලබන ආහාර සඳහා බෝග නිෂ්පාදනයේදී අන්තර්ජාතික ප්‍රමිතීන් සපුරාලීම හා අනුගමනය කිරීම අනිවාර්ය වේ. එබැවින් විවිධ රටවල පුද්ගලයන්ගේ සෞඛ්‍යයට හානියක් නොවන පරිදි ආහාර සහ ආහාරවල අඩංගු ඇෆ්ලටොක්සින් පිළිබඳ දැඩි නීතිරෙගුලාසි ක්‍රියාත්මක කෙරේ.

මිනිස් පරිභෝජනය සඳහා ඇෆ්ලටොක්සින් ආරක්ෂිත සීමාව කිලෝග්‍රෑම් 4-30 මට්ටමක තිබිය යුතුය. යුරෝපා හවුල සමස්ත ඇෆ්ලටොක්සින් සහ B1 සම්බන්ධව කිලෝග්‍රෑම් 2-4 නොඉක්මවන සම්මත මට්ටමක් පනවා ඇත. ඒ හා සමානව අමෙරිකා එක්සත් ජනපදයේ ඇෆ්ලටොක්සින් පිළිගත හැකි උපරිම සීමාව කිලෝග්‍රෑම් 20කට සීමා කර ඇත.

අනිත් අතට ශ්‍රී ලංකාවේ සමස්ත ඇෆ්ලටොක්සින් මට්ටම කිලෝග්‍රෑම් 10 දක්වා පැවැතිය හැකි වන අතර, ඇෆ්ලටොක්සින් B1 උපරිම මට්ටම කිලෝග්‍රෑම් 5ක් විය යුතුය. කෙසේ වුවත් මේ ප්‍රමාණය සෑම පුද්ගලයකුම ආරක්ෂා කිරීමට ප්‍රමාණවත් නොවන බවට පැහැදිලි සාක්ෂි තිබේ. විශේෂයෙන් මේ භෝග අධික ලෙස පරිභෝජනය කරන සංවර්ධනය වෙමින් පවතින රටවල්වල ජනතාව අතර වෙනත් හේතූන් මත ප්‍රතිශක්තිය බෙහෙවින් අඩුය.

## ඇෆ්ලටොක්සින් අක්‍රිය කිරීම

ආහාර සහ ආහාර ද්‍රව්‍යවල ඇෆ්ලටොක්සින් ඉවත් කිරීම හෝ අක්‍රිය කිරීම ගෝලීය අවධානය යොමු වූ කරුණකි. එම තත්ත්වය පවතින ආහාරවලින් ඇෆ්ලටොක්සින් අක්‍රිය කිරීම හෝ ඉවත් කිරීම රසායනික හෝ ජෛව විද්‍යාත්මක ක්‍රියාපටිපාටියකින් සිදු කළ හැකිය. එය රඳා පවතින්නේ පවතින තත්ත්වයන් තුළය. කෙසේ වුවත් ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය අතරතුර එහි අත්‍යවශ්‍ය පෝෂණ ගුණය රැක ගැනීම මෙන්ම මිනිස් සෞඛ්‍යයට හිතකර ආකාරයෙන් ආහාර නිපදවීම සිදුවිය යුතු වන බැවින් ඇෆ්ලටොක්සින් අක්‍රිය කිරීම හෝ ඉවත් කිරීම සීමාවන් සහිතව සිදු විය යුත්තකි.

පෙර සහ පසු අස්වනු නෙළීමේ අවස්ථාවන් තුළ භෝගවලට බලපා ඇති මයිකොටොක්සින් සහ ඇෆ්ලටොක්සින් පාලනය කළ හැකි පහත සඳහන් ක්‍රමවේද බොහෝ අවස්ථාවලදී යෝජනා කර තිබේ. ඒ අනුව නිවැරැදි කෘෂිකාර්මික ක්‍රමවේද අනුගමනය කිරීම, නිවැරැදි නිෂ්පාදන ක්‍රමවේද අනුගමනය කිරීම සහ නිවැරැදි ගබඩා කිරීම් අනුගමනය කිරීම එවැනි යෝජනා කිහිපයකි.

මයික්‍රෝවේව්, UV, විද්‍යුත් විච්ඡේදන ජලය, සිසිල් ප්ලාස්මා, ඕසෝන්, ඉලෙක්ට්‍රෝන බීම් හෝ ගැමා, ජෛව විද්‍යාත්මක, රසායනික හෝ ඉංජිනේරු විද්‍යා ක්‍රමවේද සුසංයෝග වැනි නව සැකසුම් තාක්ෂණ ක්‍රම ඔස්සේ ඇෆ්ලටොක්සින් ක්‍රියාකාරීත්වය මඟ හරවා ගැනීමට කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ හැකියාව තිබේ.

එබැවින් මහජන අවධානය ඉහළ දමමින් නව තාක්ෂණය භාවිතයෙන් නිවැරැදි කෘෂිකාර්මික ක්‍රමවේද අනුගමනය කිරීම, නිවැරැදි නිෂ්පාදන ක්‍රමවේද අනුගමනය කිරීම සහ නිවැරැදි ගබඩා කිරීම් අනුගමනය කිරීම ආදිය ක්‍රියාවට නංවා මානව හා සත්ව සෞඛ්‍ය පවත්වා ගැනීම සඳහා ආහාර සුරක්ෂිතභාවය සහතික කිරීම සඳහා ඇෆ්ලටොක්සින් පාලනය කිරීම ඉතා වැදගත්ය.

## ශ්‍රී ලංකාව තුළ ඇෆ්ලටොක්සින් පාලනය කිරීමේ උපාය මාර්ග

සංකීර්ණ ඇෆ්ලටොක්සින් ගැටලුව පාලනය කිරීම සහ දේශීය ගොවීන්ගේ සෞඛ්‍යය, ආදායම සහ ජීවන රටාව වැඩි දියුණු කිරීම සඳහා බහු විධ ප්‍රවේශයන් ව්‍යාප්ත කළ යුතුය. ව්‍යාප්ත වූ ඇෆ්ලටොක්සින් පාලන වැඩසටහනක් මගින් මෙය සිදු කළ හැකිය.

1. ඵලදායි ප්‍රතිපත්තීන්, ප්‍රමිතීන් සහ රෙගුලාසි ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු (ආර්ථික, ආහාර සුරක්ෂිතභාවය සහ සෞඛ්‍ය ඇගැයිම් තුළින්) ප්‍රචාරක වැඩසටහන් තුළින් ඇෆ්ලටොක්සින් සම්බන්ධව සුරක්ෂිතභාවය අපේක්ෂා කරන පාරිභෝගිකයන් සහ ඉහළ ප්‍රමිතයකින් යුතු ආහාර සම්බන්ධව අවධානය ඉහළ දැමිය හැකිය.
2. දියුණු කරනු ලැබූ යෙදවුම් සහ තාක්ෂණික විසඳුම් බෙදා හරිමින් නිෂ්පාදන භෝගවල ප්‍රමිතිය ඉහළ දැමීම.
3. ගුණාත්මකභාවය නියාමනය කිරීම සහ නිවැරැදි ගබඩා කිරීම් සහතික කිරීම සඳහා වෙළෙඳ යාන්ත්‍රණය තුළ පාරිභෝගික භාණ්ඩ පරීක්ෂා කිරීම.
4. ආරක්ෂිත හා ඉහළ ප්‍රමිතියකින් යුතු ආහාර අමු ද්‍රව්‍යය සඳහා ප්‍රවේශයක් ඇති කිරීම.
5. විසකාරක අඩංගු පාරිභෝගික භාණ්ඩ වහාම ක්‍රියාත්මක වන පරිදි ඉවත් කිරීම සහ ඊට විකල්ප භාවිතයන් ලබා දීම.

ශ්‍රී ලංකාවේ ඇෆ්ලටොක්සින් ව්‍යාප්ත වීම සහ ඊට නිරාවරණය වීම අවම කිරීමට සෑම මට්ටමකින්ම (ස්වදේශිය, කලාපීය සහ ජාතික වශයෙන්) ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. ඇෆ්ලටොක්සින් සම්බන්ධව මනා ප්‍රාමාණික දැනුමක් අප සතු වුව ද, වත්මන් පද්ධතියේ අඩුලුහුඩුකම් හේතුවෙන් ක්‍රියාත්මක වීම අවම මට්ටමක පවතී.

අපේ රටේ ඇෆ්ලටොක්සින් පිළිබඳ සාමාන්‍ය දැනුවත්භාවයක් තිබේ නම් සහ ඒ සඳහා සහාය විය හැකි රෙගුලාසි සහ ආයතන තිබේ නම් ඇෆ්ලටොක්සින් විසකාරකය මිනිස් සිරුරට බලපෑම් එල්ල කිරීම අවම වනු ඇත. එහෙත් එමඟින් වෙළෙඳපොළට සිදු වන බලපෑම නම් ඉහළ යනු ඇත.

(ආචාර්ය ප්‍රසන්න ජේ.පී.ගුණවර්ධන මහතා 'සන්ඩේ ඔබ්සර්වර් පුවත්පතට ලියූ ලිපියක් ඇසුරිනි)

**ෆවුස් මොහොමඩ්**




# ලෝක ව්‍යසන මැද එකට නැඟී සිටිමු

බෙදුම්වාදය යනු දේශපාලනය නමැති මහා වෘක්ෂයේ හට ගන්නා පිළිලයකි. පටු දේශපාලන සන්දර්භයක් සහ පරිසරයක් තිබෙන තන්හි බෙදුම්වාදය නමැති පිළිලය ආර්ථික, දේශපාලන, සමාජයීය වටිනාකම්වල සාරය උරා ගෙන රිසි සේ වැඩෙයි. ඊනියා ඊළාම්වාදය වේලුපිල්ලේ ප්‍රභාකරන්ගේ පමණක් නිර්මාණයක් නොවේ. ප්‍රභා දේශපාලනයෙන් මෙන්ම ත්‍රස්තවාදයෙන් ද මිහිපිටින් ද තුරන් වී ගියද බෙදුම්වාදය විටින් විට හිස ඔසවයි. ඉකුත්දා තමිල් මක්කල් තේසිය කුට්ටනි පක්ෂ නායක සි.වි විග්නේෂ්වරන් මහතා ද බළලා මල්ලෙන් එළියට පනින්නා සේ තම බෙදුම්වාදී විෂ මුදා හළේය. ඔහු නැවත වරක් කියා සිටියේ උතුරු නැගෙනහිර ඒකාබද්ධ කර මධ්‍යම රජය විසින් පූර්ණ බලතල විමධ්‍යගත කර ස්වයංපාලන ක්‍රමයක් ඇති කළ යුතු බවයි. නව ව්‍යවස්ථා සංශෝධනයට මෙය ඇතුළත් විය යුතු බව ඔහු පවසා ඇති අතර ඔහු ගේ අනාගත සිහිනය උතුරු නැගෙනහිර නව ප්‍රාන්තයක් බව සඟවා අඟවා තිබේ.

විග්නේෂ්වරන්ගේ සිහිනය ඊනියා දේශපාලනය දරන සුළු පිරිසකගේ ද එකම සිහිනයයි. සෙසු රටවල් හා සසඳන කල අල්ලක් තරම් රටක් දෙකඩ කොට ස්වයංපාලනයකට අර ඇදීම පටු දේශපාලනයේ එදා මෙදා තුර දෙපැත්තට තල්ලු කළ මතයකි. ත්‍රස්තවාදය මුලිනුපුටා දමා ඒකීය රටක් ලෙස 2016 වසරේ ලත් විජයග්‍රහණය බෙදුම්වාදය ට හිස එසැවිය නොහැකි බවට දුන් ප්‍රතිඥාවකි. සේනාධිනායකයා ලෙස එවකට ජනපතිව සිටි මහින්ද රාජපක්ෂ මහාතගේ නායකත්වයෙන් ඇරඹි යුද සංග්‍රාමයේදී මෙරට විරෝදාර රණවිරුවන් තිස් දහසකට අධික ප්‍රමාණයක් ජීවිත පුදමින් ලබා ගත් ජයග්‍රහණය යුදමය ජයක් පමණක් නොව දේශපාලන ජයග්‍රණයකි. බෙදුම්වාදයට ත්‍රස්තවාදයෙන් හෝ දේශපාලන මතිමතාන්තරවලින් ද ඉඩක් නොමැති බව පෙනි පෙනී තිබිය දී තව තවත් දේශපාලන කුණු කූඩයේ අඩියටම වැටී ඇති ස්වයංපාලනය නමැති මතවාදය යළි කරළියට ගෙන ඒම ජාතිවාදය ඇවිස්සවීමට දරන ප්‍රයත්නයකි.

මේ වන විට ගෝඨාභය රාජපක්ෂ මහතාගේ පාලනය යටතේ ශ්‍රී ලංකාව එකම රාජ්‍යයක් ලෙස මුළු ලෝකයම පිළිගෙන ඇත. ඒ කෙසේ වෙතත් මෙරටට සියලු ජාතින් බෙදීමකින් තොරව නිදහසේ ජීවත් වෙයි. මානව හිමිකම් උල්ලංඝනය වීමක්, නිදහසට වැට බැඳීමක් ඇත්නම් ජන කැරලි ඉස්මතු වනු ඇත. නමුත් උතුරු නැගෙනහිර ජනතාව තම දෛනික දිවි පෙවෙත ගත කරමින් රටේ ආර්ථිකයට ද දායක වෙමින් ජීවත් වන පරිසරයක විග්නේෂ්වරන්ගේ සිහිනය කුමක් සඳහා ද යන්න උභතෝකෝටික ප්‍රශ්නයකි.

විග්නේෂ්වරන්ගේ යෝජනා අතර උතුරු නැගෙනහිර පළාත්වල සිංහල ජනාවාස පිහිටුවීම සිදු නොවන අයුරින් ඉඩම් බලතල මුළුමනින්ම උතුරු නැගෙනහිර පළාත් සභාවට දිය යුතු බවත්, පොලිස් බලතල ද ලැබිය යුතු බවත් නව ව්‍යවස්ථාව සම්පාදනය කිරීමේ විද්වත් කමිටුවට හෙතෙම යෝජනා කර තිබේ. විග්නේෂ්වරන් ඉදිරිපත් කරන්නේ දමිළ ජනතාව සුබිත මුදිත කළ හැකි ඉල්ලීම් දැයි කෙනකුට ප්‍රශ්නාර්ථයක් මතු ඇත. දේශපාලන ලෝකයේ හළා හල විෂ බෙදා හරින ඇතැම් දේශපාලනඥයන් සාමකාමී ජනතාවගේ ඔළුගෙඩිවලට තම දේශපාලන අරමුණු එබ්බවීමට දරණ ප්‍රයත්නය හමුවේ රටේ අනාගතය ආපස්සට යනු විනා ඉදිරියට යෑමක් නැත.

ජනතා පරමාධිපත්‍යය යනු රටක ප්‍රජාතන්ත්‍රවාදයට දිය හැකි ඉහළම ස්ථානයයි. මේ වන විට රටේ සියලුම ප්‍රජාවට ජන්ද අයිතිය ඇතුළු නිදහස සහතික කර ඇත. අන් සියල්ලටම වඩා ජීවත් වීමේ නිදහස ඇත. ජනතාවගේ ප්‍රශ්නවලට ඇහුම්කන් දෙන ජන නායකයෙක් ඇත. ඔහු උපතින් සිංහල බෞද්ධයකු වුව මේ රටේ සියලු ජනතාව නියෝජනය කරන නායකයාය. ඔහු කිසිම විටෙක තමන් සිංහල ජනතාව වෙනුවෙන් පෙනී සිටින්නෙක් ලෙස කටයුතු කර නැත. දමිළ නායකයින්ගෙන් ද අපේක්ෂා කරන්නේ එවැනි චරිත ස්වභාවයන්ය.

ජන නායකයන් තම ජාතිය පමණක් නියෝජනය කරන්නේ නම් රටට සිදු විය හැකි විපත මෙතෙකැයි කිව නොහේ. පාස්කු ඉරිදා ප්‍රහාරය යනු අන්තවාදී ආගම්වාදය පමණක් නොව ජාති වාදය මත හිස ඔසවන ලද එක් සිද්ධි දාමයක් පමණි. මේ ලෝකය තුළ ජීවත් විය යුත්තේ මුස්ලිම් ප්‍රජාව යන විෂබීජය ලේ මස් නහරවලට කිඳා බැසීම නිසා සහරාන්ගේ සිහිනය ඔහු සමගම විනාශ විය. ඔහු අහිංසක මිනිසුන්ගේ ජීවිත ද බිලි ගැනීමට කටයුතු කළේ අන්තයෙනුත් අන්තයට ගිය මත වාද නිසාය. විග්නේෂ්වරන්ද සිංහල ජනතාව පැත්ත පළාතකට ගෙනෙන්නට එපායැයි පවසයි. ඔහු ද සහරාන් මෙන් අන්තවාදියෙක් නොවේ ද? එවැනිම මත දරන සිංහල අන්තවාදයක් ඇත්නම් එය ද වහවහා මුලිනුපුටා දැමිය යුතුය.

ලෝකය දියුණු යැයි සම්මත තැනට ගමන් කරන්නේ මිනිස් චින්තනය ද වැඩි දියුණු වූ කලය. මානව සමාජයේ පැවැත්ම පවතින්නේ සාමූහිකත්වය මතය. තිරස්චින සමාජයෙන් මානව සමාජය වෙන් කළ හැක්කේ ද එකට ජීවත් වීමේ මහඟු කලාව නිසාය. ඒ ගමන ආපස්සට යවමින් තම ජාතිය පමණක් හුවා දැක්වීම මානව පරිණාමය පවා ආපස්සට හැරවීමට දරන උත්සාහයක් බඳුය. එකට නැගී සිට එකට යා යුතු ගමනක් ශ්‍රී ලාංකේය අප හමුවේ පවතින අභියෝගාත්මක මොහොතක කොරෝනා වසංගතය වැනි අනපේක්ෂිත ලෝක ව්‍යසන මැද මිනිසා අසරණ වී ඇති මෙහොතක එකට නැගී සිටිනු විනා තනි ව ජීවත් වීමට සිහින දැකීම මනුෂ්‍ය බුද්ධිය ද නිගා කිරීමක් නොවේද?

**සකුන්තලා ජයසිංහ**

# චීන සංවර්ධන බැංකුව සමඟ ඩො. මි. 500ක ණය ගිවිසුමකට අත්සන්

**සුභාෂිණී සේනානායක සහ මහින්ද අලුත්ගෙදර**

ශ්‍රී ලංකාව චීන සංවර්ධන බැංකුව සමඟ අමෙරිකානු ඩොලර් මිලියන 500ක ණය ගිවිසුමට කොළඹ චීන තානාපති කාර්යාලයේදී ඊයේ (12) අත්සන් තබනු ලැබීය.

ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් චීනයේ ශ්‍රී ලංකා තානාපති ආචාර්ය පාලිත කොහොන මහතා ඊට අත්සන් තබා ඇත.

ඇමරිකානු ඩොලර් මිලියන 500 ක මෙම ණය මුදල චීනය විසින් පසුගිය වසරේ ලබා දුන් ඇමරිකානු ඩොලර් බිලියනයේ ණය මුදලේ දෙවැනි වාරිකය වේ.

මෙම ණය ගිවිසුම මගින් රටට ගලා එන විදේශ විනිමය කොරෝනා වසංගතය හමුවේ මෙරට ආර්ථිකය සවිමත් කිරීම සඳහා රජය ගන්නා උත්සාහයට පිටිවහලක් විය හැකි බව ගිවිසුමට අත්සන් තැබීමෙන් පසුව බීජිංහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය නිකුත් කළ නිවේදනයක දැක්වේ.

එම මුදල් මෙම සතිය තුළදී ශ්‍රී ලංකාවට ලැබීමට නියමිතය.

# පුනරුත්ථාපන කාර්යාංශයක් පිහිටුවීමට රජය සැරසෙයි

**ධනුෂ්ක ගොඩකුඹුර**

මත්ද්‍රව්‍ය මත යැපෙන්නන්, යුද වැදුණු පුද්ගලයන් සහ ප්‍රචණ්ඩකාරී අන්තවාදී කණ්ඩායම් පුනරුත්ථාපනය කිරීම සඳහා පුනරුත්ථාපන කාර්යාංශයක් පිහිටුවීමට රජය සැරසෙයි.

දැනට ක්‍රියාත්මක වන පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්වරයාගේ කාර්යය වඩාත් තිරසාර නෛතික රාමුවක් යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා පාර්ලිමේන්තු පනතකින් මෙම කාර්යාංශය ස්ථාපිත කිරීමට රජයේ අවධානය යොමුව තිබේ.

එල්.ටී.ටී.ඊ සාමාජිකයන් පුනරුත්ථාපනය කිරීම සඳහා 2006 වසරේදී පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්වරයකු පත් කරන ලද අතර මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීමේ වගකීමත් 2013 වසරේ සිට ඒ යටතට පත් කෙරිණි.

# උම්බලකඩ ව්‍යාපාරයට මුවා වී හෙරොයින් ජාවාරම් කළ කෝටිපතියා සහ ගෝලයා දැලේ

**රක්ෂණ ශ්‍රියන්ත සහ භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

උම්බලකඩ ව්‍යාපාරයට මුවාවී හෙරොයින් ජාවාරමේ යෙදෙමින් රුපියල් කෝටි 10කට අධික දේපළ වත්කම් උපයාගත් බව කියන කෝටිපති ව්‍යාපාරිකයකු සහ ඔහුගේ ගෝලයකු විශේෂ පොලිස් කණ්ඩායමක් විසින් ඊයේ (12) වත්තල ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන තිබේ.

මෙම ව්‍යාපාරිකයා මෙයට ඉහතදී හෙරොයින් ජාවාරමේ යෙදී ඇති අතර ඔහුට එරෙහිව අධිකරණවල නඩු විභාග වෙමින් පවතින බව පොලිසිය පවසයි. සැකකරු සම්බන්ධයෙන් දීර්ඝ විමර්ශණයක් සිදුකිරීමෙන් අනතුරුව ඔහු සහ ගෝලයා අත්අඩංගුවට ගෙන ඇති අතර මොවුන් දෙදෙනාම බොරැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවන් වෙති.

ප්‍රධාන සැකකරු මහා පරිමාණයෙන් උම්බලකඩ ව්‍යාපාරයේ නිරත වන්නෙකු බවත් එලෙස උම්බලකඩ ව්‍යාපාරයේ නිරතවන අතරතුර එයට මුවාවී හෙරොයින් ජාවාරම සිදුකර ඇති බව විමර්ශන වලදී අනාවරණය වී තිබේ.

අත්අඩංගුවට ගත් සැකකරුවන් රඳවාගැනීමේ නියෝග ලබාගෙන වැඩිදුර ප්‍රශ්න කිරීමට නියමිතය.

# රථවාහන අනතුරු වළක්වන්න පූර්ණ බලැති ආයතනයක්

**ධනුෂ්ක ගොඩකුඹුර**

දිනෙන් දින ඉහළ යන රථවාහන අනතුරු වළක්වාලීමේ අරමුණෙන් පූර්ණ බලැති ව්‍යවස්ථාපිත ආයතනයක් ස්ථාපිත කිරීම කෙරෙහි රජයේ අවධානය යොමුව තිබේ.

ඒ අනුව මෙතෙක් ක්‍රියාත්මක "මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව" "ජාති ප්‍රවාහන සුරක්ෂාව පිළිබඳ කොමිෂන් සභාව" ලෙස විධිමත් නීතිමය රාමුවක් යටතේ ස්ථාපිත කිරීමට නියමිතය.

දිනෙන් දින බහුලව සිදුවන රථවාහන අනතුරු හේතුවෙන් මෙරට ආර්ථික සංවර්ධනයට මෙන්ම සාමාජීය සංවර්ධනයටද සෘණාත්මක බලපෑමක් එල්ල වීම හේතුවෙන් රජය මේ තීන්දුවට එළැඹ තිබේ.

මෙම රථවාහන අනතුරු වළක්වාලීම, අවම කරලීම සහ අනතුරු හේතුවෙන් උද්ගතවී ඇති ගැටලුවලට මැදිහත්වීම මේ ආයතනය ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණු අතර වන බව රජයේ ප්‍රකාශකයකු දිනමිණට පැවසීය.

# ඇෆ්ලටොක්සීන් අඩංගු තෙල් තොගයක් ආපසු යවයි







**සුභාෂිණී සේනානායක, භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

මැලේසියාවේ සිට මෙරටට ආනයනය කර තිබු ඇෆ්ලටොක්සීන් නමැති පිළිකා කාරකය අඩංගු පොල්තෙල් තොගය ප්‍රතිඅපනයනය කිරීම සඳහා කොළඹ වරායේ SAGT පර්යන්තයේ නවතා ඇති බාවරා නෞකාවට පැටවීම ඊයේ (12) පෙරවරුවේ ආරම්භ කළ අතර පස්වරු 5 ට එම නෞකාව මැලේසියාව දක්වා ගමන් ආරම්භ කළේය.

එලෙස ප්‍රතිඅපනයනය කෙරෙන්නේ කටාන රිෆයිනරීස් සමාගමට අයත් පොල්තෙල් අඩංගු බහාලුම් 6කි.

එම පොල්තෙල් තොගය අප්‍රේල් මස 6 වන දින ආනයනයකරුගේ පෞද්ගලික ගුදමේ සිට කොළඹ වරායේ SAGT පර්යන්තය වෙත රේගු නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ රැගෙන විත් තිබිණි.

ප්‍රතිනැව්ගත කිරීම අධීක්ෂණය කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්, විශ්‍රාමික මේජර් ජෙනරාල් විජිත රවිප්‍රිය මහතාගේ උපදෙස් මත, රේගු නිවාරණ අංශයේ සහ රේගු මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශයේ නිලධාරීහු පිරිසක් කොළඹ වරායේ SAGT පර්යන්තය වෙත පැමිණ සිටියහ.

මෙම පොල්තෙල් තොගයේ වටිනාකම රුපියල් කෝටා 3කට අධික වන අතර පොල්තෙල් කිලෝ 105000 ක් මෙම බාහලුම්වල අඩංගු වේ.





# ආණ්ඩුව අධිකරණය තමන්ට අවැසි පරිදි හසුරුවනවා

## අනුර කුමාර දිසානායක



**නදී මාණික්කගේ**

මෙරට ආණ්ඩුව විසින් අධිකරණය තමන්ට අනුව හසුරුවාගත හැකි මධ්‍යස්ථානයක් බවට පත්කරගෙන අවසන් බව ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක මහතා ඊයේ (12) පැවති මාධ්‍ය හමුවේදී කියා සිටියේය.

20 වැනි සංශෝධනය මඟින් ජනාධිපතිවරයාට බලය එක්රැස් කරගනු ලැබුවේ මෙවන් කාරණාවන්ට බවත් ලංකාවට අදාළ සියලු නීති උල්ලංඝනය කරමින් චීන රජයට හා චීන හාබර් සමාගමට අවශ්‍ය පරිදි ප්‍රාන්තයක් ගොඩ නැඟීම සඳහා නීතී සකස් කර ඇති බවත් හෙතෙම පැවසුවේය.

ආණ්ඩුවට සම්බන්ධ අයගේ හා හිතවතුන්ගේ නඩු 70කට වැඩි සංඛ්‍යාවක් ඉවත් කිරීමට අදාළ නිර්දේශ ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවට එවා තිබෙන අතර ජනාධිපතිවරයා වෙනුවෙන් අගමැතිවරයා විසින් ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ බවත් දූෂණ, හොරකම් හා අපරාධ සම්බන්ධ නඩු ඉවත් කිරීමට මෙයින් යෝජනා කර තිබෙන බවත් පැවසූ ඒ මහතා 2/3ක බලයක් ආණ්ඩුවට දුන්නේ මේ වෙනුවෙන්දැයි ජනතාවගෙන් අසා සිටින බව කීවේය.

## 01 වැනි පිටුවෙන්...

### කෝටි 100ක අයිස් ...

ජා-ඇළ ප්‍රදේශයේදී පෙරේදා (11) අත්අඩංගුවට ගත් පුද්ගලයන් සිව් දෙනාගෙන් සිදු කළ ප්‍රශ්න කිරීම්වලදී හෙළි වූ තොරතුරුවලට අනුව මේ අයිස් තොගය අත්අඩංගුවට ගත් බව පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ ඉහළ නිලධාරියෙක් පැවැසීය. ඔවුන් සතුව තිබී රුපියල් කෝටි 13 අධික අයිස් මත්ද්‍රව්‍ය කිලෝ 13ක් අතංඅඩංගුවට ගත් බවත් මෙම ජවාරමට එකම පවුලේ මව පියා සහ දරුවන් දෙදෙනකු හවුල් බව සිදු කළ විමර්ශන අනාවරණය කළ බව කියා සිටි පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය ඔවුන්ගෙන් දීර්ඝ ලෙස සිදු කළ ප්‍රශ්න කිරීම්වලදී මෙම අයිස් කිලෝ 100 සොයා ගත් බවත් කියා සිටියේය.

එම වැටලීමේදී අයිස් ඇතුළත් මත්ද්‍රව්‍ය පාර්සල් 91ක් අත්අඩංගුවට ගෙන ඇති අතර එහි අයිස් කිලෝ 100ට වඩා වැඩි ප්‍රමාණයක් ඇති බවත් මෙම ජවාරම පිටිපස සිටන්නන් සොයා මෙහෙයුම් ක්‍රියාත්මක බවත් පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය කියා සිටි අතර පසුගිය දින දෙක තුළ කොළඹ අවටින් අවස්ථා දෙකකදී අයිස් මත්ද්‍රව්‍ය කිලෝ 113ක් අතංඅඩංගුවට ගැනීමට හැකි වූ බවත් කියා සිටියේය.

මෙම මත්ද්‍රව්‍ය ජාලයේ සුලමුල සොයා විමර්ශන සිදු කරන බවත් ඔවුනගේ ප්‍රකාශ ලබා ගැනීමෙන් අනතුරුව අධිකරණය හමුවට ඉදිරිපත් කරන බවත් එහි උසස් නිලධාරියක් කියා සිටියේය.

## 01 වැනි පිටුවෙන්...

### සංස්කෘතිකමය ...

වසර දහස් ගණනක් තිස්සේ මෙරට ජනතාව ඉමහත් උත්කර්ෂවත් ලෙස මේ මහා සංස්කෘතික මංගල්‍යය සැමරූ අතර එක් අතකින් ජාතික සමගියේත් තවත් අතකින් සහජීවනය සහෝදරත්වය බෙදාහදා ගැනීම වැනි යහ සංකල්ප කුළුගන්වන උත්සවයක් ලෙසත් අලුත් අවුරුද්ද විශේෂිත වෙයි.

මානවයා සහ සොබාදහම අතර පවතින්නේ අන්‍යෝන්‍ය බැඳීමක් මෙන්ම අන්‍යෝන්‍ය අරගලය කි.එම අරගලය තුළ මානවයා තාවකාලික ජයග්‍රහණයක් අත්පත් කරගෙන ඇතත් සොබාදහමට සමීපවීම මිස සොබාදහමින් දුරස් වීම මානව වංශකතාවේ පැවැත්මට හිතසුව පිණිස නොවන බව අදවනවිට වෙන කවරදාටත් වඩා තිර ලෙස සනාථ වී තිබේ.

එබැවින් සොබාදහම සමග වන ජීවිතයේ වටිනාකම ඉස්මතු කරන සිංහල අලුත් අවුරුද්ද වැනි සංස්කෘතිකමය උත්සව අවශ්‍යයෙන්ම සමාජයටත් ලෝකයටත් ආශිර්වාදයක් වෙයි . සොබාදහමේ ආශිර්වාදයෙන් තමන් උපයා සපයාගත් ධන ධාන්‍යවල අග්‍රඵලය බුදුන්,දෙවියන් වෙත පූජා කරමින්ද, ලෝකයේ පැවැත්මෙහි තීරණාත්මක මෙහෙවර ඉටු කරන සූර්යයාට කළගුණ දැක්වීමද චිරාත් කාලයක් මුළුල්ලේ ශ්‍රී ලාංකිකයන් සිදු කළ සහ සිදු කරන පුණ්‍ය ක්‍රියාවකි.

මෙවරද,සිංහල අලුත් අවුරුද්ද උදා වූයේ කොහාගේ හඬින් නොව කොරෝනාවෙන් ප්‍රවේසම් වන්න යැයි කරනු ලබන නිවේදනවල හඬිනි.සශ්‍රීකත්වයේ පාඩම කියා දෙන සුවිශේෂී උත්සවයක් වන අලුත් අවුරුද්ද මෙවර උදාවූයේ පිරිසිදු කෑම වේලක් පිස ගැනීමේ දෙගිඩියාව තුළ පවා පුරවැසියන් ව කොටු කරමිනි.

දෙවසරක් තිස්සේ ලෝකවාසී සියලු දෙනා මුව ආවරණ පැලද ජීවත් වන අතර ඊට හේතු වූ වයිරසය පරාජය කිරීමට මෙතෙක් කිසිවෙකු සමත්ව නැත.අභාග්‍යසම්පන්න කාලසමයක් තුල සකල ලෝකවාසීන්ටම අලුතින් සිතිය යුතු පාඩම සොබාදහම විසින් නිහඬවම කියාදී ඇත.

මෙවන් තත්ත්වයක් තුළ මෙවරද සිංහල හින්දු අලුත් අවුරුද්ද උදාවී ඇති අතර, මිනිස් සංහතියට යහපත,උදා කරන ශ්‍රී සුබ අලුත් අවුරුද්දක්ම වේවායි ඉතසිතින් ප්‍රාර්ථනා කරමි.

### සතොස ...

රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුව මිල අඩු කිරීම් සහ පාලන මිල පැනවීම්වලට අනුකූලවීමට සිදුවීම මෙන්ම සැපයුම්කරුවන්ට ගෙවීමට ඇති විශාල ණය බරද හේතුවෙන් 2017-2019 කාලය තුළ රුපියල් කෝටි 41.7ක බදු හිඟයක්ද පවතින බව රජයේ ආරංචි මාර්ගයක් හෙළි කළේය.

එසේම ලංකා සතොස සමාගම මාසිකව රුපියල් කෝටි 7.7ක මුදලක් ණය පියවීම සඳහා වැය කළ යුතු අතර ඉන් රුපියල් කෝටි 5ක් ණය වාරික ලෙසත් ඉතිරි රුපියල් කෝටි 2.7 පොලී මුදල් ලෙසත් ගෙවිය යුතු වේ.

2020 මාර්තු මස 18 වැනි දින සිට 2020 අප්‍රේල් මස 29 වැනි දින දක්වා සහන මිලට ටින් මාළු ලබාදීම නිසා සතොසට ලැබිය යුතු රුපියල් කෝටි 4.2ක මුදල මේ දක්වා ලැබී නොමැති අතර කොවිඩ් වසංගත කාලයේ සේවකයන් සේවයේ යෙදවීම වෙනුවෙන්ද රුපියල් කෝටි 24.7ක් වැය කර තිබේ.

### NGOවලට තහනම් 2ක් ...

මෙලෙස මුදල් ලැබී ඇති ආකාරය පිළිබඳව කිසිදු තොරතුරක් රජයට දන්වා නොතිබාණි.

ඉස්ලාමීය සංවිධාන 32කට සහ උතුරේ බෙදුම්වාදී සංවිධාන 11කට පමණ විදේශ් මුදල් ලැබෙන බවට ආරක්ෂක අංශ විසින් අනාවරණය කර ගෙන ඇත.

**කෘතඥතාවයයි**



මාගේ ආදරණීය ස්වාමිපුරුෂයා වූ V. ශිවඥානසෝති මහත්මයාගේ වියෝව සිදුවූ දින සිට අපට කරුණාව, සංවේගය, සහාය දැක්වූ සියලුම දෙනාට මාගේ හෘදයාංගම ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කරගනිමි.

අවමංගල උත්සවයට සහභාගී වූ සැමටත්, අපට සංවේගය පළකරමින් පණිවිඩ / මල් වඩම් එවූ සැමටත්, V. ශිවඥානසෝති මහත්මයාගේ උතුම් ගුණ වර්ණනා කරමින් ගුණ කථන පැවැත්වූ සැමටත් මේ අවස්ථාවේදී කෘතගුණ පූර්වකව ස්තුතිය පළ කරමි.

පුද්ගලිකව සැමට ස්තුති කිරීමට නොහැකි වීම ගැන බෙහෙවින් කණගාටු වෙමි.

**මීට සංවේගයට පත්,**
**බිරිඳ,**
**සොහොයුරන් ඇතුළු පවුලේ සැම.**

### අවුරුදු ප්‍රීතිය ...

නැවුම් බලාපොරොත්තු සහ ඒවා සඵල කර ගැනීමේ අධිෂ්ඨානය සමග සිංහල දෙමළ අලුත් අවුරුදු උදාව පිළිගැනීම අපේ සංස්කෘතියෙහි අගනා සම්ප්‍රදායක් බව ජනාධිපතිවරයා නිකුත් කළ පණිවිඩයේ සඳහන් වේ.

ජනාධිපතිවරයා නිකුත් කළ පණිවිඩයේ වැඩදුරටත් මෙසේ සඳහන් වේ.

අලුත් අවුරුදු උදාව දෙස මහත් උද්යෝගයෙන් බලා සිටින කුඩා දූ දරුවන්ගේ සේම සියලු රටවැසියන්ගේ ද අපේක්ෂා සැබෑවීමකි.

සිංහල දෙමළ අලුත් අවුරුද්ද අපේ සංස්කෘතික මහා මංගල්‍යයයි. රටවැසියන් එකම නැකතකට අලුත් අවුරුදු චාරිත්‍ර ඉටු කිරීමෙන් ලැබුවා වූ වසරේ සෞභාග්‍යය උදාවනු ඇතැයි අප සිත් සතන්හි බලවත් විශ්වාසයක් පැලපදියම්ව තිබේ.

කුඩා දරු දැරියන් උද්දාමයට පත් කරන අලුත් අවුරුදු ඇඳුම්, ආහාර පාන සහ කෙළි සෙල්ලම් දෙස බලා සිටින වැඩිහිටියන් භුක්තිවිඳින්නේ අප්‍රමාණ සතුටකි. එසේම පරිසරයේ ඇතිවන සොඳුරු වෙනස්කම් අපට කායික මානසික සැනසීම ගෙන දෙයි.

සංකීර්ණ සිතුවිලි සමග ජීවන අරගලයක නිරත වැඩිහිටියන් ඔවුනොවුන් අතර නොහොඳ නෝක්කාඩු සමනය කර ගැනීම ද අවුරුදු සමයේ විශිෂ්ට ලක්ෂණයකි.

සමස්ත ජනතාව කිසිදු භේදයකින්, වෙනසකින් තොරව සෞම්‍ය හා දැහැමි සිතිවිලි ඇතිව සිංහල දෙමළ අලුත් අවුරුදු චාරිත්‍ර සමග එක්වනු දැකීම මගේ අපේක්ෂාවයි. අලුත් අවුරුදු සමයේ දූ දරුවන්ගෙන් ඈත්ව රාජකාරියෙහි නිරත හා විදෙස්ගත සැම, කරන කැප කිරීම ද මම ගෞරවයෙන් සිහිපත් කරමි.

උදා වූ සිංහල දෙමළ අලුත් අවුරුද්ද සැමට සෞභාග්‍යය, මනා සෞඛ්‍යය සහ සතුට සපිරි සුබ අවුරුද්දක් වේවා!

### සියලු දෙනාගේ ...

අලුත් වන සිතුම් පැතුම් සමග අප හමුවේ ඇති අභියෝගයන් ද සැලකිල්ලට ගනිමින් සෞභාග්‍යයමත් දේශයක් උදෙසා නව මාවතක ගමන් කිරීමට කාලය එළැඹ ඇති බව අගමැතිවරයා එම පණිවුඩයෙන් පෙන්වා දෙයි.

එම පණිවිඩයේ මෙසේද සඳහන් වේ.

සමස්ත ශ්‍රී ලාංකේයන්ගේ නැවුම් බලාපොරොත්තු ඉටුවන සිංහල හින්දු අලුත් අවුරුද්දක උදාව නිමිත්තෙන් සුභාශිංසන පළ කරනුයේ ඉමහත් සතුටිනි. අපේ රටේ ජනතාව අනාදිමත් කාලයක සිට හෙළ චාරිත්‍ර වාරිත්‍රවලට මුල් තැන දෙමින් හෙළයේ මහා සංස්කෘතික මංගල්‍යය සමඟ එක් වෙති.

ගොවිතැන මූලික හරය කරගනිමින් මිනිසුන් අතර බැඳී පවතින සංස්කෘතිකමය වටිනාකමකින් යුතු සමාජ පිළිවෙත් අලුත් අවුරුද්ද සමඟ යළි සිහිපත් වේ.රජය දුන් සෞඛ්‍ය උපදෙස් පිළිපදිමින් විනය ගරුක ජනතාවක් ලෙස ඔබ කළ කැපකිරීම නිසා, අලුත් අවුරුද්ද මේ තරමින් හෝ නිදහසේ සැමරීමට අවස්ථාව උදා වී තිබේ.

එබැවින් සෞඛ්‍ය පිළිවෙත් සිහි තබාගනිමින් සංස්කෘතිමය වටිනාකම් රැක ගැනීම අප සියලු දෙනාගේ වගකීමකි.

ඒ සඳහා එකිනෙකා අතර බැඳීම් ශක්තිමත් කර ගනිමින් ශ්‍රී ලාංකේය ජාතියක් ලෙස ලොව ඉදිරියේ නව ජවයකින් නැගී සිටීමට මෙවර අලුත් අවුරුදු උදාවේදී අපි සියලු දෙනා අදිටන් කරගමු.

ඔබ සැමට සෞභාග්‍යමත් සුබ අලුත් අවුරුද්දක් වේවා ! යැයි මම ප්‍රාර්ථනා කරමි.

### පොල්තෙල්-වියළි මිරිස් ...

බොහෝ ආනයනික භාණ්ඩ රඳවාගැනීමට රේගුවේ ගුදම් පහසුකම් සීමාසහිත වීම නිසා තත්ත්ව සහතිකය ලැබෙන තෙක් ආනයනකරුගේ ගබඩාවලට මුදාහැරීම සිදු කරමින් සිටින බව කියා සිටි ඒ මහතා 'ඇෆ්ලටොක්සීන්' සහිත පොල්තෙල් ප්‍රශ්නය හේතුවෙන් මෙම තීරණය ගත් බව කියා සිටියේය.

මේ අනුව මෙරටට ගෙන්වන පොල්තෙල් සහ වියළි මිරිස් රේගු අංගනවල බහා තබන බවත් කඩිනමින් ප්‍රමිති සහතික ගෙන්වා ගැනීමට කටයුතු කරන බවත් කියා සිටි ඒ මහතා ඉන් අනතුරුව එම භාණ්ඩ මුදා හරින බවත් කියා සිටියේය.

### පාසල් සිසුන්ට ...

කර්මාන්ත හා සැපයුම් කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි දේශීය රෙදිපිළි නිෂ්පාදකයන් වෙතින් පමණක් ප්‍රසම්පාදනය සිදු කර ඒ අතරින් පාසැල් නිල ඇඳුම් සැපයුම් කරුවන් තෝරාගැනීමට රජය තීරණය කර ඇත.

රජයේ හා රජයේ ආධාර ලබන පාසැල්වල සිසු දරුදැරියන්ට සහ දිවයිනේ රජයේ අනුමත පිරිවෙන්වල ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලාට සහ ගිහි සිසුනට නොමිලේ පාසැල් නිල ඇඳුම් ලබා දීම 1993 වර්ෂයේ සිට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අඛණ්ඩව සිදුකර තිබේ.

### බස්නාහිර විශේෂ මෙහෙයුමකින්...

පෙරේදා (11) උදෑසන 10.00 සිට සවස 5.00 දක්වා කාලය තුළ එම විශේෂ මෙහෙයුම සිදු කිරීමේදී මෙම පිරිස අත්අඩංගුවට ගත් බව පොලීසිය පැවසීය. එමෙන්ම ඉදිරි දින කිහිපය තුළ විශේෂ සෝදිසි මෙහෙයුම් රැසක් රට පුරා ක්‍රියාත්මක කෙරෙන බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති, නීතිඥ අජිත් රෝහණ මහතා පැවැසීය.

# අලුත් අවුරුදු සුබ පැතුම්

## ශ්‍රී ලාංකිකයන් ලෙස නැඟී සිටීමට නව වසරේ සියලු දෙනාට ශක්තිය ධෛර්ය ලැබේවා !

### අස්ගිරි පාර්ශ්වයේ අනුනායක වේඩරුවේ උපාලි අනුනාහිමියෝ කියති

**අසේල කුරුළුවංශ**

රෝග බිය තුරන්ව ගොස් ජාති, ආගම් භේදයෙන් තොරව ශ්‍රී ලාංකිකයන් ලෙස නැඟී සිටීමට නව වසරේ සියලු දෙනාට ශක්තිය ධෛර්යය ලැබේවායි අස්ගිරි පාර්ශ්වයේ අනුනායක වේඩරුවේ උපාලි අනු නාහිමියෝ පවසති.


නව වසර වෙනුවෙන් සුභාශිංසන එක් කරමින් උන්වහන්සේ මේ බව ප්‍රකාශ කළහ.

එළඹෙන නව වසර ශ්‍රී ලාංකික අපට ඉතාමත්ම තීරණාත්මක එකක් බවත් ආර්ථික අතින් නැඟී සිටීමට වෙර දරන අතර ජාත්‍යන්තරයෙන් එල්ල වන අභියෝගවලටද මුහුණ දීමට සිදුව තිබෙනවා.

මෙම අභියෝගවලට සාර්ථකව මුහුණ දී ජය ගැනීමට නම් ජාති, ආගම්, පක්ෂ භේදයෙන් තොරව සියලු ජනතාව එකට එකතු විය යුතු බව අනුනාහිමියෝ අවධාරණය කළහ.

කොවිඩ් වසංගත තත්ත්වයත් සමඟ ජනතාවට පසුගිය වසරේදී ද රිසි සේ අලුත් අවුරුද්ද සැමරීමට නොහැකි වුණා. ඒ නිසා මෙවර අලුත් අවුරුද්ද උත්සවකාරයෙන් සැමරීමට ඇතමුන් උත්සහ කරන බවක් පෙනෙන්නට තිබෙනවා. පවතින අවධානම් තත්ත්වය තේරුම් ගෙන කටයුතු කිරීම වැදගත්.

කොවිඩ් වසංගතය තවමත් සියයට සීයයක්ම පාලනය වී නොමැති බැවින් අලුත් අවුරුද්ද සැමරිය යුත්තේ අවුරුද්දෙන් පසුව රට කොවිඩ් අවධානමකට පත් නොවන ආකාරයට බව ද උපාලි නාහිමියෝ පවසති.



## සෞඛ්‍ය පිළිවෙත් පිළිගනිමින් අලුත් අවුරුද්ද සමරමු

### මල්වතු පාර්ශ්වයේ අනුනායක දිඹුල්කුඹුරේ විමලධම්ම අනුනාහිමියෝ කියති

**අසේල කුරුළුවංශ**

හෙළ සිරිත් විරිත් රැක ගනිමින් උදාවන සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සාමයෙන් හා සමගියෙන් යුතුව සැමරීමට සියලු දෙනා පියවර ගත යුතු බව මල්වතු පාර්ශ්වයේ අනුනායක දිඹුල්කුඹුරේ විමලධම්ම අනු නාහිමියෝ පවසති.

එම පණිවිඩයේ මෙසේද සඳහන් වේ.

කොවිඩ් වසංගත තත්ත්වය තවමත් සම්පූර්ණයෙන් පහව ගොස් නොමැති නිසා වෙනදා මෙන් නිදහසේ අලුත් අවුරුද්ද සැමරීමට පසුබිමක් රටේ නොමැති බව සියලු දෙනා අවබෝධ කරගත යුතු බවද උන්වහන්සේ පවසති.

පසුගිය වසරේ අලුත් අවුරුද්ද සැමරීමට නොහැකි වූ නිසා මෙවර සිංහල හා දෙමළ ජනතාව නව වසරේ උදාව සමරන්නට මහත් උනන්දුවක් දක්වන බවත් සෞඛ්‍ය නිර්දේශ අමතක කර කටයුතු කරන්නට යෑමෙන් අප නොදැනුවත්වම බලවත් අනතුරකට පත්වීමේ අවධානමක් පවතින බවත් අනුනාහිමියෝ ප්‍රකාශ කළහ.

රටක් ඉදිරියට ගමන් ගැනීමට නම් සියලු දෙනා පක්ෂ,පාට,ජාති,ආගම් බේද නොසලකා එකට එක්ව කටයුතු කිරීම වැදගත් බවත් ජාතික හා ආගමික සමගිය ගොඩනැගෙන ලෙස සියලු දෙනා නව වසරේදී කටයුතු කිරීමට අධිෂ්ඨාන කරගත යුතු බවත් උන්වහන්සේ පැවසූහ.



## මෙවර අලුත් අවුරුද්ද සමස්ත ලෝකයටම ආදර්ශයක්

### ඇමැති, ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල

මෙවර අලුත් අවුරුද්ද මඟින් සමස්ත ලෝකයටම මහා ආදර්ශයක් අපට ලබා දිය හැකි යැයි අලුත් අවුරුදු පණිවිඩයක් නිකුත් කරමින් ජනමාධ්‍ය ඇමැති, කැබිනට් ප්‍රකාශක, ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා පවසයි.

එම පණිවිඩයේ මෙසේ සඳහාන් වෙයි.



සමස්ත ලෝකයම ව්‍යසනයක භීතියෙන් වෙලී සිටියදී ජාතියක් ලෙස සියලු අභියෝග එකිනෙක ජය ගනිමින් මෙවර අලුත් අවුරුද්ද සැමරීම හැකි වී තිබේ.

ලොව බොහෝ රටවල් තවමත් මරණයේ භීතියෙන් වෙළී යද්දී අභියෝගයන්ට අභියෝගාත්මකව මුහුණ දෙමින් රට සාර්ථකත්වයකට ගෙන ඒමට හැකිවීම ජනාධිපතිතුමන් අගමැතිතුමන් ප්‍රමුඛ වත්මන් ආණ්ඩුව මෙරට ජනතාවට ලබාදී ඇති ඉහළම අවුරුදු ත්‍යාගයයි.

වාර්ෂික සූරිය සංක්‍රාන්තියත් සමඟ එළඹෙන අලුත් අවුරුද්ද සාමූහිකත්වයත් අන්‍යෝන්‍ය සබඳතා වර්ධනයත් සැමරීමට මෙරට ජනතාවට හැකිව තිබෙනවා.

එහෙත් අද වන විට රට යම් යහපත් තත්ත්වයකට සැකසෙමින් ජනතාවට අලුත් අවුරුදු සැමරීමට හැකි වාතාවරණයක් උදා වී තිබෙනවා.

දැඩි කැපවීමෙන් උදාකරගත් මෙම තත්ත්වය රැකගනිමින් උපරිම සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවේදයන් හා උපදෙස් අනුගමනය කරමින් මෙම අවුරුද්ද සැමරීමට සියලු දෙනා කැපවිය යුතුයි.

සිංහල දමිළ අලුත් අවුරුද්ද තුළින් සම්ප්‍රේෂණය වනුයේ පෙරදිගවාසීන් වන අපසතු උදාරත්වය, විශිෂ්ට ලෙස පිළිබිඹුවීමක්. අලුත් අවුරුද්ද යනු සැබැවින්ම අලුත් දැක්මක්, අලුත් කියවීමක්, සහිත අලුත් මිනිසකු සමාජයට පිළිගැන්වීම බව ඇමැතිවරයාගේ අවුරුදු පණිවිඩයේ සඳහාන් වේ.

## ලාංකික ජන සමාජය තුළ ආකල්පමය පරිවර්තනයක් ඇති වේවා !

### රාජ්‍ය ඇමැති අනුරාධ ජයරත්න

ලාංකික ජන සමාජය තුළ ආකල්පමය පරිවර්තනයක් ඇති කිරීමට හැකි නීරෝගිමත් නව වසරක් උදා වේවායි සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් සුබ පැතුම් පණිවිඩයක් නිකුත් කරමින් ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව් ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය ඇමැති අනුරාධ ජයරත්න මහතා පවසයි.

එම පණිවිඩයේ මෙසේ සඳහන් වේ.



සූර්ය දිව්‍යරාජයාණන්ගේ අනුහසින් පාරම්පරික සංස්කෘතික අංගයන්ගෙන් පරිපූර්ණව ජෝතිශ්‍යවේදයේ නිගමනයෙන් සිංහල හා හින්දු අලුත් අවුරුද්ද උදා වන බවත් සූර්යා මීන රාශියේ සිට මේෂ රාශියට පැමිණීමත් නිවැරදි නැකැත් භාවිතයත් ඒ අනුව නිවැරදි චාරිත්‍ර සිදු කිරීමත් තුළ ආරම්භ කරන නව අවුරුද්ද නිදුක් නිරෝගි සුවය, සාමය, සමගිය, සෞභාග්‍ය පිරි වසරක් වන බව සියලු දෙනාගේ විශ්වාසයයි.

අතීතයේ සිටම සාමාන්‍ය ජනතාවගේ මෙන්ම රජුන්ගේ පිළිවෙත ද වූයේ සොබාදහම දේවත්වයෙන් සැලකීම බව පවසන රාජ්‍ය ඇමැතිවරයා වසන්ත ශ්‍රියෙන් හැඩ වී සොබාදහම අලුත් වෙමින් එළැබෙන සිංහල දමිළ අලුත් අවුරුද්ද ජාති ආගම් බේදයෙන් තොරව එක් වී සැමරිය යුතුයි.

ශ්‍රී ලාංකිකයන් වශයෙන් උදා වන අලුත් අවුරුද්දේ අප සියලු දෙනාගේ සුබවාදී ආකල්පමය පරිවර්තනයක් ලාංකීය ජන සමාජය තුළ ඇති කිරීමටත් වග බලා ගනිමින් නිදුක් නිරෝගි සුවදායි සංවර්ධනයෙන් පිරිපුන් සුබම සුව අලුත් අවුරුද්දක් වේවා යන්න මාගේ ප්‍රාර්ථනයයි.

## ජාතියේ අභිලාෂයන් ඉටු කරලීමට අර්ථාන්විතව - සවිමත්ව පෙළගැසෙමු

### ඇමැති විමල් වීරවංශ

ජාතියේ අභිලාෂයන් ඉටු කරලීමට අර්ථාන්විතව සහ සවිමත්ව පෙළගැසෙමු යනුවෙන් අලුත් අවුරුදු සුබ පැතුම් එක්කරමින් ජාතික නිදහස් පෙරමුණේ නායක සහ කර්මාන්ත ඇමැති විමල් වීරවංශ මහතා පවසයි.

එම සුබ පැතුම් පණිවිඩයේ මෙසේද සඳහන් වේ.

සිංහල - බෞද්ධ සහ දෙමළ - හින්දු ජන කොටස් පමණක් නොව මුළුමහත් ලාංකේය ජාතියම ඒකාත්මික කෙරෙන තවත් ජාතික අලුත් අවුරුද්දක් අදට (14) යෙදී තිබේ. ලොව පුරා පැතිර ගිය කොරෝනා වසංගතය හේතුවෙන් ගෙවී ගිය වසරේ ජාතියක් ලෙස අපට අපගේ ශිෂ්ටාචාර ගත උරුමයන් සිහිපත් කර දෙන ඒ මහා සංස්කෘතික උලෙළේ අසිරිය විඳ ගත නොහැකි විය. 2019 වසරේ ලැබුවා වූ ජාතික අලුත් අවුරුද්ද ගෙන ආ ප්‍රබෝධය උදුරා ගනු ලැබුවේ පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය විසිනි. ලොවටම ආදර්ශයක් වෙමින් කොරෝනා වසංගතය ශ්‍රී ලංකාව තුළ සාර්ථකව පාලනය කිරීමට හැකි වීම හේතුවෙන් වසර කිහිපයකට පසුව අපට ජාතියක් ලෙස අවුරුදු උලෙළක අසිරිය විඳ ගැනීමේ භාග්‍යය උදා වී තිබේ.



අප ඉදිරියේ මේ වසරේ රටක් ලෙස ඇත්තේ අභියෝග රැසකි. එක් පසෙකින් ජාතියට ඉස්ලාම් අන්තවාදය එල්ල කොට ඇති අභියෝගයට මුහුණ දීමට සිදුව තිබේ. අප ආණ්ඩුව ලෙස කටයුතු කරමින් සිටින්නේ ජාතියට කවර ආකාරයකවත් මර බියක්, ත්‍රස්තවාදයක් ඇති නොවන ලෙස අවශ්‍ය පියවර ගනිමිනි. දේශයේ දූ පුතුන් රැකියා වියුක්තියෙන් මුදවා ගනිමින් උපාධිධාරීන් පමණක් නොව අවම අධ්‍යාපන සුදුසුකම් සහිත වූවන් ද ඇතුළු ලක්ෂ එකහමාරක පමණ පිරිස රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන්නේ ද මේ වසරේ ය. ඒ තුළින් රාජ්‍ය අංශයේ මැදිහත්වීමෙන් කඩිනම් ග්‍රාමීය සංවර්ධනයක් අපේක්ෂා කළ හැකිය.

මිලේනියම් චැලේන්ජ් කෝපරේෂන් වැනි රටට සතුරු ගිවිසුම් අවලංගු කරමින් ද ජිනීවා මානව හිමිකම් උගුලට පය නොතබමින් ද යන අපේ ආණ්ඩුව මේ රටේ ස්වෛරීත්වය තහවුරු කර දෙමින් සිටියි. නමුත් මෙවැනි සාර්ථක ගමනක් යමින් සිටින විට දෙස් විදෙස් කුමන්ත්‍රණකාරී බලවේග එම ගමන අනෙක් පසට හැරවීමේ උත්සාහයක නිරතව සිටියි.

'රටේ සම්පත් විකිණීම, රාජ්‍ය නායකයාගේ නාස්තිය' ආදී චෝදනා නොමැති ආණ්ඩුවක් බිහිව ඇති මොහොතක බංකොලොත් බලවේග, ආනයනික පොල්තෙල්වල පිළිකාකාරක සංයෝග ඇති බව ආණ්ඩුව මැදිහත් වී හඳුනාගත් පසුව හැසිරෙන්නේ මෙම උත්සව සමයේ 'කැවුම් - කොකිස්' බැදීම පිළිබඳ ඉමහත් භීතිකාවක් මවමිනි. මේ බංකොලොත්, රටට එරෙහි බලවේගවලට ආණ්ඩුවට එරෙහිව අවි අමෝරා ගැනීමට ප්‍රබල මාතෘකා නොමැති පැයක ඔවුන් දුබල මාතෘකා අල්ලාගෙන විකාරරූපී රංගනයන්හි යෙදෙන බව ද මේ මොහොතේ රටට හිතැති සියලු දෙනාට සිහිපත් කළ යුතුව ඇත.

මේ රටේ අතිමහත් පොදු ජනතාව ඉතා බලවත් බලාපොරොත්තු පෙරදැරි කරගනිමින් ගොඩනගාදුන් ගමනක් ජාතියක් ලෙස අපට ඇති බවත් එහි අඩුපාඩු නැති කොට වඩා සවිමත්ව ඉදිරියට යාමේ වගකීම ආණ්ඩුව ලෙස අප සතු බවත් ජාතියට සිහිපත් කරන අතර කර්මාන්ත ඇමැතිවරයා ලෙස මේඩ් ඉන් ශ්‍රී ලංකා සන්නාමය බලගන්වන්නේ ද ඉහත ගමන අර්ථාන්විත සහ බලසම්පන්න කිරීමට බවත් සඳහන් කරනු කැමැත්තෙමි.

## අලුත් අවුරුදු සංස්කෘතික උත්සවය ශ්‍රී ලාංකික අපට ඉතා වැදගත්

### ජනතා විමුක්ති පෙරමුණ

කොවිඩ් 19 වසංගත තත්ත්වය තවමත් පහව නොගිය පසුබිමක ලාංකේය ජනතාවගෙන් වැඩිම පිරිසක් මහත් උත්සවාකාරයෙන් සමරන මෙම අලුත් අවුරුදු සංස්කෘතික උත්සවය ශ්‍රී ලාංකික අපට ඉතා වැදගත් බව අලුත් අවුරුදු පණිවුඩයක් නිකුත් කරමින් ජනතා විමුක්ති පෙරමුණ පවසයි.

එම අලුත් අවුරුදු පණිවිඩයේ මෙසේද සඳහාන් වෙයි.

සාම්ප්‍රදායික ජ්‍යොතිෂය විශ්වාසය අනුව අලුත් අවුරුදු උදාව ලෙස සැලකෙන්නේ, සූර්යා මීන රාශියේ සිට මේෂ රාශියට මාරු වෙමින් චක්‍රයක් සම්පූර්ණ කිරීමය. සෑම අතකින්ම අලුත් බව හා බැඳෙන බවට විශ්වාසය කෙරෙන නව අවුරුදු උත්සවය මෙරට ජනතාවට සාධනීය ලෙස බලපාන සමාජ සංසිද්ධියක් නිර්මාණය කරනු ලබයි. නිවෙසේ ඇති ද්‍රව්‍යවල සිට පුද්ගල ජීවිතයේද පවත්වාගෙන පැමිණි අනවශ්‍ය දෑ ඉවත් කර නැවුම් බවකින් පුරවා ගැනීමට මෙන්ම මෙතෙක් තමන් ආ ගමන දෙස අලුතින් සිතා බැලීමටද එය ජනතාවට ඉඩකඩ ලබා දෙයි.

2021 සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද උදාවන්නේ, ශ්‍රී ලංකාව පමණක් නොව මුළු මහත් ලෝකයම කොරෝනා වෛරසයට මුහුණ දීමෙන් පසුව එළඹෙන දෙවැනි අවුරුදු කාලය ලෙසය. රෝගය තවමත් සමාජයේ පවතින මෙම අභියෝගකාරී වාතාවරණයක් තුළ සාම්ප්‍රදායික අලුත් අවුරුදු උත්සවවලින් ඔබ්බට යමින් සෞඛ්‍යා රක්ෂිත අවුරුදු සැමරීමට සිදුව ඇති බවට සැකයක් නැත. එහි තේරුම කොවිඩ් 19ට එරෙහිව ප්‍රමාණවත් තරම් එන්නත් කරණයක් සිදු නොවූ රටක අවුරුද්ද හා බැඳුණු සියලු ක්‍රියාකාරකම් පවුලේ සාමාජිකයන්ට හා සමීපතමයන්ට සීමා කර ගනිමින් පවත්වා ගැනීමට සිදුව ඇති බව තේරුම් ගැනීමය.

අලුත් අවුරුද්ද සැබැවින්ම සුබ වීමට අවශ්‍ය වනුයේ බහුතර ජනතාවක් තමන් එතෙක් වැළඳ ගෙන සිටි ජරාජීර්ණ ආකල්පවලින් මිදී නව ගමනක් යෑමට නව අධිෂ්ඨානයක් කුළු ගන්වා ගැනීමය. එසේම රටත් ජනතාවත් සැබෑ ජයග්‍රහණ කරා රැගෙන යන සහ නව සමාජයක් ගොඩනගන නව දේශපාලන ගමනක් වෙනුවෙන් පෙළගැසීමට එළඹෙන අලුත් අවුරුද්ද නව ජවයක් කර ගනිමු.

## පාදුක්ක සම්බන්ධීකරණ රැස්වීමට බාධා කළ අයට එරෙහිව පියවර ගන්න

### ජනපතිට ලිපියක් ලියමින් මන්ත්‍රී ජගත් කුමාර කියයි

පාදුක්ක සම්බන්ධිකරණ රැස්වීමේදී තම රාජකාරියට බාධා කිරීම, කීර්ති නාමයට හානි කිරීම, තර්ජනය කිරීම හා බිත්තර ප්‍රහාර එල්ල කිරීම පිළිබඳ අදාළ පුද්ගලයන්ට එරෙහිව විනයානුකූල පියවර ගන්නා ලෙස කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට ලිපියක් යොමු කරමින් කියා සිටී.

එම ලිපියේ තවදුරටත් මෙසේද සඳහන් වේ.

පසුගිය 07 දින පාදුක්ක සම්බන්ධීකරණ රැස්වීමේදී ඇති වූ ඉතා අශෝභන අසීලාචාර සිදුවීම පිළිබඳ ජනාධිපතිවරයාව දැනුම්වත් කිරීම හා අවශ්‍ය පියවර ගැනීම සඳහා මෙම ලිපිය ඉදිරිපත් කළ බව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වැඩිදුරටත් පැවසීය. ප්‍රාදේශීය දේශපාලනඥයන්ට එසේ හැසිරීම සඳහා ඇතැම් මැති ඇමැතිවරුන්ගේ සහය ලැබී ඇති බවද මන්ත්‍රීවරයා චෝදනා කරයි. එම අවස්ථාවේ තමා කලබලයට පත් නොවී ක්‍රියා කිරීම නිසා ගැටලුකාරී තත්ත්වයක් ඇති නොවුණ බව ද මන්ත්‍රීවරයා වැඩිදුරටත් සඳහන් කෙළේය.

## පොල්තෙල් බෝතලයක් රු.450කට මිලට ගන්න පුළුවන්

### ඇමැති, ආචාර්ය බන්දුල ගුණවර්ධන

පොල්තෙල් බෝතලයක් රුපියල් හාරසිය පනහක මිලකට සතොස හා සමුපකාර අලෙවි සල් මඟින් පාරිභෝගික ජනතාවට මිලදී ගැනීමේ අවස්ථාව දැන් උදාකර තිබෙන බව වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා පවසයි.

ඒ මහතා මේ බව සඳහන් කෙළේ ඊයේ (12) එම අමාත්‍යාංශයේ පැවැති මාධ්‍ය හමුවකට එක් වෙමිනි. සමස්ත ලංකා පාරාම්පරික පොල්තෙල් නිෂ්පාදකයන්ගේ සංගමයේ නිලධාරින්ද මේ අවස්ථාවට සිටියහ.

තවදුරටත් ඇමැතිවරයා මෙසේද පැවසීය.

පොල්තෙල් බෝතලයක් රුපියල් හාරසීය පනහේ මිල මෙමෙ වසර අවසන් වන තුරු ක්‍රියාත්මකයි.

දැනට මිල ස්ථායිකරණය කොට තිබෙන භාණ්ඩ වර්ග විසි හතක මිල තවත් මාස තුනක් සඳහා එනම් මැයි, ජූනි හා ජූලි දක්වා දීර්ඝ වෙනවා.



ප්‍රමිති ආයතනය හා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආහාර පරීක්ෂා කරන ආයතන අධීක්ෂණ කරන්න තිබෙන ප්‍රතීතන ආයතනයයි. ඒ ආයතනය මඟින් ජාත්‍යාන්තර ප්‍රමිතියෙන් යුතුව පරීක්ෂණ කරන්න ආයතන දෙකක් පිහිටුවා තිබෙනවා. ඉන් එකක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශුසම්පත් අංශයේ පරීක්ෂණාගාරයයි. රත්මලානේ තිබෙන පෞද්ගලික ආයතනය ඉදිරියේදි පාරිභෝගික අධිකාරිය හරහා කිරිපිටි, ටින් මාළු, මිරිස් ඇතුළු භාණ්ඩ වඩාත් දියුණු මට්ටමේ පරීක්ෂණයකට ලක් කර ජනතාවට ලබාදෙන්න බලාපොරොත්තු වෙනවා.

විපක්ෂය හා ඇතැම් පාර්ශ්වයන් විසින් පිළිකාකාරක ඇතුළත් විස අවුරුද්දට කැව්වා කියලා විශාල චෝදනාවක් එල්ල කරලා. ඒ නිසා අවුරුද්දට කැවුමක් බැදගන්නට හැකියාවක් නැති කළා කියලා ඉතා විශාල අසත්‍ය ප්‍රචාරයක් ගෙන යනවා. එය දැන් අසත්‍යක් බවට පත් වෙලා.

පාරිභෝගික ආරක්ෂණ,සමූපකාර,පාරිභෝගික සේවා පිළිබඳ රාජ්‍ය ඇමැති ලසන්ත අලගියවන්න මහතා-

විපක්ෂය කියනවා හිසතෙල් ගෑමත් ආණ්ඩුව නැති කළා කියලා. විපක්ෂයේ අය දන්නේ නැහැ හිස තෙල් ගාන්නේ පොල්තෙල් වලින් නොවේ කියලා. විපක්ෂයේ මේ හැසීරීම කණගාටුදායකයි.

මෙහිදි සමස්ත ලංකා පාරම්පරික පොල්තෙල් නිෂ්පාදකයන්ගේ සංගමයේ කැඳවුම්කරු බුද්ධික ද සිල්වා මහතාද අදහස් දැක්විය.

# දක්ෂතා මත පදනම්ව වැටුප් ගෙවන

# නව ක්‍රිකට් කොන්ත්‍රාත් ගිවිසුම් බංග්ලාදේශ සංචාරයට පෙර

## ලකුණු රැස් කළොත්, තරග දිනුවොත් සල්ලි ගලයි

**ප්‍රින්ස් ගුණසේකර**

ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩකයන්ට දක්ෂතා මත පදනම්ව ගෙවීම් සිදුවන ආකාරයේ නව කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කිරීම ළඟ එන බංග්ලාදේශ සංචාරයට පෙර සිදු කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් සැලසුම් කරයි. ක්‍රිකට් කළමනාකරණ කමිටු සභාපති මහාචාර්ය අර්ජුන ද සිල්වා මහතා පැවැසුවේ සිංහල හා හින්දු අවුරුද්දට පසුව නව කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කිරීමට ක්‍රීඩකයන් සමග සාකච්ඡා කරන බවය.

දක්ෂතා මත පදනම්ව ගෙවීම් සිදු වන ආකාරය පිළිබඳ නිර්දේශ අරවින්ද ද සිල්වා මහතාගේ සභාපතිත්වයෙන් යුත් ක්‍රිකට් කමිටුව ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත ලබාදී ඇති අතර, ක්‍රීඩකයන් සමග සාකච්ඡා කොට ගිවිසුම් අත්සන් කිරීමේ කටයුතු පමණක් ඉතිරිව ඇතැයි සිල්වා මහතා පැවැසීය.

නව කොන්ත්‍රාත් ගිවිසුම් අනුව තරග ජයග්‍රහණයේදී ක්‍රිකට් ක්‍රීඩකයන්ට අමතර ප්‍රසාද දීමනා හිමි වේ. එමෙන්ම පිතිකරුවන් හා පන්දු යවන්නන් දක්වන පෞද්ගලික දක්ෂතා අනුව ගෙවීම් වැඩි කරදීමට නව කොන්ත්‍රාත් ගිවිසුම අනුව සිදුවේ.

මෙතෙක් ක්‍රියාත්මක වාර්ෂික ක්‍රිකට් කොන්ත්‍රාත්තුව අනුව පළමු කාණ්ඩයට ඇතුළත් ක්‍රීඩකයකුට ඇමෙරිකානු ඩොලර් 125,000ක් (ලක්ෂ 240), දෙවැනි කාණ්ඩයේ ක්‍රීඩකයකුට ඇමෙරිකානු ඩොලර්. 80,000ක් (ලක්ෂ 154) සහ තෙවැනි කාණ්ඩයේ ක්‍රීඩකයකුට ඇමෙරිකානු ඩොලර් 60,000ක් (ලක්ෂ 116) බැගින් හිමි වේ.

ඉහත සඳහන් කළ වාර්ෂික කොන්ත්‍රාත්තුවට අමතරව ටෙස්ට් තරගයක් ක්‍රීඩා කිරීම වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර්. 5000 (ලක්ෂ 10) හිමි වන අතර, ටෙස්ට් තරගයක් ජයගතහොත් සෑම ක්‍රීඩකයකුටම ඇමෙරිකානු ඩොලර් 7500 ක් (ලක්ෂ 15) බැගින් හිමි වේ.

ශ්‍රී ලංකා ක්‍රිකට් මෙම ගෙවීම් වෙනසකට භාජනය කොට ක්‍රීඩකයන් වඩාත් දිරි ගැන්වෙන තත්ත්වයකට පරිවර්තනය කිරීමට අපේක්ෂා කළේ පසුගිය දකුණු අප්‍රිකානු හා එංගලන්ත ටෙස්ට් තරගාවලි පරාජය වීමත් සමගය.

ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම 2018 වසරේ මෙරට පැවැති එංගලන්තය සමග ටෙස්ට් තරගාවලියේ සිට ටෙස්ට් තරග 12ක් පරාජයවී තරග 2ක් ජය පරාජයෙන් තොරව නිමාකොට තරග 3කින් පමණක් ජය ලබා සිටී. 2018 වසරේ මෙරට පැවැති එංගලන්තය සමග එක්දින තරගාවලිය හා එංගලන්තයේ පැවැති ලෝක කුසලාන තරගාවලිය ද ඇතුලුව මේ දක්වා අන්තර්ජාතික එක්දින තරග 34කට සහභාගී වී ඉන් තරග 20ක් පරාජය වී ඇති අතර, ජයගෙන ඇත්තේ තරග 11ක් පමණි. තරග 3ක් විසඳුමකින් තොරව නිමාවට පත්විය.

මෑතකදී මතු වූ මෙම තත්ත්වය හේතුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රීඩකයන් ලබන වැටුපට සරිලන සේවාවක් තම රට වෙනුවෙන් සපයනවා ද යන ගැටලුව ක්‍රීඩාලෝලීන් තුළ පැන නැගී තිබූ අතර, පරිපාලනයට, තේරීම් කමිටුවට ඇතුළු අංශ ගණනාවක් වෙත චෝදනා එල්ල විය. එවන් පසුබිමක ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය දක්ෂතා මත පදනම්ව ගෙවීම් සිදු කිරීම සඳහා ක්‍රිකට් ක්‍රීඩක කොන්ත්‍රාත් ගිවිසුම සංශෝධනය කිරීමට අවධානය යොමු කළ අතර, ඒ සඳහා ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතාගේ ද අනුමැතිය හිමි විය.

## මැලේ ක්‍රිකට් සමාජයේ මුල් පුටුව රිස්වාන්ට



කොළඹ මැලේ ක්‍රිකට් ක්‍රීඩා සමාජයේ සභාපතිවරයා ලෙස රිස්වාන් බදූර්ඩීන් දෙවැනි වරටත් තේරී පත් විය. මැලේ ක්‍රිකට් සමාජයේ වාර්ෂික මහ සභාව පසුගියදා කොම්පඤ්ඤවීදියේදී පැවැත්විණි.

**නව නිලධාරි මණ්ඩලය මෙසේය.**

**සභාපති** - රිස්වාන් බදූර්ඩීන්, **උපසභාපතිවරු** - තාජ් ලන්ත්‍රා, ඉක්රාම් කුවිලාන්, උවෙයිස් සම්සුඩීන්, හුසේන් ජායා, ශානාස් බොහොරාන්, මර්ලීන් ලන්ත්‍රා, තස්ලිම් රහ්මාන්, තාරික් බූසෝ, මෙලනී සම්සුඩීන්, විශ්‍රාමික මේජර් ජෙනරාල් රොයිස්ලාන් සාලේ, විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රුවෙයිස් ලතීෆ්, සබ්රිනා ජායා, රිචී සපිඩීන්, ටී.ජේ. පකීර් අලි, **ක්‍රීඩා සමාජ නායක** - රිනාල්ඩින් රහ්මාන්, **ලේකම්** - රොෂාන් අලාන්, **උපලේකම්** - අලාම් ඔස්මාන්, **භාණ්ඩාගාරික** - ඉර්ෆාන් අලාන්, **උපභාණ්ඩාගාරික** - යසීම් සමද්.

## වෙස්ලි - බෙනඩික්ට් මංගල ක්‍රිකට් ගැටුම 23-24 දෙදින

**ෆවුස් මොහොමඩ්**

බොරැල්ල වෙස්ලි විදුහල සහ කොටහේන සාන්ත බෙනඩික්ට් විදුහල අතර, පළමුවරට පාසල් මහා ක්‍රිකට් තරගයක් සංවිධාන වී තිබේ. මේ දෙවිදුහලම අන්තර් පාසල් ක්‍රිකට් පිටියේ කැපී පෙනෙන දස්කම් පෑමට සමත් වුවත් දෙපිල අතර, කුසලානයක් වෙනුවෙන් වාර්ෂික මහා ක්‍රිකට් තරගයක් පැවැත්වෙන පළමු අවස්ථාව මෙය වේ.

දෙපිල අතර, මේ මස 23 සහ 24 දෙදින කොටහේන සාන්ත බෙනඩික්ට් විදුහල් පිටියේදී දෙදින ක්‍රිකට් තරගය පැවැත්වෙන්නේ වෙස්ලි විදුහලේ හිටපු විදුහල්පතිවරයකු වූ ජේම්ස් කාට්මන් පියතුමා නමින් නිර්මාණය කළ කුසලානය වෙනුවෙනි. අනතුරුව මැයි මස 8 වැනිදා පී. සරා ඕවල් පිටියේදී සාන්ත බෙනඩික්ට් විදුහලේ හිටපු අධ්‍යක්ෂ ලූක් ග්‍රෙගරි පියතුමා නමින් නිර්මාණය වූ කුසලානය වෙනුවෙන් එක්දින තරගයට දෙපිල එක් වෙයි.

වෙස්ලි සහ බෙන්ඩික්ට් දෙවිදුහලේ ඒකාබද්ධ කමිටුව විසින් සංවිධාන කරන මේ දෙදින හා එක්දින තරගය වාර්ෂිකව පැවැත්වෙන තරග ඉසවුවක් බවට පත් වනු ඇත. ඒ අනුව දෙදින තරගය වසරින් වසරට දෙවිදුහලට අයත් ක්‍රීඩාංගණවල පැවැත්වෙන අතර, එක්දින තරගය මධ්‍යස්ථ ක්‍රීඩාංගණයක පැවැත්වීමට තීරණය වී තිබේ. මෙවර දෙදින තරගය බෙන්ඩික්ට් විදුහලට අයත් ක්‍රීඩාංගණයේ පැවැත්වෙන අතර, ලබන වසරේදී එය වෙස්ලි විදුහල් පිලේ ක්‍රීඩාංගණය වන කැම්බල් පිටියේදී පැවැත්වෙනු ඇත.

ක්‍රිකට් ක්‍රීඩාව හරහා දෙවිදුහල අතර, සම්බන්ධතාව පුළුල් කර ගැනීමත්, සිසුන් අතර සුහදත්වය වර්ධනය කිරීමත් අරමුණු කරමින් ආරම්භ වන මංගල ක්‍රිකට් ගැටුමේදී වෙස්ලි විදුහල් පිල මෙහෙයවීමේ ගෞරවය තෙනුක පෙරේරාට හිමි වන අතර, කවිරු පෙරේරා බෙන්ඩික්ට් විදුහල් පිල මෙහෙයවීමට වරම් ලබා සිටී.

මෙල්වා හෝල්ඩිංග්ස් සමාගමේ ප්‍රධාන අනුග්‍රාහකත්වය යටතේ පැවැත්වෙන මේ තරගය පිළිබඳ මාධ්‍ය හමුව පසුගියදා කොළඹ හිල්ටන් හෝටලයේදී පැවැත්විණි. සාන්ත බෙනඩික්ට් විදුහලේ අධ්‍යක්ෂ ආචාර්ය පුබුදු රාජපක්ෂ පියතුමා, වෙස්ලි විදුහල්පති අවංක ප්‍රනාන්දු, දෙවිදුහලේ ඒකාබද්ධ තරග කමිටු සභාපතිවරුන් වන ලලිත් මඩප්පලි (සාන්ත බෙනඩික්ට්) සහ කේ. දයාපරන් (වෙස්ලි), එම කමිටුවේ ලේකම්වරුන් වන පියල් පෙරේරා (සාන්ත බෙනඩික්ට්) සහ දර්ශන ලියනගේ (වෙස්ලි) මහත්වරු සමග සාන්ත බෙන්ඩික්ට් ක්‍රිකට් නායක කවිරු පෙරේරා සහ වෙස්ලි ක්‍රිකට් නායක තෙනුක පෙරේරා මාධ්‍ය හමුවට එක් වූහ.




වෙස්ලි විදුහල්පති අවංක ප්‍රනාන්දු මහතා සහ සාන්ත බෙනඩික්ට් විදුහලේ අධ්‍යක්ෂ ආචාර්ය පුබුදු රාජපක්ෂ පියතුමන් වෙත මෙල්වා සමූහ ව්‍යාපාරයේ අධ්‍යක්ෂ ආනන්ද රාජ් මහතා අතින් අනුග්‍රාහකත්වය පිරිනැමූ අයුරු.

ඡායාරූපය - සාලිය රූපසිංහ



## ප්‍රදර්ශන තරගය මේ මොහොතේ සුදුසු නෑ

### ලෙජන්ඩ්ස් නායක ඩිල්ෂාන්

ඉන්දියාවේදී රෝඩ් සේෆ්ටි තරගාවලියට එක් වූ ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස් කණ්ඩායම සහ ශ්‍රී ලංකා නැගී එන ක්‍රීඩකයන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වීමට නියමිත ක්‍රිකට් තරගයට මෙය සුදුසු අවස්ථාවක් නොවන බව ලෙජන්ඩ්ස් කණ්ඩායමේ නායක තිලකරත්න ඩිල්ෂාන් පවසයි.

කොරෝනා අරමුදල් රැස් කිරීම සඳහා ප්‍රදර්ශන විස්සයි20 ක්‍රිකට් තරගය ලබන මස 4 වැනිදා පල්ලේකැලේ අන්තර්ජාතික ක්‍රීඩාංගණයේදී පැවැත්වෙන බව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සඳහා අලුතින් පත් වූ ක්‍රිකට් කළමනාකරණ කමිටු සභාපති මහාචාර්ය අර්ජුන ද සිල්වා මහතා පසුගියදා පැවැති මාධ්‍ය හමුවකදී පැවසීය.


කෙසේ වෙතත් මේ තරගය සම්බන්ධයෙන් අදහස් දක්වමින් ඩිල්ෂාන් පවසා ඇත්තේ මේ තරගය පැවැත්වීමෙන් ජාතික කණ්ඩායම නියෝජනය කරන තරුණ ක්‍රීඩකයන්ගේ මානසිකත්වයට බලපෑමක් ඇති විය හැකි බවයි.

එම තරගයට ඩිල්ෂාන්ගේ නායකත්වයෙන් ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස් පිල එක් වන අතර, ශ්‍රී ලංකා ක්‍රිකට් පිලේ ක්‍රීඩකයන් කිහිපදෙනකු අනිවාර්යයෙන්ම සහභාගී වන බවත් මේ තරගයේදී තරුණ ක්‍රීඩකයන්ට වැඩි අවස්ථාවක් දෙන බවත් සිල්වා මහතා එහිදී පවසා තිබිණි.

එහෙත් තමා නායකත්වය දෙන ලෙජන්ඩ්ස් කණ්ඩායම මේ වන විට ඉතා හොඳින් දස්කම් අතර, සිටින බැවින් යම් හෙයකින් මේ තරගයේ තීරණය සිය කණ්ඩායමට වාසිදායක වුව හොත් එය ප්‍රතිවාදී කණ්ඩායමේ ක්‍රීඩකයන්ට බලපෑමක් වනු ඇති බව ඩිල්ෂාන් පෙන්වා දෙයි.

ඉදිරියේදී පැවැත්වීමට නියමිත විස්සයි20 ලෝක කුසලාන තරගාවලියට මාස කිහිපයක් තිබියදී මෙවැනි තරගයක් පැවැත්වීම සුදුසු නොවන බවත්, පළපුරුදු ක්‍රීඩකයන් ලෙස මේ මොහොතේ සිදු කළ යුත්තේ ලෝක කුසලාන තරගාවලියට එක් වන ශ්‍රී ලංකා ක්‍රීඩකයන්ට අවශ්‍ය මානසික හා ශාරීරික ශක්තිය ලබාදීම බවත් ඔහු කියා සිටී.

## ගලහිටියාව මැදි විදුහලට ක්‍රිකට් ශූරතාවක්



අවසන් තරගයේ හොඳම පිතිකරු ලෙස සම්මාන දිනූ පඤ්ඤානන්ද විදුහල් පිලේ මධූප සුදේශ්

ආර්.බී. ක්‍රිකට් පදනමේ අභියෝගතා කුසලාන අවුරුදු 15න් පහළ ක්‍රිකට් තරගාවලියේ අවසන් මහා තරගයෙන් රද්දොළුගම ශ්‍රී පඤ්ඤානන්ද විදුහල් පිලට එරෙහිව ලකුණු 22ක ජයක් වාර්තා කළ ගලහිටියාව මැදි විදුහල් පිල ශූරතාව දිනා ගැනීමට සමත් විය.

රද්දොළුගම පඤ්ඤානන්ද විදුහල් පිටියේ පසුගියදා පැවැති මේ තරගයේ පළමුව පන්දුවට පහර දුන් ගලහිටියාව මැදි විදුහල් පිල කඩුලු 9කට ලකුණු 210ක් රැස් කළ අතර, පඤ්ඤානන්ද විදුහල් පිල ලකුණු 188කට දැවී ගියේය.

ගලහිටියාව මැදි විදුහල් පිල වෙනුවෙන් කේ.කවීන් ලකුණු 52ක් ද, එස්.සනුක ලකුණු 57ක් ද රැස් කිරීමට සමත් වූහ. පිළිතුරු ඉනිම ක්‍රීඩා කළ පඤ්ඤානන්ද විදුහල් පිල වෙනුවෙන් විශිෂ්ට පිතිහරඹයක නිරත වූ මධූප සුදේශ් ලකුණු 55ක් රැස් කළ ද ජයග්‍රහණයට එය ප්‍රමාණවත් නොවීය. එස්. සනුක කඩුලු 3ක් දවාලමින් දස්කම් පෑවේය.

අවසන් මහා තරගයේ හොඳම පිතිකරු ලෙස මධූප සුදේශ් සම්මාන දිනා ගත්තේය. තරගයේ වීරයා සම්මානයත්, හොඳම පන්දු යවන්නාගේ සම්මානයත් ගලහිටියාව මැදි විදුහල් පිලේ එස්. සනුක දිනා ගත්තේය.

## විස්සයි 20 ලෝක කුසලානය ඩුබායි යයි

මේ වසරේ ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී ඉන්දියාවේ පැවැත්වීමට නියමිත අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සිලයේ (අයිසීසී) විස්සයි20 ලෝක කුසලාන තරගාවලිය සැලසුම් කළ පරිදි ඉදිරියට ගෙන යෑමට සංවිධායකයෝ සූදානම් වෙති. එක්සත් අරාබි එමීර් රාජ්‍යය විකල්ප ස්ථානයක් ලෙස තබා ගැනීමට අයිසීසීය දැනටමත් තීරණය කර ඇති අතර, ඉන්දියාවේ කොරෝනා වසංගත තත්ත්වය උග්‍ර වුවහොත් ඩුබායි වෙතට තරගාවලිය තල්ලු වේ.

“දැනට පවතින කොරෝනා තත්ත්වය දිගටම පවතින්නේ නම්, ජගත් ක්‍රිකට් කවුන්සිලය අනිවාර්යයෙන්ම විස්සයි20 ලෝක කුසලානය එක්සත් අරාබි එමීර් රාජ්‍යයට ගෙන යනවා. මේ වසරේ අග භාගයේදී ඉන්දියාවේ පැවැත්වීමට නියමිත ලෝක කුසලානය සඳහා විකල්ප සකස් කර ඇති නමුත් එය ඉන්දියාවෙන් පිටතට ගෙන යාමේ කිසිදු අදහසක් දැනට නැහැ” යැයි අයිසීසී ප්‍රධාන විධායක ජෙෆ් ඇලාර්ඩිස් ප්‍රකාශ කර තිබේ.

“ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය සඳහා ‘බී’ සැලැස්ම අප සතුව තිබෙනවා. නමුත් අපි තවමත් එම සැලසුම් ක්‍රියාත්මක කර නෑ. අප ඉන්දීය ක්‍රිකට් පාලක මණ්ඩලය සමඟ වැඩ කරමින් සිටිනවා. අපට විකල්ප සැලසුම් තිබේ නම් කාලය ගියත් එය ක්‍රියාත්මක කළ හැකියි. නමුත් සැලකිය යුතු කරුණක් නම්, අයිසීසීහි අවසාන තීරණය ප්‍රධාන වශයෙන් රඳා පවතින්නේ මෙහි රූපවාහිනී විකාශ අයිතිය හිමි ස්ටාර් ටීවිහි අදහස් මතයි” ජෙෆ් ඇලාර්ඩිස් පවසයි.

2023 (ඕවර 50) ලෝක කුසලානය සඳහා සත්කාරක අයිතිය ඉන්දියාවට හිමිව ඇත. එබැවින් වසර දෙකකින් ඔවුන්ට ලෝක කුසලාන දෙකක් පැවැත්විය නොහැකි බව සඳහන් විය.

## බීච් වොලිබෝල් ජාතික සංචිතයට තේරීම 18 දා

ශ්‍රී ලංකා ජාතික බීච් වොලිබෝල් පිරිමි සහ කාන්තා සංචිත සඳහා තෝරා ගැනීමේ විවෘත පරීක්ෂණය මේ මස 18 වැනිදා පෙරවරු 8.30 සිට ජාතික තරුණ සේවා සභාවේ හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථාන බීච් වොලිබෝල් ක්‍රීඩාංගණයේදී පැවැත්වේ.

ඕනෑම බීච් වොලිබෝල් ක්‍රීඩකයකුට හෝ ක්‍රීඩිකාවකට මේ පරීක්ෂණය සඳහා සහභාගි විය හැකි අතර, ඉදිරිපත් වන සියලු ක්‍රීඩක ක්‍රීඩිකාවන් එදින පෙරවරු 8.30 වන විට අදාළ ස්ථානයට වාර්තා කරන ලෙස ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය දැනුම් දෙයි.



## රාණාගේ පිත්තෙන් කල්කටාවට 100 වැනි ජය

පන්දු 56කදී හතරේ පහර 9ක් සහ හයේ පහර 4ක් සමඟ ලකුණු 80ක් රැස් කළ නිටිෂ් රාණාගේ පිතිහරඹයෙන් ඉනිම ගොඩ නැගූ කල්කටා නයිට් රයිඩර්ස් පිල ඉන්දීය ප්‍රිමියර් ලීග් තරගාවලියේ පෙරේදා රාත්‍රී පැවැති තරගයෙන් සන්රයිස් හයිද්‍රබාද් පිලට එරෙහිව ලකුණු 10ක තියුණු ජයක් වාර්තා කිරීමට සමත් විය.

මෙවර අයිපීඑල් තරගාවලියේ තුන්වැනි තරගය ලෙස චෙන්නායි නුවර පැවැති මේ තරගයෙන් ජයග්‍රහණය අත් කර ගැනීමත් සමඟ අයිපීඑල් තරග ඉතිහාසයේ සිය වැනි ජය වාර්තා කිරීමට කල්කටා පිල සමත් විය.

තරගයේ කාසියේ වාසිය දිනූ සන්රයිස් පිලේ ඇරියුමෙන් පළමුව පන්දුවට පහර දුන් කල්කටා පිල ඕවර 20 අවසානයේ කඩුලු 6කට රැස් කළ ලකුණු සංඛ්‍යාව 187කි. රාණාට අමතරව මැදපෙළ පිතිකරු රාහුල් ත්‍රිපති වේගවත් ඉනිමක් ක්‍රීඩා කරමින් ලකුණු 53ක් රැස් කළේ පන්දු 29කිනි. ඊට හතරේ පහර 5ක් සහ හයේ පහර 2ක් එක් විය.

පිළිතුරු ඉනිම ක්‍රීඩා කළ සන්රයිස් පිලට ඕවර 20 අවසානයේ කඩුලු 5කට රැස් කිරීමට හැකි වූයේ ලකුණු 177ක් පමණි.

## හැටන් නැෂනල් බැංකු පිල නෙට්බෝල් ශූරතාව දිනයි

ශ්‍රී ලංකා ගුවන් හමුදා කණ්ඩායමට එරෙහිව ලකුණු 54-37ක ජයක් වාර්තා කළ හැටන් නැෂනල් බැංකු කණ්ඩායම සුපර් ලීග් නෙට්බෝල් ශූරතාව දිනා ගැනීමට සමත් විය. රත්නපුර මහජන ක්‍රීඩාංගණයේ පසුගියදා පැවැති මේ තරගයේ තුන්වැනි ස්ථානය දිනා ගනු ලැබුවේ යුද හමුදා පිල ලකුණු 28-26කින් පරාජය කළ පොලිස් ක්‍රීඩා සමාජය විසිනි.

ජයග්‍රාහී හැටන් නැෂනල් බැංකු පිල දර්ශිකා අබේවික්‍රම විසින් මෙහෙයවනු ලැබූ අතර, උමයංගනා ද සොයිසා, දුලාංගි වන්නිතිලක, ගයාංජලී අමරවංශ, අන්ජලී ඒකනායක, මල්මි හෙට්ටිආරච්චි, ගයනි දිසානායක, කුමරිනි සිල්වා, පබසරා ගුණසේකර, හසීනා අබ්දුල්, ඉමාෂි සුබසිංහ, හංසි බණ්ඩාර සෙසු ක්‍රීඩිකාවෝ වෙති.



ශූරතාව දිනූ හැටන් නැෂනල් බැංකු පිල



අනුශූරතාව දිනූ ගුවන් හමුදා පිල



# නව වසරක අබිමන...

## මෙවර අවුරුදු නැකැත්

සිංහල අවුරුද්ද උදා වන්නේ ඍතු අතුරින් වසන්ත ඍතුවේ ආරම්භයේදීය. මහා කවි කාලිදාසයෝ වසන්ත කාලය මනා කොට සුසැදුණු මී අඹ දලු නමැති තියුණු ඊතල ඇති බඹරවැල නමැති බබළන දුනුදිය ඇති යෝධයකුට උපමා කළහ. මෙම ඍතුවේදී රටේ සශ්‍රීකත්වය මෙන්ම සෞභාග්‍ය ද ඇති වේ. මේ කාලයේදී කුඹුරුවල ගොයම් කපා පාගා ගැනීමද සිදු කෙරේ. කෙත්වතුවල අස්වැන්න නෙළාගැනීමෙන් පසුව ගෙවල්වල අටු කොටු ධන ධාන්‍යවලින් පිරේ. මේ කාලයේදී මී අඹ ගස් මල් පලින් බර වේ. කජු ගස් ද කජු නාඹර මෙන්ම රතුපාට කහපාට පුහුලම්වලින් පිරී යයි.

බක්මහ අකුණු සමඟ ඇද හැලෙන මහා වර්ෂාවෙන් ඇළ දොළ වැව් පොකුණු නිල් දියෙන් පිරී යයි. ඒ වගේම නෙළුම්, මහනෙල්, ඕලු මල්වලින් වැව් පිරී යද්දී ගස් වැල් මල් පලින් බර වී යද්දී අවට පරිසරයේ දක්නට ඇත්තේ අමුතුම සුන්දරත්වයකි. කොවුල් ගී හඬ ඇත ගම්මැද්දෙන් රැව් පිළිරැව් දෙන විට ගමේත්, නගරයේත් මිනිසුන්ගේ හදවත් සතුටින් පිරී ඉතිරී යන්නේ නිරායාසයෙනි.

සිංහල අවුරුද්ද ළඟ ළඟ එන බව මුලින්ම දැනෙන්නේ අම්මාටය. ඇය මාර්තු මාසයේ සිටම අප්‍රේල් මාසයේ උදා වන ජාතික මහෝත්සවයට ලහි ලහිමයේ සූදානම් වෙයි. ගේදොර වතුපිටි සියල්ල අලුත් වෙයි. පැරණි ජන සමාජයේ නම් නිවෙස පොල් අතු සෙවිලි කිරීම ගොම මැටි ගෑම සිදු කළ අතර දර මඩුව, කරත්ත මඩුව පවා අලුතින් පොල්අතු සෙවිළි කර උදාවන අලුත් අවුරුද්දට සූදානම් කළහ. අලුත් අවුරුද්දට පිරිසුදු පරිසරයක් මෙන්ම පිරිසුදු හදවතකින් අලුත් අවුරුද්ද සැමරීම එහි මූලික පරමාර්ථයයි. සිංහල හා හින්දු අලුත් අවුරුද්ද බාල මහලු ලොකු කුඩා භේදයකින් තොරව කවුරුත් සතුටින් සමරන ජාතික මහෝත්සවයකි. මෙහිදී ජනතාව තුළ සොම්නස උපදවන විවිධ වූ ජාතික ක්‍රීඩා පැවැත්වීමද විශේෂත්වයකි. ඒ අතර රබන් ගැසීම, ඔන්චිල්ලා පැදීම, වළ කජු ගැසීම, එල්ලේ ගැසීම, පංචා දැමීම, පොරපොල් ගැසීම, චක්කුඩු පැනීම හැඳින්විය හැකිය.

සිංහල අවුරුද්ද සැමරීමේදී චාරිත්‍ර වාරිත්‍රවලට මූලික තැනක් හිමි වෙයි. අවුරුද්දේ සෑම ක්‍රියාවලියක්ම සිදු වන්නේ නැකැත් මුල් කරගෙනය. ජ්‍යොතිර් විද්‍යාව අනුව සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට සංක්‍රමණය වීම අරමුණු කරගෙන අවුරුද්දක් ගෙවී තවත් නව අවුරුද්දක් ලැබීම හේතුකොට ගෙන පවත්වනු ලබන චිරාගත ජාතික මහෝත්සවය සිංහල අවුරුද්ද නමින් හඳුන්වයි. අවුරුදු චාරිත්‍ර පිළිබඳ පියවරෙන් පියවර විමසා බලමු.

### පරණ අවුරුද්ද සඳහා ස්නානය

නව අවුරුද්ද ලබන්නට ආසන්නයේ පරණ අවුරුද්ද සඳහා ජලස්නානය අතීතයේ සිට පැවත එන චාරිත්‍රයකි. මෙවර එම නැකත උදා වී ඇත්තේ අප්‍රේල් 12 සඳුදා දිනය. දිවුල්පත් යුෂ මිශ්‍ර නානු ගා එදින ස්නානය කළ යුතුය. මේ සඳහා තෝරාගනු ලබන්නේ අලුත් අවුරුද්ද ලබන්නට පෙර පවත්නා අවසාන සතියේ අග වූ සඳු, බුද, ගුරු, ශනි යන මේ දිනවලින් සුදුසු එකකි. මෙදින දියනෑමට පෙර ඖෂධීය ගුණයෙන් යුතු කොළ වර්ගයක යුෂ හිස ගැල්වීමද කරනු ලබයි. මෙලෙස ස්නානයෙන් පසුව පුණ්‍ය කටයුතුවල නිරත වෙති. මේ කටයුතු කායික මෙන්ම මානසික වශයෙන් ද නීරෝගී භාවය ඇතිවීමට හේතු වේ.

### නව සඳ බැලීම

අභිනව චන්ද්‍ර වර්ෂය සහ අභිනව සූර්ය වර්ෂය සඳහා නව සඳ බැලීමේ චාරිත්‍රය මෙවර යෙදී ඇත්තේ අප්‍රේල් 16 සිකුරාදාය. ඉර හඳ ග්‍රහ තාරකා සමග අප ජීවිත එකට බැඳී පවතින හෙයින් ඉර හා සඳ වන්දනා මාන කිරීම ඈත අතීතයේ සිටම පැවත එන චාරිත්‍රයකි. හින්දු භක්තිකයෝ ද සූර්ය වන්දනාවට ප්‍රධාන තැනක් දෙති.

### පුණ්‍ය කාලය

මෙවර පුණ්‍ය කාලය යෙදී ඇත්තේ අප්‍රේල් 13 අඟහරුවාදා අපරභාග 8.00 පසු වී විනාඩි 09 සිට පසුදින එනම් 14 බදාදා පූර්ව භාග 8 පසු වී විනාඩි 57 දක්වා පුණ්‍ය කාලය යෙදී ඇත. මෙම කාලය නොනගතය ලෙසද හඳුන්වයි. කිසිදු ගෘහස්ථ කටයුත්තක හෝ සුබ කටයුත්තක් නොනගතය ලැබුවායින් පසුව සිදු නොකරයි. මෙම කාලය තුළ ලිප ගිනි මෙළවීම ආහාර පිසීම, ආහාර අනුභවය, අමුත්තන්ට සංග්‍රහ කිරීම සිදු නොකරයි. එබැවින් සියලු වැඩ අතහැර පුණ්‍ය කටයුතු සිදු කිරීම ගමේ විහාරස්ථානයට ගොස් ආගමික වතාවත්වල යෙදීම හා නව වසර සඳහා මහා සංඝරත්නයේ ආශීර්වාදය ලබාගැනීම සුදුසුය.

### ආහාර පිසීම

සුබ නැකතට සුබ දිසාව බලා ළිප් බැඳ ගිනි මොළවා නැවුම් මුට්ටියක කිරිබතක් පිසීම සිංහල අවුරුද්දට ආවේණික වූ මංගල සම්මත අවුරුදු චාරිත්‍රයකි. මෙවර මෙම නැකත උදා වී ඇත්තේ අප්‍රේල් 14 බදාදා පෙරවරු 6.17ටය. ඒ සඳහා ළා කොළ පැහැති (පලාවන්) පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී නැගෙනහිර දිසාව බලා ලිප බැඳ ගිනි මොළවා එළකිරි මිශ්‍ර කිරිබතක්ද මුං ඇට මිශ්‍ර කැවිලි වර්ගයක් ද සුදුසු බව ජ්‍යොතිර්වේදයේ සඳහන් කර ඇත.



### ආහාර අනුභවය

සුබ නැකතින් ගෘහිණිය විසින් පිසූ කිරිබත සුබ නැකතට අනුභව කිරීමද අවුරුදු චාරිත්‍ර අතර ප්‍රධාන කටයුත්තකි. මේ සඳහා මව පියා දරුවන් ඇතුළු සියලු දෙනා කෑම මේසයට එක් වෙති. ගෘහ මූලිකයා එසේත් නැත්නම් තාත්තා හෝ වැඩිහිටියකු විසින් කිරිබත් කැබැල්ලක් බෙදාගෙන ඉන් සියලු දෙනාටම කවනු ලබයි. ඉන් පසුව දරුමුනුපුරෝ ද වැඩිහිටියන් අනුගමනය කරමින් වැඩිහිටියන්ටද කිරිබත් කවති. කැවුම්, මුංකැවුම්, අතිරස, කොකිස්, අග්ගලා වැනි රස කැවිලි හා කෙසෙල්ගෙඩි සමඟ අවුරුදු කිරිබත් මේසය සරසන අතර විවිධ පළාත්වල විවිධ වූ කැවිලි වර්ග මේ සඳහා යොදාගනිති. මෙවර වැඩ ඇල්ලීම ගනුදෙනු කිරීම හා ආහාර අනුභව කිරීමේ නැකත යෙදී ඇත්තේ අප්‍රේල් 14 බදාදා පූර්වභාග 07.41ටය.

වැඩ අල්ලා ගනුදෙනු කොට ආහාර අනුභවය කිරීමටද ඇතැමෙක් පුරුදුව සිටිති. එම චාරිත්‍රයෙන් අනතුරුව තම අසල්වැසියන් හා ඥාතීන් වෙත කිරිබත් කැවිලි බෙදාදීම සඳහා අම්මා මූලික වී කටයුතු කරයි. එහි ප්‍රධාන අරමුණ වන්නේ නව වසරේ සිට පැවැති සුහදතාව තවතවත් වර්ධනය කරගැනීමටය.

වැඩිහිටියන්ගෙන් ආශීර්වාද ගැනීම ද අලුත් අවුරුද්ද සැමරීමත් සමග සිංහල ජන සමාජයේ සිදුවන ඉතාම වැදගත් වූ චාරිත්‍රයකි. බුලත්අතක් දී මවුපිය ගුරු දෙගුරුන් ඇතුළු වැඩිහිටියන්ගේ දෙපා නැමැද ආශීර්වාදය ගැනීමත් පෙරවසරේදී සිදු වූ වැරදි අඩුපාඩු මෙන්ම නොහොඳ නෝක්කාඩුකම් සිදු වී නම් ඒවාට සමාව අයැදීමද මේ චාරිත්‍රයේ අප දකින විශේෂත්වයකි. එවැනි යහපත් ගුණධර්ම හා සාරධර්ම තවමත් උරුමව ඇත්තේ සිංහල ජනසමාජයට පමණි.

### හිසතෙල් ගෑම

හිසතෙල් හා නානු ගෑම සිංහල අලුත් අවුරුදු චාරිත්‍රවල විශිෂ්ටතම චාරිත්‍රයකි. මෙම චාරිත්‍රයෙන් ගම්‍ය වන්නේ ශරීර සෞඛ්‍ය ආරක්ෂා කර ගැනීමය. අප ජීවිතයේ සෑම කටයුත්තක්ම සාර්ථකව හා නිවැරදිව කරගැනීමට නීරෝගිකම හා බුද්ධිය අත්‍යාවශ්‍යයි. එබැවින් නානු ගා හිසතෙල් ගැල්වීමෙන් හිස සිසිල් වී බුද්ධිය වර්ධනය වේ. මින් හිසේ පවත්නා ලෙඩ රෝග සුව වන්නේය. උදා වූ නව වසර ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥා යන සම්පත් වැඩිවර්ධනය වේවායි ප්‍රාර්ථනා කරමින් ගමේ පන්සලේ නායක හාමුදුරුවන්, එසේත් නැත්නම් ගමේ වෙද මහතා අම්මා තාත්තා හෝ වැඩිහිටියකු විසින් මෙම චාරිත්‍රය සිදු කරනු ලබයි. මෙවර හිසතෙල් ගෑමේ නැකත යෙදී ඇත්තේ අප්‍රේල් 17 සෙනසුරාදා පූර්වභාග 07.16ටය. දකුණු දිශාව බලා හිසට නුග පත් ද පයට කරඳ පත් ද තබා නිල් පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී එම චාරිත්‍රය සිදු කළ යුතුය. වර්තමානයේද මෙම චාරිත්‍රය සඳහා හිසතෙල් හා නානු සකස් කරන්නේ ගමේ විහාරස්ථානය මූලික කරගෙනය.

### රැකී රක්ෂා සඳහා පිටත් වීම

සිංහල අවුරුදු චාරිත්‍රවල අවසන් චාරිත්‍රය ලෙස රැකීරක්ෂා සඳහා පිටත්වයෑම හඳුන්වයි. දින කීපයක් තම අඹුදරුවන් දෙමාපියන් සමඟ ගත කර යළි රැකී රක්ෂා සඳහා නගරයට පිටත්ව යෑමත් එසේත් නැති නම් තම තමන්ගේ ජීවන වෘත්තීන්හි නියැළීම එම චාරිත්‍රයයි. මෙවර එම නැකත ලබා ඇත්තේ අප්‍රේල් 19 සඳුදා පූර්වභාග 06.39ටය.

ඈත අතීතයේ සිටම පැවත එන මේ අලුත් අවුරුදු චාරිත්‍ර කිසිවක් නොසලකා බැහැර කළ යුතු ඒවා නොවේ. මේ සියලු කාර්යයන්හි ගැඹුරු අර්ථයක් අපට කියා දෙයි. සියල්ල සුබ හෝරාවකට සුබ දිසාවකට සිදුවන අතර බුද්ධිය වර්ධනය වීම නීරෝගිකම, කායශක්තිය, සොබාදහම මෙන්ම ආගමික පසුබිම මේ ආදී සුවිශේෂ කරුණු රැසක් මුල්කරගෙන පවත්වන සිංහල හා හින්දු අලුත් අවුරුදු චාරිත්‍ර මතු පරපුර වෙනුවෙන් රැකගැනීම ඔවුන් ඒ සඳහා යොමු කිරීම අද දවසේ වැඩිහිටියන් වන අපට පැවරී ඇති ජාතික වගකීමකි. වර්තමාන ජනසමාජයෙන් බරපතළ ලෙස සාරධර්ම ගුණධර්ම පිරිහී යනු පෙනේ. එබැවින් සිංහල අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර ද ටිකෙන් ටික පරිහානිය කරා ඇදී යන අයුරු පෙනේ. අප රටට පමණක් ආවේණික වූ මේ චාරිත්‍ර වාරිත්‍ර ආරක්ෂා කර ගැනීම සඳහා ලබන්නා වූ 2021 සිංහල හා හින්දු අලුත් අවුරුද්දේ සිට වත් ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට කාලය එළැඹ ඇති බව සිහිපත් කළ යුතුය.

රන්වන් කරල් එක යායට හිනැහෙනවා
හිරු තව අලුත් මෙහෙවරකට සැරසෙනවා
යහපත් පැතුම් හැම හදකම දලුලනවා
හොඳ හිත අරන් අවුරුදු ගෙදරට එනවා

**රත්නසිරි පතිරණ**

# නව වසරක අභිමන...

සිංහල හින්දු අලුත් අවුරුද්ද අත ළඟ ය. ගිය වතාවේ කොවිඩ් - 19 ගේදොරකඩ රැකවල් ලා සිටි හෙයින් අවුරුදු කුමාරයා හරිහැටි ගෙටවද්දා ගැනීමට අපට නොහැකි විය. පැවැති සංචරණ සීමා සහ ආර්ථික ගැටලු බොහෝදුරට හරස් විය. කොවිඩ් භීතිය තවම පහව ගොස් නැතත් ගියවර මෙන් මෙවර සංචරණ සීමා නම් පනවා නැත. සංචරණ සීමා පනවා නැතැයි යන්නේ අර්ථය වන්නේ ගෙයින් ගෙයට දොරින් දොරට කොවිඩ් -19 පතුරුවාලීම සුදුසු බව නම් නොවේ.


මෙදා අවුරුද්ද තරමක් සුවිශේෂ ය. එක අතකින් මේ ලබන්නා වූ සිංහල හින්දු අලුත් අවුරුද්දේ අපේ පැරණි චාරිත්‍රවාරිත්‍ර රැකගත යුතු ය. තවත් අතෙකින් මේ සමයේ පනවා ඇති සෞඛ්‍යාරක්ෂණ නීතිරීති පිළිපැදීම ද අනිවාර්යයෙන් සිදු කළ යුත්තකි. මෙතෙක් අප අවුරුද්ද සැමරුවේ චාරිත්‍රවාරිත්‍ර අනුව ය. මෙදා අවුරුද්දේ ඒ සඳහා කොවිඩ් - ආරක්ෂණ නීති රීති අනුගමනය ද ඈඳී තිබේ. එනම් මේ අලුත් අවුරුද්දේ සියලු චාරිත්‍ර වාරිත්‍ර ඉටු කළ යුත්තේ සෞඛ්‍යාරක්ෂණ නීතිරීතිවලට මුල්තැන දෙමිනි. මුව ආවරණ පැළඳ, සමාජ දූරස්ථ භාවය පවත්වාගනිමින්, නිතර දෑත් විෂබීජහරණය කරමින් අවුරුද්ද සැමරිය යුතු ය. තවදුරටත් කිවතොත් මේ අවුරුද්දේ අමුත්ත නම් නක්ෂත්‍රයට අමතර ව වෛද්‍ය විද්‍යාවේ ද බලපෑම එල්ල වී තිබීම ය.

කොවිඩ් -19 යනු සුළු සෙම්ප්‍රතිශ්‍යා හෝ උණ තත්ත්වයක් ගණනට දමා සැලකිය නොහැක්කකි. මේ නම් ලෝකයට ම බලපාන වසංගතයකි. එබැවින් අප සියලු දෙනා එක ම සෞඛ්‍ය නීතිරීති පද්ධතියකින් බැඳී සිටී. මේ බව තරයේ සිහි තබා ගත යුතු ය. සිංහල හින්දු අලුත් අවුරුද්ද සැමරීමට බාලමහලු කා තුළත් ඇත්තේ ඉමහත් කැමැත්තකි. එබැවින් අලුත් අවුරුදු චාරිත්‍රවාරිත්‍ර ඉටු කිරීම ද අවැසි ය. එසේ ම කොවිඩ් -19 රෝගයෙන් වැළකී සිටීමේ පිළිවෙත් අනුගමනය කිරීම ද කළ යුතු ය. මේ කාර්යයන් ද්විත්වය ම එකවර ඉටු කිරීම ද කළ නොහැක්කක් නොවේ.

අවුරුද්දට මව්පිය, සහෝදර සහෝදරයන් දැකීමට යෑමට වාරණ පනවා නැත. තෑගි බෝග දීමට, බුලත් දී වැඳීමට තහනමක් නැත. බලධාරීන් උපදෙස් දී ඇත්තේ මේ සියලු දේ සෞඛ්‍යාරක්ෂණ පිළිවෙත් අනුගමනය කරමින් සිදු කිරීමට ය. අතීතයේ පටන් පැවතගෙන එන අලුත් අවුරුදු සිරිත්විරිත් ඉටු කිරීමට මෙයින් බාධාවක් නැත. එහෙත් පොදු ස්ථානවල ඒකරාශී වී පවත්වන ජන ක්‍රීඩා, අවුරුදු උත්සව ආදිය නොපවත්වා සිටීම නම් ඇගට ගුණ ය.

උයන ගේ (මුළුතැන්ගේ) සුද්ධ පවිත්‍ර කරගැනීම සිංහල අවුරුදු සිරිත්විරිත්වල එන ප්‍රධාන අංගයකි. අතීතයේ "ළිප් බැඳ ගිනි මොළවා" යනුවෙන් දැක්වූයේ එකල පැවැති මැටියෙන් සැකසූ ළිප් සිංහල අවුරුද්දට පෙර අලුතින් බැඳ, පිරිසුදු කොට නැකතට ළිප ගිනි මෙළවූ බැවිනි. දැන් අපට ඇති නවීන පන්නයේ ළිප් හා මුළුතැන් ගෙවල්, දොරවල්, වත්තපිටිය සිංහල අවුරුදු උදාවට පෙර පිරිසුදු කරගැනීම සෞඛ්‍යාරක්ෂාවට ද ලබා දෙන්නේ මනා රුකුලකි.

විශේෂයෙන් ම මුළුතැන් ගෙයි පිරිසුදු බව වඩා වැදගත් ය. මන්ද අප ගන්නා ආහාරපානවලට අපිරිසුදු දේ එක්වීම ලෙඩරෝග ඇතිවීමට බලපාන මූලික කාරණාවකි. එබැවින් සිංහල අවුරුදු චාරිත්‍රවල එන මුළුතැන්ගේ හා ළිප සැකසීම, සුද්දපවිත්‍ර කරගැනීම සැබැවින් ම යහපත් චාරිත්‍රයකි.



## සිතින් ළං වී මානව බැඳීම් අලුත් කර ගනිමු

### සම්මානිත මහාචාර්ය ජේ.බී. දිසානායක

අතීතයේ නිවෙස්වල භාවිත කළ ලුණු පොල්කටු අවුරුද්ද උදාවීමට පෙර ඉවතලා නව ලුණු පොල්කටුවක් මුළුතැන් ගෙයි තබන්නේ, කලක් ගත වෙද්දී පොල්කටුවේ යට ලුණු බැඳීම හා අපිරිසිදු වීම සිදු වන බැවිනි. වර්තමානයේ නිවෙස්වල නම් ලුණු පොල්කටු දැකීම අපහසු ය. එහෙත් ඒ වෙනුවට මුළුතැන්ගෙයි භාවිත වන කුළුබඩු හා අමුද්‍රව්‍ය දමන බඳුන් නිසි ලෙස පිරිසුදු කිරීම අවුරුදු උදාවට පෙර සිදු කළ හැකි ය. විශේෂයෙන් ම පිරිසිදු ව සහ නීරෝගී ව සිටීම සිංහල හින්දු අලුත් අවුරුද්දේ මුල්තැනක් ලැබෙන කරුණකි. මෙවර අවුරුද්දේ ද එය සිදු කිරීමට කිසිදු බාධාවක් නැත.

පුණ්‍ය කාලයේදී ආගමික ස්ථානවලට යෑමට ද වාරණ දමා නැත. එහෙත් එලෙස යන විට ජනාකීර්ණ නොවන ආගමික ස්ථානවලට ගොස් සමාජ දූරස්ථ භාවය රැකගනිමින් ආගමික වතාවත් ඉටු කරලීම ඉතාමත් වැදගත් වේ. ඒ සඳහා ද බාධාවක් නැත. මෙවර අවුරුදු ක්‍රීඩා කරන විට ද සමාජ දූරස්ථ භාවය රැකගනිමින් කළ හැකි ක්‍රීඩා තෝරාගත යුතු ය.

සිංහල අවුරුදු චාරිත්‍රයක් වන හිසතෙල් ගෑම ද මඟ නොහැරිය යුතු චාරිත්‍රයකි. අපේ හිසේ නොයෙක් අපද්‍රව්‍ය එක් වන අතර එම අපද්‍රව්‍ය ඉවත් කිරීමට පිළියමක් ලෙසත් කොණ්ඩය දිගු කරගැනීමට හා කළු කරගැනීමටත් වසරක් මුළුල්ලේ අපි හිසට නොයෙක් නිෂ්පාදන යොදමින් සිටිමු. මේ නිෂ්පාදනවලින් අප නොදැනුවත්ව ම හිසට අහිතකර බලපෑම් එල්ලවීමට ද පුළුවනි. ඇතැම් විට එය විවිධ ලෙඩරෝග ඇතිකිරීමට ද හේතුවක් විය හැකි ය. එබැවින් අඩුම තරමේ සිංහල හින්දු අලුත් අවුරුද්දේ හිස තෙල් ගාන නැකතට හෝ හිසට ගුණදායක ඖෂධීය තෙලක් යෙදීම වටී.

අලුත් අවුරුද්දේ අප කළ යුත්තේ අපේ ජීවිත අලුත්වැඩියා කරගැනීම ය. ගෙවී ගිය වසර තුළ අපට කරගත හැකි වූ දේ සේ ම කරගත නොහැකි වූ දේ ද කොතෙකුත් ය. ඉටුකරගත හැකි වූ බලාපොරොත්තු සේ ම ඉටු කරගත නොහැකි වූ බලාපොරොත්තු ද එමට ය. සම්පූර්ණ කළ නොහැකි වූ කාර්යයන් සම්පූර්ණ කිරීමට නව වසරේ නැවත අවස්ථාවක් උදා වනු ඇත. ගෙවුණු වසරේ ප්‍රශස්ත සිංහල නවකතාවක්, කාව්‍ය සඟරාවක් රසවිඳිය නොහැකි වූයේ නම් නව වසර ඒ සඳහා කදිම අවස්ථාවක් කරගත හැකි ය. කෙටි කතාවක් රචනයට ඔබ තුළ වූ බලාපොරොත්තුව ඉටු කරගත නොහැකි වූයේ නම් සිංහල අලුත් අවුරුද්දේ වැඩ අල්ලන නැකතින් එය අරඹන්න. මඟ හැරුණු බලාපොරොත්තු නැවත අල්වා ගැනීමට මෙය කදිම අවස්ථාවකි. එසේ ම මානව බැඳීම් අලුත් කරගැනීමට ද සිංහල හින්දු අලුත් අවුරුදු සමය තරම් අගනා සමයක් තවත් නැත. මව්පිය දූදරුවන්, සොහොයුරු සොහොයුරියන් සියල්ලන් එකට එක් වී නිදහසේ බත් කටක් කන්නට නොහැකි තරමට නූතන මානවයා කාර්යබහුල වී ඇත. එකී කාර්යබහුලත්වයෙන් බිඳකට හෝ අත්මිදෙන්නට සිංහල අවුරුදු සමයේ ඔවුනට ඉස්පාසුවක් ලැබීම සුවිශේෂ කාරණාවකි. අවුරුදු සමයේ නෑගම් යන විට තෑගිබෝග ගෙනයන්නේ ඒ බැඳීම් තවත් අලුත් කරගැනීමට ය. එබැවින් තම තමන්ට හැකි පමණින් මේ සිංහල හින්දු අලුත් අවුරුද්දේ තම සමීපතමයන්ට තෑගි



කළ යුත්තේ ද පවතින යමක් ම ය. කේක්, බිස්කට්, පැණි රස ගෙනගොස් දී සමීපතමයන් ලෙඩ කරවනවාට වැඩියෙන් රසවත් පොතක් තෑගි කිරීම අගනේ ය. මේ එළැඹෙන්නේ සාහිත්‍ය ඇසුරු කිරීමට ද කදිම කලෙකි.

එබැවින් කොවිඩ්-19 හේතුවෙන් මෙවරත් හිතේ හැටියට අවුරුදු සැමරීමට නොහැකි වන බවක් සිතා, අමුතු කම්පාවකින් සිටිය යුතු නැත. වසංගතයේ පැතිරීම වැඩි නොවන ලෙස පරිස්සමට අවුරුදු චාරිත්‍ර ඉටු කරන්නේ නම් මේ සිංහල හින්දු අලුත් අවුරුද්ද සතුටින් සැමරීමට විශාල බාධාවක්, කොවිඩ් -19 වසංගතයෙන් එල්ල නොවනු ඇත. කෙසේ වෙතත් මේ අවුරුදු සමයේ අනවශ්‍ය ගමන්බිමන් හැකිතාක් දුරට අවමකරමින් ඔබේ හිතවතුන්ට ගතින් නොව සිතින් ළංවන්නට අවස්ථාව උදා කරගැනීම ද වටී. ඔබ නීරෝගී නම්, සිතේ සතුට රැකගත හැකි නම්, මානව බැඳීම් අලුත් කරගත හැකි නම් අලුත් අවුරුද්දේ සැබෑ අරුත එය යි.

**සටහන - කාංචනා සිරිවර්ධන**

# සංස්කෘතික සබැඳියාව ගෙනෙන සූර්ය මංගල්ලය



පෘථිවියේ ගෙවී යන සෑම දින තුන්සිය හැටහතරකට වරක් බක් මාසයේදී සිංහල හින්දු අලුත් අවුරුද්ද එළඹේ. අලුත් අවුරුද්ද යනු අප ජීවත්වන මෙම චක්‍රාවාටයට අයත් සෞර්යග්‍රහ මණ්ඩලයේ සූර්ය දිව්‍යරාජයාගේ ගමන් මඟ කේන්ද්‍රකොට ගත් භ්‍රමණාරම්භයකි. එනම්, සූර්යා වර්ෂයක් පුරාවට සියලු රාශිවල ගමන් කොට අවසානයේදී මීන රාශියෙන් නැවතත් මේෂ රාශියට මාරුවන ගමනාරම්භයකි. මෙකී අවස්ථාව සිංහල හින්දු බැතිමතුන්ට ඔවුනොවුන්ගේ ජන ජීවිතයේ ජීවන ගමන් මඟට ආශීර්වාදය හා නව ඇරඹුමක සුබ ලකුණු ගෙන දෙනු ලබන්නා වූ සුවිශේෂී කඩඉමකි. එනිසා සූර්ය දෙවිදුන් කේන්ද්‍රකොටගෙන භක්තියෙන් යුතුව පූජෝපහාර පවත්වමින් සූර්ය දෙවිදුන් සතුටු කිරිම මෙහි විශේෂ ලක්ෂණයකි. එසේම මේ මොහොතේ තමාද සතුටු වෙමින් විනෝදවෙමින් අපල දුරුවනු පිණිස ආශිර්වාදය පැතීම ප්‍රමුඛ කාරණයකි. මෙම පෘථිවියේ සහ එහි වාසය කරන්නන්ගේ ජීවය පවතින්නේ මෙන්ම පැවැත්මට අනුබල දෙනු ලබන්නේ සූර්ය දිව්‍යරාජයා වන බවට පවතින විශ්වාසය වෙනුවෙන් කෘත ගුණ පූජා දැක්වීම වැනි පරාර්ථකාමී මානුෂීය ගුණාංගයක් සිංහල හින්දු බැතිමතුන් අතර පවතී. එනිසා මෙය කෘතගුණ පූජා මංගල්‍යයක් වශයෙන්ද හැඳින්විය හැකිය.

අපගේ මනස දිවයන්නේ අසල්වාසී ඉන්දීය සංස්කෘතිය වෙතටය. අපගේ සිංහල බෞද්ධ සමාජය ගත් කල එයද ඉන්දියානු සම්භවයක උරුමයකි. ශ්‍රී ලාංකීය දෙමළ සමාජය ද ඉන්දීය සංස්කෘතියේම පර්යායකි. කෙසේ නමුත් ඔවුනොවුන් අතර පවතින ආභාසාත්මක ලක්ෂණයන්ගේ කැඩපතක් වශයෙන් සිංහල හින්දු අලුත් අවුරුද්ද සඳහන් කළ හැකිය. නර්තනය, සංගීතය, චිත්‍රකලාව හා නාට්‍ය කලාව මෙන්ම සිනමාව පමණක් නොව සකලවිධ මනුෂ්‍ය ක්‍රියාකාරකම් හී ඇති ලක්ෂණ මෙම සංස්කෘතීන් දෙක අතර ප්‍රදර්ශනය වන්නේ එකම ගසේ අතු ශාඛා වශයෙනි. එහි සුසංයෝගී වටිනාකම් හා ධර්මතා පිළිබිඹු කරන ප්‍රධාන අංගයක් වශයෙන් සිංහල හින්දු අළුත් අවුරුද්ද සහ එහි චාරිත්‍ර සඳහන් කළ හැකිය. එකම සංස්කෘතික සන්දර්භයක් සිංහල හින්දු අලුත් අවුරුදු චාරිත්‍ර තුළ අන්තර්ගතය.

අන්තර් සංස්කෘතික සබැඳියාවක මිත්‍රශීලී සාමුහික එකමුතුවේ අසිරිය සිංහල හින්දු අලුත් අවුරුදු කාලය තුළ රට පුරා දක්නට



ලැබෙන්නේ එකම සංස්කෘතිකාංගයක් වශයෙනි. ඒ තුළ පවතින ප්‍රබෝධය, යාවජීයත්වය, සුහදත්වය, මිත්‍රත්වය ලෝක ප්‍රජාව අබියස සමස්තයට අදාර්ශයකි.

වර්ෂයකට වරක් සුවිශේෂි ලෙස පවුල් වශයෙන්, පවුල් පවුල් වශයෙන්, ප්‍රජාවක් වශයෙන්, සාමාජීය වශයෙන් හා සංස්කෘතික වශයෙන් ඒකීය සමස්තයක් ලෙස සියල්ලෝම ඒකරාශී වී එදිරිවාදිකම් සියල්ල අතහැර නව සිතුම් පැතුම්, හැඟීම් දැනීම් සමුදායකින් ඇයි හොඳයිකම් පවත්වමින් සතුටු වී විනෝද වී නැවතත් විසිර යන්නේ තවත් අළුත් අවුරුදු උදාවක් අපේක්ෂාවෙනි. එතෙක් සහ ජීවනයෙන් වාසය කිරිමේ සංකේතයක් මෙහි තවදුරටත් අන්තර්ගත බව සඳහන් කළ හැකිය. ශ්‍රී ලංකික සිංහල හා හින්දූන් අතර අන්‍යොන්‍යයත්වයේ යාවත්කාලීන බවේ සංකේතයක් වශයෙන් තවත් විටක සිංහල හින්දු අලුත් අවුරුද්ද සඳහන් කළ හැකිය. සිංහල හින්දු අළුත් අවුරුදු කාලයට පරිසරයේ සිදුවන වෙනස් වීම් අලුත් අවුරුද්දට ආශිර්වාදයක් වන්නා සේම සබඳතා දලුලා වැඩීමට උත්තේජනයක් වන්නේය.

හින්දූන් විසින් ඔවුන්ට අවේණික කැවිලි පෙවිලි ආචාර ධර්මයන්ගෙන් හා ක්‍රියාකාරකම්වලින් සැරසී අවුරුදු කාලය පෝෂණය කරන විට සිංහලයන් ඔවුන්ට ආවේණික සම්ප්‍රදායික කැවිලි, පෙවිලි, ආචාර ධර්මයන්ගෙන් හා පොදුජන ක්‍රීඩාවන්ගෙන් අවුරුදු කාලය අසිරිමත් කරති. තම වර්ගයා අතර නෑගම් යාමෙන් ඔබ්බට ගොස් සිංහල හා දමිළ ජනයා අතර නෑගම් යෑම තුළින් කියාපාන සහෝදරත්වය මිනිසුන් භේද භින්න කරනන්වුන්ට හොඳ අතුල්පහරක් සේම ගුණාත්මක පනිවිඩයකි. ආගන්තුක සත්කාර අතින් අතිෂය පෝෂණය වූ සිංහල දමිළ සමාජයේ මානුෂිය හැඟීම්

ගුණධර්ම සහ ශිෂ්ටත්වය මෙන්ම ශ්‍රේෂ්ඨත්වය දෝරගලමින් උතුරායන සංස්කෘතික පිළිබිඹුවක් සිංහල හින්දු අළුත් අවුරුද්දෙන් නිර්මිතය.

උත්සවභශ්‍රීයෙන් සමරන සිංහල හින්දු අළුත් අවුරුද්ද කුඩාම දරුවාගේ සිට මහලුම පුද්ගලයා දක්වා සිටින සියලූම සිත්සතන් තුළ ඇතිකරණ ප්‍රීතිය විද්‍යාමාන කරනු ලබන සුවිශේෂී අවස්ථාවක් වශයෙන් අවුරුදු උත්සවය (බක්මහ උලෙළ)ට ලැබෙන්නේ ද ප්‍රමුඛස්ථානයකි. අවුරුදු කාලය බක්මාසයේ තිබෙන නිසා අවුරුදු උත්සවය බක්මහ උලෙළ යනුවෙන්ද හඳුන්වයි.

සුවිශේෂි ගැමි ජන ක්‍රීඩා සහ ජන සෙල්ලම් මෙන්ම ගැමි ශාන්ති කර්ම ආදිය ආශ්‍රය කරගනිමින් ගැමි ජනවහරක ආභාසය ලබමින් පවත්වනු ලබන අවුරුදු උත්සවය සෑම වයස් මට්ටමකගේම ජනයා නියෝජනය වන තරග මෙන්ම පූජා පිටියකි. ජය පරාජය විඳදරා ගැනීමේ මා හැඟී ශ්‍රේෂ්ඨ ගති ලක්ෂණ මනුෂ්‍ය සන්තානයේ රෝපණය කරමින් සියල්ල සාමූහිකව බෙදා ගැනීමේ- උතුම් මානුෂීය දායාද රසක් අවුරුදු උත්සවයක් තුළ අන්තර්ගතය.

ජාති, ආගම්, කුල, මල භේද නොතකා සාමූහිකව එකට මුහුවීමේ සහ වාසය කිරිමේ අන්තර් සංස්කෘතික සංකලනය සිංහල හින්දු අලුත් අවුරුද්ද පුරාවට ආලෝකමත් වන්නේ මිනිසුන්ට කළ නොහැක්කක් නොමැත යන සංස්කෘතික පනිවිඩය සමාජය අබියස තබමිනි. අප අදින පලඳින භෞතික දෙයින් පමණක් අලුත් නොවී නව්‍යමය යහපත් ආකල්වලින් ස්වයංපෝශිත වී දෛනික ජීවිතය පෙරට වඩා ධනාත්මක නැඹුරුතාවකින් නැකතට ළිපගිණි මොළවා ආහාර අනුභව කිරිමෙන් පසු වැඩ අරඹා යහපත් චේතනාවෙන් ජීවත්වීමට සූදානම් වනවාර්ෂික ඇරඹුමක් සිංහල හින්දු අලුත් අවුරුදු සුසංයෝගය තුළ ඇත. කෘෂක සමාජ සංස්කෘතියක නියැළෙන සිංහල හින්දු ජනයාගේ එකී කෘෂිකාර්මික කර්මාන්තයේ සශ්‍රීක අස්වැන්න නෙළා ගැනීමෙන් අනතුරුව එළඹෙන සිංහල හින්දු අළුත් අවුරුද්ද වනාහී නෙළාගත් අස්වැන්නේ අග්‍රභාගය තම ආගමික ශාස්තෘන් වහන්සේ වෙනුවෙන් පූජා කිරීමෙන් පසු සූර්ය දෙවිඳුන්ට වන්දනාමාන පුද පූජා ඉටු කරමින් අවශේෂ ඉෂ්ට දෙවි දේවතාවුන් වහන්සේලාද පුද ලබන සූර්ය මංගල්‍යයකි.

**චමින්ද මොරගොඩ**
**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.**



## බැතියෙන් නැකත් සමරමු

දිනඉඳු මේෂයට, මීනෙන් ඇදෙන්නී
තරු ඉඳු තරු වටා සඳ රැස් පෙරන්නී
සුපුරුදු සෙනෙහසින් රන්මිණි සලන්නී
අවුරුදු කුමාරිය මෙවරත් වඩින්නී

පොර පොල් කඹ ඇදිලි නැතිමුත් සතර ඉමේ
සුර ලියො වගේ කැකුළියො හැඩ මවන ගමේ
සර නා අයුරු දැක රනහස විලෙහි ළැමේ
පොර කති ගැටවු බහ දෙන්නට තරග බිමේ

නැති මුත් පිරෙන්නට අතිරහ කොකිස් හෙම
බැති යෙන් නැකත් සමරති නිවහනෙහි තම
සති යෙන් වැඩ කරන හෙළ දන අනගි තම
නිති දැනැඳින අරුත බිය ඇති සතර ඉම

නොනගතයට නොගොස් එක්වී සැම පන්සල්
සැනසෙමු ! බුදුන් වැද නිවසේ ගෙන තෙල්මල්
පින පව දැන හැදින මේයයි හැම සැමකල්
වන සමු වයිරසය පැතිරෙන බව මරුවැල්

බාදා නැතේ ඉටු කෙරුමට නැකත් විදි
ආදා, අලුත් අවුරුදු පෙර පර බැඳී
සාදා රස, කැවිලි කිරිබත් සුවඳ රැඳි
පෝදා සඳ වගේ බැබළෙනු ! එළිය දිදී

දුම් කොළ රහිත පිරි බුලතින් දෝත දැරී
අම් මට තාත්තට දී වැඳ සෙනේ පිරී
නිම් නැති ඉසුරු ලැබුමට දිවිත පෙරී
සම් පත් වඩා ගනු නොඅඩුව කොහොම හරී

දෙණියේ සිට පියාඹා විත් අඹ ගහට
පැණි මී අඹ කකා ගිරවුන් අලුයමට
පිනි පලසට අවුත් දිය බොන කණිසමට
මිණි මිණි පොදේ එයි අවුරුදු දොරකඩට

සිත්පිත් නොමැති සේ විශ්වය අත පැතිරී
අත්පත් කරන වයිරස බිය රළු ඇඳිරී
සත්සිත් බලෙන් සැම හදවත් තුළ විසිරී
හෙටවත් ඇසේවා ! මැද අවුරුදු අසිරී

**ඩබ්ලිව්.කේ. සරත් විමලසිරි**

# නව වසරක අභිමන...

## පරිස්සමෙන් සාප්පු සවාරි

සිංහල හින්දු අලුත් අවුරුද්ද කිව්වම ඉතිං බාල මහලු කාට කාටත් ඉස් ඉස්සෙල්ලාම මතක් වෙන දෙයක් තමයි අලුත් ඇඳුම් ටිකක් ගන්න ඕන කියන එක. ඒක නිසාමනේ අපේ අය මාර්තු ඉඳලම අලුත් අවුරුදු ෂොපින් සවාරිය පටන් ගන්නෙත්. අත දරුවොත් වඩාගෙන, තවත් දරුවෝ අතින් පයින් අල්ලගෙන, ගෑනු උදවිය එක්කෙනාට එක්කෙනා පොර කාගෙන, අතේ තියන කීය හරි වියදම් කරගෙන, පිරිමි උදවියට රෙදි සාප්පුව ඇතුළෙම නින්දෙ යනකල් කරන මේ යුද්දෙ, ලංකාවේ අපිට නම් හරිම හුරු පුරුදු දෙයක්.

කොරෝනා ලංකාවට ආව මුල් කාලේ නිසාම 2020 අලුත් අවුරුද්දේ නම් රෙදි යුද්ධයක් නැතුවම, තියෙන ඇඳුමක් ඇඳගෙන, ගෙවල් ඇතුළට වෙලා, ඇඳිරි නීතියත් එක්ක, අතේ තියන කීය හරින් ඉතිරි කරගෙන, තියන දෙයක් කාලා බීලා, පවුලේ අයවලුත් එක්ක සාමකාමීව ගෙවිලා ගියා.

ගිය අවුරුද්ද එහෙම ගෙවිලා ගියා කියලා හැමදාමත් එහෙම ඉන්නවා කියන එක ඇත්තටම ප්‍රායෝගිකව කරන්න බැරි වැඩක් කියලා අපි කවුරුත් දන්න දෙයක්. ඒ නිසාම මේ වෙද්දිත් රටේ ගොඩක් දේවල් සාමාන්‍ය අතට හැරිලා ඉවරයි. ඒ මොනවා වුනත් කොරෝනා වයිරසයගේ තිබීම අඩුවක් දකින්නට නැහැ.

ඒ දේවල් එහෙම වෙද්දිත් රටට තියන ලොකුම ඛේදවාචකය තමයි කොරෝනා කියන්නේ වසංගතයක් කියලා කාට කාටත් දැන් වෙද්දි අමතක වෙලා තියන එක. 2020 අලුත් අවුරුද්දේ ඇඳුම් ඇරියස් එකත්, 2021 අලුත් අවුරුද්දෙන්



අල්ලනව කියන එක දැන් ඕනම කෙනෙක්ට ඇඳුම් සාප්පුවක් ළඟින් යද්දි ඕනම වෙලාවක දකින්න පුළුවන් දෙයක්. මීටරේ සෙන්ටි මීටරේ වෙද්දී, මාස්ක් එක ටිකෙන් ටික බෙල්ලට වැද්දී, සබන් දාලා අත සෝදනවා තියා සැනිටයිසර් එකක්වත් ළඟ නැති වෙද්දී, ලෝකේ අවසාන රෙදි ටික සොයාගෙන අපේ මිනිස්සු ගමන් ආරම්භ කරලා ඉවරයි.

මී මැසි පොදියක් වගේ සාප්පු අස්සට රිංගලා, එක්කෙනෙක් ගිහිල්ලා කපපු ඇඳුමක් සිය දහස් වරක් ආයෙ ආයෙත් ගිහිල්ලා කපලා, ඩාක් එකක් දාන්නත් බැරි පුංචිම පුංචි පැටවුන්ටත් ඇඳුම තිය තිය තෝරලා, අපේ මිනිස්සු මේ පාර නම් යන්න හදන්නේ එසේ මෙසේ නැගුම් යාමක් නම් නෙවෙයි. මේ අලුත් අවුරුදු නැගි බෝග කෙසේ වෙතත් ගෙයින් ගෙට කොරෝනා නැගි කරන්න යන අවුරුද්දක් වන බව නොඅනුමානයි.

සිහි බුද්ධියෙන් වැඩ කරන මිනිස්සු කොරෝනාවෙන් ආරක්ෂාවෙලා ජීවිතේ බේරාගන්න වෙහෙසෙද්දිත් තවත් අපේම පිරිසක් ජීවිතේ කවදාවත් ඇඳුමක් ඇඳල නැති ජාතියක් වගේ මෙහෙම හැසිරෙන එක නම් රටටම කොඩිවිනයක් ම අවාසනයි. අනුන් ගැන කෙසේවෙතත් තම තමන්ගේ ජීවිතයවත් ආරක්ෂා කරගන්නට අපේ මිනිස්සුන්ට පුළුවන් නම් අනෙකාගේ ආරක්ෂාවද ඉබේම සිද්ධ වේවි.

ඇඳුම් එක්කම කොරෝනා පොකුර නොමිලේම ගෙදර අරන් යන කාලයක් වෙනුවට නිසිපරිදි මුව ආවරණයක් පැලඳලා, සබන් දාලා අත් සෝදලා, මීටරේ මීටරේ පිළිවෙලට අවශ්‍ය අය පමණක් පැමිණ, අවශ්‍ය දේ පමණක් අරගෙන හැකි ඉක්මනින් ඒ ඒ ස්ථානවලින් ඉවත් වෙලා යනවානම් "අවුරුදු පොකුරු" කියලා රජය කොරෝනා රැල්ලේ ආරම්භයක් ඇති නොවේවි. ඉතිං අපි පරිස්සම් වෙමු. සිහියෙන් ජීවත් වෙමු.

**කේ.ඒ.ආර්.කේ. සමරවික්‍රම**
**නැගෙනහිර විශ්වවිද්‍යාලය**

## අවුරුදු උදාවයි සොබාසිරියයි



සිරිලක සිරියෙන් පිරී ඉතිරී යන සිංහල අලුත් අවුරුද්ද ලාංකික ජනතාවගේ ඓතිහාසික, උදාර, අනන්‍යතාව ප්‍රකට කරන කැඩපතක් බඳුය. ආහාර පාන, ඇඳුම් පැලඳුම්, ගමන් බිමන් ආදී ජීවන ගමනේ සියලුම අවශ්‍යතාවයන් සම්පාදනය වන මෙම බක්මහ උලෙළ සොබාදහමින් මානව පරපුරට පිදෙන උතුම් දායාදයකි.

ලක්දිව බක්මහ උලෙළ ළං වනවිට ගම් නියම්ගම් නගරවල ගෙයක් දොරක් පාසා මඟක් තොටක් ගානේ බාල, තරුණ, මහලු යන සෑම දෙනාම අලුත් සිතුම් පැතුම්වලින්, සම්පත්වලින් ප්‍රබෝදමත් වන්නේ මල්පලින් බර තුරුලතා මත ගිරා, කොවුල්, සැළලිහිණි ආදි විහඟුන්ගෙන් ඇසෙන සුමිහිරි නාදයෙන් යොමු වන සංඥාවන්ගෙනි.

මෙහිදී මේ උත්සව සමයේ ක්‍රියාකාරිත්වයෙන් පෝෂණය වන ප්‍රධාන විෂයන් පිළිබඳ ඉතා සංක්ෂේප විවරණයක් කෙරෙන්නේය.

01 නක්ෂත්‍ර විද්‍යාව
02 බුද්ධාගම හා හින්දු ආගම
03 කෘෂි කර්මාන්තය
04 ශිෂ්ටාචාරය

මිනිසා විශ්වය පිළිබඳව සිතන්නට ආරම්භ වූ දා සිට නක්ෂත්‍ර විද්‍යාව උපයෝගී කරගත් බව ශාස්ත්‍රඥයන්ගේ මතයයි. චින්තන ශක්තිය දියුණු වන විට විශ්වයේ ක්‍රියාකාරීත්වය පදනම් කරගෙන එයින් කාලය හා වේලාව මෙන්ම දුක සැප පිළිබඳව තීරණය කරන්නට වූයේ දිගු කලක් කළ පර්යේෂණාත්මක අත්දැකීම් අනුවය. අප මහපොළොව මත සිට දර්ශන පථයේ ප්‍රකටම පෙනෙන ඉර හඳ, තාරකා ආදි ග්‍රහලෝකවල චංචලභාවය මිනිස් චින්තනයට මෙන්ම පුද්ගලාන්තර සහජීවනයට ද, සජීවී ශිෂ්ටාචාරයට ද බලපාන අයුරු සොයාගෙන එයට ශාස්ත්‍රීය ලෙස සූදානම් වන්නට මෙම උත්සවය මාර්ගෝපදේශක වන්නේය. භාරතයේ ආදිතම සාහිත්‍යය වන වේද වේදාංග අතරින් ජ්‍යෝතිෂය හෙවත් තාරකා ශාස්ත්‍රය බ්‍රාහ්මණ අධ්‍යාපනයේ ප්‍රධාන අංශයයි. එය වඩාත් යෝග්‍යකාරක වූයේ යාගහෝම පැවැත්වීමේ කාලය දැන ගැනීමටය. භාරතීය හා ශ්‍රීකරෝම ශාස්ත්‍රඥයන් ජ්‍යෝතිෂය හෙවත් තාරකා ශාස්ත්‍රය හදාරමින් කාලය නිසි පරිදි බෙදා වෙන් කර ගෙන ආගමික සිරිත් විරිත් සිදු කරන්නට මෙන්ම නිමිති කීම, පුද්ගලයාගේ දෛවය කීම, දින දර්ශන සකස් කිරීම ආදි වශයෙන් මිනිසාගේ දෛනික ජීවිතය මෙහෙයවන්නට විය.

ශ්‍රී ලංකාවේ මෙම අලුත් අවුරුදු උත්සවය පුද්ගලාන්තර සහජීවනය තහවුරු කරගන්නට ඒකාන්තයෙන් හේතුවාසනා වන්නේය. නක්ෂත්‍ර විද්‍යාවෙන් කාලය පාලනය කරගෙන ජීවන ගමනේ සාර්ථකත්වයට යථා පරදීම උපකාරී කර ගැනීමෙහිලා මෙම අවුරුදු සමයේ ජනතාව සූදානම් වන්නේ සෙසු සියලු කාර්යන් අමතක කරමිනි. දින දින යාන්ත්‍රීකරණයෙන් සසලවන ජනතාවට මෙම කාලය තුළ සිහි බුද්ධියෙන්, සහන් සුවයෙන් ප්‍රසන්න මනසින් පෞද්ගලික පොදු කාර්යයන් සාධනීය සඵලත්වය දක්වා කරගෙන යෑමේ ධෛර්ය, වාසනාව උදාවන ආකාරයට අවුරුදු සමයේ ක්‍රියාවලිය සකස් වී ඇත. සිතීම, අධිෂ්ඨානය ක්‍රියාකාරීත්වය හා විපුල ප්‍රයෝජනය යන සියල්ලම එකිනෙකට ක්‍රමවත්ව සංයුක්තව පවත්නා බැවින් ප්‍රත්‍යක්ෂයෙන් ජීවන ප්‍රතිලාභ ලබන්නට හැකි වන්නේය.

දින, මාස, සති, පක්ෂ, මොහොතෙ, අනුව පියවරෙන් පියවර එළඹෙන කාර්යයන්ට පොදුවේ සම්බන්ධ වන්නට හැකි නිසාම ගෙදර දොරේ ගමේ රටේ සාමය, සමගිය, වර්ධනය වී සම්පත් පිරී පැතිරී යන්නේය.

ශ්‍රී ලංකාවාසී ජනතාව වසර දෙදහස් පන්සිය ගණනකට පෙර සිට බුද්ධාගම හා හින්දු ආගම දෙක මිශ්‍රව ශ්‍රද්ධා භක්ති චින්තනයෙන් බුද්ධාදී තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් හා අපමණ දේවභක්තියෙන්, ස්වාධීන චින්තනයෙන් ප්‍රාණවත්ව උතුම් සිරිත් විරිත් අනුගමන කොට උදාර මානුෂික ගුණාංග ආරක්ෂා පෝෂණය කොට මතු පරපුරට දායාද කළ අයුරු මෙවන් උත්සව ඉතිහාස කතාවෙන් ප්‍රකට වන්නේය.

ලක්දිව ජනවංශ පරපුරේ අතීත රජවරුන් ද නැකැත් කෙළි පැවැත්වූ අයුරු මහාවංශාදී ඓතිහාසික ග්‍රන්ථවලින් දක්නට පුළුවන. සියදහස් ගණන් සිරිත්වලින් පෝෂණය වී ආර්ය ශිෂ්ටාචාරය මෙතරම් උදාරත්වයට පත් වූයේ එවන් අසිරිමත් සැණකෙළිවලින් ආරක්ෂා වූ සාමූහික හැඟීම් නිසාමය.

විශේෂයෙන් සූර්ය මණ්ඩලය මීන රාශියෙන් මේෂ රාශියට සංක්‍රමණය වන මොහොත සෞරග්‍රහමණ්ඩලයම අක්‍රිය වන නිසා ජීව අජීව සැමටම බලපාන බැවින් මානව සිත්සතන් තුළ ආධ්‍යාත්මික හැඟීම් ජනිත විය යුතු වන්නේය.

නක්ෂත්‍ර විද්‍යාවත්, බෞද්ධ දර්ශනයත්, ආයුර්වේදයත් එක්තැන් වී සෑම දෙනාගේම සම සිත්හි ඇති වන මෙම අලුත් අවරුදු උත්සවය තරම් ප්‍රසන්න ප්‍රබෝධවත් වෙනත් සැණකෙළියක් නැත්තේමය.

අලුත් අවුරුදු උත්සවය ප්‍රධාන කරගෙන ලාංකිකයන් ලබන ප්‍රධාන ප්‍රතිලාභ අතර ආගමික දියුණුව, උදාර සිරිත් විරිත් ආරක්ෂා කර පෝෂණය වීම, ජාතික සමගිය තහවුරු වීම, සෞන්දර්ය විෂය පෝෂණය විම වැදගත් වේ.

සොබාදහමින් ජනතාවට ලබාදෙන භූගත සම්පත් පොදු හැඟීමෙන් පරිහරණය කරන්නට මෙන්ම මතු පරපුරට සම්ප්‍රේෂණය කිරීමෙන් එම නැවුම් අදහස් හා ක්‍රියාකාරිත්වය පෝෂණය කරන්නට අවස්ථාව එළඹෙන්නේ මෙම අවුරුදු උත්සව සමයේ බව ප්‍රත්‍යක්ෂ වන්නේය.

මිනිසා මිනිසාට ගරු කළ යුතුය යන ප්‍රධාන තේමාව අනුව සිංහල බෞද්ධයන් මෙම අවුරුදු උත්සව සමය තුළ සිදු කරන ආචාර සමාචාර වැඳුම් පිදුම් අපමණය. මහා සංඝරත්නයට, ගුරු දෙගුරුන්ට, වැඩිහිටියන්ට බුලත් අත් ඇතිව පසඟ පිහිටුවා වඳින පුදන විට එකී දරුවන්ට, ශිෂ්‍යයන්ට ලැබෙන ආශීර්වාදය වර්ෂය පුරාවට නීරෝගි සම්පත්තියට, දිගාසිරි ලැබීමට, වාසනා මහිමයට හේතුවාසනා වන්නේය.

පූජාකො ලභතෙ පූජං
වන්දකො පටිවන්දනං

ආදී නයින් දේශනා කළ ධර්මයට අනුව වඳින පුදන, ගරුකරන අයට යළි එහි ප්‍රතිවිපාක වශයෙන් මහා විශ්ව බලයක් ලැබෙන්නේය. මහා සතුරු විපත්, කරදර, වේදනා සමනය වන්නේය.

ශ්‍රී ලංකාවේ විවිධ ජාතීන් එකමුතුව ජීවත් වන්නේ බෞද්ධ දර්ශනයේ විද්‍යමාන වන අනිත්‍යාදි ත්‍රිලක්ෂණය නිසාය. එහෙත් මෙහි අර්ථය හා බලපෑම් පිළිබඳ යථාර්ථය ගැන දන්නේ ඉතා ස්වල්ප දෙනෙකි. අවුරුදු උත්සව කාලය තුළ එම යථාර්ථය නිසාම සාමය, සමගිය සපුරා ක්‍රියාත්මක වන්නේය. මෙම විශ්වයට අයත් ජීවීන් හා වස්තු පවතින්නේ අනිත්‍ය ක්‍රියාත්මක වන නිසාය. ඇති වීම හා නැති වීම අතර අන්තරයක් නැති නිසා යමක් පවත්නා බව පෙනෙන මුත් එම අන්තරය කොයි මොහොතක නැති වන්නේ දැයි කිව නොහැක. අලුත් අවුරුදු කාලය තුළ පවත්නා සුහදශීලීභාවයෙන් ජාතික සමගිය ඇති වන්නේය. ශ්‍රී ලංකාවේ අනන්‍යතාව ප්‍රකට වන ඇඳුම් පැලඳුම්, ආහාරපාන, කෙළිසෙල්ලම්, භාෂා සාහිත්‍ය, නාට්‍ය, සංගීත අලුත් අවුරුදු සමය තුළ ළමා චින්තනයට මනනන්දනීය වින්දනයක් ලබා දෙන්නේය. කාලය හා පරිසරය අනුව පාරම්පරිකව පැවතෙන ඔන්චිලි පැදීම, අඟ ඇට පැනීම, ඔළිඳ කෙළිය, බෙල්ලන් දැමීම ආදී කෙළිසෙල්ලම්වලින් සුන්දර ළමා ලෝකය ප්‍රභාමත් වන්නේය. අවුරුදු උත්සවයේ ක්‍රියාවලිය තුළ පවතින ප්‍රධාන කාරණය නම් වෙලාවට වැඩ කිරීම හා එම අවස්ථාවේම එහි ප්‍රතිඵල ලබාගැනීමයි. මෙම ප්‍රවණතාව සැමදාම සෑම පුරවැසියාටම පවතින්නේ නම් ශ්‍රී ලංකාව වසරකින් සුරපුරක් කරන්නට හැකිවන්නේමය.

**අමුණුපුර පියරතන හිමි**
**අස්ගිරිය**





## හිසතෙල් ගෑම සිංහල අලුත් අවුරුද්දේ සුවිශේෂිත වූ චාරිත්‍රයකි

සිංහල හින්දු අලුත් අවුරුදු සංස්කෘතික සැණකෙළියේ සිදුවන ක්‍රියා පද්ධතියේ හිසතෙල් ගෑම සුවිශේෂිතය. මේ හිසතෙල් ගෑමට ඇත්තේ දිගු ඉතිහාසයක් යැයි ඒ පිළිබඳව ඈතට තතු සෙව්වෝ පවසති.

අද ද නුවර කලාවියේ ජනයා අනුරාධපුර යුගයේ ඇති වුණු මේ සම්ප්‍රදාය අඛණ්ඩවම රකින බව පෙනේ. අස්වැන්න නෙළා ගැනීමෙන් අනතුරුව රුක්මූලයක් භාවිතයට ගෙන පූජාවක් පවත්වා ඉන්පසු පන්සලට ගොස් එහි වැඩ වසන බුද්ධ සංකේතයට මුල් බුද්ධපූජාව තබා සංඝරත්නය ලවා හිසතෙල් ගාවා ගැනීම ජීවිතාශ්‍රිත පුරුද්දක් බවට පත්කරගෙන ඇත.

මේ හිසතෙල් ගෑමේ සම්ප්‍රදාය අද පරිණාමයට පාත්‍ර වී සිංහල-හින්දු අලුත් අවුරුදු සංස්කෘතිකම හා සැණකෙළියේ සුවිශේෂිත අංගයක් බවට පරිවර්තනය වී ඇත. ඇතැම් පෙදෙස්වල අලුත් අවුරුදු උලෙළ ලෙස සලකනු ලබන්නේ හිසතෙල් ගෑමේ උලෙළයි. ජීවිතයේ සියලු දුක්ඛයන් මහ සයුරට එක්කොට අලුත් වසරට ජීවිතයේ අලුත් පිටුවක් පරිච්ඡේදයක් පෙරළා ගැනීමේ අරමුණෙන් මෙසේ හිස තෙල් ගාවා ගනු ලබන්නේ පෙර සිරිතට අනුගතව නිරෝගී දිවියක් ගත කොට ප්‍රඥාව ලැබීමේ අටියෙනි.

ජීවිතය නීරෝගි නැත්නම් එයට සාපේක්ෂව ප්‍රඥාව නොවූයේ නම් එම ජීවිතය නිසරු අර්ථ ශුන්‍යභාවයෙන් උපයුක්ත වූවකි. එබැවින් දුරදිග බලා මෙසේ ඖෂධීය තෙල්වලින් වැඩිහිටියකු නැත්නම් ගමේ පන්සලේ නායක හාමුදුරුවරුන් ලවා හිසතෙල් ගාවා ගැනීම ඉතාම වැදගත් කර්තව්‍යයක් බවට පත්ව ඇත.

මෙවර හිසතෙල් ගෑම අප්‍රේල් මස 15 සෙනසුරාදා පූර්ව භාග 11.04ට උතුරු දිශාව බලා නීල වර්ණ වස්ත්‍රාභරණයෙන් සැරසී හිසට නුග පත් ද පයට කරඳ පත් ද තබා තල තෙල් හා නුගපත් යුෂ මිශ්‍ර නානු ද ගා ස්නානය කරනු මැනවි යනුවෙන් ජ්‍යෝතිෂයේ නියමයයි.

වැඩි වශයෙන් මේ තෙල් හා නානු සකස් කරනු ලබන්නේ ගමේ පන්සලේ නායක හාමුදුරුවරුන්ය. නැකැත් සතරට අනුව කෙරෙන මේ භාග්‍යවත් සාපත්‍යයට මුළුමනින්ම උරදෙනු ලබන්නේ පන්සලේ නායක හාමුදුරුවන්ය. මුළු ගමටම තෙල් හා නානු සකස් කොට බෙදා දෙනු ලබන්නේ ද පන්සලයි. මෙය ඒ සඳහා කේන්ද්‍රස්ථානයයි. උදයේම පන්සලට ගොස් තෙල් හා නානු ගෙන ඒම අතීතයේ පැවති සිරිතයි. මෙයට දශක තුනකට හතරකට පෙරාතුව මේ සම්ප්‍රදායය රට පුරා හැම පන්සලකින්ම සිදු වුව ද අද එය ගමේ පන්සලෙන් දූරස්ථව ගමේ ප්‍රභූ ගෙදරකට පමණක් සීමා වී ඇත. එහෙත් සමහර පන්සල්වල නායක හාමුදුරුවන් මේ පැරණි සිරිතට මූලිකත්වය දෙමින් තෙල් හා නානු සකස් කිරීම ගැන පැසසිය යුතුය.

පැරණි පුස්කොළ පොතක වට්ටෝරුවකට අනුව නානු සෑදීමට ගන්නා ඖෂධ මෙසේය. කලාඳුරු අල, කුංකුමප්පු, සුදුහඳුන්, විශ්ණුක්‍රාන්තිය, ගෝරෝචන, සස්සඳ මුල්, ඉරිවේරිය, නස්නාරන්මුල්, සැවැන්දරාමුල්, නෙළුම්දඬු, ගොඩමානෙල් අල, බෙලිමුල්, වෙනිවැල්ගැට, රත්ණ යන වර්ග 14 සමව ගෙන තලා අළුත් මුට්ටියකටය දමා තම්බා පත අටදෙකට සිඳගනු ලැබේ. ඉන් පසු නුග පත් කොටා ඒවායේ යුෂ ද දෙහි ඇඹුල් ද ඉහත සඳහන් දියරය දමා හොඳට මිශ්‍රකොට පිරිසිදු රෙද්දකින් පෙරාගනු ලැබේ. එවිට ලැබෙන දියරය 'නානු' ලෙස භාවිත කෙරේ.

හිසතෙල් සඳහා භාවිත කෙරෙන තෙල් වර්ග මෙසේයි. තල තෙල්, මී තෙල්, අබතෙල්, කොහොඹ තෙල් හා එඬරුතෙල් මිශ්‍ර කොට 'තෙල්' සකසනු ලැබේ. මේ 'තෙල්' හා 'නානු' හිසට ගා නෑම සිදුකිරීම හිසතෙල් ගෑමේ උළෙලේ සමාප්තියයි.

මේ සඳහා උපයෝගී කොට ගන්නා අමුද්‍රව්‍ය ආයුර්වේදයේ සඳහන් ඉහළම ශාක සාරයයි. සොබාදහමෙන් මිනිසාට ලැබී ඇති අමුද්‍රව්‍ය සියල්ල මිශ්‍රකොට හිසේ ගල්වන්නට ඇත්නම් කොතරම් භාග්‍යයක්ද? එයින් විදහාපාන්නේ ජීවක ගුණයයි. මිනිසාගේ හිසේ රෝග නිවාරණය කරනු ලබන්නේ හිසේ තෙල් ගැල්වීමෙනි. හිසේ නිතර ඇතිවන වේදනාව, හිසරදය, අව්වේ යෑම අගුණ වීම, අකලට හිසකෙස් පැසීම, නුවණ වැඩීම ආදියට ශරීරයේ උත්තමාංගයවන හිසේතෙල් ගැල්වීම ගුණදායකයි.

වසර ගණන් පිරිතෙන් පේ කරන ලද තෙල් යොදා සකස් කරන මෙම ඖෂධය හිසට ගල්වා ගන්නේ ද නිරෝගී වැඩිහිටියෙකු ලවාය. එසේ නැත්නම් ගෙදර බුදුන් ලෙස සලකන දෙගුරුන් ලවාය. එසේත් නැත්නම් ගමේ පන්සලේ ලොකු හාමුදුරුවන් නැත්නම් නායක හාමුදුරුවන් ලවාය.

ලෙඩදුක් වලින් තොර නිර්ආබාධිත වසරක් සඳහා කරන ආශීර්වාද පතන පැතුම් අලුත් අවුරුද්දේ උදාරවත් සිතුවිලි හා ප්‍රාර්ථනා වෙයි. වත්මන් ලෝකයේ තිබෙන විවිධ උත්සව අතර සිංහලයන් හා හින්දු භක්තිකයන් විසින් සමගි දමින් බැඳි පවත්වන හා පැවැත්විය හැකි එකම උත්සවය මේ බක්මහ උලෙළයි.

ඒ ඒ නැකත අනුව ද හිසට යොදා ගන්නා පත්‍ර ද වෙනස් වේ. ඉඹුල්පත් ද කරඳපත් ද ඇතැම් විට නා පත්‍ර ද, නුග පත්‍ර ද, බෝ පත්‍ර ද යොදා ගැනේ. කොහොඹ පත්‍රවලට අමතරව නික පත්‍ර ද මේ සඳහා උපයෝගී කොට ගනු ලැබේ. මේ හැම ඖෂධීය පත්‍රයකින්ම මිනිසාට සෙත සලසයි. මේ සියල්ලෙන්ම සංකේතවත් කරන්නේ උපද්‍රවයන්ගෙන් තොර පිංබර දිවියක් උදාකර ගැනීමයි. පුළුල් වූ අර්ථයක හා පරාසයකට විහිදී ගිය හිසතෙල් ගෑම සිංහල අලුත් අවුරුද්දේ සුවිශේෂිත වූ භූමිකාවකි.

මේ ගැබ් වී ඇති සමස්ථාර්ථය පෘථුලය. ගැඹුරුය. සමාජය වර්ගීකරණයකට පාත්‍ර නොකොට පන්සල තෙල් හා නානු බෙදා දෙනු ලබන්නේ බුදුරදුන් අපට දේශිත, සමාජවාදී අර්ථ කථනයට අනුගතවය. එයින් බැහැර වීමට අපට කිසිසේත්ම නුපුළුවන. මිනිසාගේ පැවැත්මේ වෛෂයිකභාවය පදනම් කරගෙන මෙබඳු සිරිත් අනුගමනය කිරීමට මිනිසා පොලඹවයි. එය සොබාදහම මඟින් මිනිසා ඒ දිසාවට තල්ලු කරයි. දෝලනය කරයි. වසරක් ගෙවී එසේ නැත්නම් දවස් තුන්සීය හැට පහක් පසු කොට තවත් දින තුන්සීය හැට පහකට මුල පුරන මේ අවස්ථාවේ මෙවැන්නක් අපට දයාද කොට ඇත්තේ ද එහි ඵල වශයෙනි.

**ශාස්ත්‍රපති පණ්ඩිත**
**අරම ශ්‍රී ධම්මතිලක නාහිමි**



# නව වසරක අබිමාන...





# ගැමි ගෙදර අවුරුදු අසිරිය

මඳ පවන ළා දලු සොලවමින් හමා යයි. එරබදු තුරු මත රතට රතේ පිපි එරබදු මල්, උදාවන සිංහල අලුත් අවුරුද්ද ළඟ ළඟ යැයි පවසමින් අතු අග සැලෙයි. ගම්මානය පුරා අතුපතර රැඳි කොවුලන්ගේ මිහිරි නාදය හාත්පස පැතිර යන්නේ පරිසරය ගීතවත් කරමිනි. ඈත ගෙදරක රබන් සුරල් වැයෙන හඬද, උණබට වෙඩිල්ලක හඬ සමඟ භූමිතෙල් මුසු වූ දුම වාතලය හා එක්ව තාං සුළඟේ හීන් සැරේ ඇදී යයි. ඒ අසිරිමත් බක්මහේ උදාව සනිටුහන් කරවමිනි. සිංහල අලුත් අවුරුදු සුබ හෝරාව ඇරඹීමට ඇත්තේ තවත් කෙටි කාලයකි. හෙළයේ මහා සංස්කෘතික මංගල්‍යය අනාදිමත් කලෙක සිට පැවැත්වෙන්නේ හෙළ සිරිත විරිත මුල්කර ගනිමිනි. සිංහල ගැමි ගෙදර සිංහල අලුත් අවුරුදු දිනය හරිම අසිරියකි. ඔවුන් සිංහල අලුත් අවුරුද්දට පේවෙමින් සූදානම් වන්නේ, මුල පුරන්නේ අවුරුදු උදාවට පෙර සිටමය. නැවුම් අස්වනු නෙළාගත් ගොවි ගෙදර සතුටින් පිරෙන කාලයකි. බක්මහේ අකුණු ගහමින් මහ වැස්ස ඇළ දොළ වැව් පුරවමින් ගැමියන්ගේ සිත් ද පුරවයි.

කුඩා දරුවෝ අස්වනු අහවර කළ කුඹුරුවලට බැස කරල් අහුලමින් සිංහල අවුරුද්දට රතිඤ්ඤා ගැනීමට මුදල් සරිකර ගනිති. වවුලන් කා දැමූ කජු ඇට ඇහිඳිමින් වළ කජු ගැසීමට මෙන්ම කජු අළුවා සඳහා මෙන්ම සිංහල අවුරුද්දේ කජු මාළුවට ද සරිලන සේ වවුල් පොළවල් මඟ නොහැර කජු එකතු කරති. ගොම මැටි ගා ගැමි ගෙදර බිම, බිත්ති, වටපිළ, පොල්අත්තේ රටාවට ගේ මැදෙන්නේ අලුත් අසිරියක් එක් කරමිනි. ඔවුහු රතු පස්, හිරියල් පස් හා ගොම මැටි සමඟ අපූරු වර්ණයන්ගෙන් ගෙහි බිත්ති මැටි පිරිමදිති. නැවුම් වළං ගෙට පැමිණ පැරණි වළං අහවර කරයි. අලුත් පොල්අතු සෙවිලි කළ වහලය ගෙදරට අලුත් ඇඳුමක් ඇන්දූ කලෙක මෙනි. ගෙවත්තේ කුණු රොඩු පුලුස්සා කල එළි කෙරෙන්නේ දැළි රැවුල් බාගත් ඉලන්දාරි මුහුණක් පරිද්දෙනි. අලුත් සහල් සැකසීම ලහි ලහියේය. නැවුම් පොල්තෙල් සිඳීමට වෙන් කළ ගසක් අතු බැඳ එහි ගෙඩි අවුරුද්දට ගන්නා තෙක් තහංචි කරති. නැවුම් පොල් නෙළා බිඳ ගා ගත් පොල් තම්බා මිරිකා තෙල් හිඳගන්නා අපූරුවත් ඉතිරිවන තෙල් කහ අපූරුවට කිරි කැඳ බවට පත් කරන තෙක් අම්මා වටා කුඩාවුන් කැරකෙන්නේ කිරිකැඳ රස දන්නා නිසාමය. එකෙක් තෙල් ඉවත් කළ කුණ්ඩහට්ටියට අතදමා තෙල් කහ මිටක් කට ලන්නේ එහි ඇති රසයත් සමඟ තලු මරමිනි. කුස්සියට අහවරක් නැත. කුරහන්ගල, මිරිස්ගල, වංගෙඩි මෝල්ගස් නැම්බියන් ගේ අතින් අත මාරුවෙමින් කදිමට මුං පිටි, කුරහන් පිටි, හාල් පිටි සැකසෙන්නේ නැවුම් බවකිනි. අම්මා ගෙදරදොර බලාගන්නා අතර, තාත්තා සිදාදියට ගොස් තුනපහ, ගෙදර සියල්ලන්ට රෙදි පෙරදි, හොඳ කරවල කූරියෙක් දෙන්නෙක් හා ලොකු කුඩාවුන්ට රතිඤ්ඤා රෝලක් ද බඩු මල්ලට එක්කර ගැනීම සිදු කරයි. තාත්තා පැමිණි පසු මල්ල ලිහා බලන තෙක් ගෙදර ඇත්තන්ට ඉස්පාසුවක් නැත. අලුත් චීත්ත, සරොම්, බඩුමුට්ටුවල සුවඳ මල්ලෙන් එළියට එන්නේ සියල්ලන් ගේ මුහුණු ඔපවත් කරමිනි.

## කෘතගුණ දැක්වීම

බල්ලාගේ බිරුමත් සමඟ ගෙදරට ගොඩවන රෙදි නැන්දා අවුරුද්දේ අමතක නොවන චරිතයකි. අවුරුද්දක් පුරා කිලිටි පිරිසිදු කරන රෙදි නැන්දා ගෙදර සමීපතමයෙකි. පිරිසිදු කළ රෙදි වෙන වෙනම දෙන අතර අලුත් අවුරුද්දේ කිලිටි බාර නොගනියි. ඒ වෙනුවට මල්ලක් පුරා අලුත් සහල්, කරවල, තුනපහ, චීත්ත රෙද්දක්, රතිඤ්ඤා ටිකක් එතු වූ "දිවෙල්" මල්ල රෙදි නැන්දාට තෑගි කරමින් කිලිටි සුද්ද කිරීමට කෘතගුණ දක්වයි. අවුරුද්දක් තිස්සේ බත බුලත සරිකර ගැනීමට උදව් කළ පස්ගෝ රසින් පවුල පෝෂණය කළ ගවයා ගැමියා මහ ඉහළින් සලකයි. ගව ගාලේ ගොමරිටි එක්තැන් කොට ගාල පිරිසිදු කරමින්, සතුන් නහවා සාත්තු කිරීමත් ගෙදර ඉලන්දාරින්ට පැවරී ඇති කටයුතු අතර වේ.

සුබ දිනය ළංවන විට ගැමි ගෙදර කටයුතු සාරසුබාවට අහවර වෙමින් සැහැල්ලුවට පත් වෙයි. කිරිඅම්මා, කිරිඅත්තා ඔවුන්ගේ සිල් රෙදි පිරිසිදු කර නිල් දමා සුදෝ සුදුවට වියළා තබන්නේ නොනගතය දා පන්සල් යාමට පෙරුම් පුරමිනි.

ගෙදරම සිටුවා අවුරුද්දට ගැනීමට හැකි වන සේ සාත්තු කළ කෙසෙල් කැන් තාත්තාගේ අතින්ම කැපී වළට දමා දුම් ගසන්නේ එය නොකරම බැරි කාරියක් ලෙසිනි. අවුරුද්දට දිනක් තියා වළ පස් ඇර ඉදුණු කෙසෙල් ඇවරි එකින් එක ගොඩ තබන කළ තාත්තාගේ මුහුණ ද සතුටින් පිරී යයි. කුඩාවුන් එකිනෙක ඇවරිය බැගින් ගෙන ගෙදර වැල් ඇඳ යට එළූ ගෝනි පඩංගුව මත කෙසෙල් ඇවරි තබන්නේ සීරුවටය. අවසානයේ මල් ඇවරිය අතට ගන්නා කළ



අපගේ මුහුණුවලද සිනා ඇඳේ. ඒ තාත්තා මල් ඇවරිය අපට කෑමට දෙන හෙයිනි. නැකතට තෙල් තාච්චිය ළිප තැබීම අම්මා මහත් ඉහළින් කරන කටයුත්තකි. පදමට ඇනූ පිටිවලින් සැකසූ දවුල් කුරුඳු නානු යොදා පිළියෙළ කළ පිටි ආනම අම්මාගේ ඇඟිලි අගින් පෙරෙමින් තාච්චිය පුරා දුවන්නේ රටාවකටය. ආස්මී සිනාසෙන්නා සේය. ළිප ළඟ සිටින ඇයගේ මුහුණ ගිනි රස්නයට දිලිහෙමින් දහදිය හා මුසු වූ දාහය සමඟ තවත් රන්වන් කැවුම් ගෙඩියක් මතක් කරමින් බැදෙන අතිරස, කොණ්ඩ කැවුම්, කොකිස්, මුං කැවුම් සියල්ල හට්ටි මුට්ටිවලට පිරවෙන්නේ අක්කා ගේ අතිනි. අවුරුද්දට ඉඳුල් කරන තෙක් කඩවතක් බැඳ ඒවා වෙනමම තබයි.

## අවුරුද්දේ කොටස් තුන

සිංහලයෝ අවුරුද්ද කොටස් තුනකින් ගත කිරීමට කටයුතු කළහ. ඒ පරණ අවුරුද්ද ,නොනගතය, අලුත් අවුරුද්ද ලෙස මේ සියල්ල මනා සංයමයෙන් , සීරුවට, දැහැමිව, සාරසුබාවට එකිනෙකා කෙරෙහි අසීමිත ගෞරවයෙන් බැතියෙන් සිදු කළ කටයුතු විය. තවවත් අවුරුද්දකට ජීවනෝපායට මේ සියල්ල ගැමියෝ නිබඳවම ප්‍රාර්ථනා කළහ. ඒ තුළින් ගොවිතැනට ඇවැසි ශ්‍රමය සපයන පවුලේ සාමාජිකයන්ගේ අභිවෘද්ධිය අපේක්ෂාව විය.

සිංහල අවුරුද්ද උදාවට පෙරදින පරණ අවුරුද්ද ලෙස සලකා කටයුතු කළහ. ඒ මෙතුවක් තමනට උපකාරී වූ සියල්ලන්ට ගෞරවයෙන් සමුදීමට කෘතවේදී වීමට හා නැවුම් හැඟුම් තුළ අලුත් වීමට පසුබිම සකසා ගැනීමටය. පරණ අවුරුද්දේ ස්නානය කිරීම වැදගත් කාර්යයක් සේ සැලකූහ. ගෙදර දොර වැඩ අහවර කර දිවා ආහාරයට පෙර ස්නානය සඳහා අලුත් වතුරින් පිරී ගිය වැව දෙසට ගෙදර සියල්ලන් පා නගයි. දොඩම්, ඇඹුල් කොතලය අම්මාගේ හිණ රැඳී තිබිණ. කිරිඅත්තා, කිරිඅම්මා, තාත්තා, අම්මා පිළිවෙළින් වැඩිමහලු දරුවාගේ සිට බඩපිස්සා තෙක් පැටිපස්පරාණයම සීරුවට පේළියට වැවට ඇදෙන්නේ කතා හා සිනා පිරි උද්දාමයෙනි. එතෙක් ගෙදර පස්ගෝ රස දෙන්නවුන් දක්කාගෙන පිටුපසින් පැමිණේ.

එදිනම සවස මල් පහන් පුදා රෑ බතට කලියෙන් උදාවන නව සඳ බැලීම තවත් අවුරුදු චාරිත්‍රයකි. ජීවිතයට සමෘද්ධිය ළංකරන්නාවූ සිසිල් ගුණයෙන් යුතු සඳ දේවත්වයෙන් සලකා පැරණියෝ කටයුතු කළහ. පියා හිරු මෙන් වූ අතර, මව පවුලකට සඳු මෙනි, මෙයද සංකේතවත් කරමින් චන්ද්‍ර වන්දනාව සිදු කළහ. පැළෑටිවලට ඖෂධවලට මෙන්ම බීජවලට අධිපතිත්වය දරන සඳු ඉෂ්ටාර්ථ සිද්ධියට සම්පත් ලැබීමට හේතුකාර වන බව ගැමියන් විශ්වාස කළහ. ඒ නිසා අවුරුදු උදාවට පෙර අහසේ මෝදු වන නව සඳ බැලීම චාරිත්‍රයක් බවට පත්ව ඇත. ගේ ඉදිරිපස මල් පැල අබියස සිටිමින් වෑ කන්දට උඩින් නැගෙනහිරින් පායා එන නව සඳ ඔවුන්ගේ සියලු සිතුම් පැතුම් ඉටු කරන බවට සපථ කරමින් ටිකෙන් ටික අහස් තලය තුළ විරාජමාන වේ. ගැමියන් දෑත් එක්කොට සොබාදහමේ මේ අපූරු මිතුරාට සිය කෘතවේදී නමස්කාරය එක්කරමින් නව සඳ බැලීමේ චාරිත්‍රය නිමා කරති.

අලුත් අවුරුදු උදාවත් සමඟ සිංහල අලුත් අවුරුද්ද උදාවන නැකතට කලින් සූර්යයා මීන රාශියෙන් මේෂ රාශි ගතවන කාලය පරණ අවුරුද්ද හැරපියා අලුත් වසරට පා තබන මොහොතේ කාලය නොනගතය වේ. මේ කාලය කිසිම රාශියක සූර්යයා පිහිටා නොමැති හෙයින් නැකතක් නොවන කාලය නොනැකැත් හෙවත් නොනගතය ලෙසින් ව්‍යවහර කරයි. සුබ නැකත් නොමැති මෙම කාලය යහපත් කාලයක් නොවන හෙයින් ධාර්මික කටයුතුවල යෙදී අනිෂ්ඨාර්ථයක් සිදු නොකර ගැනීමට ද ගැමියෝ වග බලා ගත්හ. කිරි අත්තාගේ කිරි අම්මාගේ ගතවට පෙර වූ පිරුවට පෙරටු වූ පවුලේ සියල්ලෝම තෙල්, මල්, පහන් රැගෙන පන්සල කරා ඇදෙති. පන්සලේ සණ්ටා නාදය ගම සිසාරා රැව් පිලිරැව් දෙමින් දෝංකාර දේ. බුද්ධ ධම්ම සංඝ ත්‍රිවිධ රත්නයේ හා දේව ආශිර්වාද ලැබ නව වසරට පා තැබීමට ඔවුහු පෙරමුණ ගනිති.

සිංහල අලුත් අවුරුද්දේ නැකත ලබන්නට ආසන්න වන විට ගෙදර සියල්ලන්ම කඩිමුඩියේ ලක ලෑස්ති වෙති. අම්මා ලිප ගිනි මොළවා ආහාර පිසීමටත් තාත්තා ඇතුලු අනෙක් සියලු දෙනා නැකතට වැඩ ඇල්ලීමටත් කටයුතු කරන අතර ඉන් අනතුරුව ආහාර අනුභවයට ලෑස්ති වෙති.

## ගින්නට කෘතවේදී වීම

අම්මා කුස්සියේ නැකතට ගිනි මෙළවීමට සූදානමිනි. මුවවිට දක්වා පිරුණු කිරි ඇති නැවුම් මුට්ටිය පසෙකිනි. ළිප සූදානම්ව ඇත. අවුරුදු සිරිතට අනුව අම්මා නැකතට ගැළපෙන පාට ඇති චීත්තය ඇඳ සිටී. සියල්ලෝම නැකැත් අවස්ථාවට පේවී සිටිති. මහ හඬ නගමින් ගෙදර බීරංගය පත්තු කළේ මද්දුමයාය. දසතින් උණවෙඩි හඬ මෙන්ම රතිඤ්ඤා හඬ ද ඇසෙයි. නැකත උදා වී ඇත. අම්මා දිශාව බලා ලිප පත්තු කළාය. ගිනි දලු මුකුළු නගමින් කිරි මුට්ටිය වටා නටයි. පැසි පැසී ගොජ දමමින් කිරි මුට්ටිය මුව විටින් පෙරී කිරි ඉතිරෙන කළ සියල්ලන්ගේ හිත් ද සතුටින් මෝදු වේ. කැකුළු සහල් ගිතෙල්, උක් හකුරු හා මුං ඇට කිරි හැලියට එකතු වේ. ගිනි දේවත්වයෙන් සලකා ළිප ගිනි මෙළවීම සිදු වේ. ජන ජීවිතය හා ගින්න බැඳී පවතී. හේන් දැවීමේ සිට ගෙදර දොර ආහාර පිසදීමට වසරක් පුරා උදව් වන ගින්නට කෘතවේදී වීම ගැමි සිරිතය. ගින්න කෝප වූ කළ ජන ජීවිතයට එන තර්ජන ඉමහත්ය. ඉන් වැළකීමටත් උදව් උපකාරයට භක්තිමත් වීමත් පැරණි ජනයා තුළ වූ අව්‍යාජත්වය ප්‍රකට කරමින් අවුරුදු නැකතට ගිනි මෙළවූහ.

කෑම මේසය කඩි මුඩියේ පිළියෙල වෙයි. සුදු පිරුවටයෙන් මේසය හැඩ වී ඇත. බුලත් ඇසුරුම මත පිත්තල පහන රන්වන් පැහැයෙන් විරාජමානව ඇත. ඇත්දළ කෝලිකුට්ටු ඇවරියත් මේසය මතට වැඩ සිටී. අතිරහ, මුංකැවුම්, කොණ්ඩ කැවුම්, උඳුවැල්, ආස්මී, කොකිස් එකිනෙකා පරයමින් පැණි බේරෙමින් නැකත උදාවන තුරු බලා සිටිති. මේසය මැද ඉඩකඩ කිරි බතටය. කැට කපන ලද දුම්දමන කිරිබත් පලගාන දෝතින්ම මේසය මත තබන්නේ අම්මාය. අක්කාගේ අතින් ලුණු මිරිස් පසෙකය. කිරි බතේ සුදු පැහැය කෑම මේසය ඔපවත් කරයි. සියලු කෑමවලින් සැකසූ පලගානක් පසෙකය. එය පන්සලටය. ආහාර අනුභවය දක්වමින් නැකත එළඹි බවට ආයෙත් බීරංග හඬ හා නොනැවතී නැඟුණු රතිඤ්ඤා හඬද කෙමෙන් තුනී වෙයි. පහනේ සිලි එකින් එක දැල්වේ. කිරි අත්තා සියලු ආහාරවලින් ටික ටික ගෙන ඇතුල් පතක තබා ඉෂ්ට දේවතානුස්මරණය කරමින් පසෙක තබයි. පවුලේ වැඩිහිටියා අතින් සෑම දෙනාගේම ඇතුල්පත් මත ඇති කෙසෙල් කොළවල කිරිබත් ඇතුළු ආහාර වර්ග තබයි. සියල්ලෝම තමන්ගේ ඇතුලුපත දෝතින් ගනිති. ඉෂ්ට දේවතානුස්මරණයේ යෙදෙමින් නිදුක් නිරෝගී සුවය හා සමෘද්ධිය උදෙසා අලුත් අවුරුදු මේසය ඉඳුල් කරති. කිරිබතට කැවුමට කොකිසට කුඩාවුන් වග කියන්නේ බලා ඉදිද්දීමය. තවත් ඇතුල්පත් කීපයක් ගව මහීෂාන්දීන්ට වෙන් වේ. ගෙදර ටොමියාට ද අලුත් අවුරුද්ද ඉව වැටී ඇත. ගනුදෙනු කිරීමේ හා වැඩ ඇල්ලීමේ නැකත උදාවී ඇති බව දෝංකාර දෙන රතිඤ්ඤාවෙන් ගමටම දැනුම් දෙයි. නැකත එළඹිනි. කිරිඅත්තාගේ උදලු පාරින් තණකොළ කැපෙයි.

කිරිඅම්මා බෝලත්තෙන් මිදුලේ රටා මවයි. අම්මාගේ කුල්ලෙන් පෙළෙන සහල් වට්ටියටය. ළිඳෙන් බාගත් වතුර පිර වූ නැවුම් කළය අක්කාගේ උකුළේ නැළවෙයි. තාත්තා එල්ලය බලා කැපූ කොස් අත්ත කිරි වෑස්සෙමින් බිම පතිත වෙයි. කුඩාවුන් පාඩම් පොතේ කවි පේළි ගම කෙළවරට ඇසෙන සේ ගායනා කරති. මුල් ගනුදෙනුව තාත්තා හා කිරි අත්තා අතරය. අම්මා ගනුදෙනුව ළිඳ සමඟය. වැඩිහිටියන්ට ගැළපෙන සේ බුලත් මත තැබූ කාසි කුඩා වුන් පිරිනමයි. ඊට වැඩිමහල්ලන්ගෙන් ගැළපෙන මුදලක් කුඩාවුන්ට ලැබෙයි. උන් ප්‍රීති වෙති. කෑම මේසයේ උණුසුමින් හැමදෙනාගේම හදපිරී ඇත. බඩ පිරීමත්, හිත පිරීමත් උදා වූ අවුරුද්දේ සතුට ළංකරයි. අඹ ගහේ උඩ අත්තේ බැඳි ඔංචිල්ලාවේ ගැටිස්සියෝ වාරම් කියමින් පදිති. ගැටව් කොලොප්පන් කරමින් හුරේ දමති. රබානට ඉස්පාසුවක් නැත. බවලතුන් තම හපන්කම් පෙන්වමින් සුරල් වයති. අත්මාරු ගසති. නටති. රතිඤ්ඤා පුපුරයි. කුඩා උන් වළ කජු ගසති. කෙළි පැංචියෝ අඹ කොටු පනිති. ගල් කොටති. පංච දමති. ඔළිඳ කෙළිති. වැඩිහිටියන්ගෙන් බුලත් හෙප්පුවට ඉන්පාඩුවක් නැත. අල්ලාප සල්ලාපයේ යෙදෙන ඔවුන් අවිහිංසක ජීවිතයේ සතුට කියාපායි. බුලත් කහටින් ඔපවත්ව මදටි ඇට බඳු කහට බැඳි දත් දෙපළ සිනාවට එකතු කළේ අපූරුවකි. හිරු අස්තංගවෙත්ම සියල්ලෝ ගෙදරට සේන්දු වී රෑ බත බුදිති. පොළොස් ඇඹුලත්, සිංහල අච්චාරුවත්, මැල්ලුම් පලාවත්, අළු පුහුල් හොද්දත්, මුං ඇට ආනමත්, කරෝල බැදුමත් ඊට වැඩිමනත් දඩමසක් එක්ව තිබිණි.

හිස තෙල් ගෑමේ නැකතට බොහෝ විට පන්සලට හෝ ගමේ ප්‍රභූ නිවසකට යාම හෝ නැතිනම් තම නිවසේ ද සකසා ගත් උත්සව අවස්ථාවක් සංවිධානය කර ගනිති. හිසතෙල් ගෑම තුළ ශීර්ෂයේ සිට පාදාන්තය තෙක් නීරෝගී බවත් වසර පුරා සියලු රෝගාබාධයන්ගෙන් වැළකී සිටින ශක්තිමත් කුටුම්බයක් ප්‍රාර්ථනා කළහ.

## ළිඳ සමඟ ගනුදෙනුව

නානුවර්ග හා පස් තෙල් සකසා ගැණින. නානු සඳහා කලාඳුරු අල, කුංකුම , සුදු හඳුන්, ගෝවරන, විෂ්ණුක්‍රාන්තිය, සස්සඳ මුල්, ඉරිවේරිය, නස්නාරං මුල්, සැවැන්දරා මුල්, නෙළුම් දඬු, ගොඩමානෙල්, බෙලිමුල්, ඊතණ, වෙනිවැල් ගැට ගෙන කකාරා බෝපත් යුෂ හා දෙහි ඇඹුල් මිශ්‍ර කර ගනිති. මී තෙල්, අබ තෙල්, තලතෙල්, කොහොඹ තෙල්, එඬරු තෙල්, පස්තෙල් ලෙස ගනී. හිසතෙල් ගාන නැකත අනුව දිශාව හා පනවා ඇති හිසට හා පයට නිමිත ඔසුපත් එල්ලා පිළියෙල කළ ස්ථානයේ පහනක් දල්වමින්, පන්සලේ ස්වාමින් වහන්සේ හෝ වැඩිහිටියෙකු බුද්ධ ධම්ම සංඝ තෙරුවන සිහි කරමින් ගාථා සජ්ඣායනා කරමින් හිසතෙල් ගල්වා නිරෝගී සම්පත් ප්‍රාර්ථනා කෙරේ. අනතුරුව සියල්ලන් ස්නානය පිණිස ගමේ වැවට පියමං කරති. දියබුං ගසමින්, පිහිනමින් ඇති තරම් කරවටක් දියේ ගිලී රිසි පරිදි නා පහසු වී ගෙදරට පැමිණෙන්නේ දහවල බත් පිණිසය. එදින බත ද අවුරුදු දා තරම් සරුය. ගිනියම් කාෂ්ටක දහවල ගෙවෙමින් හීල් මං සවස් වරුවේ නෑදෑ ගෙවල් වල යෑම ඇරඹේ. කැවිලි පෙවිලි බඳුන් රැගෙන ගෙන් ගෙට යමින් එකිනෙකා හා ඇලුම් බැඳුම් අලුත් කරගනිමින් පරණ කෝන්තර පරණ අවුරුද්දට භාර කරමින් අලුත් වෙති. වැඩිහිටියන්ගේ දෙපා තෙල් ගා පිරිමැද පව් සමා කර ගනිති. අරෝවන් දුරුකරමින් ආශිර්වාද ලබති. පිරිසුදු සිතින් අලුත් අවුරුද්ද දෙස බලමින් ඔවුහු නිවී ගිය සිත් ඇත්තෝ වූහ.

යළිත් දෛනික දිවි පෙවතට මුහුණ දීමට ශක්තිය ලබමින් නැකතට රැකියාවට යොමු වෙමින්, කැත්ත, උදැල්ල, නගුල, වියගහ, හරකා බාන සමඟ පැටිපස්පරාණය ද එක්ව ජීවිතයට මුහුණ දුන්නේ සිංහල අවුරුදු සිරිතෙන් ප්‍රාණවත්ව ලැබූ නව ජීවිතය ද සමඟිනි. පැරණි හෙළයින් සිය ජීවිතයේ මහගුම උත්කර්ෂවත් අවස්ථාව වූ මහා සංස්කෘතිය මංගල්‍යය නිමා කරනුයේ උද්දාමයෙනි. ප්‍රාර්ථනාවෙනි. සහජීවනයෙනි. සුරක්ෂිත වූ කුටුම්භයක පරම රමණීය වූ සෙනෙහසිනි. වත්මන මේ සියල්ල හුදු සිහිනයක් වීමට යා නොදී යථාර්ථයක් බවට පත් කර ගැනීම කළ යුත්තේ අපටම අනන්‍ය වූ, අපටම උරුම වූ සංස්කෘතිකාංග රසක් මෙන්ම, අපට උරුම වූ ජීවනයක් ද ඇති හෙයිනි.

**නයනසිරි තිලකරත්න**
**විශ්‍රාමික පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක**
**කුරුණෑගල**

# අපේ හර පද්ධති රැක ගනිමු



සිංහල හා හින්දු අලුත් අවුරුද්ද මෙරට ප්‍රධානතම ජාතික උත්සවයයි. එය මානව ශිෂ්ටාචාරයේද සොබාදම හා බැඳුණු ප්‍රීති උත්සව සැමරුමකි. සූර්ය සංක්‍රාන්තිය, සූර්ය මංගල්‍යය නමින් අර්ථවත් කරනුයේ ද මේ විශ්වය, සොබාදම හා බැඳුණු සාංකල්පික අර්ථයෙන් සමරන අවුරුද්දක් වීම නිසයි.

පුරාතනයේ පටන් දේශීය සිරිත් විරිත් හා ආගමික භාවිතාවකට මුල්තැන දෙමින් පැවති මෙම අවුරුදු උලෙළේ හර පද්ධතිය වටහා ගෙන එය සැමරීම ඉතා වැදගත්. සිංහල අවුරුදු සමය උදාවන්නේ ගොයම් පාගා සකසා ගත් අලුත් සහලින් බුදුන්, දෙවියන් පුදකොට භක්තිමත් ආගමික පිළිවෙත් පුරමිනි. මුළු උත්සවයම සොබා දම හා පිවිතුරු බව රැකගෙන සිදු වේ.

සියලු නැකත් චාරිත්‍රයන් ද ඒ ආධ්‍යාත්මික වටිනාකම රැකගනිමින් ඉටුකිරීම පැරණි පිළිවෙළයි. එබැවින් මෑතකාලීනව අප දකින අවුරුදු උත්සව ඇතුළු සිංහල අලුත් අවුරුදු චාරිත්‍ර ආදිය ඉටුකිරීමේදී විකෘති කාරක අංග ලක්ෂණ එක්කොට තිබෙනු දැකීම අශෝභනය.

විශේෂයෙන් බොහෝ අවුරුදු උත්සවවල ගැබ්ව ඇත්තේ සිංහල අවුරුදු වටපිටාවට වඩා විනෝදයම කුළු ගන්වන අවස්ථාවක් බව පෙනී යයි. ජුගුප්සාජනක අත්දැකීම් සහිත අවුරුදු උත්සව සංවිධානය කරන අවස්ථා පසුගිය වසරවල විමර්ශනාත්මකව බැලූ විට දක්නට ලැබුණි. වාණිජත්වය හා වෙළෙඳ අනුග්‍රහයන් වෙතම නැඹුරුව සාම්ප්‍රදායික අර්ථය කෙලෙසන අවුරුදු උලෙළයන් පවත්වනවාට වඩා නොපැවැත්වීම යහපත්.

මෙවර කොරෝනා අර්බුදකාරී වාතාවරණය යටතේ වුවත් රජයේ නිරෝධායන පිළිවෙත් සුරකිමින් යම් සීමාවක සිට අවුරුදු උත්සව පැවැත්වීමට ගත් තීරණය ඉතා යහපත්.

එහෙයින් විකාර රූපී අර්ථ නොදක්වන සංස්කෘතික හෙළ උරුමය සනිටුහන් වන අවුරුදු උත්සව පැවැත්වීම කෙරෙහි අවධානය යොමුවීම වැදගත්. මෑත දශකය තුළ ඇතැම් උත්සවවල දක්නට ලැබුණු කපල් ඩාන්ස්, බැලුන් ඩාන්ස්, ජුගුප්සාජනක යුගල තරග ආදියත් අනිසි ලිංගිකත්ව ආකර්ෂණ මතුකරන අවුරුදු කුමර කුමරියන් තේරීමේ තරග ගැනත් ඒවා සංවිධානය කරන අයගේ ඇස යොමුවිය යුතුය. හොඳම බඩ, හොඳම ඇඟ, හොඳම පපුව තේරීම වැනි අවුරුදු උලෙළක චාම් බව කෙළෙසන අනඟ රංගන තරග නොපැවැත්විය යුතුය. විශේෂයෙන් අදාළ පෙදෙස්වල වෙසෙන පැවිදි, ගිහි උගත් ප්‍රජාව මීට වඩා සැලකිලිමත් වීම වැදගත්.

ඇත්තෙන්ම අපේ දරුවන්ට, අනාගතයේ උරුම කරවන්නේ පුහු ආස්වාද මතම ගොඩනැගුණු නිසරු වෙළෙඳ ආකර්ෂණ වැඩසටහන් ද ඔවුන්ගේ ගත, සිත පෝෂණය කරන සාමය, සමඟිය, සහජීවනය රැගත් සාම්ප්‍රදායික අර්ථද යන්න ගැන විමසා බැලීම කාලෝචිතයි.

තවද වඩාත් මෑතකාලීනව අන්තර්ජාල තාක්ෂණය භාවිතයෙන් ජංගම දුරකථන භාවිත කරන අය ආසක්ත කරගනිමින් විවිධ ආලිංගන සමාජජාල මඟින් නිකුත් කරයි. ඔබේ දුවා දරුවන්ගේ සදාචාර මානසිකත්වයට නිගා දෙන එවැනි අවුරුදු වැඩසටහන්, ඡායාරූප, වීඩියෝ දර්ශන ආදිය දුටු විට ඊට එරෙහිව වගකිව යුතු අංශ දැනුවත් කිරීම ද වැදගත්. තව ද දැන් දැන් සිදුවන මත්ද්‍රව්‍ය හා විෂ මත් රසායනිකයන් ශරීරගත කරවගන්නා තරුණ ප්‍රජාව එවැනි අවස්ථාවලට යොමු නොකරවන අයුරින් උත්සව සංවිධානය කිරීම වගකීමෙන් කළ යුත්තකි. අවුරුදු උත්සව අවස්ථාවලදී මෙන්ම ඉන්පසු අවස්ථාවලත් එවැනි භාවිතයන්ට ඉඩ නොදීම ඉතා වැදගත්. ඇතැම් උප සංස්කෘතික ප්‍රජාවන් මෙවැනි දේට පෙලඹී තිබුණත් ඒවා වළක්වා ගැනීමට අප මෙවැනි අවස්ථාවලදී විචක්ෂණශීලී විය යුතුයි. රටේ නීති ආයතන මෙන්ම වගකිව යුත්තන් ද මෙවැනි දේ ගැන වැඩි අවධානයක් යොමුකිරීම වැදගත්.

අපේ සම්ප්‍රදාය, ජන උරුමය ආගමික පාරිසරික වටපිටාව ගැන ද අවධානය යොමු කරමින් සාරවත් අවුරුදු උත්සව සංවිධානය කිරීම කෙරෙහි සියලු පුරවැසියන් හට ජාතික වගකීමක් ඇත.

**නිශාන්ත චාමින්ද පීරිස්**



# දසත
දස අත ම එක තැන

ඒ. ටී. එම්. ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ

## තුන්රෝද රියෙන් රහක් මස් ඇදලා

ප්ලාස්ටික් බැරල් දෙකක දමාගෙන සේරුනුවර මාතලේ හෙට්ටිපොළ ප්‍රදේශයට ත්‍රිරෝද රථයකින් ප්‍රවාහනය කළ හරක් මස් තොගයක් පෙරේදා (10) පෝටන්කාටුව මාර්ග බාධකයේදී අත්අඩංගුවට ගැනීමට කන්තලේ මූලස්ථාන පොලීසිය සමත්වූහ. අත්අඩංගුවට පත් වූ සැකකරුවන් දෙදෙනාගෙන් එක් අයෙකු ත්‍රිරෝද රථ රියැදුරාවේ. සැකකරුවන් පවසන්නේ සේරුනුවරදී මෙම මස් තොගය තවත් අයකුගෙන් මිලදී ගත් බවයි. මෙම ප්ලාස්ටික් බැරල් දෙක තුළ බහා හරක් මස් කිලෝ ග්‍රෑම් 70ක් ඇති අතර සැකකරුවන් මස් සමග කන්තලේ මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.

කන්තලේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක එච්.එම්.පී.බී. විජේසිරි මහතාගේ උපදෙස් මත දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක කරුණාරත්න මහතාගේ මෙහෙය වීමෙන් මාර්ග බාධක පොලිස් සැරයන් (10977) සමරකෝන් , ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් මෙම අත්අඩංගුවට ගැනීම සිදු කර ඇත.

අයි. එම්. වී. සී. ගුණසේකර - ඇල්පිටිය සමූහ

# මවයි හොර සැමියයි එක්වී පිරිමි දරු දෙදෙනා විකුණලා

## මත් පෙතිවලටත් පුරුදු කරලා

මවක් සිය අනියම් සැමියා සමග එක්ව තමන්ගේ එකොළොස් හැවිරිදි හා දහහතර හැවිරිදි පිරිමි දරුවන් දෙදෙනෙකු මුදලට ලිංගික අපයෝජනයේ යෙදවූ බව කියන සිද්ධියක් සම්බන්ධයෙන් ඇල්පිටිය පොලීසියේ කාන්තා කාර්යංශය මගින් පරීක්ෂණයක් ආරම්භ කර ඇතැයි පොලීසිය පවසයි. මෙම දරුවන්ගේ පියා මව හා දරුවන් දෙදෙනා හැරගොස් වෙනත් ප්‍රදේශයක ජීවත්වන අතර මව අනියම් සැමියකු හා මොරටුව ප්‍රදේශයේ ජීවත් වන බවත් දරුවන් දෙදෙනා මිත්තනියක් සමග සිටිමින් ඇල්පිටිය ප්‍රදේශයේ පාසලක ඉගෙනුම ලබමින් සිටි බවත් විමර්ශනවලදී හෙළිවී තිබේ. මව අනියම් සැමියා සමග එක්ව මෙම දරුවන් දෙදෙනා රැගෙන ගොස් ඔවුන් මත්ද්‍රව්‍ය භාවිතයට හුරු කර රහසි ගත ලෙස ලිංගික අපයෝජනය සඳහා මුදලට ලබා දී සිටියදී කොළඹ ළමා හා කාන්තා කාර්යාංශයට ලද තොරතුරක් මත කරන ලද දැනුම් දීමක් මත ඇල්පිටිය පොලිසිය මේ පිළිබඳ පරීක්ෂණ ආරම්භ කර තිබේ. ඒ අනුව මෙම දරුවන් ලිංගික අපයෝජනය සඳහා යොදවාගත් හෝටල් හා නිවාස පිළිබඳව විමර්ශන කිරීමට පොලීසිය පියවර ගෙන තිබේ. තවද මෙම යුවළ සොයා පරීක්ෂණ සිදු කෙරෙන අතර ඇල්පිටිය පොලිස් අධිකාරී වයි.එල්. ලීලවංශ මහතාගේ උපදෙස් පරිදි ඇල්පිටිය පොලීසියේ ළමා හා කාන්තා කාර්යාංශය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

ඩී. එස්. ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

## කතරගම - නාගහ වීදියේ පවුලකට නව නිවෙසක්





ගැටමාන්නේ ගුණානන්ද හිමිපාණන් සහ දායක කාරකාදීන්ගේ ආධාර මත කතරගම - නාගහ වීදියේ පැල්පත්වාසී පවුලකට ඉදිකරන ලද නව නිවෙස පෙරේදා (10) භාරදෙනු ලැබීය.

රුහුණු මාගම්පත්තුවේ ප්‍රධාන අධිකරණ සංඝනායක කතරගම ශ්‍රී අභිනවාරාමාධිපති කපුගම සරණතිස්ස, රුහුණු විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොග්ගල්ලේ විජිත යන නායක ස්වාමීන් වහන්සේලාගේ සහ ඓතිහාසික රුහුණු කතරගම මහ දේවාලයේ බස්නායක නිලමේ තැන්පත් ඩිෂාන් වික්‍රමරත්න ගුණසේකර මහතාගේ මග පෙන්වීම මත ඉදිකරන ලද නව නිවෙසේ යතුර නිවාසලාභිනියට පිරිනැමූ අයුරුයි මේ.

සම්පත් ප්‍රියනන්දන - බළන්ගොඩ විශේෂ

# සෞඛ්‍ය උපදෙස්වලට අනුගතව කටයුතු කරන්න

## යුද්ධ හමුදාපති හා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි ශවේන්ද්‍ර සිල්වා



මාස කිහිපයක් පීඩා විඳලා රටේ කෝවිඩ් වසංගතය පාලනය කිරීමට හැකියාව ලැබුණු බවත් සිංහල සහ දෙමළ අලුත් අවුරුදු සමයේ සෞඛ්‍ය උපදෙස්වලට අනුගතව ජනතාව කටයුතු කළ යුතු බවත් එසේ නොවුනහොත් අලුත් අවුරුදු සමයෙන් පසු මේ ලබාගත් තත්ත්වය අපෙන් ගිලිහී යෑමේ හැකියාවක් තිබෙන බව යුද්ධ හමුදාපති හා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි ශවේන්ද්‍ර සිල්වා මහතා පැවැසීය.

ප්‍රති නිර්මාණය කෙරෙන බළන්ගොඩ ඓතිහාසික කුරගල පුද බිමේ ප්‍රගතිය නිරීක්ෂණ කිරීමේ චාරිකාවකට පෙරේදා (10) එක් වීමෙන් පසු මාධ්‍ය වෙත අදහස් දක්වමින් ඒ මහතා මේ බව පැවසීය. එහිදී තවදුරටත් අදහස් දක්වමින් ශවේන්ද්‍ර සිල්වා මහතා කියා සිටියේ උත්සවය සමයේ ජනතාව සෞඛ්‍ය උපදෙස්වලට අනුගතව කටයුතු නොකරන්නේ නම් පාලනය කර තිබෙන කෝවිඩ් තත්ත්වය අපෙන් ගිලිහීයන්න හැකියාවක් අලුත් අවුරුදු සමයෙන් පසුව තිබෙන බවයි. මුඛ ආවරණය පැලඳ සමාජ දුරස්ථභාවය ආරක්ෂා වන අයුරින් ජනතාව කටයුතු කිරීම ඉතා වැදගත් බවද ඒ මහතා වැඩිදුරටත් පැවැසීය.

ලෝකයේ අනිකුත් රටවල කෝවිඩ් ආසාදනය වීම ඉතාමත් ශීඝ්‍රයෙන් වැඩි වෙමින් පවතින වකවානුවව සිංහල සහ දමිළ අලුත් අවුරුදු සමරන්න සූදානම් වෙලා සිටින බව ඒ මහතා කීය.

ආසන්නයේ තිබෙන ඉන්දියාවේ පසුගිය දිනවල කෝවිඩ් ආසාදිතයන් වැඩි වීමක් දක්නට ලැබුණු බවත් ප්‍රංශය, ඇමෙරිකාව, බ්‍රසීලය, ඉතාලි වැනි රටවල කෝවිඩ් ආසාදිතයන් වැඩිපුර වාර්තා වන අවස්ථාවකදී ශ්‍රී ලංකවේ කෝවිඩ් පාලනය කළ බවද ඒ මහතා කීය.

මේ අතර බළන්ගොඩ තංජන්තැන්න විදුහලේ ඉගනුම ලබන සිංහල, දමිළ සහ මුස්ලිම් දරු දැරියන් වෙනුවෙන් පාසල් බෑග් බෙදා දීමේ වැඩසටහනක්ද කුරගල පුද බිමේදී ශවේන්ද්‍ර සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි. කුරගල පුද බිමේ වර්තමාන භාරකාරත්වය දරන වතුර කුඹරේ ධම්ම රතන නාහියන්ගේ අනුසාසනා පරිදි මහා සංඝරත්නය, ප්‍රදේශවාසීන් එක්ව එය සංවිධානය කර තිබුණි.

තංජන්තැන්න විදුහලේ ක්‍රීඩා කටයුතු දියුණු කිරීම සඳහා ශවේන්ද්‍ර සිල්වා මහතා පෞද්ගලික ධනයෙන් රුපියල් පනස්දහසක මුදලක් පරිත්‍යාග කිරීමද එහිදී සිදු විය.

ඩී. එස්. ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ


## මැදවෙලගම නාගාරාම විහාරයේ සංඝාවාසය- පුස්තකාලය ජනතා අයිතියට



පස්සර මැදවෙලගම නාගාරාම විහාරස්ථානයේ ඉදිකළ සංඝාවාසය සහ පුස්තකාලය පෙරේදා (10) විවෘත කරනු ලැබීය. අපවත්වී වදාළ නාගාරාමයේ විහාරාධිපති ගැරඬිඇල්ලේ චන්ද්‍රජෝති හිමිපාණන් වහන්සේගේ තෙමස් පූර්ණ පින්කම නිමිත්තෙන් උන්වහන්සේගේ නමින් මෙම සංඝාවාසය සහ පුස්තකාලය විවෘත කෙරිණි. මෙම අවස්ථාවට මහා විහාරය වංශික ශ්‍යාමෝපාලි මල්වතු පාර්ශවයේ අනුනායක යක්කල ආයුර්වේද විශ්වවිද්‍යාලයේ කුලපති නියංගොඩ විජිතසිරි අනුනායක ස්වාමීන් වහන්සේ හා දිඹුල්කුඹුරේ විමලධම්ම ස්වාමීන්වහන්සේ ඇතුළු මහා සංඝරත්නය වැඩම කර සිටියහ. දහම් පාසල්, භික්ෂු අධ්‍යාපන, පිරිවෙන් කටයුතු පිළිබඳව රාජ්‍ය ඇමති විජිත බේරුගොඩ මහතා විසින් සංඝාවාසය විවෘත කළ අයුරුයි මේ.

රෝහන කාරියවසම් - පාණදුර

## දිග්ගල තොටුපළේ පාලම් පාරුව අක්‍රියයි



ප්‍රාදේශීය සභා මගින් ධාවනයට යොදවා ඇති දිග්ගල තොටුපළේ පාලම් පාරුව අක්‍රිය වී ඇතැයි ජනතාව පවසති. මේ හේතුව නිසා පරණ පාරේ සිට දම්පේ, පිළියන්දල, මඩපාත, කැස්බෑව යන ස්ථාන වෙත ළඟා වීමට කිලෝමීටර් 16ක් පමණ දුර ගතවන බවද ඔවුහු පවසති. පැයක පමණ කාලයක් ගතවන ගමන විනාඩි පහකින් කෙටි කර ගැනීම සඳහා මෙම පාලම් පාරුව ඉවහල් වූ බව මගීහු පවසති. මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ ලේකම් කාන්ති සිල්වා මහත්මියගෙන් විමසූ අවස්ථාවේ ඇය මෙසේ පැවසුවාය. පාලම් පාරුවේ අඩුපාඩු කිහිපයක් ඇති බවත් එය කඩිනමින් යථා තත්ත්වයට පත් කර දෙන බවත් පැවසීය.

කල්පනී පද්මපෙරුම - අවිස්සාවේල්ල විශේෂ

## සමන්පුර මහ විදුහලේ සිඟිති බක්මහ උලෙළ



හම්බන්තොට ලුණුගම්වෙහෙර සමන්පුර මහා විදුහලේ පසුගියදා සිඟිති බක්මහ උලෙළක් පැවැත්විණි. එම උත්සවය පාසලේ කුඩා දරුවන්හට සිංහල සහ දෙමළ චාරිත්‍ර වාරිත්‍ර හුරු කිරීමේ අරමුණෙන් සංවිධානය කොට තිබිණි. මෙම වැඩසටහන සංවිධානය කර ඇත්තේ ජේ.සී. සුභද්‍රකා මහත්මිය ඇතුළු 2ශ්‍රේණිය ගුරුවරු විසිනි.

එම අවස්ථාවට විදුහල්පති ලක්ෂ්මන් රත්නායක මහතා, ගුරුවරුන් සහ පාසලේ කුඩා ළමුන් විශාල පිරිසක් එක්ව සිටියහ.





ඩබ්ලිව්. රෝහණ - බුලත්කොහුපිටිය සමූහ

## එල්ලී මිය මළ සිරුරක් මාතලාව කොටසේ

බුලත්කොහුපිටිය පොලිස් වසමට අයත් යටිදැරිය වත්ත, මාතලාව කොටසේ පුද්ගලයෙකු එල්ලී මිය ගොස් ඇති බව බුලත්කොහුපිටිය පොලීසිය පවසයි.

මෙසේ මිය ගොස් ඇත්තේ පෙරිය කරුප්පන් කන්දසාමි නමැති අවුරුදු 88ක පමණ පුද්ගලයෙකි. මහරංගල්ල මාර්ගයේ කහපිටිය අසන්නයේ යටිදැරිය වත්තෙහි රබර් ගස අදාළ පුද්ගලයාගේ දේහය එල්ලී තිබිය දී පෙරේදා (10) දර කැඩීමට ගිය අයෙකු විසින් දැක බුලත්කොහුපිටිය පොලිස් ස්ථානයට දැනුම් දී තිබෙයි. වැඩිදුර පරීක්ෂණ බුලත්කොහුපිටිය පොලීසිය පවත්වයි.

ඒ. ටී. එම්. ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ

## හැඹිලි දැල් යොදා මාළු අල්ලූ 16කට වැඩ වරදී

බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් හැඹිලි දැල් යොදා ජමාලියා මුතූර් හා කින්නියා යන මුහුදු තීරයන්හි මසුන් මැරූ ධීවර කාර්මිකයෝ 16 දෙනෙකු අත්අඩංගුවට ගත් නාවික හමුදාව සැකකරුවන් මාළු තොගය සමඟ පෙරේදා (10) වැඩිදුර පරීක්ෂණ සඳහා ත්‍රිකුණාමලය ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේනතුවට භාර දෙනු ලැබීය. සැකකරුවන් 16 දෙනා අතරින් හත්දෙනෙකු කින්නයා ප්‍රදේශයෙන් අත්අඩංගුවට ගෙන තිබූ අතර හය දෙනෙකු අත්අඩංගුවට ගෙන තිබුණේ මුතූර් ප්‍රදේශයෙනි. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේනතුවේ ත්‍රිකුණාමල සහකාර අධ්‍යක්ෂ අනිල් සේනාරත්න මහතාගේ උපදෙස් මත ධීවර නිලධාරීන් වන මධුෂානි වලිසුන්දර, ඉෂාර ටී. කන්කාංමගේ යන මහත්ම මහත්මීන් මේ සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ පැවැත්වූහ.

තමරසිරි විජේසේකර - දෙයියන්දර සමූහ සහ යුවන්ත නෙත්සර - මුලටියන විශේෂ

## බලපත්‍ර නැතිව රජයේ අරක්කු එකතු කළ අයෙක් අත්අඩංගුවට



සිංහල අලුත් අවුරුදු සමයේ විකිණීම සඳහා බලපත්‍ර නොමැතිව රජයේ අරක්කු කාලෙ බෝතල් අනූ අටක් ළඟ තබාගෙන සිටි කඹුරුපිටිය, කහගල, වැලිමඩුව ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකු කඹුරුපිටිය පොලීසිය මගින් අත්අඩංගුවට ගෙන ඇත. මෙම අරක්කු බෝතල් තොගය පෙට්ටි හතරක අසුරා නිවෙස තුළ තිබූ සෝපාවක ඉතා රහසිගතව සඟවා තිබූ බව පොලීසිය පැවසීය.

කඹුරුපිටිය පොලිස් ස්ථානයේ වැඩ බලන ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ජයවර්ධන මහතාගේ උපදෙස් පරිදි දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ජේ .ඒ.ඒ.ආර්.සී. සිසිර කුමාර, පො . සැ . කොඩිතුවක්කු, පො . සැ . සමරවික්‍රම යන නිලධාරීහු මෙම වැටලීමට සහභාගී වී තිබේ.

විජිත සල්ගාදු - අකුරැස්ස මධ්‍යම විශේෂ





## කඹුරුපිටිය මූලික රෝහල අවුරුදු සිරියෙන් ඇලලී

කඹුරුපිටිය මූලික රෝහලේ සියලුම කාර්ය මණ්ඩලය එකමුතුව අවුරුදු ක්‍රීඩා උලෙළක් සංවිධානය කොට තිබිණි.

සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් පසුගියදා (09) රෝහල් පරිශ්‍රයේදී පැවැත්විණි. රෝහලේ වෛද්‍ය අධිකාරීවරයා, විශේෂඥ වෛද්‍යවරු, වෛද්‍යවරු හෙද හෙදි කාර්ය මණ්ඩලය ඇතුළු සියලුම කාර්ය මණ්ඩලය මෙම ක්‍රීඩා උත්සවයේ විවිධ තරග ඉසව්වලට සහභාගීවී සිටියහ. කාර්ය බහුල අවිවේකී මෙන්ම වගකීම් බහුල රැකියාවක නිරතව සිටින තමනට මදකට හෝ කාර්ය බහුලත්වය අමතක කර මෙමගින් මහත් අස්වැසිල්ලක් ලද බව කාර්ය මණ්ඩල සාමාජිකයෝ රැසක් පැවසූහ.

# මුවන්පැලැස්සේ අතීත කතාව

ලංකා ගුවන්විදුලි ඉතිහාසයේ මෙන්ම ආසියාවේ ද දීර්ඝතම මාලා ගුවන්විදුලි නාටකය වූ මුවන්පැලැස්ස ගැන අද ඉන්නා තරුණ පරපුර එතරම් යමක් දන්නේ නැත. එයට හේතුව ගුවන්විදුලියට වඩා රූපවාහිනිය තරුණ පරපුර මෙන්ම අද ඇතැම් දෙමාපියන් ද තම විනෝදාස්වාදය සඳහා සමීප කරගෙන සිටින බැවිනි. එහෙත් 1960 දශකයේ සිට 2010 පමණ වන තුරු රූපවාහිනිය මෙන්ම ගුවන්විදුලියේ මුවන්පැලැස්ස නාට්‍යය සතිපතා අසන්නන්ගේ සිත් ඇද බැඳ සිටි බැවිනි. මුවන්පැලැස්ස ආරම්භය ගැන තතු දන්නෝ එය දොස්තර මුදලිනායක සෝමරත්තයන් විසින් ආරම්භ කළ බව පමණක් දැන සිටියහ. එහෙත් මුවන්පැලැස්සේ ආරම්භය ඔබ දන්නා නම්වලට වඩා වෙනත් නාමයකින් ඇරඹුනක් බව සටහන් කර තැබීම අනාගතය වෙනුවෙන් ඉතිහාසය නැවත ලියන්නක් කොට සැලකුවෙමි. එබැවින් මෙසේ ලියමි.

ශ්‍රී ලංකාවේ ගුවන්විදුලි නාට්‍ය ඉතිහාසය ආරම්භ වන්නේ කවදා ද, කුමන නාට්‍යයකින්දැයි පැහැදිලිව සටහනක් සොයා ගත නොහැක. එහෙත් ‘කොළඹ රේඩියෝව’ (colombo radio ) ආරම්භ වූ යුගයේම සංගීත වැඩසටහන් අතර ලන්ඩන් හි බීබීසී ආයතනය වෙතින් රැගෙන ආ ගුවන්විදුලි නාට්‍ය තැටි මෙහි ප්‍රචාරය කරවා ඇත. ඉන් අනතුරුව සිංහල නාට්‍ය පිටපත් රචනය ආරම්භ විය. එකළ කොළඹ ආධුනික නාට්‍ය සංගමය මඟින් ප්‍රථම වරට මෙරට ගුවන් විදුලි නාට්‍ය නිෂ්පාදනය කළ බවට ඇතැම් සටහන්වල දැක්වෙන අතර, ඒවා "වයර්ලස් ඩ්‍රාමා" නමින් හැඳින්වීය. මෙම නාට්‍ය නිෂ්පාදනය කිරීම් ජේ.එස්. එම් පැටර්සන්ගේ මෙහෙයවීමෙන් සිදුව ඇත.



වමේ සිට දකුණට - වික්ටර් මිගල්, විජේරත්න වරකාගොඩ, නෙතලි නානායක්කාර, රත්නාවලී කැකුණවෙල , ගැමුණු විජේසූරිය , ශ්‍රී නිමල් පද්මකුමාර



වමේ සිට දකුණට - ජී. ගුණවර්ධන , ධර්ම ශ්‍රී මුණසිංහ , මංජුලා මල්කාන්ති , නෙතලි නානායක්කාර , වොලී නානායක්කාර , ගැමුණු විජේසූරිය , රත්නාවලී කැකුණවෙල , විජේරත්න වරකාගොඩ , වික්ටර් මිගල්



ගැමුණු- ශ්‍රී නිමල්



වරකාගොඩ සහ රත්නාවලී

එම ගුවන් විදුලි නාට්‍ය හඬ කැවීමට එකළ මෙහි සිටි බ්‍රිතාන්‍ය ජාතිකයන් වූ දොස්තර ජෝෂප් පියර්සන්, දොස්තර එල්.නිකල්සන්, සර් රොනල්ඩ් රෝස්, එෆ්.ඕ බ්‍රයන් එලියන් හා දොස්තර ආර්. එල්. ස්පිට්ල් යන අය දායක වී ඇත. එවකට ලංකාව එංගලන්තයේ යටත් විජිතයක්ව පැවැති අතර සියල්ල ඉංග්‍රීසි මාධ්‍යයෙන් සිදු වෙද් දී මෙම ගුවන් විදුලි නාට්‍යය ද ඉංග්‍රීසි බසින්ම ප්‍රචාරය වී තිබේ.

ආරම්භයේ වුව ද ගුවන්විදුලි නාට්‍ය සඳහා ප්‍රමුඛතාවක් හිමිව තිබූ බව පෙනී යන්නේ 1932 වන විට පිහිට වූ ගුවන් විදුලි උපදේශක මණ්ඩලයට නාට්‍ය අංශයේ ද නියෝජනක් තිබීමෙන්ය. 1930 දශකය වන විට ලංකාවේ රේඩියෝ තුළින් ප්‍රචාරය කෙරුනු සිංහල නාට්‍ය අසන්නන් අතර ජනප්‍රිය වී ඇත. එබැවින් නොයෙකුත් නවකතා ඇසුරෙන් ලියැවුණු ගුවන්විදුලි නාට්‍ය නිෂ්පාදනය කිරීම ආරම්භ වී ඇත.


ශ්‍රී ලංකාවේ පළමු විධායක ජනාධිපතිවරයා වූ ජේ.ආර්. ජයවර්ධනයන් ගුවන්විදුලි නාට්‍ය රචකයකු මෙන්ම ගුවන්විදුලි නාට්‍ය හඬ කවන්නකු ලෙස ද කටයුතු කර ඇති බැව් දන්නේ සුළු පිරිසකි. ශ්‍රී ලංකා ගුවන්විදුලි ඉතිහාසයේ මුල්ම යුගයේ දී ජේ.ආර් ජයවර්ධනයන් විසින් රචනා කරන ලද " සමාජ සේවකයා " (The Social worker) නමැති ගුවන් විදුලි නාට්‍යය 1939 මාර්තු මස 29 වනදා සජීවී ලෙස ප්‍රචාරය වී ඇත. එය ජේ.ආර් රචනා කළා පමණක් නොව ඔහු හා එලීනා ජයවර්ධනයන් (ජේ.ආර් බිරිඳ) ද එම නාට්‍යයට කටහඬ ලබා දී ඇත. මෙය මුදලිඳු ඊ.ඒ. අබේසේකර මහතා විසින් නිෂ්පාදනය කර ඇත.

1948 නිදහස ලබන වකවානුවේ දී කෙමෙන් කෙමෙන් විකාශන පුළුල් වී රටේ ඈත පෙදෙස්වලට ඉතා හොඳින් ගුවන්විදුලිය ශ්‍රවණය වූ අතර මධ්‍යම තරංග හා කෙටි තරංග විකාශ ඔස්සේ බදුල්ල, මහියංගනය, හම්බන්තොට ආදී පෙදෙස්වල නිවෙස්හි පවා වයර්ලස් දක්නට ලැබිණි. 1948 නිදහස ලැබීමත් සමගම එවකට විකාශනය වූ වැඩ සටහන් අතරට ගුවන්විදුලි නාට්‍ය කිහිපයක් ද එකතු වී තිබූ බව පෙනේ. 1948 පෙබරවාරි 12 රාත්‍රී 7.30 ට සී.ඩී.එස්. කරුණාජීවගේ "ශ්‍රී වික්‍රම රාජසිංහ", පෙබරවාරි 13 රාත්‍රී 8.15ට සී.ඒ. ෆොන්සේකාගේ "විජය" හා පෙබරවාරි 21 රාත්‍රී 7.30 ට යූ.ඒ.එස් පෙරේරා (සිරි අයියා) ගේ "පෘතුගීසීන්ගේ පැමිණීම" ආදී දේශාභිමාන කතා ඇතුලත් ගුවන්විදුලි නාට්‍ය ප්‍රචාරය වී ඇති බව සටහන්ව ඇත.

1950 දශකය ශ්‍රී ලංකාවේ ගුවන්විදුලි නාට්‍ය කලාවේ නව නිෂ්පාදන රැසක් ඇති වූ යුගයකි. දැනට ඇති ගුවන්විදුලි නාට්‍ය ඉතිහාස තොරතුරු අතර ඉතා වැදගත් අතීත ගුවන්විදුලි නාට්‍ය කිහිපයක තොරතුරු හමුවේ. රාමායනය (1951), කොටාගෙ ගුංඩුව(1951), තරුණ හිත (1951) එයින් කිහිපයකි.



එස්.බී. සේනානායක



වික්ටර් මිගල්

ඒකාංගික නාට්‍යවලින් ආරම්භ වී සති කිහිපයක් කොටස් කිහිපයකින් ප්‍රචාරය වූ ගුවන්විදුලි නාට්‍ය දක්වා ඇ දී ගිය නාට්‍ය යුගය නවකතා ගුවන්විදුලි නාට්‍ය බවට හැරීම දක්වා දියුණු විය. මහ රෑ හමුවූ ස්ත්‍රිය (පළමු කොටස 1952.1.13), බැද්දේගම (පළමු කොටස 1952.6.19), ගම්පෙරළිය (පළමු කොටස 1952.8.29 ) ඉන් කිහිපයකි. ඒවා අසන්නන් අතර ඉතා ජනප්‍රිය වූ අතර දීර්ඝ කාලීනව වසර 4 ක් පුරා සතිපතා ප්‍රචාරය වූ සිකුරු තරුව ඒ අතරින් ඉතා ජනප්‍රිය විය. හක්ගල්ලේ පී.කේ.ඩී. සෙනෙවිරත්න ලියූ සිකුරු තරුව නාටකයේ පළමු කොටස 1953 ජනවාරි 3 දින ප්‍රචාරය වී තිබූ අතර, සතියකට එක් කොටසක් බැගින් සති 218 ක් තිස්සේ ප්‍රචාරය වූ එය 1957 මාර්තු 30 දින එහි 218 වැනි කොටස ප්‍රචාරය වී නැවතී තිබිණ.

මුවන්පැලැස්ස නාටකයේ ඉතිහාස කතාව ද සුන්දර නාටකයක් මෙනි. එය ඇරඹෙන්නේ 1962 වසරේ ලංකා ගුවන් විදුලියට හෙවත් රේඩියෝ සිලෝන් එකට නව අධ්‍යක්ෂ ජනරාල්වරයකු ලෙස සිවිල් පරිපාලකයකු වූ එස්. බී. සේනානායක මහතා පත්වීමත් සමගය. ඒ වන විට මුල් වරට දීර්ඝකාලීන ගුවන්විදුලි නාටකයක් ලෙස එක්වූ " සිකුරු තරුව" අසන්නන් අතර ඉතා ජනප්‍රිය වී තිබුණි. එය අසන්නන් අතර කෙතරම් ජනප්‍රිය වී තිබුණේ ද යත් 1962 පත්ව ආ එස්. බී. සේනානායක නව අධ්‍යක්ෂ ජනරාල් වරයාට ද දීර්ඝ මාලා නාටකයක අඩුව දැනී තිබිණ. සිකුරු තරුව සාමාන්‍ය පරිසරයක තිබූ ගමක ජීවන රටාව හා චරිත පාදක කරගෙන ලියැවී තිබුණෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයාට අවශ්‍යව තිබුණේ එවැනිම තවත් කතාවක් ආරම්භ කිරීමටය. දොස්තර මුදලිනායක සෝමරත්නයන් ඒ වන විට ගුවන්විදුලියට විවිධ නාට්‍ය රචනා කරමින් සිටි දක්ෂ රචකයකු බව අධ්‍යක්ෂ ජනරාල්වරයා හඳුනාගෙන තිබිණ. ඔහුගේ නාට්‍ය පිටපත් ගැමි පරිසරය තුළ ලියැවුණු ඒවා වූයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා සෝමරත්නයන් අමතා සිකුරු තරුව වැනි ගැමි කතාවක් ගුවන්විදුලියට රචනා කරන මෙන් ඉල්ලා සිටියේය.

දොස්තර සෝමරත්නයන් අභියෝගය බාරගත්ත ද ලෙහෙසියෙන් එය රචනා කිරීම ආරම්භ කළේ නැත. ඒ සඳහා ඔහු එවැනි පරිසර පද්ධතීන් සොයා දීර්ඝ පර්යේෂණාත්මක ගවේෂණයක් කරන්නට තීරණය කළේය. ඔහු එවැනි ගම්මාන සොයා මිනිපේ, මහියංගනය, ලග්ගල, මීමුරේ, කයිකාවල, දියනිල්ල ආදී ඈත පිටිසරබද ගම්මාන සොයා ගොස් ඒවායේ පරිසර පද්ධති, බස් වහර, ජන වහර මෙන්ම ජනජීවිත පිළිබඳව ද මනා අවබෝධයක් ලබා ගත්තේය. ඒ අතරතුර දී ඔහු එම ප්‍රදේශවල ජීවත් වූ වැදි ජනතාව පිළිබඳව හා ඔවුනගේ චාරිත්‍ර, බස්වහර, වැදි ගී, නැලවිලි ගී, ඇදැහිලි, මන්ත්‍ර ශාස්ත්‍රය හා පවුල් ජීවිත පිළිබඳව ද මනා අවබෝධයක් ලබා ගත්තේය.

වියලි කලාපීය ගොවි ජනතාව වැසි සමය ආරම්භ වීමට පෙර මහ වනය තුළ තමන්ට රිසි බිම් පෙදෙසක් කපා එළිකොට, පුලුස්සා හේන් වගාවට සූදානම් කරති. නියමිත කාලයේ බීජ සිටවූ විට වැසි ලැබීමෙන් සරුවට වැඩෙන විවිධ බෝගවලින් පිරීයයි. වාර ගණනාවක්ම අස්වනු නෙලා විකුණා අතමිට සරුකරගන්නා ඔවුහු එසේ තාවකාලිකව එළි පෙහෙළි කරගත් බිම් පෙදෙස අතැර දමා යළි තම ගම්, නිවෙස් බලා පැමිණෙති. රජයේ මිනින්දෝරු සිතියම්වල මෙම කොටස් "පැලැස්ස" ක් ලෙස නම් කර ඇති අතර, හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිතියමේ එවැනි පැලැස්සවල් රැසක් දැකිය හැක. ඇතැම් විට එහි මුලට වෙනත් නම් කොටස් එකතුවී ස්ථිර ගම්මාන බවට ද පත්වී තිබෙනු දැකිය හැක. අද ද දක්නට ලැබෙණ දිවුලන්පැලැස්ස, අඟුණකොලපැලැස්ස, කහකුරුල්ලන්පැලැස්ස ආදී ගම්වල නම් සෑ දී ඇත්තේ මෙසේ පැලැස්සක් ස්ථිර වාසභූමි වීමෙනි.

දොස්තර මුදලිනායක සෝමරත්නයන් තම ගවේශණාත්මක චාරිකාවේ දී එක්තරා වැඩිහිටි ගැමියකු හා තොරතුරු කතා කරමින් සිටිය දී එම ගැමියා විසින් මෙම පැලැස්ස යන නාමය පිළිබඳව ඔහුට තේරුම් කර දී, තමාගේ මෙම හේන ද පැලැස්සක් බව පවසා ඇත. එම කතාබහේ අතරමග දී හොඳින් වැඩුණු මුවකු ගැමියාගේ හේනේ එනම් පැලැස්සේ ඈත කෙළවර හරහා දිව යනු සෝමරත්නයන් දැක ඇත. ඒ සැණෙකින්ම ඔහුට හිතට ඇතුළු වී ඇත්තේ "මුවන්පැලැස්ස" යන නාමය තමා ලියන්නට යන නාට්‍යයේ නමට යෙදිය යුතු බවය.

අදාල තොරතුරු අධ්‍යයනයෙන් පසුව මුවන් පැලැස්ස රචනා කිරීම ආරම්භ කළ දොස්තර

> ඇමරිකාවේ සිටි දොස්තර මුදලිනායක සෝමරත්නයන් විසින් ගුවන්විදුලියට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතු කරන ලදී. තමා විසින් රචනා කළ නාට්‍යය, එම නමින්ම හා තමා නිර්මාණය කළ ආරච්චිල, එතනාහාමි, වෙදමාමා, බිනරමලී, සුදුබණ්ඩා, වෙඩික්කාරයා යන චරිත යොදා ගනිමින් යළි වෙනකකු විසින් නාට්‍යය රචනා කිරීම නීති විරෝධී බව ඉන් කියැවිණ.

මුදලිනායක සෝමරත්නයන් රචනා කළ පළමු නාට්‍ය කොටස 1964 මාර්තු 6 වනදා පටිගත කර ඇති අතර එය 1964 මාර්තු 12 වනදා රාත්‍රී ප්‍රචාරය වී ඇත. එහි කතා සාරාංශය මෙසේ විය.

යටත් විජිත සමයේ සුදු පාලකයන් අතර සිටි එක් නිලධාරියකුට ඈත පිටිසර කැලෑවෙන් වට වූ වැදි ගම්මානයක් දකින්නට යන්නට ආශාවක් ඇතිවිය. එම සුදු නිලධාරියාගේ නම ජෝන් මැක්වුඩ් විය. ඔහු සමග මෙම ගමනට කිහිප දෙනකු එක්වූ අතර, වනය මැද දී වෙඩික්කාරයා නම් වූ දඩයක්කරුවකු ද වැදි ගම්මානය ද ඇතුළත් වූ මුළු ගම්මානයේම යටත් විජිතය නියෝජනය කළ පාලකයා වූ ආරච්චිල ද ඔහුට හමුවේ. ජෝන් මැක්වුඩ් නම් සුදු නිලධාරියාගේ චරිතයට එවකට පොලිස් නිලධාරියකු වූ විජේරත්න වරකාගොඩ තෝරා ගැණුනු අතර, රළු හඬක් ඇති වික්ටර් මිගල් වෙඩික්කාරයා විය. කැලෑ ගම්මානයේ ජීවත් වූවෝ රැසක් වූහ. වෙදමාමා (ගැමුණු විජේසූරිය), සුදුබණ්ඩා (මුදලිනායක සෝමරත්න), බිනරමලී (නෙතලි නානායක්කාර), ගුරුහාමි හා ඉස්කෝලෙ මහත්තයා (ධර්ම ශ්‍රී මුණසිංහ), බිසෝමැණිකේ (රත්නාවලී කැකුණවෙල) ඒ අතර විය. පසුව යායේ ආරච්චිලගේ චරිතය විජේරත්න වරකාගොඩ විසින් නිරූපනය කළ අතර, ජෝන් මැක්වුඩ් සුදු මහතා වනයේ සිරි නැරඹීමෙන් පසු ආපසු නගරයට ගියේය. ආරච්චිලගේ බිරිය වූ එතනාහාමිගේ චරිතය රත්නාවලී කැකුණවෙලට බාර විය. බිනරමලී හා සුදුබණ්ඩාගේ ආදර කතාව මුවන්පැලැස්සේ ගලා ගිය අතර වසර 7 ක් ඉතා ජනප්‍රියව ගුවන්විදුලියෙන් ප්‍රචාරය වූ මුවන්පැලැස්ස 1971 දී හදිසියේම ප්‍රචාරය වීම නැවතුණි. එයට හේතුව වූයේ රචකයා වූ දොස්තර මුදලිනායක සෝමරත්නයන් ශ්‍රී ලංකාව අතහැර විදෙස් රටකට යාමයි. මුවන්පැලැස්ස නතර විය. එකල, මෙකළ මෙන් දුරකතන හෝ කෙටි පණිවුඩ සේවා නොතිබුණෙන් මුවන්පැලැස්ස රසවිඳි රසිකයන්ගෙන් මුවන්පැලැස්ස ගැන විමසූ තැපැල් පත් හා ලිපි ගුවන්විදුලියට ගලා එන්නට විය.

1971 වන විට ගුවන්විදුලියේ සභාපතිවරයා වූයේ රිජ්වේ තිලකරත්න මහතා වන අතර තේවිස් ගුරුගේ මහතා අධ්‍යක්ෂ ජනරාල්වරයා විය. මුවන්පැලැස්ස යළි අරඹන්නට ගුරුගේ මහතාට දැඩි වුවමනාවක් තිබුණු හෙයින් මුවන්පැලැස්ස ශිල්පීන්ගේ හමුවක් කැඳවා පැන නැඟී ඇති තත්ත්වය තේරුම් කර දී මුදලිනායක සෝමරත්නයන් ලියූ නාට්‍යය දිගට පවත්වාගෙන යා හැකි රචකයකු වේ නම් පිටපත් ලියා ඉදිරිපත් කරන ලෙස දැන්වීය. එහි දී එවකට ගුවන්විදුලි නාට්‍ය රචකයන් වූ ධර්ම ශ්‍රී මුණසිංහ හා වික්ටර් මිගල් යන දෙදෙනාම පිටපත් ලියා ඉදිරිපත් කර අතර ගුරුගේ මහතා විසින් කමිටුවක් සමඟ එක්ව එම පිටපත් පරීක්ෂා කර බලා, වික්ටර් මිගල් මහතා ලියූ පිටපත ගැන පැහැ දී මුවන්පැලැස්ස ඉදිරියට රචනා කිරීමේ වගකීම ඔහුට පවරනු ලැබීය. වික්ටර් මිගල්ගේ රචනයෙන් යළි ආරම්භ වූ මුවන්පැලැස්ස 1971 ජූනි මස 25 වන දින යළි ප්‍රචාරය ඇරඹිණ. ටික දිනකින්ම ඇමරිකාවේ සිටි දොස්තර මුදලිනායක සෝමරත්නයන් විසින් ගුවන්විදුලියට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතු කරන ලදී. තමා විසින් රචනා කළ නාට්‍යය, එම නමින්ම හා තමා නිර්මාණය කළ ආරච්චිල, එතනාහාමි, වෙදමාමා, බිනරමලී, සුදුබණ්ඩා, වෙඩික්කාරයා යන චරිත යොදා ගනිමින් යළි වෙනකකු විසින් නාට්‍යය රචනා කිරීම නීති විරෝධී බව ඉන් කියැවිණ. වහාම වික්ටර් මිගල් කැඳවූ තේවිස් ගුරුගේ මහතා "අයිසෙ.. වික්ටර් මේකට මොකක් හරි උප්පරවැට්ටියක් කරනවකො.." යනුවෙන් උපදෙස් දුනි. කතා රචක වික්ටර් මිගල් වහාම කතාව වෙනතකට හැරවීය. ආරච්චිලට වෙනත් ඈත යායක කෝරළේ වසමක් බාරව යාමට උසස්වීමක් ලැබේ. ඒ අනුව මුවන්පැලැස්ස ගම අතහැර ආරච්චිල හා එතනාහාමි අලුත් වසම වූ ගෝණින්පැලැස්සට යන පිරිසට එක්වන්නේ කිහිපදෙනකු පමණි. වෙදමාමා, වෙඩික්කාරයා, ගුරුහාමි, බිනරමලී, සුදුබණ්ඩා ආදීන් මුවන්පැලැස්සේම නතර වන අතර නව සේවා වසම අනුව ආරච්චිල, කෝරළේ මහත්තයා බවට පත්වේ. එතනාහාමි මැණිකේ ලෙසින් අමතනු ලැබූ අතර, වෙඩික්කාරයාගේ ගෝලයකු වූ කදිරා ද එහි දී හමුවේ. නව කොරළේ වසමේ ජීවත් වූ ඩිංගි ගුරුන්නාන්සේ නම් දක්ෂ වෙදැදුරා මුවන්පැලැස්ස ගමේ වෙසෙන වෙදමාමාගේ නිවුන් සහෝදරයකු වේ. නීතිමය කටයුතු සමථයකට පත්වන තුරු ගෝණින්පැලැස්ස ලෙස නම් කෙරුණු නාට්‍යය සති කිහිපයකින්ම නව මුවන්පැලැස්ස බවට පත්වේ. වසර කිහිපයකට පසු යළි මුවන්පැලැස්ස ලෙසින්ම නම් කෙරුණු එය 1971 ජූනි 25 දින සිට 1994 නොවැම්බර් 6 දින දක්වාම වික්ටර් මිගල් මහතා විසින් රචනා කරන ලදී. හදිසි හෘදයාබාධයකින් වික්ටර් මිගල් මියයන අතර ඒ වන විට වසර 12 ක් පමණ ජන්තුගේ චරිතයට පණ පෙවූ මෙම ලියුම්කරු ශ්‍රී නිමල් පද්මකුමාර විසින් 1994 දෙසැම්බර් මස සිට මුවන්පැලැස්ස රචනා කිරීම සිදුකරන ලදී. 1994 සිට 2010 අප්‍රියෙල් දක්වා ඔහු විසින් රචනා කළ මුවන්පැලැස්ස ඒ වන විට සිටි සභාපතිවරයා වූ හඩ්සන් සමරසිංහ මහතා විසින් යළි මුදලිනායක සෝමරත්නයන්ටම බාරදෙන ලදි. ශ්‍රී ලංකා ගුවන්විදුලි සේවයේ එතෙක් මෙතෙක් ප්‍රචාරය වූ දීර්ඝතම ගුවන්විදුලි නාට්‍යය එවන් අපූර්ව ඉතිහාස කතා රැසකින් යුතුව තවමත් ගලා යයි. හේන් යායකින් හෙවත් පැලැස්සකින් දුටු මුවකුගේ රුවක් නිසා එසේ අහම්බෙන් දොස්තර මුදලිනායක සෝමරත්නයන් සිතට ආ මුවන් පැලැස්ස නාමය පසු කලෙක ලෝක ප්‍රසිද්ධ වේ යැයි ඔහු කිසිසේත්ම නොසිතන්නට ඇත.

**ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේ දී**
**ශ්‍රී නිමල් පද්මකුමාර**

# ජාති හෝ ආගම් වශයෙන් වෙනස් වුණාට තරුණ පරපුරේ අරමුණු එක සමානයි

## ● අන්තර්ජාතික මාතෘ භාෂා දින චිත්‍ර තරගයේ ත්‍යාග පිරිනමමින් අධ්‍යාපන ඇමැති ජී.එල්. කියයි



ජාතීන් අතර අවබෝධය ඇති කිරීමට ඇති හොඳම විසඳුම ඵලදායි සන්නිවේදනයට අවස්ථාව සලසාදීම බව අධ්‍යාපන ඇමැති, මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා පවසයි.

ජාතීන් හෝ ආගම් අනුව අපේ තරුණ පරපුරට බරපතළ වෙනස්කම් නොමැති අතර, ඔවුන්ගේ මූලික අරමුණු එක හා සමාන වන බවත්, කනගාටුවට කරුණ වන්නේ බොහෝ දෙනකු එය අවබෝධ කර නොගෙන ජීවත්වීම බවත් ඇමැතිවරයා කියයි. එසේම මේ සඳහා ඇති වඩාත් ප්‍රායෝගික විසඳුම ඵලදායී සන්නිවේදනයට අවස්ථාව සලසාදීම බවද සඳහන් කරයි.

අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා මේ අදහස් පළ කළේ, බංග්ලාදේශ මහ කොමසාරිස් කාර්යාලය හා අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව සංවිධාන කරන ලද ජාත්‍යන්තර මාතෘ භාෂා දින සමරුව හා ඊට සමගාමීව පවත්වන ලද වාර්ෂික චිත්‍ර තරගයේ ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානෝත්සවයට එක්වෙමිනි. අධ්‍යාපන අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ පැවති මේ උත්සවයට බංග්ලාදේශ රජය නියෝජනය කරමින් බංග්ලාදේශ මහ කොමසාරිස් තාරික් මොහොමඩ් අරිෆුල් ඉස්ලාම් (Tariqe Mohomad Ariful Islam) මහතා ඇතුළු නියෝජිත පිරිසක්ද, අධ්‍යාපන අමාත්‍යාංශය නියෝජනය කරමින් අධ්‍යාපන ලේකම් මහා චාර්ය කපිල පෙරේරා, අතිරේක ලේකම් හේමන්ත ප්‍රේමතිලක, සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂ හඳුන්පතිරණ මහත්වරු, ප්‍රමුඛ අමාත්‍යාංශයේ නිලධාරීහු රැසක් ද මේ අවස්ථාවට එක්ව සිටියහ.

මෙහිදී වැඩිදුරටත් අධ්‍යාපන ඇමැතිවරයා මෙසේද කීය. බංග්ලාදේශය සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික , සංස්කෘතික හා දේශපාලනික වශයෙන් මනා අවබෝධයක් සහ අන්‍යෝන්‍ය බැඳීමක් පවතින බවත්, දෙරට අතර මිත්‍රත්වය ශක්තිමත් කිරීමට පියවර ගැනීම සම්බන්ධයෙන් බංග්ලාදේශයේ අගමැතිනි ෂීක් හසීනා මහත්මියට තම කෘතවේදිත්වය පළ කරන බවත් පැවසීය.

විශේෂයෙන්ම මෑතකදී පැවති ජිනීවා සමුළුවේදී ශ්‍රී ලංකාවට සහාය පළ කිරීමට බංග්ලාදේශය කටයුතු කිරීම දෙරට අතර මිත්‍රත්වය පිළිබඳ මනා සාක්ෂියක් බවද, බෙංගාලි ජාතිකයන් ස්වකීය මාතෘ භාෂාව ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් දිවි කැප කර සටන් කළ පිරිසක් බවද, අද අප මේ සමරන්නේ ඔවුන් විසින් රැකදුන් මාතෘ භාෂා අයිතිය බවද ඇමැතිවරයා පෙන්වා දුන්නේය.

දෙදාහ වර්ෂයේ දී මාතෘ භාෂාව ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් බංග්ලාදේශය ආරම්භ කළ ක්‍රියාදාමය 2015 වර්ෂයේ සිට ජාත්‍යන්තරය පවා පිළිගෙන ඇති බවත්, ඒ අනුව මාතෘ භාෂාව අනාගත පරපුර වෙනුවෙන් රැකගැනීම සහ උරුම කරදීම රටක වගකීමක් බවත් අවධාරණය කළ ඇමැතිවරයා, භාෂාවේ සීමා මායිම්වලින් ඔබ්බට ගිය ප්‍රකාශන මාධ්‍යයක් භාවිතයෙන් සිතිවිලි හෙළිදරව් කිරීමට සංවිධාන කරන ලද චිත්‍ර තරගය පිළිබඳව ද කෘතවේදීත්වය පළ කළේය. දරුවන්ගේ සහජ හැකියා සහ නිර්මාණශීලීත්වය හඳුනාගනිමින් ඔවුන්ගේ විභව්‍යතා ඔප් නංවා ලීමට උපකාර කිරීම අපගේ වගකීමක් වන බව ද, ඒ වෙනුවෙන් බංග්ලාදේශය දෙන සහයෝගය අතිශයින්ම අගය කරන බවද ඇමැතිවරයා පැවසීය.

අන්තර්ජාතික මාතෘ භාෂා දින සමරුවට සමගාමීව අධ්‍යාපන අමාත්‍යාංශයේ භාෂා හා මානව ශාස්ත්‍ර ඒකකය හා ඉංග්‍රීසි භාෂා ඒකකයේ සහයෝගය ද ඇතිව සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව විසින් වාර්ෂිකව සංවිධාන කරන මේ චිත්‍ර තරගයෙන් මෙවර සිසුන් හතළිස් දෙනකු ඇගයීමට ලක් වූ අතර, ප්‍රථම දෙවන සහ තුන්වන ස්ථාන දිනාගත් සිසු දරුවන් වෙත මූල්‍ය ප්‍රදාන ද පිරිනමනු ලැබිණි.

# විදේශ ඇමැති දිනේෂ් සහ ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපතිනිය අතර සාකච්ඡාවක්



**මහින්ද අලුත්ගෙදර**

විදේශ කටයුතු ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා සහ ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපතිනී ඇලයිනා බී ටෙප්ලිට්ස් මහත්මිය අතර විශේෂ සාකච්ඡාවක් විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී සිදු විය.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ මග පෙන්වීම යටතේ, රටේ සිදු වන විවිධ ධනාත්මක වර්ධනය සම්බන්ධයෙන් එහිදී ඇමැතිවරයා විසින් තානාපතිනිය දැනුවත් කර තිබෙන අතර මේ දක්වා වත්මන් ආණ්ඩුව රටේ අනාගතය වෙනුවෙන් ගෙන තිබෙන ක්‍රියාමාර්ග මෙන්ම ඉදිරි සැලසුම් සම්බන්ධයෙන් ද දැනුවත් කළ බව විදේශ කටයුතු අමාත්‍යාංශය පවසයි.

සංවර්ධන ආධාර ඇතුළු ද්විපාර්ශ්වික සහයෝගීතාව වැඩිදියුණු කළ හැකි ක්‍රම සහ විධි පිළිබඳව ද මෙහිදී දෙපාර්ශ්වය සාකච්ඡා කර තිබෙන අතර එක්සත් ජනපදයේ සහාය ලබාගැනීමට වන ප්‍රමුඛතා ක්ෂේත්‍ර ලෙස දේශගුණික විපර්යාස, හරිත බලශක්තිය සහ තොරතුරු තාක්ෂණය හඳුනා ගත් බව අමාත්‍යාංශය පෙන්වා දෙයි.

# ගෙවුණු මාස තුනේදී ශ්‍රී ලංකාවට කොවිඩ් එන්නත් ලක්ෂ 12ක්

## ● ඉන්දියාව කියයි

**මහින්ද අලුත්ගෙදර**

පසුගිය මාස තුනක කාලයේ දී කොවිඩ්-19 එන්නත් ලක්ෂ 12ක ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට සපයා තිබෙන බව ඉන්දියාව ප්‍රකාශ කරයි.

ඉන්දියාවේ නිෂ්පාදිත කොවිඩ්-19 එන්නත් ශ්‍රී ලංකාවට සැපයීම පිළිබඳ නවතම තත්ත්වය සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වමින් ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය මේ බව සඳහන් කරයි.

කොවිඩ්-19 වසංගතයට එරෙහිව සාමූහිකව සටන් කිරීමට ඉන්දියාව දක්වන කැපවීම අනුව, ඉන්දියාව කොවිඩ්-19 එන්නත් මාත්‍රා මිලියන 64.51 ක් ද්විපාර්ශ්වික වශයෙන් රටවල් 85කට ද කොවැක්ස් (COVAX) පහසුකම යටතේ ද එක්සත් ජාතීන්ගේ සෞඛ්‍ය සේවකයන්ට ද සාම සාධක හමුදාවන්ට ද ලබා දී ඇති බව මහ කොමසාරිස් කාර්යාලය කියයි.

පසුගිය සතිය තරම් ආසන්න කාලයේ ද මේ එන්නත් තොග ආසියානු, පැසිෆික් සහ දකුණු අමෙරිකානු රටවලට සපයා ඇති අතර ඉන්දියාව විසින් නිෂ්පාදිත ඇස්ට්‍රාසෙනිකා එන්නත් මාත්‍රා මිලියන 1.2ක් ජනවාරි, පෙබරවාරි සහ මාර්තු මාසයන්හිදී ශ්‍රී ලංකාවට ළඟාවිය.

මෙයින් අවසාන තොගය කොවැක්ස් පහසුකම යටතේ ශ්‍රී ලංකාවට හිමිවූ අතර මේ එන්නත්හි ප්‍රථම තොග ලැබීමත් සමඟ සැලසුම් කළ දිනයන්ට පෙර එන්නත්කරණ වැඩසටහන ඇරඹීමට ශ්‍රී ලංකාවට හැකිවිය.

දැනටමත් ලොව විශාලම එන්නත් නිෂ්පාදන ධාරිතාව හිමි ඉන්දියාවේ නිෂ්පාදන ධාරිතාව නිසි අනුමැතිය ලද කොවිඩ්-19 එන්නත් සඳහා හදිසි ගෝලීය ඉල්ලුම සපුරාලීමට ඉහළ නැංවෙමින් පවතින අතර නිෂ්පාදනය සහ දේශීය අවශ්‍යතාව ඇතුළු විවිධ කරුණු සැලකිල්ලට ගනිමින් එන්නත් සැපයුම සකස් කෙරෙමින් පවතී.

ඉන්දියාව තවදුරටත් කොවිඩ්-19 වසංගතයට එරෙහිව ගෝලීය සටනේ පෙරමුණ ගනු ඇති අතර අදාළ පාර්ශ්වකරුවන් සමඟ සිය වටිනා සහයෝගීතාව පවත්වාගෙන යන බවද ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය කියයි.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රධාන වීදිය, අංක 152 ලිපිනයෙහි පදිංචි **මනමේඳු පටබැඳිගේ චම්මි ගයාශානි** වන මම මෙතැන් පටන් **මනමේඳු පටබැඳිගේ චම්මි ගයාශානි** යනුවෙන් භාවිත කරන බව උතුම් ජනරජයේ සැමට මෙයින් දැනුම් දෙමි.

මෙයට :
මනමේඳු පටබැඳිගේ චම්මි ගයාශානි

## 'ෆැමිලි රන් සැටර්ඩේ' කොළඹ තුරඟ තරග පිටියෙන් ඇරඹේ

# බෝ නොවන රෝගවලින් ආරක්ෂා වීමට පියවරක්

**ඇමැති නාමල් රාජපක්ෂ**

**නුවන් කොඩිකාර**

බෝ නොවන රෝගවලින් ආරක්ෂා වී සෞඛ්‍ය සම්පන්න දිවි පෙවෙතක් වෙනුවෙන් අපි දැමූ අඩිතාලම "ෆැමිලි රන් සැටර්ඩේ" බව තරුණ කටයුතු හා ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා පැවසීය.

කායික හා මානසික වශයෙන් ශක්තිමත් සහ නීරෝගිමත් තරුණ පරපුරක් දැයට දයාද කිරීමේ ජාතික කාර්යය පෙරදැරි කර ගනිමින් සිය සංකල්පයක් අනුව පසුගියදා (10) උදෑසන කොළඹ තුරඟ තරග පිටියෙන් ආරම්භ කළ "ෆැමිලි රන් සැටර්ඩේ" ( Family Run Saturday) සමාරම්භයට එක්වෙමින් ඇමැතිවරයා මේ බව කියා සිටියේය.

මේ වැඩසටහන සෑම සෙනසුරාදා දිනකම පෙරවරු. 6.00ට කොළඹ තුරඟ තරග පිටියෙන් ආරම්භ වන අතර නොබෝදිනකින් එය රට පුරා ක්‍රියාත්මක කරන බව රාජපක්ෂ මහතා කීය.

තුරඟ තරග පිටියේ සිට මාර්ගයේ වෙන් කළ ආරක්ෂිත මංතීරුවක් ඔස්සේ කිලෝමීටර් 5 ක දුරක් ඇවිදීම හෝ ධාවනය මේ වැඩසටහන අයත් වන අතර කාර්ය බහුල ජීවිතයේ ව්‍යායාම වෙනුවෙන් සතියට එක් දිනක් හෝ ඇවිදීමට ජනතාව හුරුකිරීමේ අරමුණින් මේ වැඩසටහන සංවිධාන කර තිබේ.

ලියාපදිංචිවීමකින් තොරව පවුලේ සියලුම දෙනාට "ෆැමිලි රන් සැටර්ඩේ" සමඟ එක් විය හැකි අතර තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය, ලංකා ස්පෝර්ට්ස් රයිසන් ආයතනය (LSR), ශ්‍රී ලංකා පොලීසිය ඇතුළු ආයතන ගණනාවක් මේ වැඩසටහන සමඟ අත්වැල් බැඳගෙන සිටී.

ඇමැතිවරයා වැඩිදුරටත් එහිදී මෙසේ ද පැවසීය.

ශ්‍රී ලංකාවේ දිවි පෙවෙත ගැන කතා කරන විට අපට ක්‍රියාශීලී මෙන්ම ක්‍රියාකාරී ජන ජීවිතයක් ඉතිහාසයේ උරුමව තිබුණා. නමුත් වර්තමානයේ පවතින කාර්යබහුලත්වය සමඟ ජනතාවගේ ක්‍රියාශීලීත්වය අඩු වී තිබෙන බව පෙනෙන්න තිබෙනවා.

බාල, තරුණ, වැඩිහිටි බොහෝ පිරිස අද තාක්ෂණය පිටුපස හඹා යෑම නිසා මේ තත්ත්වය වඩා නරක අතට හැරිලා. අපි දක්ෂ ක්‍රීඩකයෙක් හදන්න නම් ක්‍රියාශීලී අනාගත පරපුරක් නිර්මාණය කළ යුතුයි.

ක්‍රියාශීලී පරපුරක් ගොඩනගන්න නම් මව්පියන් දරුවන් ක්‍රියාශීලී දිවිපෙවෙතක් කරා රැගෙන යා යුතුයි.

සිංහල හා දමිළ අලුත් අවුරුද්ද උදාවෙන කාලය තමයි අපේ වැඩිම ක්‍රියාශීලී කාලසීමාව ලෙස හඳුන්වන්නේ. ඒ කාලසීමාවෙත් සෙනසුරාදා දිනයේ උදේ වරුවේ පවුලේ සියලුදෙනා එකතුවෙලා ක්‍රියාශීලී දිවිපෙවෙතක් ගත කරන්න එකතු වෙන්න කියා ගෞරවනීයව ආරාධනය කරනවා. අද කොළඹ තුරඟ තරඟ පිටියෙන් ආරම්භ කළ මේ වැඩසටහන ලංකාවේ සෑම පළාතකම ආරම්භ කරන්න බලාපොරොත්තු වෙනවා.

මීට පෙර අපි සතියේ සෑම ඉරිදා දිනකම කිඹුලාවල හන්දියේ සිට තුරඟ තරග පිටිය දක්වා පවුලේ සැමට එක්විය හැකි ලෙස ඉතා ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් "සයිකල් සන්ඩේ" වැඩසටහන ආරම්භ කළා. අද එය ලංකාව පුරා ව්‍යාප්ත වෙලා තිබෙනවා. ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය හා බැඳුණු අපේ රට ප්‍රවර්ධනය වන විදියට වගේම මේ රටේ ජනතාවට පරිසරයට, සතා සිවුපාවාට ආදරය කරමින් ක්‍රියාශීලි දිවි පෙවෙතක් ගත කරන්න පුළුවන් ආකාරයේ සංකල්ප රැසක් ඉදිරියේ දී අපි ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබෙනවා.

# ඉන්දීය ධීවරයන් මෙරට මුහුදු සීමා ආක්‍රමණය කිරීම මේ වසරේ සම්පූර්ණයෙන් නවත්වනවා

## ● ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා



**බුද්ධිකා ඉඹුලාන**

ඉන්දීය ධීවරයන් මෙරට මුහුදු සීමා ආක්‍රමණය කිරීම මේ වසරේදී සම්පූර්ණයෙන් නවත්වන බව ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා මහතා පවසයි.

හම්බන්තොට දිස්ත්‍රික් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මහතා සහ සමස්ත ලංකා පොදු ධීවර සංගමයේ නියෝජිතයන් හමු වූ අවස්ථාවේදී දේවානන්දා මහතා මේ බැව් පැවැසීය.

ශ්‍රී ලංකාවේ ධීවර කාර්මිකයන් මුහුණපාන ගැටලු කීපයක් සම්බන්ධයෙන් මේ විශේෂ සාකච්ඡාවක් ධීවර අමාත්‍යාංශයේ දී පැවැත්විණි.

මෙහිදි සමිති නියෝජිතයන් පෙන්වා දුන්නේ ඉන්දියානු ධීවරයන්ගේ දිගින් දිගටම ශ්‍රී ලංකා මුහුදු සම්පත් ආක්‍රමණය හා මෙරට ධීවරයන් ඉන්දීය සාගරය හරහා අරාබි මුහුදු සීමාවට ඇතුළු වීමේදි ඉන්දීය වෙරළ ආරක්ෂක භටයන් විසින් සිදු කරන පහරදීම්වලින් හිරිහැර විදීමට, එම හරිහැර නතර කර දෙන ලෙස ඔවුහු ඇමැතිවරයාගෙන් ඉල්ලා සිටියහ.

මෙහිදී වැඩිදුරටත් ධීවර ඇමැතිවරයා මෙසේද කීය. ඉන්දීය ධීවරයන්ගේ ආක්‍රමණශීලි ක්‍රියා වසර කීපයක් තිස්සේ පවතින බවත් මේ ප්‍රශ්නය පිළිබඳ තමන් රාජ්‍ය තාන්ත්‍රික සාකච්ඡා වට 4කට අධික ප්‍රමාණයක් පවත්වා ඇති බවය.

සාර්ථක විසඳුමක් කරා එළඹීමට අවශ්‍ය පදනම සාකච්ඡා කර ඇති බවත්, ඒවා සාර්ථක අන්දමින් ධනාත්මකව සිදුවන බවත් පෙන්වා දුන් ඇමැතිවරයා විශේෂයෙන් ඉන්දියානු ධීවරයන්ගේ ආක්‍රමණයේ බලපෑම උතුරු පළාතට සිදුවීම හේතුවෙන් එය වැඩිපුර බලපාන්නේ තම පළාතේ ධීවරයන්ට බවද කීය. මේ ආක්‍රමණවලට ඉඩ දුන හොත් ශ්‍රී ලංකා මුහුදේ ධීවර සම්පත් වසර 03,04 කින් සම්පූර්ණයෙන්ම විනාශ වීය හැකි බව ද දේවානන්දා මහතා පැවැසීය.

තමන් අගමැති මහින්ද රාජපක්ෂ මහතා සමඟ පසුගිය වසරේ ඉන්දියාවේ සිදුකළ සංචාරයේදී මේ ගැටලුව විසඳීමට අවශ්‍ය වැඩපිළිවෙළක් ඉදිරිපත් කළ බවත්, එම වැඩපිළිවෙළ ඉන්දීය අගමැතිවරයාද පිළිගන්නා අතර ලෝකයම වසා ගනිමින් පැතිරුණු කොරෝනා උවදුර හේතුවෙන් එය ක්‍රියාවට නැංවීමට නොහැකි වූ බවත් මෙහිදී ඇමැතිවරයා අවධාරණය කළේය.

අමාත්‍යාංශ ලේකම් ඉන්දු රත්නායක මහත්මිය හා ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සුසන්ත කහවත්ත මහතා ඇතුළු නිලධාරීහු පිරිසක් මේ අවස්ථාවට එක් වූහ.

## රුහුණ සරසවියේ ණය ගනුදෙනු සමුප සමිති සාමාජිකයන්ට වියළි සලාක මලු



සීමාසහිත රුහුණ විශ්වවිද්‍යාලයීය සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය විසින් 7 වැනි වරටත් සාමාජිකයන් සඳහා බක්මහේ සණස වියළි සලාක මලු ලබාදීම ඉකුත්දා (07) රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතාගේ ප්‍රධානත්වයෙන් සේවක විවේකාගාරයේදී පැවැත්විණි.

එක් සාමාජිකයකුට රුපියල් දෙදහසක බඩු මල්ලක් බැගින් සාමාජිකයන් 880ක් සඳහා බඩු මලු ලබාදීම වෙනුවෙන් සණස සමිතිය රුපියල් 1760000 ක මුදලක් සාමාජිකත්වයට වාර්ෂිකව වෙන් කළ බව රුහුණ විශ්වවිද්‍යාලයේ සණස සමිතියේ සභාපති ඕ.වී.එල්.පී. අනුර මහතා පැවසීය.

බක්මහ වියළි සලාක බඩු මලු ලබාදීමේ අවස්ථාවට රුහුණ විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපති මහාචාර්ය සමන් චන්දන එදිරිවීර, ලේඛකාධිකාරී සේනානි කලුගම, මූල්‍යාධිකාරී කේ.ඒ.ආර්.එස්. ජයකොඩි, නියෝජ්‍ය ලේඛකාධිකාරී (නීති) ජී.එල්. එරත්න ඇතුළු අධ්‍යයන, පරිපාලන හා අනධ්‍යයන සේවක මහත්ම මහත්මීහු රැසක් මේ අවස්ථාවට සහභාගි වූහ.

www.nlb.lk
NLB
දිනය 2021.04.11 ඉරිදා නිල ප්‍රතිඵල

මහජන සම්පත
දිනුම් වාරය : 4454
දිනා ඇති මුළු මුදල 11,411,520.00
ඊළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 18,876,440.00
ඉංග්‍රීසි අක්ෂරය V
ජයග්‍රාහී අංක 6 3 9 2 2 0

ගොවිසෙත
දිනුම් වාරය : 2749
දිනා ඇති මුළු මුදල රු. 7,332,380.00
ඊළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 64,728,276.40
ඉංග්‍රීසි අක්ෂරය H
ජයග්‍රාහී අංක 16 19 59 76

සෙවණ
දිනුම් වාරය : 330
දිනා ඇති මුළු මුදල රු. 2,154,580.00
ඊළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 14,000,000.00
ඉංග්‍රීසි අක්ෂරය Q
ජයග්‍රාහී අංක 14 23 24 68

ධන නිධානය
දිනුම් වාරය : 491
දිනා ඇති මුළු මුදල රු. 3,223,840.00
ඊළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 92,902,915.20
ඉංග්‍රීසි අක්ෂරය O
ජයග්‍රාහී අංක 32 43 65 69

දරු දිරි සම්පත
දිනුම් වාරය 34
දිනා ඇති මුළු මුදල රු. 3,215,280.00
ඊළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 7,196,614.80
ඉංග්‍රීසි අක්ෂරය E
ජයග්‍රාහී අංක 32 42 60 90

2021.04.11 ... 686,483
... රු. 27,337,600.00
රු. 2,000,000.00 ... 01 රු. 1,000,000.00 ... 01 රු. 100,000.00 ... 30
අංක 32, ... කොළඹ 01.
දුර.: 011-4607000, 011-4607001-2
ෆැක්ස්: 011-4669475

# යාපනයේ නගරාධිපතිට කියා වෙනම නීතියක් මේ රටේ නෑ

## ● මහාමාර්ග ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු

**ක්‍රිසන්ති විතාරණ**

පොලිසියේ රාජකාරිය කිසිම නගරාධිපතිවරයකුට භාවිත කිරීමට මේ ආණ්ඩුව ඉඩ නොදෙන බව වගකීමෙන් ප්‍රකාශ කරන බව මහාමාර්ග ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා පැවසීය.

මේ රටේ දැන් ක්‍රියාත්මක වන්නේ එක නීතියක් බවත් යාපනයේ නගරාධිපතිට කියා වෙනම නීතියක් නැති බවත් ඇමැතිවරයා අවධාරණය කළේය.

ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා මේ බව කියා සිටියේ, මහාමාර්ග ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා විසින් ප්‍රතිපාදන වෙන් කරන ලද ගිරිඋල්ල නගරයේ පවතින අධික රථවාහන තදබදයට පිළියමක් ලෙස නගරයේ අභ්‍යන්තර මාර්ග සියල්ල කාපට් අතුරා සංවර්ධනය කිරීමේ කටයුතු නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව මාධ්‍යවේදීන් නැගූ ප්‍රශ්නවලට පිළිතුරු සපයමිනි.

එහිදී වැඩිදුරටත් ඇමැතිවරයා මෙසේද කීය.

රාසමාණික්කම් මන්ත්‍රීතුමා කිව්වා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට කතා කරන්න වෙලාව දෙන්නේ නැහැ කියා. අපි පළමු මාස තුන ඇතුළත මේ පාර්ලිමේන්තුවට පත් වුණ සෑම මන්ත්‍රී කෙනෙකුටම අවස්ථාව දුන්නා. ඒ නිසා ජ්‍යෙෂ්ඨයන්ට සහ පාර්ලිමේන්තුවේ මීට පෙර කතා කර පළපුරුද්දක් තිබෙන අයට ඔවුන්ගෙන් අහන ප්‍රශ්නවලට හරියට උත්තර දෙන්නවත් වෙලාවක් ලැබුණේ නැහැ. හැම කෙනෙකුටම වෙලාව ලබා දුන්නා. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක හැටියට ඉතාමත් වගකීමෙන් මම එය කියනවා. ඒ අයට ලැබෙන කාලය වගේ කාලයක් අපේ අයට හම්බ වෙන්නේ නැහැ. ඒ වගේම යාපනය නගරාධිපති ගැන ඔහු කතා කෙරුවා. යාපනේ නගරාධිපති ගැන කියවුණේ ප්‍රසිද්ධ නාලිකාවක. ඒ නාලිකාවේ ඇහුවා අද පොලිසියේ රාජකාරියත් නගර සභාව ද කරන්නේ., මේ රටේ නීතිය කෝ කියලා ඇහුවා. එල්ටීටීඊ නීතිය ක්‍රියාත්මක වෙද්දී අපි දැක්කා උතුරේ උසාවි කොහොමද ක්‍රියාත්මක වුණේ කියලා. ඒ වගේම උතුරේ පොලිසිය එල්ටීටීඊය කාලේ ක්‍රියාත්මක වුණේ කොහොමද කියා අපි දැක්කා. පොලිසියේ රාජකාරිය කිසිම නගරාධිපති කෙනෙකුට පාවිච්චි කරන්න ඉඩ දෙන්නේ නැහැ කියන එක ආණ්ඩුව වෙනුවෙන් ඉතාමත් වගකීමෙන් පැහැදිලිව කියනවා.

# සෙලින්කෝ හෙල්ත් කෙයාර් කොළඹ පිළිකා ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් 50%ක් දක්වා වට්ටම්

## සෙලින්කෝ සමාගම



සෙලින්කෝ ලයිෆ් සමාගමේ ජීවිත රක්ෂණ ඔප්පු හිමියන්ට සෙලින්කෝ හෙල්ත් කෙයාර් සර්විසස් ලිමිටඩ් (CHSL) සමාගමට අයත් කොළඹ පිහිටි අතිනවීන පිළිකා ප්‍රතිකාර මධ්‍යස්ථාන දෙකෙන් විකිරණ ප්‍රතිකාර ලබාගැනීමේදී 50%ක් දක්වා වට්ටමක් ලබාදෙන බව සමාගම නිවේදනය කරයි.

වසර තුනකට වඩා වැඩි කාලයක් සිය ජීවිත රක්ෂණ ඔප්පු සක්‍රියව පවත්වාගෙන යන සෙලින්කෝ ලයිෆ් රක්ෂණ ඔප්පු හිමියන් 50% ක වට්ටම ලබාගැනීමට සුදුසුකම් ලබන බවත් අනිකුත් රක්ෂණ ඔප්පු හිමියන් 25%ක වට්ටමක් ලබාගැනීමට සුදුසුකම් ලබන බවත් සමාගම සඳහන් කරයි.

Varian Clinac® iX ලීනියර් ඇක්සලරේටර් යන්ත්‍රය මගින් හෝ AccurayTomoHD™ ටොමෝතෙරපි විකිරණ ප්‍රතිකාර ලබාගැනීමේදී මේ වට්ටම් ලබාගනිමින් රුපියල් 400,000ක් දක්වා මුදලක් ඉතිරි කර ගැනීමේ අවස්ථාව තම රක්ෂණ ඔප්පු හිමියන්ට හිමිවන බව සෙලින්කෝ ලයිෆ් පවසයි.

සෙලින්කෝ හෙල්ත්කෙයාර් සර්විසස් ලිමිටඩ් වෙතින් මේ වට්ටම් ලබාගැනීමට සෙලින්කෝ ලයිෆ් සමාගමේ ජීවිත රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආසන්නතම පවුලේ සාමාජිකයින්ද සුදුසුකම් ලබන බව සමාගම සඳහන් කරයි. මේ අනුව, ආසන්නතම පවුලේ සාමාජිකයන් ලෙස සලකන්නේ විවාහක රක්ෂණ ඔප්පුහිමියකුගේ බිරිය, සැමියා සහ දරුවන් හෝ අවිවාහක රක්ෂණ ඔප්පු හිමියකුගේ මවුපියන්ය.

# සාගරයට පොලිතීන් හා ප්ලාස්ටික් මුදා හරින්න එපා:

# ලොවට හොඳ පණිවිඩයක් දුන් ගුවන් හමුදාවේ රොෂාන්ට පරිසර ඇමැතිගෙන් සුබ පැතුම්

**බුද්ධිකා ඉඹුලාන**

'සාගරයට පොලිතීන් හා ප්ලාස්ටික් මුදාහරින්න එපා' පණිවිඩය ලෝක වාසීන්ට දෙමින් ඉන්දියන් සාගරයේ පෝක් සමුද්‍ර සන්ධිය හරහා පිහිනමින් වාර්තාවක් එක් කළ ගුවන් හමුදාවේ රොෂාන් අබේසුන්දර රණවිරුවා කළ මෙහෙවර රටම කෘතඥතාව පළ කළ යුතු බව පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා රොෂාන් අබේසුන්දර රණවිරුවාට සුබ පැතුම් එක් කරමින් පවසයි.

මේ රණවිරුවා තම ජීවිත අවදානමක් පවා නොත.කමින්මේ වීරක්‍රියාව සිදු කළේ ඔහු පරිසරයට දක්වන ආදරය හේතුවෙන් බවත් පරිසරය ආදරය කරන එවැනි අයට සමස්ත ජාතියේම කෘතඥතාව පළ කළ යුතු බවත් ඇමැතිවරයා කියයි.

ශ්‍රී ලංකාව සාගරයට ප්ලාස්ටික් හා පොලිතීන් එකතු කරන 05 වන රට බවට එක්තරා විදේශීය ආයතනයක් පසුගියදා නම් කර තිබූ නමුත් එය සම්පූර්ණයෙන්ම අසත්‍ය වුවද අපේ රටේ ජනගහනයට සාපේක්ෂව පොලිතින් හා ප්ලාස්ටික් භාවිතය දිනෙන් දින ඉහළ යමින් තිබෙන බවත් ඇමැතිවරයා පෙන්වා දෙයි.

'අපේ රටේ ජනගහනය ගත්තත්, මේ කලාපයේ අනෙක් රටවලට වඩා අපේ රටේ අඩුයි. කොළඹ ජනගහනය වගේ සිය ගුණයක් ජනගහනය ඉන්න නගර මේ කලාපයේ තිබෙනවා. කෙසේ වෙතත් අප රටේ පොලිතින් හා ප්ලාස්ටික් භාවිතය දිනෙන් දින ඉහළ යන බව සත්‍යයක්.සාගරයට වන මේ හානිය ගැන අප විටින් විට ජනතාව දැනුම්වත් කරනවා.විශේෂයෙන් ධීවර ජනතාව වෙත අප මේ ගැන දැනුම්වත් කිරීම් සිදු කළ සාගරය අප හැමදෙනාටම සම්පතක් යැයිද අමරවීර මහතා කියයි.

# පළාත් පාලන මැතිවරණ ක්‍රමය සංශෝධනයට යෝජනා හයක් කමිටුවට භාර දුන්නා

## ● පැෆ්රල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ

**අනුර ප්‍රේමලාල්**

පළාත් පාලන මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීමට නොසලකා නොහැරිය යුතු පදනම් හතරක් හා සැලකිල්ලට ගත යුතු යෝජනා හයක් ඒ සඳහා පත් කර තිබෙන කමිටුව වෙත භාරදුන් බව පැෆ්රල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ නීතිඥ රෝහණ හෙට්ටිආරච්චි මහතා ප්‍රකාශ කරයි.

ඒ මහතා මේ බව සඳහන් කළේ ඉකුත්දා (09) එම කමිටුව හමුවේ සිය අදහස් දක්වමිනි. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ විධායක අධ්‍යක්ෂවරයා මෙසේද කීය. පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයටත්, විෂය භාර ඇමැතිවරයාටත් ප්‍රසාදය පළකර සිටිනවා. ඒ අනුව සමානුපාතික පදනම එලෙසම ආරක්ෂා විය යුතු බව, කාන්තාවන් සඳහා කෝටාව 25% එලෙසම ආරක්ෂා කර ගැනීම, කොට්ඨාස පදනම ආරක්ෂා කර ගැනීම, පළාත් පාලන සභික ප්‍රමාණය අවම වශයෙන් 30%ක්වත් අඩු කර ගැනීම ආදියයි.


ලංසු සඳහා ආරාධනයයි

ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව (CPC)

(බලශක්ති අමාත්‍යාංශය)

**ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ (CPC) ප්‍රධාන කාර්යාලයේ පියැසිමුදුනට ඇලුමිනියම් සංයුක්ත ලෝහමය / ආරක්ෂක ආවරණය සැපයීම හා ස්ථාපනය**

**(Supply & Installing of Aluminium Composite Cladding Work to the Roof Top of CPC, Head Office)**

**B/31/2021**

01. ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත විස්තර කොට ඇති පරිදි හා (ආසන්න වශයෙන්) රු. මිලියන 3.0 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත CPC ප්‍රධාන කාර්යාලයේ පියැසි මුදුනට ඇලුමිනියම් සංයුක්ත ලෝහමය / ආරක්ෂක ආවරණය සැපයීම හා ස්ථාපනය කිරීම සඳහා සුදුසුකම්ලත් යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.
02. මෙම කර්මාන්තයෙහි ඉදිකිරීම් කාලය මාස එකකි (01)
03. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවනු ලැබේ.
04. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවූවකු විය යුතු අතර, C8 හෝ C7 ICTAD ලියාපදිංචිය සපුරා තිබිය යුතුය.
05. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීම සඳහා අවශ්‍යතාවයන්ට මෙම ටෙන්ඩරයට අයදුම්කළ ලංසුකරුවන්ට C8 හෝ C7 ICTAD ලියාපදිංචිය තිබිය යුතුය යන්නද ඇතුළත් වේ. අභිලාෂී ලංසුකරුවන්ට වැඩිමනත් තොරතුරු කළමනාකාර (ප්‍රසම්පාදන හා ගබඩා) වෙතින් ලබාගත හැකි අතර, ලං.බ.නී. සංස්ථාවේ නිල වෙබ් අඩවිය වන http://ceypetco.gov.lk/public-tenders වෙත පිවිසීමෙන් ලංසුකරණ ලිපි ලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.
06. පහත සඳහන් ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන රු. 2,000.00 (එනම් රු. 1851.85 + 8% VAT) ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2021.05.04 දින තෙක් 0900 පැය සිට 1500 පැය දක්වා අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.
07. කොවිඩ් – 19 වසංගතය හේතුවෙන් ලංසුකරුවන්ට ලං.බ.නී. සංස්ථා වෙබ් අඩවිය වන http://ceypetco.gov.lk/public-tenders වෙතින් ලංසුකරණ ලිපිලේඛන බාගත කරගත හැකි අතර, සියලුම ගෙවීම් මහජන බැංකුව (ප්‍රධාන කාර්යාලය) ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාවේ ගිණුම් අංක 004100110208633 වෙත කළ හැකිය. ලංසු සමග කරුණාකර බැංකු ලදුපතේ මුල් පිටපත ඉදිරිපත් කරන්න.
08. ලංසු අනුපිටපතකින් යුතුව 2021.05.05 දින 1400 පැයට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනය වෙත ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු භාර නොගැනේ. ලංසු භාරගැනීම අවසන්වූ වහාම, එම අවස්ථාවට සහභාගීවීමට කැමති ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කෙරෙනු ඇත.
09. ලංසු, ලංසු භාරගැනීමේ අවසාන දිනයේ සිට දින හැට තුනක් (63) දක්වා වලංගු විය යුතුය.
10. සියලුම ලංසු සමග බැංකුවකින් හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලත් රක්ෂණ සමාගමකින් රු. 50,000.00 ක වටිනාකමකට ලබාගත් ලංසු සුරක්ෂණයක් එවිය යුතුය. ලංසු සුරක්ෂණය 2021.05.05 දින තෙක් වලංගු විය යුතුය.

ඉහත සඳහන් කළ ලිපිනය,

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**කළමනාකරු (ප්‍රසම්පාදන හා ගබඩා) බාරේ,**
**ප්‍රසම්පාදන හා ගබඩා අංශය,**
**ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව,**
**1 වන මහල,**
**නො. 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.**

**දුරකථන : 5455331 ෆැක්ස් : 5455424**



afc රන් ණය සේවාව

රන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

එලායන්ස් ෆිනෑන්ස් කොම්පැනි පීඑල්සී පහත සඳහන් ස්ථානවල උකස් තබන ලද 2020-01-31 දිනට කල්පිරුණු, මෙතෙක් බේරා නොගත් රන් භාණ්ඩ 2021-04-28 වන දින පෙ.ව. 9.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**රන් ණය මධ්‍යස්ථාන**

**අළුත්ගම, අම්බලන්ගොඩ, අම්පාර, අනුරාධපුර, අතුරුගිරිය, අවිස්සාවේල්ල, බදුල්ල, බලංගොඩ, මඩකලපුව, චන්කනෙයි, චාවකච්චේරි, හලාවත, චුන්නක්කම්, දඹුල්ල, ගලේවෙල, මොණරාගල, හැටන්, හෝමාගම, හොරණ, ජා-ඇල, යාපනය, කඩවත, කදුරුවෙල, කඩුවෙල, කලවංචිකුඩි, කල්පිටිය, කිලිනොච්චි, කිරිබත්ගොඩ, කිරිඳිවැල, මාලබේ, මාතර, මීගමුව, නිට්ටඹුව, පානදුර, පිළියන්දල, පේදුරු තුඩුව, පූගොඩ, රත්නපුර, රිකිල්ලගස්කඩ, තිරුනවේලි, ත්‍රිකුණාමළය, වව්නියාව, වැලිමඩ, දෙහිඅත්තකණ්ඩිය, ගල්ගමුව, කළුතර, කෑගල්ල, කැලණිය, කුරුණෑගල, නාවලපිටිය, රාගල, රාජගිරිය, වැලල්ලවාය, කොහුවල, නුවර එළිය, නිකවැරටිය, මාතලේ, හිඟුරක්ගොඩ, මැදවච්චිය**

**වෙන්දේසිය පැවැත්වෙන ස්ථානය සහ දිනය**

**නො 722, කෝට්ටේ පාර, රාජගිරිය**

**2021-04-28**

වෙන්දේසිය සඳහා පැමිණෙන සියලුම දෙනා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය. දැනුම්දීමකින් තොරව වෙන්දේසිය අවලංගු කිරීමේ, කල් දැමීමේ හා ඒකාබද්ධ කිරීමේ බලය එලායන්ස් ෆිනෑන්ස් කොම්පැනි පී එල් සී සතුය.

ආරම්භය 1956
එලායන්ස් ෆිනෑන්ස් කොම්පැනි පී එල් සී
සෞභාග්‍යයට විශ්වාසනීය අඩිතාලමක්

ප්‍රධානි - රන් ණය
**එලායන්ස් ෆිනෑන්ස් කොම්පැනි පී.එල්.සී**
නො.722, කෝට්ටේ පාර, රාජගිරිය.
දුරකථන - 0115 573600



ප්‍රසම්පාදන දැන්වීමයි

**බලශක්ති අමාත්‍යාංශය**

**ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව**

**ඩිස්පෙන්සින්ග් පොම්ප, එයාර් කොම්ප්‍රෙසර්, හිබෝයිස් (Hibouys) පාවිච්චි කළ ටයර් හා රිම්, බැටරි, පාවෙන පොම්ප, යකඩ සුන්බුන් ආදිය ඉවත්කරලීම**

**B/30/2021**

ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, සපුගස්කන්ද පෙර පැවති තයිලොත් 6 පරිශ්‍රයේ RDD අංගනයේ ඇති පහත සඳහන් අයිතම ඉවත්කර ගැනීම සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| ලොට් A | : | ඩිස්පෙන්සින්ග් පොම්ප – 127 |
| | : | එයාර් කොම්ප්‍රෙසර් – 32 |
| | | හිබෝයිස් (Hibouys) – 29 |
| ලොට් B | : | පාවිච්චි කළ ටයර් – 256 ක් සහ වාහන රිම් – 12 ක් |
| ලොට් C | : | හයිබ්‍රිඩ් නොවන බැටරි – 123 ක් හා UPS බැටරි – 18 |
| ලොට් D | : | හයිබ්‍රිඩ් කාර් බැටරි 07 |
| ලොට් E | : | පාවෙන පොම්ප (අක්වෙරළ SPMB පහසුකම් ස්ථානයෙන් ලැබුණු හෝස්, චේන්, වයර් රෝප්, යකඩ සුන්බුන් යනාදිය ඇතුළත්ය.) |
| ලොට් F | : | යකඩ සුන්බුන් |

ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන රු. 500/– ක (එනම් රු. 462.96 + 8% VAT) බැගින් ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2021.05.04 දින තෙක් 0900 පැය සිට 1500 පැය දක්වා, කොළඹ – 09, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, නො. 609, පළමු මහල, ප්‍රසම්පාදන හා ගබඩා අංශයේ, ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාවේ කළමනාකරු (ප්‍රසම්පාදන හා ගබඩා) වෙතින් ලංසුකරණ ලිපිලේඛන ලබාගත හැකිය.

2021.05.05 දින 1400 පැයට ලංසු භාරගැනීම අවසන් කෙරෙන අතර, ඒ වහාම කළමනාකරු (ප්‍රසම්පාදන හා ගබඩා) කාර්යාලයේදී ලංසු විවෘත කෙරේ.

ලොට් A සිට ලොට් F දක්වා වන ඉවත්කිරීමට නියමිත අයිතම සපුගස්කන්ද පෙර පැවති තයිලොත් 6 පරිශ්‍රයේදී සහ CPC ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැකි අතර, 2021.05.04 දින දක්වා කළමනාකරු (ප්‍රසම්පාදන හා ගබඩා) වෙතින් කලින් වේලාවක් වෙන් කරවාගෙන අයිතම පරීක්ෂා කර බැලිය හැකිය.

යම් පැහැදිලි කිරීම් (වෙතොත්) පහත සඳහන් දුරකථන හා ෆැක්ස් අංක මගින් කළමනාකරු (ප්‍රසම්පාදන හා ගබඩා) වෙතින් දුරකථන අංක 5455331, ෆැක්ස් : 5455424 මගින් ලබාගත හැකිය.

කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ලංසුකරුවන්ට ලංසුකරණ ලිපිලේඛන ලං.බ.නී. සංස්ථාවේ වෙබ් අඩවියෙන් www.ceypetco.gov.lk බාගත කරගත හැකි අතර, සියලුම ගෙවීම්, මහජන බැංකුවේ (ප්‍රධාන කාර්යාලයේ) ගිණුම් අංක 004100110208633 දරන ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගිණුමට ගෙවිය හැකිය. බැංකු ලදුපතේ මුල්පිටපත කරුණාකර ලංසු සමග ඉදිරිපත් කරන්න.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**කළමනාකරු (ප්‍රසම්පාදන හා ගබඩා) බාරේ,**
**ප්‍රසම්පාදන හා ගබඩා අංශය,**
**ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව, නො. 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.**


# අවුරුදු සමයේදීත් කොවිඩ් සෞඛ්‍ය මාර්ගෝපදේශ අමතක කරන්න එපා

## මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ සභාපති අනතුරු අඟවයි

**අනුර ප්‍රේමලාල්**

කොවිඩ්-19 වසංගත තත්ත්වය කළමනාකරණය කරමින් රට ඉදිරියට ගෙන යෑමට උත්සාහ කරන මේ අවස්ථාවේදී මහජනතාව වෙත ලබාදී ඇති සෞඛ්‍ය මාර්ගෝපදේශ අමතක නොකර අවුරුදු සමයේදීද ඒවා හොඳින් පිළිපැදිය යුතු බව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ සභාපති උපුල් රෝහණ මහතා ප්‍රකාශ කරයි.

ඒ මහතා මේ බව සඳහන් කළේ ඉකුත්දා (09) නීතිය හා සමාජ භාරය මෙහෙයවූ 'කොවිඩ් 19 මර්දනයට සහාය වෙමු' මැයෙන් පැවැති වැඩමුළුවක් අමතමිනි. එය රාජගිරියේ පිහිටි දකුණු ආසියානු සහයෝගිතා ගොඩනැගිල්ලේ ශ්‍රවාණාගාරයේදී පැවැත්විණි. එහිදි වැඩිදුරටත්ඒ මහතා මෙසේද කීය.

මේ වනවිට අවුරුදු උත්සව සමය නිසා ජනතාව ඉතා ප්‍රවේශම්කාරීව සිටිය යුතු වුණත් මේවන විට මහජනතා කොවිඩ්-19 නව කොරෝනා වසංගතය අමතක කර තිබෙනවා. අද මොන බස් රථයේද ආසන ගණනට ජනතාව ගෙන යන්නේ. රෙදි පිළි විකුණන ප්‍රධාන වෙළෙඳසැල්වල මේ මාර්ගෝපදේශ ක්‍රියාත්මක වෙනවාද. මේවාට නීතිරීති දමනවා වගේම ජනතාව තමන් වෙත ලබාදී ඇති උපදෙස් පිළිපැදිය යුතුයි. නමුත් මේ වනවිට ජනතාවගේ දායකත්වය අවම වෙමින් තිබෙනවා. නමුත් පී.සී.ආර්.පරීක්ෂණවලින් පොසිටිව් වුණොත් එහිදි නිවෙස්වලින් ගෙන යන්න සූදානම් වනවිට තමයි ජනතාවට තේරෙන්නේ මෙහි බරපතළකම. එහිදී අඬා වැටෙනවා.

මේ වනවිට එන්නත්කරණය ආරම්භ කරගෙන එහි කටයුතු කරන අතර දෙවන එන්නත ගැනද කතා කරනවා. එන්නත් ලබපු අය ගැන කිසිම ගැටලුවක් මේ වනවිට නැහැ. නමුත් අපි අදාළ ජන කාණ්ඩ වෙත මේ එන්නත ලබාදිය යුතුයි.

මේ වනවිට කොවිඩ්-19 මර්දනය කරන මධ්‍යස්ථානයේ ප්‍රධානියා වන හමුදාපති ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා ඉතා හොඳින් තමා වෙත පැවරී තිබෙන කාර්යය සියලු දෙනාගේ සහයෝගය ලබාගනිමින් ඉටුකරන බව සිහිපත් කළ යුතුයි. කොවිඩ් සඳහා එන්නත් කරන සියලු දෙනාගේ ලේඛන ගත වීමක් සිදුවෙනවායිද කීය.

# බකමූණ ප්‍රාදේශීය රෝහලේ බාහිර රෝගී අංශය ජනතා අයිතියට



**නුවන් කොඩිකාර සහ පොළොන්නරුව සමූහ**

උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව මගින් පාලනය වන බකමූණ ප්‍රාදේශීය රෝහලේ බාහිර රෝගී අංශය පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය ඇමැති රොෂාන් රණසිංහ මහතා අතින් පසුගියදා විවෘත කෙරිණි.

ඊට සමගාමීව අභ්‍යන්තර ප්‍රවේශ මාර්ග සංවර්ධනයට මුල්ගල තැබීමද රාජ්‍ය ඇමැතිවරයා අතින් සිදු විය.

අධ්‍යාපනය, ආර්ථිකය, සෞඛ්‍ය යන අභියෝග අප දිස්ත්‍රික්කයේ ජයග්‍රහණය කළ යුතු බව වැරදි ආහාර පිළිවෙත්, පානීය ජල ගැටලුව ආදිය ඉදිරියේදී විවිධ ව්‍යාපෘතිය හරහා අවම කරගැනීමට කටයුතු කරන බවත් රොෂාන් රණසිංහ මහතා පැවසීය.

පරිපාලන සේවයේ පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරන පිරිස ඉතා අල්පයක් බව පැවැසූ ඒ මහතා එයට හේතුව අධ්‍යාපනයේ ඇති ගැටලුකාරී තත්ත්වයන් බව සඳහන් කළේය.

විශේෂයෙන් තවමත් දිස්ත්‍රික්කයේ පාසල්වල නොවිසඳුණු විදුහල්පති හිඟයට විසඳුම සෙවිය යුතු බවත්, කාලයක් පුරා පවතින මේ ගැටලු මධ්‍යයේ වුවත් කැපවීමෙන් අධ්‍යාපනය ලබා, පොළොන්නරුව දිස්ත්‍රික්කයට සේවය කරන සෞඛ්‍ය කාර්යමණ්ඩලය වෙත ප්‍රශංසනීය ස්තුතියක් පුදකර සිටින බවත් රණසිංහ මහතා කියා සිටියේය.

රාජ්‍ය ඇමැති සිරිපාල ගම්ලත්, පොළොන්නරුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති අමරකීර්ති අතුකෝරල, උතුරු මැද පළාත් ආණ්ඩුකාර ලේකම් ඒ.කේ.එන්. වික්‍රමසිංහ, උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ පාලිත බණ්ඩාර මහත්වරුන් ඇතුළු රෝහල් සෞඛ්‍ය කාර්ය මණ්ඩලය මේ අවස්ථාවට එක් වූහ.

## දවසේ රාහු කාලය

සවස 03.15 සිට 04.47 දක්වා අලුයම 03.07 සිට 04.35 දක්වා



සුබසෙත
ජ්‍යෙෂ්ඨ කර්තෘ
ප්‍රවීණ
ජ්‍යෙතිෂවේදී
අජිත් ධර්මසිරි

## දින තත්ත්වය

මීන රවි 30 බක් පුර දියවක තිථිය ලත් කුජ දින ඉර උදාව 06.30ට ඉර බැසීම 06.19ට අස්විද නැකත දහවල් 02.22න් ගෙවී බෙර නැකත ලබයි. බක් පුර පෑලවිය තිථිය උදේ 10.19න් ගෙවී බක් පුර දියවක තිථිය ලබා පවතී. විශ්කම්භ යෝගය සවස 03.17න් ගෙවී ප්‍රීති යෝගය ලබයි. බවකරණය උදේ 10.19න් ගෙවී බාලවකරණය ලබා එය රාත්‍රි 11.33න් ගෙවී කෞලවකරණය ලබයි.

විෂ කලාව - ලැම - තනය  අමෘත කලාව - මාපටැඟිලි

මරු සිටින දිසාව - බටහිර  යෝගිනි - නැගෙනහිර සුබ දිසාව - දකුණ

## 2021 අප්‍රේල් 13 අඟහරුවාදා හෝරාව ලබා ගෙවී යන අයුරු

**උදේ**

06.03 - 07.03 දක්වා - කුජ හෝරාව
07.03 - 08.03 දක්වා - රවි හෝරාව
08.03 - 09.03 දක්වා - සිකුරු හෝරාව
09.03 - 10.03 දක්වා - බුධ හෝරාව
10.03 - 11.03 දක්වා - සඳු හෝරාව
11.03 - 12. 03 දක්වා - සෙනසුරු හෝරාව

**සවස**

12.03 - 01.03 දක්වා - ගුරු හෝරාව
01.03 - 02.03 දක්වා - කුජ හෝරාව
02.03 - 03.03 දක්වා - රවි හෝරාව
03.03 - 04.03 දක්වා - සිකුරු හෝරාව
04.03 - 05.03 දක්වා - බුධ හෝරාව
05.03 - 06.03 දක්වා - සඳු හෝරාව

**රාත්‍රී**

06.03 - 07.03 දක්වා - සෙනසුරු හෝරාව
07.03 - 08.03 දක්වා - ගුරු හෝරාව
08.03 - 09.03 දක්වා - කුජ හෝරාව
09.03 - 10.03 දක්වා - රවි හෝරාව
10.03 - 11.03 දක්වා - සිකුරු හෝරාව
11.03 - 12. 03 දක්වා - බුධ හෝරාව

**අලුයම**

12.03 - 01.03 දක්වා - සඳු හෝරාව
01.03 - 02.03 දක්වා - සෙනසුරු හෝරාව
02.03 - 03.03 දක්වා - ගුරු හෝරාව
03.03 - 04.03 දක්වා - කුජ හෝරාව
04.03 - 05.03 දක්වා - රවි හෝරාව
05.03 - 06.03 දක්වා - සිකුරු හෝරාව



**බබාට නමක්**

මෙදින දහවල් 02.22 දක්වා අස්විද නැකත පවතින නිසා චු-චෙ-චො-ල අකුරු ද ඉන්පසුව උදා වන බෙරණ නැකත අනුව ලි-ලු-ලෙ-ලො අකුරු ද, දිනට අනුව ක-බ-ග-ඩ අකුරු ද මුල් කොට බබාට නමක් දැමීම සුබයි





## දවසේ ලග්න පලාපල

### මේෂ ලග්නය - සිතැඟි ඉටු වනු ඇත

මේෂ ලග්නයට අනුව අද ඔබට සුබ දිනකි. චන්ද්‍රයා ලග්නගත වීමෙන් තම සිතැඟි ඉටුවන ලකුණු පල කරයි. නිර්මාණශීලී බව හා තම ජීවන ගමනේ සහකරු හෝ සහකාරිය තමාට හිමි වනු ඇත. දුරස් වී සිටි අය සමීප වන දිනකි. ආර්ථිකය සුබවාදි වෙයි රැකියා උසස් වීම් පිළිබඳ ආරංචි ලැබේ. අවිවේකය නිසා ශාරීරික තෙහෙට්ටු ගතිය මතු වනු ඇත.

### වෘෂභ ලග්නය - සමීපතමයකුගේ වෙන් වීමක්

වෘෂභ ලග්නයට අනුව අද ඔබට රටක සිටින අයකුගේ පැමිණීම නිසා අනුන් වෙනුවෙන් කැප වීමට සිදු වේ. ආර්ථික වාසි ඇතත් ඊට වඩා වියදම අධික ලකුණු පෙනේ. තමා ඇලුම් කළ කෙනෙකු තමාගෙන් වෙන් වනු ඇත. තමාට ද දුර බැහැර ගමන් යෙදේ. පාදයේ වළළුකර ආශ්‍රිත උවදුරු පෙනෙන්නට තිබේ. කෑම බීම විෂවීම නිසා ප්‍රතිකාර ගැනීමට වුව ද සිදු වේ.

### මිථුන ලග්නය - ඉඩම් ලාභයක්

මිථුන ලග්නයට අනුව ආර්ථික ප්‍රතිඵල හිමි වන දිනකි. තමා මීට පෙර කළ ආයෝජනයක ප්‍රතිඵල උදා වේ. සිතට අවිවේකය නිසා කටයුතුවල ප්‍රමාදයක් පෙන්වුවද තම ආත්ම අභිමානය නොඅඩුව පැවතීම තුළ විය හැකි අවමයක් මග හරවා ගත හැකිවේ. තම දරුවන්ගේ කටයුතු වෙනුවෙන් වැඩි කාලයක් කැප කිරීමට ද සිදු වේ. තමාට උරුම වන්නට තිබි අන්සතුව තිබූ ඉඩමක් තමාට හිමි වන දිනකි.

### කටක ලග්නය - අතමිට මිල මුදල් ගැවසේ

කටක ලග්නයට අනුව අද ඔබට සුවිශේෂී දිනකි. ඒ බොහෝ දෙනාගේ පැසසුමට ලක්වන නිසාය. රැකියාගත විවේකය හිමි වුවද නිවෙසේ කටයුතු කෙරේ. වැඩි කැපවීමක් දැරීමට සිදු වේ. අතමිට මිල මුදල් ගැවසෙන දිනයකි. වියදම අතින් ද අඩුවක් නොවුවද ලැබීම් අතින් යහපත් නිසා බිය විය යුතු නැත. තුනටියට අගුණය. බර වැඩවලදී පරිස්සම් වන්න.

### සිංහ ලග්නය - වියදම් අධික වේ

සිංහ ලග්නයට අනුව අද ඔබට ඉතා සුබයි. සිතේ සතුට අභිවෘද්ධිය උදා වේ. වැඩිහිටි පාර්ශ්වයෙන් ඇප උපකාර ලැබේ. තම නිවහනේ අලුත්වැඩියා කටයුත්තක් වෙනුවෙන් වෙහෙස මහන්සි වීම සිදු වේ. මිල මුදල් අත රැඳුන ද වියදම් අධිකයි. තම එදිනෙදා කටයුතු සකසුරුවම්ව කර ගෙන යාම සුබයි. අන් අය සමඟ තිබූ ගිවිසුම්වල ස්ථාවර බව රැකෙන දිනකි.

### කන්‍යා ලග්නය - රැකියා ස්ථානගත සතුරු කරදර

කන්‍යා ලග්නයට අනුව අද ඔබට ප්‍රවේසම් විය යුතු දිනකි. හදිසි අනතුරු අපවාද චෝදනාවලට හසු වීමට පුළුවන. තමා රැකියාව කරන ස්ථානයේ සතුරු බලවේගයක් නිසා තමාට අසුබ ආරංචි ඇසීමට සිදු වේ. තමා මීට පෙර කරගෙන ආ ආදායම් මාර්ග ඇහිරී යන බවක් පෙනෙන්නට තිබේ. එහෙත් නව ආර්ථික ක්‍රමෝපායන නිසා නව ජීවයක් සිතට දැනෙනු ඇත.

### තුලා ලග්නය - ගෙදර සාමාජිකයෝ එකට එකතු වෙති

තුලා ලග්නයට අනුව අද ඔබට ඉතා සුබයි. ඒ ගෘහ ජීවිතයේ සතුට මතු කෙරෙන කරුණු කාරණා යෙදෙන නිසාය. කාලෙකට පසුව ගෙදර සාමාජිකයින් එකට එකතුව සතුට භුක්ති විඳීමට කටයුතු කරයි. නිවසේ අලුත් වැඩියා කටයුතු, නිවෙසට අලුත් ගෘහ භාණ්ඩ ගෙන එන දිනකි. තුනටියට ආපදා පෙන්වන නිසා බර ඉසිලිම්වලදී කල්පනාකාරී වන්න. දරු සම්පත් අපේක්ෂා කරන අයට අලුත් සාමාජිකයින් පවුලට එකතු වන දිනකි.

### වෘශ්චික ලග්නය - දුර බැහැර රාජකාරියකට

වෘශ්චික ලග්නයට අනුව අද ඔබට ගමෙන් දුර බැහැර රාජකාරියකට යෑමට සිදු වේ. උත්සව සමයේ නිවෙසේ රැඳී සිටීමට තිබූ අවස්ථාව ගිලිහී යෑමෙන් සිතට කනගාටුව මතු කෙරේ. රැකියා ව්‍යාපාර කටයුතුවල අවිවේකී බවක් උසුලයි. තම ගෘහ ජීවිතයේ ගැටලු මතු වීමට ඉඩ ඇත. හුදෙකලාව ගත කිරීමට සිදු වන දිනකි. යටි බඩ ආශ්‍රිත ආසාදන මතු කෙරේ.

### ධනු ලග්නය - දරුවන්ගේ කුසලතා පිළිබඳ සතුට

ධනු ලග්නයට අනුව අද ඔබට තම ජීවිතයේ සතුටුදායක අවස්ථා කීපයකට මුහුණ දීමට හැකි වේ. ආර්ථික ලාභ, රැකියි අභිවෘද්ධිය ඒ අතර වෙයි. තම දූ දරුවන්ගේ කුසලතා පිළිබඳ සතුටු විය හැකි අවස්ථා මතු කෙරේ. පවුලට අලුත් සාමාජිකයන් එකතු වන අතර නිවෙසේ උත්සවශ්‍රීයක් උසුලන දිනකි. තම වැඩිහිටි පාර්ශ්වයේ ආශිර්වාද ලැබෙනු ඇත.

### මකර ලග්නය - ආර්ථිකය උසස් වේ

මකර ලග්නයට අනුව අද ඔබට තම ජීවිතයේ සුවිශේෂ දිනකි. රැකියාව වේවා, තම ආර්ථිකය වේවා ඉතා උසස් තලයට පැමිණෙන දිනකි. ගෘහ උපකරණ නිවෙසට ගෙන ඒම, නව නිවෙසක පදිංචිය මේ අතර සිතට සතුට ගෙන එයි. එහෙත් තම සමීපතමයකුගේ අභාවයක් නිසා තරමක දුකක් වේදනාවක් මෙන්ම මුදල් වැය කිරීමක් සිදු වන දිනකි.

### කුම්භ ලග්නය - පැවැති නඩුවක තීන්දුව තමාගේ වාසියට

කුම්භ ලග්නයට අනුව අද ඔබට ගුරු ග්‍රහයා ලග්නගතවීම ද චන්ද්‍රයා 03 වැන්නේ වීම ද නිසා තම සහකරු හෝ සහකාරියගේ පාර්ශ්වයෙන් හදිසි ධනය, හදිසි උරුමකම් පෙනෙන්නට තිබේ. කලක් පැවති නඩුවක් තමාගේ වාසියට පෙරළෙනු ඇත. තමා අතින් සිදු වූ බොහෝ අඩුපාඩු අවම කර ගැනීමට සිතන දිනකි. ප්‍රතිචාර අනුව තමා සමාජයේ උසස් බවක් දක්නට පුළුවන.

### මීන ලග්නය - විදේශ මිතුරකුගෙන් සතුටුදායක ආරංචියක්

මීන ලග්නයට අනුව අද දින තමාට හදිසි ධනයක් උරුම වීමට පුළුවන. තමා කලක් ඇසුරු කළ විදේශිකයකුගෙන් සතුටුදායක ආරංචියක් ලැබේ. තමා ආරම්භ කර තිබූ ව්‍යාපාරයක ප්‍රතිලාභ පත්වන දිනකි. තම දූ දරුවන්ගේ කටයුතු වෙනුවෙන් දැඩි මහන්සියෙන් කටයුතු කිරීමට සිදු වේ. රාත්‍රි කාලයේ සුහද හමුවක්, ප්‍රිය සම්භාෂණයක් වෙනුවෙන් කාලය කැප කිරීමට සිදු වේ.

# පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් විපක්ෂ නායකවරයා කරන ප්‍රකාශ විහිළුවක්

## ඇමැති ප්‍රසන්න රණතුංග

**මහින්ද අලුත්ගෙදර**

පාස්කු ඉරිදා ප්‍රහාරය සිදු වන විට යහපාලන ආණ්ඩුවේ කැබිනට් ඇමැතිවරයකු මෙන්ම එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායකයාව සිටි වත්මන් විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා පාස්කු ප්‍රහාරයේ මහ මොළකරුවන් සැඟවීමට ආණ්ඩුව උත්සාහ දරන බවට චෝදනා කිරීම තරම් තවත් විහිළුවක් නැතැයි සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා අවධාරණය කරයි.

පාස්කු ප්‍රහාරයේ මහ මොළකරුවන් සැඟවීමට උත්සාහ දැරුවේ පසුගිය යහපාලන ආණ්ඩුව බවත්, එහි ප්‍රබල සාමාජිකයකු වූ වත්මන් විපක්ෂ නායකවරයා ද ඊට වගකිව යුතු බවත් ඇමැතිවරයා පෙන්වා දෙයි.

පාස්කු ප්‍රහාරයේ මහ මොළකරුවන් සැඟවීමට වත්මන් ආණ්ඩුව උක්සාහ දරන බවට චෝදනා කරමින් විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා කර ඇති ප්‍රකාශයක් සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වමින් ඇමැතිවරයා මේ බව සඳහන් කළේය.

රටේ සහ ජනතාවගේ ආරක්ෂාව සැලසීම සෑම රජයකම පරම වගකීම බව පෙන්වා දුන් ඇමැති ප්‍රසන්න රණතුංග මහතා යහපාලන රජය එය පැහැර හැරිය බවත් ඊට යහපාලන ආණ්ඩුවේ ඉහළ සිට පහළ දක්වා සියලු දෙනා වගකිව යුතු බවත් පෙන්වා දුන්නේය. යහපාලන ආණ්ඩුව පවත්වාගෙන යෑම සඳහා උදව් කළ දෙමළ ජාතික සන්ධානය හා ජනතා විමුක්ති පෙරමුණ වැනි දේශපාලන පක්ෂවලට ද මෙම වගකීමෙන් ගැලවිය නොහැකි බව ද ඒ මහතා කීවේය.

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව ඒ පිළිබඳව සොයා බැලීම සඳහා ජනාධිපති කොමිෂන් සභාවක් පත් කළේ හිටපු ජනාධිපතිවරයායි. ඊට අමතරව පාර්ලිමේන්තුවේ ආරක්ෂාව පිළිබද ආංශික කමිටුව ද මේ පිළිබඳව වෙනම විමර්ශනයක් සිදු කළේය. ඊට අමතරව පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් ද පත් කර තිබුණි. මෙම විමර්ශනයන් පිළිබඳව සෑහිමකට පත් නොවන බව පවසන ඇමැතිවරයා යහපාලන ආණ්ඩුව පාස්කු ප්‍රහාරයේ වගකිව යුත්තන් ඉන් ගලවා ගැනීමට මෙම පරික්ෂණ උපයෝගී කරගත් බවට චෝදනා නගා ඇතැයි ද ඇමැතිවරයා පෙන්වා දුන්නේය.

සජිත් ප්‍රේමදාස වත්මන් විපක්ෂ නායකවරයා පාස්කු ප්‍රහාරය සිදු වන විටත් ඉන් පසු අදාළ විමර්ශන සිදුකෙරෙන විටත් යහපාලන ආණ්ඩුවේ ප්‍රබල ඇමැතිධුරයක් දැරූ අතර ඊට අමතරව එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායකවරයා ලෙස ද කටයුතු කළේය. පාස්කු ප්‍රහාරයට එරෙහිව හෝ එහි විමර්ශන සම්බන්ධයෙන් යහපාලන ආණ්ඩුව තුළ ප්‍රේමදාස මහතා කිසිදු හඬක් නැගුවේ නැත. ඔහු ඒ සම්බන්ධයෙන් මුණිවත රැක්කේය. එදා පාස්කු ප්‍රහාරයෙන් පසුව විමර්ශන නිසි ලෙස සිදු නොවෙද්දී එය නිවැරදි කර ගැනීමට එවකට වගකිව යුතු ඇමැතිවරයකු ලෙස ප්‍රේමදාස මහතා කටයුතු නොකළ බව ද රණතුංග මහතා පෙන්වා දෙයි. එදා නිහඬව සිටි වත්මන් විපක්ෂ නායකවරයා අද පාස්කු ප්‍රහාරය



ගැන කිඹුල් කඳුළු හෙළන්නේ ඇයිදැයි රටේ ජනතාව වටහා ගත යුතු බව ද ඇමැතිවරයා කියයි.

පාස්කු කොමිසමේ නිර්දේශ මේ වන විට අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇති ආයතන වෙත යොමු කර තිබේ. නීතිපති දෙපාර්තමේන්තුව, ආරක්ෂක අමාත්‍යාංශය, පොලිස් දෙපාර්තුමේන්තුව මේ සම්බන්ධයෙන් ඉදිරි පියවර ගනු ඇත. නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන නොමැති නම් නව නීති පනවා හෝ පාස්කු ප්‍රහාරයට වගකිව යුත්තන්ට දඬුවම් දීම රජයේ අපේක්ෂාව බව අවධාරණය කරන ඇමති ප්‍රසන්න රණතුංග මහතා අවශ්‍ය නම් ඒ සඳහා වෙනම ආයතනයක් පිහිටුවීමට හෝ ආණ්ඩුව පසුබට නොවන බවද පැවැසීය.

විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස ඇතුළු යහපාලන නඩයේ අවශ්‍යතාව වී ඇත්තේ ජනතාව තුළ ආණ්ඩුව කෙරෙහි අප්‍රසාදයක් ඇති කිරීමයි. ඒ සඳහා ඔවුන් හැකි උපරිමයෙන් කටයුතු කරමින් සිටී. යාපනය නගරාධිපතිවරා අත්අඩංගුවට ගැනීම පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු හෙළිදරව් වීම යට ගැසීමේ කුමන්ත්‍රණයක් බවට ඔහු කරන ප්‍රකාශයද එවැන්නකි. පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් වගකිය යුත්තන් ආරක්ෂා කිරිමට ගෝඨාභය රාජපක්ෂ, මහින්ද රාජපක්ෂ සුසංයෝගයෙන් සැදී වත්මන් ආණ්ඩුවට කිසිදු අවශ්‍යතාවක් නොමැත. ඒ නිසා විපක්ෂයේ බොරුවලට නොරැවටෙන්නැයි ජනතාවගෙන් ඉල්ලා සිටින බව ඇමැතිවරයා කියා සිටියේය.

# ‘භාරතී පදනමෙන්’ දිළිඳු පවුල්වලට ආහාර මලු



‘භාරති සමාජ සත්කාර පදනම’ මරදංකඩවල ඇතිණිවැටුනුවැව ගම්මානයේ දිළිඳු පවුල් 150කට වියළි ආහාර මලු බෙදාදීම පසුගිය දා (6) සිරිවර්ධනාරාම විහාරයේදී සිදු විය.

කුලියපිටිය අස්වැද්දුම ශ්‍රී ශාසනාලංකාර මහා විහාරයේ විහාරාධිපති පල්ලේකාගම රතනභාරතී හිමියන්ගේ 50 වැනි ජන්ම දිනය හා ශාසනාලංකාර මහා විහාරයට ශතවර්ෂයක් පිරීම නිමිත්තෙන් මෙම වියලි ආහාර මලු බෙදා දීම සිදු විය.

‘භාරතී සමාජ සත්කාර පදනමේ’ නිර්මාතෘ ඇස්වැද්දුම ශ්‍රී ශාසනාලංකාර මහා විහාරයේ සමිත භාරතී ස්වාමීන්වහන්සේ මේ අවස්ථාව සංවිධානය කළේය.

**වර්ජිනී පෙරේරා**

# සියලු දෙනාට පොදු නීතියක් මේ රටේ නෑ

## නව ජාතික පෙරමුණේ නායක ජේ කණ්ඩම්බි

ජනතාවට අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය පොතේ ඇතත් උසාවියේ නැතැයි නව ජාතික පෙරමුණේ නායක ජේ. කණ්ඩබ්බි මහතා පවසයි.

රජය ජනතා බලය ලබා ගත්තේ පොදු නීතියක් ක්‍රියාත්මක කිරීමට වුවද මේ වන විටත් ඒ බලාපොරොත්තු ඉටු වී නැතැයි ද හෙතෙම ප්‍රකාශ කරයි.

වැඩිදුරටත් ඒ මහතා මෙසේ ද කියයි.

අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන් ලීසිං ආයතන එක් ව ජනාතව ගසා කනවා. එහෙත් ඊට එරෙහිව ලිඛිත පැමිණිලි කරන්න බැහැ. මූල්‍ය ආයතනවලට අනුකූලව තීන්දු ලියා දී වාහන පැහැර ගැනීමට පොලීසිය ද දායක කර ගන්නා රෙජිස්ට්‍රාර්වරු ඉන්නවා. නාමල්ට ඉරු දින රට යෑමට බාධා වුයේ ද අධිකරණයේ වරදකින්. ඔහුගේ නඩුව තවමත් නිමා වී නැහැ. එහෙත් නඩු නිමා වී ගුවන්තොටුපළ දැනුවත් නොකිරීමෙන් මූල්‍ය හා වැදගත් අවස්ථා මගහැරී ගිය සාමාන්‍ය ජනයා අපමණයි. දුබලයාට එක් නීතියක් ප්‍රබලයාට තවත් නීතියක් ක්‍රියාත්මක වෙනවා. ගුවන් බලපත්‍ර ගැනීමේදී ගුවන් තහනම බල පාන්නේ නැහැ. නීතිය එක සමාන නම් ඇති අය ගුවන්තොටුපළේ දී පීඩනවලට ලක් විය යුතු නැහැ. ජනතාව බලය දුන්නේ කොටසක් පිම්බීමට නොවෙයි.

ජනතාවට ආතතිය ඇති කරන ආණ්ඩුවලින් නිදහස් වන දිනක් ගැන සිතීමටත් බැහැ.

# දෙමළ ජනතාවගේ ප්‍රශ්න දෙස රජය සානුකම්පිතව බලන්නේ නෑ

## හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සුරේෂ් ප්‍රේමචන්ද්‍රන්

**උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ**

දෙමළ ජනතාව තුළට බිය කාවද්දා ඔවුන්ව නිහඬ කරවීමට රජය මෑතක සිට උත්සාහ කරන බව පවසන ඊ.පී.ආර්.එල්. එෆ්. සංවිධානයේ නායක සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා මේ තත්ත්වය දෙමළ ජනතාවගේ අනාගතයට විශාල තර්ජනයක් බවද පැවැසීය.

මේ රටේ ජන සංයුතිය අනුව දෙමළ ජනතාව විශාල ප්‍රමාණයක් සිටින නිසා පවත්නා රජය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුවද දෙමළ ජනතාවගේ ප්‍රශ්න දෙස බැලීමට බැඳී සිටියත් දේශපාලන මතිමතාන්තර නිසා දෙමළ ජනතාව මේ රටේ ජීවත් නොවන පිරිසක් ලෙස සලකා වත්මන් රජය කටයුතු කිරීම ඉතා කණගාටුදායක බව ඊ.පි.ආර්.එල්.එෆ්. නායකයා සඳහන් කළේය.

දෙමළ ජනතාව අයිතිවාසිකම් ඉල්ලමින් දේශපාලනමය වශයෙන් ගන්නා සියලු තීන්දු තීරණ වලට මේ රජයෙන් කිසිම ඇහුම්කන් දීමක් සිදු වන්නේ නැහැ. පෙළපාලි යෑම් උද්ඝෝෂණ කිරීම් සියල්ලම අධිකරණයේ බලය යොදාගෙන නවතා දමනවා. දෙමළ ජනතාව හා දෙමළ දේශපාලනඥයන්ව පොලීසිවලට හා අධිකරණ වලට රැගෙන ගොස් ඔවුන්ව බියට පත් කරනවා.

යාපනය නගරාධිපතිවරයා අත්අඩංගුවට ගැනීමත් මේ වගේම ක්‍රියාවක් තමයි. නගරාධිපතිවරයාව කොටි සාමාජිකයකු ගානට දමා අත් අඩංගුවට ගෙන ඔහුට එරෙහිව අධිකරණයේ නඩු පවරා තිබෙනවා. මේ තත්ත්වයත් එක්ක යාපනයේ පමණක් නොවෙයි මුළු රටේම දෙමළ ජනතාව බියට පත්ව සිටිනවා.

යුද්ධය අවසන් වී වසර එකොළහක් ගත වී හමාරයි. කොටි සංවිධානය අහවර කළා කියලා ආණ්ඩුව නිවේදනයක් නිකුත් කළෙත් එදාමයි. එහෙත් මේ වන තුරු ආණ්ඩුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඉවත් කිරීමට පියවර ගෙන නැහැ. දෙමළ ජනතාව මර්දනය කිරීම සඳහා ආණ්ඩුව යොදා ගන්නේ මේ පනතයි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම හෝ සංශෝධනය කිරීම සිද්ධ කරන්නට ජිනීවා මානව හිමිකම් කමිටුවෙන් නිර්දේශයන් ලැබුණේ මීට වසර කීපයකට ඉහතදියි.නමුත් මේ දක්වා එය සිදු වී නැහැ. දෙමළ ජනතාව බියට පත් කොට ඔවුන්ව මර්දනය කරමින් සිංහල බෞද්ධ ජනතාවගේ සිත් සතුටු කිරීමට මේ ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙළ දෙමළ ජනතාව ඉතා පිළිකුළෙන් හෙළා දකිනවා.

මේ තත්ත්වය මත සිදු වන්නේ දෙමළ ජනතාව රජය කෙරෙන් ක්‍රමයෙන් ඉවත් වීමයි.ඒක මොන ආණ්ඩුවකට වුණත් ඉතාම අවාසිදායක තත්ත්වයක් කියලා කවුරුවත් පිළිගන්නේ නැහැ.'

# කොමර්ෂල් ටෙක්නොලොජීස් ප්ලස් ජාතික ජයග්‍රහණයක් හිමි කර ගනී



ස්මාර්ට් මොබිලිටි ව්‍යාපාර (Smart Mobility Enterprise) විසඳුම් සපයන්නකු වශයෙන් SAAS Enterprise ව්‍යාපාර වේදිකා සංවර්ධනයේ පෙරමුණ ගත් සී/ස කොමර්ෂල් ටෙක්නොලොජීස් ප්ලස් සමාගම ඉදිරිපත් කළ බිල්ලා ක්ලවුඩ් විසඳුම ශ්‍රී ලංකා මෘදුකාංග සේවා සමාගම් සංගමය (SLASSCOM) සංවිධාන කළ'National Ingenuity Awards 2021' සම්මාන උලෙළේදී ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ කාණ්ඩයේ හොඳම නවතාවෙන් යුත් නිර්මාණය වෙනුවෙන් ජාතික ජයග්‍රහණය ලබා ගත්තේය. එම කාණ්ඩයේ බස්නාහිර පළාත් ජයග්‍රහණයත් ඔවුන් සතු වීම විශේෂත්වයකි.

දීප ව්‍යාප්ත තරගාවලියක් ඔස්සේ මෘදුකාංග ක්ෂේත්‍රයේ නව නිර්මාණකරණයට උනන්දුව සපයන 'National Ingenuity Awards 2021' සම්මාන උලෙළ පසුගියදා කොළඹ ෂැන්ග්‍රිලා හෝටලයේදී උත්කර්ෂවත් ලෙස පැවැත්විණි.

"නැඟී එන සමාගමක් වශයෙන් මෙවැනි ජාතික ජයග්‍රහණයක් ලැබීම විශාල සතුටක්. බාධක සහ අභියෝග රැසක් ජය ගනිමින් අපේ කණ්ඩායම කළ කැප වීම මීට බෙහෙවින් දායක වුණා. කණ්ඩායමේ සෑම දෙනාටම මාගේ ප්‍රශංසාත්මක ස්තුතිය පුද කරනවා." සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි, නවෝත්පාදන ප්‍රධානි සුපුන් මයුෂාන් මහතා පැවසීය.

සුපුන් මයුෂාන් මහතා 2016දී ඇරඹූ කොමර්ෂල් ටෙක්නොලොජීස් ප්ලස් තාක්ෂණික අංශයෙන් ඉදිරියට යමින්SAAS Platforms Development ඔස්සේ සිය කෙටි ඉතිහාසය තුළ ශීඝ්‍ර වර්ධනයක් පෙන්වීය. සමාගමේ ප්‍රමුඛතම නිපැයුම වන බිල්ලා ක්ලවුඩ් (BillaCloud-Business Management System) මීට පෙර e-ස්වාභිමානි 2020 සම්මාන උලෙළේදී ද ව්‍යාපාර හා වාණිජ කාණ්ඩය යටතේ ඇගයුමට ලක් විය. බිල්ලා ක්ලවුඩ් යනු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා අවශ්‍ය සියල්ල ඇතුළත් ව්‍යාපාර කළමනාකරණ පද්ධතියකි. එක් ලියාපදිංචි කිරීමකින් Cloud POS, Mobile POS, e-commerce Websites, Order Management Platform සහ Driver app යනාදී සේවා රැසක් සැපයීමට එම පද්ධතියට හැකියාව තිබේ. කොමර්ෂල් ටෙක්නොලොජීස් ප්ලස් සිය සේවාදායකයන්ට දත්ත පාදක උපක්‍රමික අලෙවිකරණයට උපකාර කරමින් ඔවුන්ගේ ව්‍යාපාර ඉහළටම නැංවීමට ක්‍රියා කරයි. එහි ශාඛා සමාගමක් වන බ්‍රෑන්ඩ් කියුබ්ස් පෞද්ගලික සමාගමද ඊට සහාය දක්වයි.

# උසස් ඉංජිනේරු තාක්ෂණ භාවිතයට ලක්ශොප් සම්මාන ලබයි



ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වෙබ් අඩවි ගොඩ නැඟීමේ සේවාවක් වන ලක්ශොප් 2020දී ශ්‍රී ලංකා ජාතික විශිෂ්ට මෘදුකාංග තත්ත්ව සම්මාන උළෙලේදී උසස් තත්ත්වයේ ඉංජිනේරු තාක්ෂණ භාවිතය සඳහා සම්මාන දිනා ගත්තේය. සම්මාන ප්‍රදානෝත්සවය කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ අන්තර්ජාතික සම්මන්ත්‍රණ ශාලාවේදී පසුගිය දා පැවැත්විණි. වෙබ් අඩවි නිර්මාණය කිරීමේ කුසලතාවකින් තොරව වුවද කුඩා ව්‍යාපාර හිමියන්ට සහ සමාගම්වලට ඔවුන්ගේ ඔන්ලයින් වෙළෙඳසල් සහ ආයතනික වෙබ් අඩවි සැකසීමට ලක්ශොප් අවස්ථාව සලසා දෙයි. පැකේජ නොමිලේ ආරම්භ වන අතර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට (SME) ඔන්ලයින් වෙළෙඳපොළක් නිර්මාණය කර ගැනීමට අවශ්‍ය සියලු පහසුකම් ලක්ශොප් සතු වේ. ව්‍යාපාරිකයන්ට ඔවුන්ගේ වෙබ් ලිපිනය සම්බන්ධ කිරීමට, නිෂ්පාදන එකතු කිරීමට, මිල නියම කිරීමට, ගෙවීම් දොරටු (Payment Gateway) සම්බන්ධ කිරීමට හා වෙනත් බොහෝ අංග සමග සම්පූර්ණ ඔන්ලයින් වෙළෙඳසලක් සැකසීමට අවස්ථාව ලක්ශොප් සලසා දී ඇත. ලක්ශොප්හි දැනට ප්‍රධාන වෙබ් අඩවි කාණ්ඩ තුනක් ඇත. එනම්, ඔන්ලයින් වෙළෙඳසල්, ආයතනික වෙබ් අඩවි හා සංගම් හෝ වෘත්තීය සමිති වෙබ් අඩවි වේ. මොරටුව විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන් දෙදෙනකු වන චන්දන බණ්ඩාර සහ ජයමිහිරි බණ්ඩාර යන මහත්ම මහත්මීන් අතරින් බිහිවූ සංකල්පයක් අනුව, ලක්ශොප් නිර්මාණය විය.

"අපගේ ඉලක්කය වන්නේ ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රජාවට ඔවුන්ගේ නිෂ්පාදන කෙලින්ම පාරිභෝගිකයන් වෙත ගෙන ඒමට පහසුකම් සැලසීම සහ බල ගැන්වීමයි. ශ්‍රී ලංකාවේ සෑම ව්‍යාපාරයක්ම ඔවුන්ගේ වෙබ් අඩවි තනා ගනු දැකීම අපගේ අරමුණයි. වෙබ් අඩවියක් සාදා ගැනීම පහසු සහ විනෝදජනක විය යුතුයි." ලක්ශොප් නිර්මාතෘ/ ප්‍රධාන විධායක නිලධාරි චන්දන බණ්ඩාර මහතා පැවසීය.

# ත්‍රී සිංහ සමූහ ව්‍යාපාරයට රන් සම්මාන ද්විත්වයක්



ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සමාගමක් වන ත්‍රී සිංහ සමූහ ව්‍යාපාරය ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය (FCCISL) සංවිධාන කළ වසරේ ව්‍යවසායකයා සම්මාන උලෙළේදී ජාතික මට්ටමේ, මහා පරිමාණ කාණ්ඩයේ, රන් සම්මානයෙන් සහ බස්නාහිර පළාතේ, මහා පරිමාණ කාණ්ඩයේ, රන් සම්මානයෙන් පිදුම් ලැබීය. සම්මාන උලෙළ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් උත්කර්ෂවත් ලෙස BMICHහිදී පැවැත්විණි. ත්‍රී සිංහ සමූහ ව්‍යාපාරයේ කළමනාකාර අධ්‍යක්ෂ මංජුල ආරියකුමාර මහතා එහිදී සම්මානය ගත්තේය."නිෂ්පාදන සහ සේවා විශිෂ්ට මට්ටමින් සැපයීම අපගේ ප්‍රධාන දැක්ම වන නිසා ත්‍රී සිංහ සමූහ ව්‍යාපාරය නිරන්තරයෙන් ඇගැයීමට ලක් වෙමින් සම්මාන දිනා ගන්නවා. මේ සම්මානය ගැනීමට දායකත්වය සැපයූ කාර්ය මණ්ඩලයට මෙන්ම අපගේ පාරිභෝගිකයන්ට මගේ කෘතවේදීත්වය පිරිනමනවා." මංජුල ආරියකුමාර මහතා පැවසීය.

කුඩා පරිමාණයෙන් අරඹා වර්තමානයේදී ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සමාගමක් බවට පත්වී තිබෙන ත්‍රී සිංහ සමූහ ව්‍යාපාරය සම්මාන රැසකින් පිදුම් ලබා ඇත. ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය පිරිනැමූ කර්මාන්ත විශිෂ්ටතා රන් හා රිදී සම්මාන සහ ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය පිරිනැමූ විශිෂ්ටතම ව්‍යවසායකයා රන් හා රිදී සම්මාන හිමි කර ගැනීමත්, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය පිරිනැමූ නිෂ්පාදන විශිෂ්ටතා සම්මානවලින් අඛණ්ඩව පිදුම් ලැබීමත් ඒ අතරින් ප්‍රධානය. ත්‍රී සිංහ සමූහ ව්‍යාපාරයේ නවතම පරිසර හිතකාමී හඳුන්වාදීම වන්නේ හිරු එළියෙන් විදුලිය නිපදවන සූර්ය පැනල පද්ධතියයි. ත්‍රී සිංහ සමූහය නවීන තාක්ෂණය යොදා ගනිමින් අඩු වියදමින් වානේ ගොඩනැගිලි (Pre fabricated Steel Building) ඉදිකිරීමද අරඹා තිබේ. රෝලර් ඩෝ, රෝලර් ෂටර්ස්, සෙක්ෂනල් ඕවර්හෙඩ් ඩෝ, වින්ඩෝ ෂටර්ස්, ෆයර් රෙසිස්ටන්ට් ඩෝ, ඇලුමිනියම් ෆැබ්රිකේෂන්ස්, සෙන්සර් ඩෝ, ස්ටේන්ලස් ස්ටීල්, ස්ටීල් රේලින්ග්ස් සහ ස්ටෙයාවේස්, පොලිකාබනේට් කැනපීස්, ස්ටේන්ලස් ස්ටීල් පැන්ට්‍රි කබඩ්ස්, ස්ටීල් බිල්ඩින්ග්ස්, ඔටෝමැටික් බැරියර්ස් සහ මෝටර් සවි කළ ස්ලයිඩින්ග් ඇන්ඩ් ස්වින්ග් ගේට්ස් ත්‍රී සිංහ සමූහ ව්‍යා පාරයේ අනෙකුත් නිෂ්පාදන අතර වේ.

# MARKET PRICE

## රට වටා මිල ගණන්



| | නාරාහේන්පිට ආ. ම. | රත්මලාන ආ. ම. | වැලිසර. ආ. ම. | මීගොඩ ආ. ම. | තඹුත්තේගම ආ. ම. | දඹුල්ල ආ. ම. | නුවරඑළිය ආ. ම. | මිල රුපියල් |
|---|---|---|---|---|---|---|---|---|
| පහත රට එළවළු | සිල්ලර මිල රු. | සිල්ලර මිල රු. | තොග මිල රු. | තොග මිල රු | තොග මිල රු. | තොග මිල රු | | තොග මිල රු. |
| වට්ටක්කා | 100 | 120 | 60 | 70 | 50-60 | - | ගෝවා | 110 |
| අළු කෙසෙල් | 120 | 130 | 60 | 60 | 30-40 | 40-50 | කැරට් | 140 |
| පිපිඤ්ඤා | 100 | 100 | 40 | 20 | 30 | 15-20 | ලීක්ස් | 70 |
| වැටකොළු | 150 | 170 | 90 | 90-100 | 70-80 | 70-80 | රාබු | 50 |
| බණ්ඩක්කා | 100 | 130 | 60 | 80-90 | 60-70 | 50-60 | බීට්රූට් | 70 |
| කරවිල | 180 | 200 | 50 | 100-110 | 110-120 | 80-90 | අර්තාපල් | 130 |
| පතෝල | 160 | 160 | 50 | 100 | 50-60 | 65-70 | අර්තාපල් රතු | 120 |
| මාළු මිරිස් | 320 | 330 | 250 | 250 | 260 | 170-200 | නෝකෝල් | 70 |
| බටානා | - | - | 100 | 50 | - | 60-70 | බෙල්පෙපර් රතු | 400 |
| මුරුංගා | 350 | - | - | - | 200 | 150-160 | කහ | 400 |
| එළබටු | 120 | - | 80 | 90 | 70 | 80-90 | කොළ | 350 |
| කැකිරි | 80 | 90 | 30 | 30 | 20-40 | 25-30 | බැසිල් | 350 |
| නෝකෝල් | 140 | 140 | 80 | 70-80 | 80 | 35-40 | චයිනීස් කැබේජ් | 170 |
| මඤ්ඤොක්කා | 80 | 80 | 50 | - | 30 | 25-30 | රෙඩ් කැබේජ් | 800 |
| බතල | - | - | 50 | - | 40 | 40-50 | සැල්දිරි | 240 |
| දඹල | 160 | 160 | 100 | 100 | 80 | 80-90 | කොත්තමල්ලි කොළ | 175 |
| මැකරල් | 140 | 150 | 70 | 70-80 | 65-80 | 80-90 | අයිස්බර්ග් | 150 |
| **උඩරට එළවළු** | | | | | | | සලාද | 80 |
| බෝංචි | 200 | 220 | 190 | 200-240 | 190-200 | 80-100 | රතුසලාද | 500 |
| ගෝවා ගෙඩි | 200 | 220 | 110 | 150-160 | 150-160 | 80-100 | මිංචි | 150 |
| කැරට් | 200 | 200 | 150 | 130-140 | 100-180 | 130-140 | පාස්ලි | 400 |
| ලීක්ස් | 140 | 160 | 80 | 80-95 | 80-110 | 70-80 | රුබා | 50 |
| රාබු | 120 | 120 | 40 | 60-90 | 60 | 15-20 | රෝස්මරි | 600 |
| තක්කාලි | 200 | 200 | 150 | 150 | 120 | 65-70 | බ්‍රොකෝලි | 1000 |
| බීට්රූට් | 140 | 160 | 80 | 80 | 120-150 | 50-60 | මල්ගෝවා | 800 |
| සලාද | - | 160 | 200 | - | 150 | 70-100 | රතුරාබු | 300 |
| ගෝවා කොළ | 160 | - | 100 | 80 | 15-20 | - | පැචර්ලි | 100 |
| **පලතුරු** | | | | | | | සුකිනි | 170 |
| අන්නාසි | 130 | 150 | 120 | 120 | 120-130 | 100-110 | කහ සුකිනි | 180 |
| ඇඹුල් කෙසෙල් | 160 | 160 | 80 | 100 | 30-40 | 65-70 | දිගරාබු | 80 |
| කෝලිකුට්ටු | 260 | 260 | 180 | 220 | 190-200 | 180-190 | තක්කාලි | 200 |
| සීනි කෙසෙල් | 160 | 160 | 90 | 100 | 40-80 | 75-80 | මාළුමිරිස් | 250 |
| ඇඹුල් | 200 | 200 | 130 | - | 130-180 | - | | |
| ගස් ලබු (රෙඩ්ලේඩි) | - | - | 140 | - | 50-90 | 80-90 | | |
| ගස් ලබු | 180 | 180 | 140 | 100 | 50-90 | 80-90 | | |
| ඇපල් (ආනයනික) | 60-80 | - | 60 | - | - | - | | |
| මිදි (දේශිය) | - | - | - | - | - | - | | |
| මිදි (ආනයනික රතු) | 1100 | - | 950 | - | - | - | | |
| මිදි (ආනයනික කොළ) | 1100 | - | 950 | - | - | - | | - |
| **මස්** | | | | | | | | |
| කුකුළු මස් - අලුත් (සම රහිත) | 650 | 650 | 550 | - | 520 | - | | - |
| කුකුළු මස් - ශීත කළ (සම සහිත) | 480 | 400 | 650 | - | - | - | | |
| **අනෙකුත්** | | | | | | | | |
| අමු මිරිස් | 300 | 500 | 240 | - | - | 280-400 | | |
| දෙහි | 180 | 160 | 130 | 130 | 70-80 | - | | |
| අමු ඉඟුරු | - | 300 | - | - | 160 | 150 | | |
| **සහල්** | | | | | | | | |
| රතු නාඩු | 96-105 | 110 | 98 | 100 | - | - | | |
| සුදු නාඩු | 90-105 | 105 | 100 | 98-99 | 96 | - | | |
| රතු කැකුළු | 89-95 | 95 | 96 | 90-92 | 96 | - | | |
| සුදු කැකුළු | 89-97 | 100 | 95 | 94 | 93-94 | - | | |
| සුදු කැකුළු සම්බා | 98-99 | - | 120 | 112-118 | - | - | | |
| තම්බපු කැකුළු සම්බා | 98-110 | 135 | 120 | 112-118 | 128-130 | - | | |
| කිරි සම්බා | 150-175 | 185 | 180 | - | - | - | | |



දැනගෙන ගන්න

රන් මිල

| | |
|---|---|
| කැරට් 21 | - 93625 |
| කැරට් 22 | - 98,083 |
| කැරට් 24 | - 107,000 |

2021 අප්‍රේල් 13 අඟහරුවාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.